200 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 200 - இல. 8
**Volume 200 - No. 8**

2011 ජූලි 20 වන බදාදා
2011 யூலை 20, புதன்கிழமை
**Wednesday, 20th July, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කිරීමට දැනුම් දී තිබූ ස්ථාවර නියෝග 23(2) යටතේ වූ ප්‍රශ්නය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ධීවර හා ජලජ සම්පත් පනත:**
නියෝග

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
மாண்புமிகு அநுர திஸாநாயக்க நிலையியற் கட்டளை 23(2)இன் கீழ் எழுப்பவிருந்த வினா

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**கடற்றொழில், நீரியல் வளங்கள் சட்டம்:**
ஒழுங்கு விதிகள்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Question scheduled to be raised by Hon. Anura Dissanayake under Standing Order 23(2)

ORAL ANSWERS TO QUESTIONS

FISHERIES AND AQUATIC RESOURCES ACT:
Regulations

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2011 ජූලි 20 වන බදාදා***
*2011 யூலை 20, புதன்கிழமை*
*Wednesday, 20th July, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***

*பாராளுமன்றம் பி. ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 1.00 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කිරීමට දැනුම් දී තිබූ ස්ථාවර නියෝග 23(2) යටතේ වූ ප්‍රශ්නය
### மாண்புமிகு அநுர திஸாநாயக்க நிலையியற் கட்டளை 23(2) இன் கீழ் எழுப்பவிருந்த வினா
### QUESTION SCHEDULED TO BE RAISED BY HON. ANURA DISSANAYAKE UNDER STANDING ORDER 23 (2)

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඊයේ දින ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කිරීමට දැනුම් දී තිබූ ස්ථාවර නියෝග 23(2) යටතේ වූ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු සභානායකතුමා විසින් මතු කරන ලද රීති ප්‍රශ්නය පිළිබඳව මාගේ තීරණය දැනුම් දීමට කැමැත්තෙමි.

එකී රීති ප්‍රශ්නය සම්බන්ධයෙන් දෙපාර්ශ්වය විසින් මාගේ අවධානයට ලක් කරන ලද සියලු සැලකිරීම් සහ ඊට අදාළ රීති සම්ප්‍රදායයන් මාගේ පූර්වගාමීන්ගේ නියෝග සහ අදාළ කෘතීන් මා විසින් සලකා බලන ලදී.

අධිකරණයේ විනිශ්චයට භාජනය වී ඇති කරුණක් හෙවත් *sub judice* රීතියත් අනෙක් අතට මහජන මුදල් පිළිබඳව මෙම සභාවේ කථා කිරීමට ගරු මන්ත්‍රීවරුන්ට ඇති අයිතිවාසිකමත් තුලනය කිරීමට මට සිදු වෙනවා. *Ssub judice* රීතියේ හරය වන්නේ විනිශ්චයට භාජනය වන කරුණක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ සාකච්ඡා කිරීමේදී හෙළිදරවු විය හැකි කරුණු විනිශ්චයකරුවන්ගේ තීරණය කෙරෙහි බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති බැවින් එවැනි සාකච්ඡාවකට අවස්ථාවක් ලබා නොදිය යුතුය යන්නයි.

ස්ථාවර නියෝග 31(6) අනුව පාර්ලිමේන්තුව තුළ ප්‍රශ්නයක් ඇසීමේදී සහ ස්ථාවර නියෝග 84(vi) අනුව පාර්ලිමේන්තුව තුළ කථා කිරීමේදී අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් පවතින කරුණක් ගැන හෝ ප්‍රකාශයට පත් කිරීමට නියමිත අධිකරණ තීරණයකට විෂයය වන කරුණක් ගැන හෝ ප්‍රශ්නයේ හෝ ප්‍රකාශයේ අන්තර්ගත නොවිය යුතු බව සඳහන් වේ.

*Sub judice* රීතිය සිවිල් නඩුවලට බල නොපාන බව විපක්ෂ නායකතුමා විසින් සැල කර සිටියද ඒ පිළිබඳව මට එකඟ වීමට නොහැක. ඉන්දියාවේ සහ මහා බ්‍රිතාන්‍යයේ මෙම රීතිය සිවිල් නඩුවලට පමණක් නොව යුද අධිකරණ, මරණ පරීක්ෂණ දක්වා පවා විහිදෙන බව අර්ස්කින් මේ සහ කවුල් ශක්ධාර් යන විශාරදයන්ගේ ග්‍රන්ථවල සඳහන් වේ.

අනෙක් අතට මෙම රීතිය ලංකාවෙන් බැහැරව විනිශ්චයට භාජනය වන නඩුවලට අදාළ නොවන බව ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා තර්ක කර සිටියද මා ඉහතින් උපුටා දක්වන ලද ස්ථාවර නියෝගවල එබඳු සීමාවක් පනවා නොමැති බව පෙන්වා දෙනු කැමැත්තෙමි. වර්තමානයේ අන්තර් ජාල භාවිතය නිසා එක් තැනක කථා කරන දේ හෝ සිදු වන දේ එසැනින්ම ලෝකයේ ඕනෑම රටක සිට නැරඹීමට හෝ කියවීමට හැකියාවක් ඇත. අනෙක් අතට මෙහිදී විනිශ්චයට භාජනය වන මුදල - claim - අති විශාල බව ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයේම සඳහන් වේ. මෙය පෞද්ගලික පාර්ශ්වකරුවන් දෙදෙනෙකු අතර පවතින නඩුවක් නොවන අතර එහි එක් පාර්ශ්වයක් වන්නේ අපගේ රටයි. එම නිසා මෙම රීතිය පිළිබඳව වර්තමානයේ වඩා පුළුල් ලෙස අර්ථකථනය කිරීමට සිදු වේ.

මෙම කරුණු සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා තේරීම් කාරක සභාවක් පත් කරන ලෙස යෝජනාවක් දැනටමත් මා වෙත භාර දී ඇති බවද සඳහන් කරනු කැමැත්තෙමි.

මෙම කරුණු සියල්ලක් සලකා බලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට පාර්ලිමේන්තුව තුළ කථා කිරීමට ඇති අයිතිවාසිකම ආරක්ෂා කරමින් ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය මා විසින් සංස්කරණය කරන ලදී. එකී සංස්කරණය කරන ලද ප්‍රශ්නය හෙට දින ඉදිරිපත් කිරීමට ගරු මන්ත්‍රීතුමාට අවස්ථාවක් ලබා දෙමි.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2011 ජූලි මස 20 වන බදාදා, එනම් අද දින පස් වරු 2.00ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් විදුලිබල හා බලශක්ති විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා සාදන ලදුව 2011 අප්‍රේල් 29 දිනැති අංක 1703/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පිළිගන්වන ලද වාර්තා
## சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
## REPORTS PRESENTED

### ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### லெஸ்டர் ஜேம்ஸ் பீரிஸ் மற்றும் சுமித்ரா பீரிஸ் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### LESTER JAMES PERIES AND SUMITRA PERIES FOUNDATION (INCORPORATION) BILL

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු කථානායකතුමනි, "ඒ" ස්ථාවර කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් "ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ "ඒ" ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

"ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත."

***පනත් කෙටුම්පත "ඒ" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2011 ජූලි මස 21 වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.***

*சட்டமூலம் நிலைக்குழு "ஏ" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2011 யூலை 21, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.*

*Bill, as reported by Standing Committee "A", to be considered upon Thursday, 21st, July, 2011.*

### ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### ஒலகங்கல மஹா சுதர்ஷன பரோபகாரி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### OLAGANGALA MAHA SUDARSHANA PAROPAKARI FOUNDATION (INCORPORATION) BILL

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු කථානායකතුමනි, "ඒ" ස්ථාවර කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් "ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ 'ඒ' ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ) නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර්මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත."

***පනත් කෙටුම්පත "ඒ" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2011 ජූලි මස 21 වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.***

*சட்டமூலம் நிலைக்குழு "ஏ" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2011 யூலை 21 வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.*

*Bill, as reported by Standing Committee "A", to be considered upon Thursday,21st July, 2011.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා - පැමිණ නැත.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු කථානායකතුමනි, මම පිළියන්දල, බෝකුන්දර, අංක 89/1 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.ඩී. ෂෙල්ටන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මහින්ද සමරසිංහ මහතා - පැමිණ නැත.

ගරු පාඨලී චම්පික රණවක මහතා - පැමිණ නැත.

ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා - පැමිණ නැත.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා - පැමිණ නැත.

ගරු වාසුදේව නානායක්කාර මහතා - පැමිණ නැත.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වැලිගම, වැලිපිටිය, රජ්ජේ ගෙදර පදිංචි ඩබ්ලිව්.කේ.එස්. සසන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) වැලිගම, වැලිපිටිය, ෆහ්මියා මන්සිල්, අංක 12 දරන ස්ථානයේ පදිංචි එම්.එම්. රිෆායි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු බුද්ධික පතිරණ මහතා - පැමිණ නැත.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා - පැමිණ නැත.

ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු රොෂාන් රණසිංහ මහතා - පැමිණ නැත.

ගරු නාමල් රාජපක්ෂ මහතා - පැමිණ නැත.

ගරු ආර්. දුමින්ද සිල්වා මහතා - පැමිණ නැත.

ගරු වසන්ත සේනානායක මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 1-0454/'10-(2), ගරු රවි කරුණානායක මහතා

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය මා තුන්වන වතාවටත් අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, දෙවන වර ලෙස ලේඛනගත කර තිබෙන මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

### ගාලු කොටුව: ඉදිරි සැලසුම්
### காலிக் கோட்டை: எதிர்காலத் திட்டங்கள்
### GALLE FORT: FUTURE PLANS

1422/'11

5. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මෙම වර්ෂයේදී හා ඉදිරියේදී ගාලු කොටුව තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති හා වැඩසටහන් කවරේද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය හා එම ප්‍රතිපාදන ලබා දෙන ආයතන කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගාලු කොටුව තුළ තිබෙන පාසල් හෝ වෙනත් රාජ්‍ය ආයතන ඉවත් කිරීමට සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එම පාසල් හෝ ආයතන ඉවත් කරන්නේ නම්, එම ගොඩනැගිලි සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගාලු කොටුව තුළ තිබෙන ඉඩම් හෝ ගොඩනැගිලි කිසියම් ව්‍යාපෘතියක් සඳහා බදු දීමට හෝ එහි ගොඩනැගිලි බැහැර කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, එම ඉඩම් හෝ ගොඩනැගිලි කවරේද;

(iii) එසේ බැහැර කරන්නේ නම්, ඊට අදාළ කොන්දේසි කවරේද;

(iv) ඉඩම් හා ගොඩනැගිලි බදු දී හෝ ගොඩනැගිලි බැහැර කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිය කවරේද;

(v) ඒ සඳහා ඉඩම් හා ගොඩනැගිලි ලබා දෙන ආයතන, සමාගම් හෝ පුද්ගලයන් කවුරුන්ද;

(vi) ඒ සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

தேசிய மரபுரிமைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இவ்வருடத்தில் மற்றும் எதிர்காலத்தில் காலி கோட்டையினுள் நடைமுறைப்படுத்துவதற்கு உத்தேசித்திருக்கும் கருத்திட்டங்கள் மற்றும் நிகழ்ச் சித்திட்டங்கள் யாவை என்பதையும்;

(ii) இதற்கு ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை மற்றும் நிதி வழங்கும் நிறுவனங்கள் யாவையென்பதையும்

வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) காலி கோட்டையினுள் உள்ள பாடசாலைகள் அல்லது வேறு அரச நிறுவனங்களை அப்புறப் படுத்துவதற்கான திட்டம் உள்ளதா என்பதையும்;

(ii) அவ்வாறெனின் அதற்கான காரணம் என்னவென் பதையும்;

(iii) அந்தப் பாடசாலைகள் அல்லது நிறுவனங்களை அப்புறப்படுத்துவதாயின், அந்தக் கட்டிடங்கள் தொடர்பாக எடுக்கும் நடவடிக்கைகள் யாவையென் பதையும்

அவர் இச் சபையில் குறிப்பிடுவாரா?

(இ) (i) காலி கோட்டையினுள் உள்ள காணிகளை அல்லது கட்டிடங்களை ஏதேனும் கருத்திட்டத்துக்காக குத்த கைக்கு வழங்க அல்லது அங்குள்ள கட்டிடங் களை அப்புறப்படுத்த எதிர்பார்க்கின்றீர்களா என்ப தையும்;

(ii) அவ்வாறெனின் அந்தக் காணிகள் அல்லது கட்டி டங்கள் யாவையென்பதையும்;

(iii) அவ்வாறு அப்புறப்படுத்துவதாக இருப்பின், அதற் கான நிபந்தனைகள் யாவையென்பதையும்;

[ගරු අජිත් කුමාර මහතා]

(iv) காணிகள் அல்லது கட்டிடங்களைக் குத்தகைக்கு வழங்கி அல்லது கட்டிடங்களை அப்புறப்படுத்தி நடைமுறைப்படுத்த உத்தேசித்திருக்கும் கருத் திட்டங்கள் யாவையென்பதையும்;

(v) இதற்காக காணிகளை அல்லது கட்டிடங்களை வழங்கும் நிறுவனங்கள், கம்பனிகள் அல்லது நபர்கள் யார் என்பதையும்;

(vi) இது தொடர்பாக ஏற்கனவே எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of National Heritage:

(a) Will he state separately-

(i) the projects and programmes planned to be implemented within the Galle Fort within this year and in future; and

(ii) financial allocations made for those projects and programmes and the institutions that provide funds?

(b) Will he inform this House-

(i) whether there is a plan to remove the schools or other public institutions located within the Galle Fort;

(ii) if so, of the reasons for that; and

(iii) if those schools or institutions are to be removed, the measures that will be taken regarding those buildings?

(c) Will he inform this House-

(i) whether it is expected to lease out the lands or buildings located within the Galle Fort for some project or to dispose of the buildings in it;

(ii) if so, what those lands or buildings are;

(iii) if they are to be disposed of, the conditions applicable to the disposal;

(iv) of the project that is expected to be implemented by leasing out land and buildings or by disposing of buildings;

(v) of the names of the institutions, companies or persons that will provide lands and buildings for that project; and

(vi) of the measures that have been taken by now in that respect?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2011 වර්ෂයේ ගාලු කොටුව තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති හා වැඩසටහන් පහතින් ඉදිරිපත් කරමි.

01. සුධර්මාලය පිට්ටනිය සංවර්ධනය කිරීම.

02. පැරණි කච්චේරි ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම.

03. පැරණි කච්චේරි ගොඩනැගිල්ලේ හුදර්ශන සැකසීම.

04. ලංකා බැංකුව ඉදිරිපස හුදර්ශන සැකසීම.

05. ගාල්ල කොටුවේ සිතියම් දෙකක් ප්‍රදර්ශනය කිරීම.

06. ගාල්ල කොටුව තුළ කසළ බඳුන් 10ක් ස්ථානගත කිරීම.

07. ගාල්ල කොටුවේ තණකොළ කැපීම හා කොටු බැම්ම සංරක්ෂණය කිරීම.

08. ගාල්ල කොටුවේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය.

(ii) ඉහත ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ එවා ලබා දෙන ආයතන මෙසේය.

| ව්‍යාපෘති හා වැඩසටහන | ප්‍රතිපාදන ප්‍රමාණය | ප්‍රතිපාදන ලබා දෙන ආයතන |
|---|---|---|
| 01. සුධර්මාලය පිට්ටනිය සංවර්ධනය කිරීම | මි. 1.9 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය |
| 02. පැරණි කච්චේරි ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම. | මි. 1.86 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය |
| 03. පැරණි කච්චේරි ගොඩනැගිල්ලේ හුදර්ශන සැකසීම. | මි. 0.96 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය |
| 04. ලංකා බැංකුව ඉදිරිපස හුදර්ශන සැකසීම. | මි. 0.8 | ලංකා බැංකුව |
| 05. ගාල්ල කොටුවේ සිතියම් දෙකක් ප්‍රදර්ශනය කිරීම. | මි. 0.26 | ගෝල් ෆෝට් හෝටලය |
| 06. ගාල්ල කොටුව තුළ කසළ බඳුන් 10ක් ස්ථානගත කිරීම. | මි. 0.139 | ගාලු උරුමය පදනම |
| 07. ගාල්ල කොටුවේ තණකොළ කැපීම හා කොටු බැම්ම සංරක්ෂණය කිරීම. | මි. 0.47 | ගාලු උරුමය පදනම |
| 08. ගාල්ල කොටුවේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය. | මි. 167 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |

(ආ) (i) නැත.

(ii) අදාළ නැත.

(iii) අදාළ නැත.

(ඇ) (i) නැත.

(ii) අදාළ නැත.

(iii) අදාළ නැත.

(iv) අදාළ නැත.

(v) අදාළ නැත.

(vi) අදාළ නැත.

(ඈ) අදාළ නැත.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු ඇමතිතුමනි, (ඇ) (i) ප්‍රශ්නය වන ගාලු කොටුව තුළ තිබෙන ඉඩම් හෝ ගොඩනැඟිලි කිසියම් ව්‍යාපෘතියක් සඳහා බදු දීමට හෝ එහි ගොඩනැඟිලි බැහැර කිරීමට අපේක්ෂා කරන්නේද යන ප්‍රශ්නයට පිළිතුර නැවත කියවන්න පුළුවන්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම ඔබතුමාට ඒ ප්‍රශ්නයට පිළිතුර දුන්නා. එයට පිළිතුර "නැත" කියන එකයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6-0773/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා. පළමුවැනි වතාවටයි මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කරුණාකර මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු දීම සම්බන්ධයෙන් ස්ථාවරයක් ගන්න.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8-1221/'11-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10-1423/'11-(1), ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11-0850/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයටවත් උත්තරයක් ලබා දෙයි කියන විශ්වාසයෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පළමු වතාවට තමයි මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලැජ්ජා නැති ආණ්ඩුවක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතුමාට හුඟක් ලැජ්ජාව තිබෙනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල: රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

### 2011 `தயட்ட கிருல' கண்காட்சிச் செலவினம்: அரசாங்க முகாமைத்துவ மறுசீரமைப்பு அமைச்சு

### MONEY SPENT ON "DEYATA KIRULA" EXHIBITION 2011: PUBLIC MANAGEMENT REFORMS

1222/'11

**13. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

அரசாங்க முகாமைத்துவ, மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தயட்ட கிருல' கண்காட்சிக்காக அரசாங்க முகாமைத்துவ மறுசீரமைப்பு அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக் களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற் கொள்ளப்பட்ட செலவு தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்க ளினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Management Reforms:

(a) Will he state the total amount of money spent by the Ministry of Public Management Reforms on the "Deyata Kirula" Exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above mentioned expenses?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) අමාත්‍යාංශය මඟින් දරන ලද මුළු වියදම රුපියල් 43,00,304.85 යි. මෙයින් දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය ඉදි කිරීමේ කාර්යය සඳහා පෞද්ගලික අංශයේ අනුග්‍රාහක දායකත්වය රුපියල් 4,40,000කි.

(ආ) (i) ප්‍රදර්ශනය සඳහා සහභාගි වූ අමාත්‍යාංශය යටතේ වන ආයතන හෝ දෙපාර්තමේන්තු නොමැත.

(ii) අමාත්‍යාංශය මඟින් ඉටු කළ ප්‍රධාන කාර්යයන් 04කි.

කාර්යය I - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධව නිපුණතා ප්‍රවර්ධන ඒකකයක් පිහිටුවීම;

කාර්යය II - රාජ්‍ය නිලධාරින් සඳහා රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණවල වැදගත්කම හඳුන්වා දීමේ වැඩ මුළුවක් පැවැත්වීම;

කාර්යය III - සේවා පියස කාර්යාල 12 සඳහා පරිගණක යන්ත්‍ර ලබා දීම;

කාර්යය IV - අමාත්‍යාංශ ප්‍රදර්ශන කුටිය ඉදි කිරීම.

(iii) එක් එක් කාර්යය සඳහා වැය කළ මුදල මෙසේය.

කාර්යය I - රුපියල් 16,40,091.85

කාර්යය II - රුපියල් 1,99,728.00

කාර්යය III - රුපියල් 13,03,275.00

කාර්යය IV - රුපියල් 11,57,210.00

(ඇ) වියදම් දරන ලද වැය විෂයයන් පහත පරිදිය.

කාර්යය I - 173-1-2-0-2001, 173-1-2-0-2102

කාර්යය II - 173-1-2-0-2103

කාර්යය III - 173-1-2-0-2404

කාර්යය IV - 173-1-2-0-1405

(ඈ) පැන නොනඟී.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, මගේ අතුරු ප්‍රශ්න අහන්න කලින් මේක දැන ගන්නයි අහන්නේ."දැයට කිරුළ" ප්‍රදර්ශනයේදී මේ අමාත්‍යාංශයෙන් ඉටු කරපු කාර්යයන් 4ක් ඔබතුමා කිව්වා. මට පළමුවැනි කාරණය ඇත්තටම ඇහුණේ නැහැ. ඒක ඔබතුමා නැවත කිව්වොත් හොඳයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පළමුවැනි කාරණය තමයි, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධව නිපුණතා ප්‍රවර්ධන ඒකකයක් පිහිටුවීම.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒ මොකක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නිපුණතා ප්‍රවර්ධන ඒකකය ගැන ඔබතුමාට අවබෝධයක්- [බාධා කිරීමක්]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

"විෂමතා" කියලා වචනයක් ඇහුණා. හරි, නිපුණතා ප්‍රවර්ධන ඒකකය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

විෂමතා කිව්වේ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නිපුණතා. ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. මේ ප්‍රදර්ශනයට අමාත්‍යාංශයෙන් රුපියල් ලක්ෂ 43ක් වියදම් කරලා තිබෙනවා. එතකොට ඊයේ මේ සම්බන්ධවම මම විමසූ ප්‍රශ්නයකට ඒ අමාත්‍යාංශයත් රුපියල් ලක්ෂ 45ක් වියදම් කරලා තිබෙනවා කියා පිළිතුරු දුන්නා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

කවුද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඊයේ ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් දුන්නු උත්තරයේ. ඒක මේකට අදාළ කරන්නේ නැහැ. නමුත් දැන් මේ ඔබතුමා කිව්ව, ඉටු කරපු කාරණා හතර ගත්තොත් ඒ කාරණා හතරට පමණක් රුපියල් ලක්ෂ 43ක්. ඔබතුමා කියන කාරණා අනුව අමාත්‍යාංශයෙන් "දැයට කිරුළ" ප්‍රදර්ශන භූමියේ හදපු ප්‍රදර්ශන කුටියට රුපියල් 11 ලක්ෂයයි. එතකොට ඔය කියන නිපුණතා ඒකකයට තව ලක්ෂ 13ක් විතර වියදම් වෙලා. පරිගණක 12ක් දුන්නාය කියන කාරණය එක අතකින් හිතමු සාධාරණයි කියලා. මොනරාගල දිස්ත්‍රික්කයේ මොකක් හෝ ආයතනයකට පරිගණක 12ක් දෙන එකේ ඉතුරුවක් තිබෙනවා. නමුත් මෙසේ එක අමාත්‍යාංශයකින් -ඒ අමාත්‍යාංශයට දෙපාර්තමේන්තුත් නැතුව- "දැයට කිරුළ" වෙනුවෙන් රුපියල් ලක්ෂ 43 ගණනේ වියදම් කිරීමෙන් වෙන්නේ "දැයේ කිරුළ" හානි කිරීමක් නේද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ ඔබතුමන්ලා දකින විධිය. ඔබතුමන්ලා "දැයට කිරුළ" ප්‍රදර්ශනය අවශ්‍ය නැහැ කියන මතයේ ඉඳ ගෙන තමයි ඔය සියලු දේ කියන්නේ. "දැයට කිරුළ" අපේ රටේ පසු ගාමී දිස්ත්‍රික්කය වන මොනරාගල දිස්ත්‍රික්කයේයි පැවැත්වුයේ. සංඛ්‍යා ලේඛන අනුව ආර්ථික වශයෙන් පසු ගාමී දිස්ත්‍රික්කය නඟා සිටුවීම සඳහා වූ ක්‍රියා දාමයේ තවත් එක පියවරක් හැටියටයි එය එම දිස්ත්‍රික්කයේ පැවැත්වුයේ. ඒ වාගේම අපේ රටේ නිදහස වෙනුවෙන් සුද්දන්ට එරෙහිව නැඟිට්ට පළාතකට ගෞරවයේ කිරුළ පුදන නිදහස් දිනය පැවැත්වුයේත් මේ දිස්ත්‍රික්කයේයි ගරු කථානායකතුමනි. මේ රට සුද්දන්ගෙන් නිදහස් කර ගන්න ජීවිත පූජා කරපු මිනිසුන්ට ඒ ගෞරවය පුද කිරීමත් හොඳ නැහැ කියලා තමයි තමුන්නාන්සේ දැන් කියන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒවාට සංඛ්‍යා ලේඛන නැහැ. ඒවාට කවදාවත් සංඛ්‍යා ලේඛන තියා ගන්න එපා. මේ රට වෙනුවෙන් ජීවිත පූජා කරපු, ගම් නියම්ගම්වල දහස් ගණන් තරුණයන් වෙනුවෙන් අප යම්කිසි දෙයක් වැය කරලා තිබෙනවා නම් ඒ වැය කිරීම කරලා තිබෙන්නේ ඒ ජනතාව වෙනුවෙනුයි. ඒක කනගාටුවෙන් යුතුව ඔබතුමාට මතක් කරන්න ඕනෑ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. ඒ නිදහස වෙනුවෙන් දිවි පිදූ ඌව වෙල්ලස්සේ වීරයන් ඇගයීමත් හොඳයි. ඒ වාගේම ඒ වීරයන්ගේ මෑත පරම්පරාවේ දරුවන්ට අඩු තරමින් ඉගෙන ගන්න තවම පහසුකම් නැහැ. හරියට ක්‍රීඩා පිටියක් නැහැ. මේ අමාත්‍යාංශය මැදිහත් වෙලා කරපු මේ කටයුත්තෙන් ඒ හතළිස්තුන් ලක්ෂය වියදම් කරලා හරියට එක පාසලක් ගොඩ නඟන්න, විද්‍යාගාරයක් හෝ ක්‍රීඩා පිටියක් හරි ගොඩ නඟන්න මැදහත් වුණා නම් ඒක අගනා නේදැයි මම අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මේ අමාත්‍යාංශය පාසල් ගොඩ නඟන අමාත්‍යාංශයක් නොවෙයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එහෙනම් මොකටද මේකේ සල්ලි අරගෙන "දැයට කිරුළ" කළේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පොඩ්ඩක් ඉන්න. කලබල වන්න එපා. "දැයට කිරුළ" යටතේ විවිධ අමාත්‍යාංශ, විවිධ දෙපාර්තමේන්තුවල නිලධාරීන් තම විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරන්න ගිහිල්ලා උදව් වෙනවා. දැන් බලන්න, මගේ අමාත්‍යාංශයට අදාළ ව්‍යාපෘතිය ගරු කථානායකතුමා විවෘත කළා. පහළොස්දහසකට පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතිය නිම කළා. ඉතින් ඒකත් වැරදිද? මේ විධියට මොනරාගල දිස්ත්‍රික්කයේත් ඇත එපිට ගම් නියම්ගම්වල පාසල්වලටත් පාරවල්, විදුලි පද්ධතිය සකස් කිරීම ආදී කටයුතු තුළින් විශාල සහයෝගයක් ලැබිලා තිබෙනවා. ඔබතුමා කියන පාසල්වලටත් ලැබිලා තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

දැන් තුන්වන අතුරු ප්‍රශ්නය ඇහුවා නේද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නැහැ, නැහැ. ගරු කථානායකතුමනි, දැන් එක එක අමාත්‍යාංශවල වැය ශීර්ෂවලින් මුදල් අරගෙන "දැයට කිරුළ"ට මේ තරම් වියදම් කරනවා නම් මා අහනවා "දැයට කිරුළ" කියලා අමාත්‍යාංශයක් හදලා ඒ වෙනුවෙන් වෙනම වැය ශීර්ෂයක් ඇති කළොත් නරකද කියලා?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ ගැන පිළිතුරක්වත් දීමට වටිනාකමක් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒක ඔබතුමාට හම්බ වන්නේ නැහැ.

## "අපි වවමු - රට නගමු" ව්‍යාපෘතිය : වෙන් කළ මුදල
## "நாம் பயிர் செய்வோம் - நாட்டைக் கட்டியெழுப்புவோம்" கருத்திட்டம் : ஒதுக்கீட்டுத் தொகை
## "API WAWAMU RATA NAGAMU" PROJECT : MONEY ALLOCATED

1425/'11

15\. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) "අපි වවමු - රට නගමු" යනුවෙන් වූ ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියෙන් ඉටු කරලීමට අපේක්ෂා කළ අරමුණු කවරේද;

(iii) එම අරමුණු ඉටු වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) වෙන් කළ මුදලින් වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන් කවරේද;

(iv) එම එක් එක් වැඩසටහන සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) මෙම ව්‍යාපෘතියේ ප්‍රචාරක හා උත්සව කටයුතු සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) "අපි වවමු - රට නගමු" ව්‍යාපෘතිය මේ වන විට නතර කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) `நாம் பயிர் செய்வோம் - நாட்டைக் கட்டியெழுப் புவோம்' எனும் கருத்திட்டம் ஆரம்பிக்கப்பட்ட திகதி என்னவென்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்தின் மூலம் நிறைவேற்று வதற்கு எதிர்ப்பார்க்கப்பட்ட நோக்கங்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி நோக்கங்கள் நிறைவேற்றியுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கருத்திட்டத்துக்காக ஒதுக்கப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

(ii) ஒதுக்கப்பட்ட தொகையில் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்;

(iii) மேற்படி கருத்திட்டத்தின் கீழ் செயற்படுத்தப்பட்ட நிகழ்ச்சித்திட்டங்கள் யாவையென்பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு நிகழ்ச்சித்திட்டத்துக்கும் செலவிடப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

(v) மேற்படி கருத்திட்டத்தின் பிரச்சாரத்திற்காகவும் விழாக்களுக்காகவும் ஒதுக்கப்பட்ட தொகை எவ்வளவென்பதையும்

வருடாந்த ரீதியாக தனித் தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) `நாம் பயிர் செய்வோம் - நாட்டைக் கட்டியெழுப்புவோம்' கருத்திட்டம் தற்போது நிறுத்தப்பட்டுள்ளதா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன் ?

asked the Minister of Agriculture:

(a) Will he inform this House-

(i) the date on which the "Api Wawamu Rata Nagamu" project was started;

(ii) the objectives expected to be achieved through that project; and

(iii) whether those objectives have been achieved?

(b) Will he inform this House, separately in relation to each year,

(i) the amount of money allocated for the aforesaid project;

(ii) the amount spent out of that allocation;

(iii) the programmes implemented under that project;

(iv) the amount of money spent for each such programme; and

(v) the amount of money allocated for publicity campaign and functions of the aforesaid project?

(c) Will he state whether "Api Wawamu Rata Nagamu" project has been stopped by now?

(d) If not, why?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට අදාළව විශාල උත්තරයක් තිබෙනවා. මා එය **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2007 සැප්තැම්බර් 03

(ii)

1. අත්‍යවශ්‍ය ආහාර බෝග නිෂ්පාදනය වැඩි කිරීම
2. ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය වැඩි කිරීම
3. ජනතාවගේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීම
4. ජනතාවගේ පරිභෝජන රටාව දියුණු කිරීම
5. ආහාර ආනයන සඳහා වැය වන විදේශ විනිමය වාර්ෂිකව අඩු කිරීම
6. ගොවි ජනතාවගේ ආදායම් තත්ත්වය දියුණු කිරීම.
7. ඉදිරි වසර තුන තුළදී කාබනික පොහොර භාවිතය තුළින් රසායනික පොහොර භාවිතය 25% කින් අඩු කිරීම.
8. උචිත හා නව තාක්ෂණය කෘෂිකර්ම ක්ෂේත්‍රයට හැඳුරු කිරීම
9. තරුණ තරුණියන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට නැඹුරු කිරීම
10. පරිසර හිතකාමී හා දේශීය/ පාරම්පරික කෘෂි ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීම

(iii) ඉටු වී ඇත

(ආ)

| වර්ෂය | (i) වෙන් කළ මුදල (රු.මි) | (ii) වැය කළ මුදල (රු.මි) |
|---|---|---|
| 2008 | 418.6 | 386.5 |
| 2009 | 300 | 250.692 |
| 2010 | 420 | *455 |
| 2011 | 490 | |

* 2010 වසර සඳහා වැඩියෙන් වියදම් කළ රු.මි. 35 ක මුදල වැය විෂය අතර හුවමාරුව මගින් ලබා ගෙන ඇත.

(iii)
(iv) ( ඇමුණුම 1, 2, 3, 4 බලන්න.)

(v)

| වර්ෂය | වෙන් කළ මුදල (රු.මි) |
|---|---|
| 2008 | 8.0 |
| 2009 | 8.5 |
| 2010 | 7.75 |
| 2011 | 10.0 |

(ඇ) නතර කර නැත.

(ඈ) මෙම ව්‍යාපෘතිය 2008 - 2010 කාලය තුළ සාර්ථකව ක්‍රියාත්මක වූ බැවින් 2011 වසරේ සිට 2013 දක්වා ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මෙම වර්ෂයේද මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතී.

ඇමුණුම 01

අපි වවමු - රට නගමු වැඩසටහන - 2008

| වැඩසටහන | වෙන් කළ මුදල රු.මි. |
|---|---|
| 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 19.0 |
| 2. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 6.0 |
| 3. කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි දියුණු කිරීමේ වැඩසටහන | 50.0 |
| 4. පසු අස්වනු හානි අවම කිරීම | 19.0 |
| 5. විශේෂිත බෝග නිෂ්පාදන කලාප පිහිටුවීම | 47.0 |
| 6. ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන | 5.0 |
| 7. පාසැල් ගෙවතු සංවර්ධන වැඩසටහන | 5.0 |
| 8. මාධ්‍ය වැඩසටහන් | 8.0 |
| 9. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 47.0 |
| 10. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 7.0 |
| 11. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 9.0 |
| 12. ශ්‍රී ලංකා ජාතික සාහිත්‍ය නිවීමේ ව්‍යාපාර මණ්ඩලය | 5.0 |
| 13. තරුණ ගොවි අරුණ වැඩසටහන | 9.0 |
| 14. ගොවීන් සවිබල ගැන්වීමේ වැඩසටහන | 45.0 |

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

අපි වවමු - රට නගමු වැඩසටහනෙහි 2008.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

| වැය විෂය | ක්‍රියාත්මක කරනු ලබන ආයතන | ව්‍යාපෘති | වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය /අත් මුදල් ප්‍රමාණය(රු.මි.) | වියදම් කළ ප්‍රමාණ (රු.මි.) | |
|---|---|---|---|---|---|
| 118-2-3-20-2502 අයවැය ඇස්තමේන්තු (රු.මි.159) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (රු.මි. 125.3) | කුඩා ගොවි ව්‍යවසායක කණ්ඩායම් ගම් නැගුම් වැඩසටහන තුලින් ශක්තිමත් කිරීම. | 4 | 1.45965 | |
| | | පාසල් ගෙවතු සංවර්ධන වැඩසටහන | 4 | 4.019 | |
| | | ගොවි කාන්තා කණ්ඩායම් හරහා දේශීය ආහාර ප්‍රචලිත කිරීම | 2.5 | 2.225 | |
| | | මී මැසි ගම්මාන පිහිටුවීම | 2.5 | 2.375 | |
| | | තෝරාගත් ක්ෂේත්‍ර බෝග ඵලදායි ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය | 5 | 3.214 | |
| | | පළාත් දිස්ත්‍රික් කෘෂිකර්ම සම්බන්ධීකරණය | 4 | 1.901 | |
| | | කෘෂි සේවා පියස ස්ථාපිත කිරීම. | 1 | 0.658 | |
| | | කෘෂි තාක්ෂණ උද්‍යාන සංවර්ධනය හා නඩත්තුව | 26 | 25.484 | |
| | | විශේෂ බෝග නිෂ්පාදන වැඩසටහන් පුහුණු කටයුතු සඳහා මාකඳුර කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයට | 2 | 1.065 | |
| | | බෝග නිෂ්පාදන කලාප | 16 | 15.858 | |
| | | මාධ්‍ය වැඩසටහන් | 8 | 6.469 | |
| | | අපි වවමු - රට නගමු දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීම | 30 | 21.474 | |
| | | පලතුරු බෝග සඳහා | 11.3 | 8.756 | |
| | | එළවළු හා පලතුරුවල පසු අස්වනු හානි අවම කිරීම. | 9 | 6.118 | 101.07565 |
| | පස්වාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය | පසු අස්වනු හානි අවම කිරීම. | 10 | 9.128 | |
| | ශ්‍රී ලංකා ජාතික තිවිමේ ව්‍යාපාර මණ්ඩලය | පාරම්පරික සහල් ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය | 3 | 1.8 | |
| | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | අපි වවමු - රට නගමු | 6 | 5.32 | |
| | අමාත්‍යාංශය | මාධ්‍ය වැඩසටහන් | | | |
| | මධ්‍යම පළාත | බෝග කලාපීයකරණය (රු.මි. 09.7) | 1.07 | 1.03 | |
| | ඌව පළාත | | 1 | 0.99 | |
| | වයඹ පළාත | | 1 | 0.54 | |
| | සබරගමුව පළාත | | 1 | 0.75 | |
| | බස්නාහිර පළාත | | 1 | 0.19 | |
| | උතුරු මැද පළාත | | 1 | 0.34 | |
| | නැගෙනහිර පළාත | | 1 | 0.69 | |
| | උතුරු පළාත | | | 0.9 | |
| | දකුණු පළාත * | | | — | -5.43 |
| | මධ්‍යම පළාත | පලතුරු බෝග නිෂ්පාදන ව්‍යාපෘතිය (රු.මි. 3.7) | 0.65 | | |
| | වයඹ පළාත | | 1.3 | 0.19 | |
| | බස්නාහිර පළාත | | 0.84 | 0.02 | |
| | ඌව පළාත | | 0.45 | | |
| | සබරගමුව පළාත | | 0.63 | 0.04 | |
| | දකුණු පළාත | | 0.35 | | |
| | නැගෙනහිර පළාත | | 0.07 | | -0.25 |
| | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (රු.මි. 113.14) | වී වගාව | 22.48 ත් 12.5 | 7.693 | |
| | | ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය | 19.8 ත් 8.125 | 11.222 | |
| | | එළවළු හා පලතුරු වල පසු අස්වනු හානි අවම කිරීම. | 8.32 ත් 4.375 | 1.889 | |
| | | අර්තාපල් | 7.9 ත් 2.5 | 1.818 | |
| | | බීජ සහතික කිරීම. | 5 ත් 1.25 | 1.177 | |
| | | ගෙවතු වගා | 4.64 ත් 1.25 | 0.869 | |
| | | බීජ හා රෝපණ ද්‍රව්‍ය | 45 ත් 11.25 | 4.732 | 29.4 |
| 118-2-3-20-2502 අයවැය ඇස්තමේන්තු (රු.මි. 200) | මධ්‍යම පළාත | බෝග නිෂ්පාදන ව්‍යාපෘතිය (රු.මි. 51.84) | 5.84 | 1.5 | |
| | ඌව පළාත | | 4.48 | 0.02 | |
| | වයඹ පළාත | | 7.36 | 1.68 | |
| | සබරගමුව පළාත | | 4.24 | 1.92 | |
| | බස්නාහිර පළාත | | 4.24 | 0.81 | |
| | උතුරු මැද පළාත | | 2.34 | 0.67 | |
| | නැගෙනහිර පළාත | | 13.8 | 10.18 | |
| | උතුරු පළාත | | 1.88 | 0.41 | |
| | දකුණු පළාත | | 7.56 | 0.8 | 17.99 |
| | මධ්‍යම පළාත | දේශීය ආහාර දිරිගැන්වීමේ ජාතික සමහෙයුම (රු.මි. 30) | 5 | 3.5 | |
| | දකුණු පළාත | | 5 | 4.14 | |
| | වයඹ පළාත | | 5 | 4.16 | |
| | සබරගමුව පළාත | | 5 | 4.34 | |
| | බස්නාහිර පළාත | | 5 | 4.89 | |
| | ඌව පළාත ** | | 5 | - | |
| | උතුරු මැද පළාත | | 5 35 | 4.7 | 25.73 |

* - මෙම ව්‍යාපෘතිය සඳහා දකුණු පළාත් සභාව මුදල් ලබාගෙන නැත.

** - මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල් ලබා දී නැත.

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

| | |
|---|---|
| දේශීය ආහාර ප්‍රචලිත කිරීම සඳහා Suwadal Slow food restaurant ආරම්භ කිරීම - නාරාහේන්පිට | 5.0 |
| අපනයන පොකුරු ගම්මාන වැඩ සටහන | 15 |
| විශේෂ කෘෂිකාර්මික ව්‍යවසායකත්ව වැඩසටහන | 9.0 |
| පරිපාලන වියදම් | 1.3 |
| එකතුව | රු.මි. 490 |

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයේ (ආ) (i) සඳහා දීලා තිබෙන පිළිතුර පොඩ්ඩක් පැහැදිලි කරනවාද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල 2008 අවුරුද්දේ රුපියල් මිලියන 418.6යි. වැය කළ මුදල රුපියල් මිලියන 386.5යි. 2009 අවුරුද්දේ වෙන් කළ මුදල රුපියල් මිලියන 300යි.

වැය කළ මුදල රුපියල් මිලියන 250.692යි. 2010 අවුරුද්දේ වෙන් කළ මුදල රුපියල් මිලියන 420යි. වැය කළ මුදල රුපියල් මිලියන 455යි. 2011 අවුරුද්දට තවම සංඛ්‍යා ලේඛන නැහැ.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයේ (ආ) (v) සහ (ඇ) කොටස්වලට අදාළ පිළිතුරුත් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. පොඩි උත්තර තිබෙන්නේ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

(ආ) (v) වර්ෂය - වෙන් කළ මුදල රුපියල් මිලියන 8.0යි;
2009 - වෙන් කළ මුදල රුපියල් මිලියන 8.5යි;
2010 - වෙන් කළ මුදල රුපියල් මිලියන 7.75යි;
2011 - වෙන් කළ මුදල රුපියල් මිලියන 10.0 යි.

(ඇ) නතර කර නැත.

(ඈ) මෙම ව්‍යාපෘතිය 2008-2010 කාලය තුළ සාර්ථකව ක්‍රියාත්මක වූ බැවින් 2011 වසරේ සිට 2013 දක්වා ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මෙම වර්ෂයේද මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතී.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. එතුමා සඳහන් කළ පරිදි 2008 වසරේදී ප්‍රචාරක කටයුතු සඳහා ලක්ෂ 80ක්, 2009 වසරේ ප්‍රචාරක කටයුතු සඳහා ලක්ෂ 85ක්, 2010 වසරේ ප්‍රචාරක කටයුතු සඳහා ලක්ෂ 75ක්, 2011 වසරේ ප්‍රචාරක කටයුතු සඳහා ලක්ෂ 100ක් වශයෙන් ආසන්න වශයෙන් ලක්ෂ 310ක් -ඒ කියන්නේ තුන්කෝටි දස ලක්ෂයක්- "අපි වවමු රට නගමු" ව්‍යාපෘතියේ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කර තිබෙනවා.

ඔබතුමා සහාගත කළා මම හිතන්නේ මෙහි අරමුණු කවරේද කියන එක. මෙහි අරමුණු බවට පත්ව ඇත්තේ අපේ රටේ ජාතික නිෂ්පාදනය ඉහළ දැමීම -

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමාට අවශ්‍ය නම් මම ඒක කියවන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අරමුණු කියවන්නකෝ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අරමුණු දහයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ජාතික නිෂ්පාදනය ඉහළ දැමීම අරමුණක් ලෙස තිබෙනවා නේ?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හරි. ඒක ප්‍රමාණවත්.

ගරු කථානායකතුමනි, මෙහි එක් අරමුණක් බවට පත් වෙලා තිබෙන්නේ අපේ රටේ ජාතික නිෂ්පාදනය ඉහළ දැමීම. නමුත් ගරු කථානායකතුමනි, මේ අදාළ වර්ෂ සැලකිල්ලට ලක් කරන කොට, අපේ රටට පිට රටින් ලොකු ලූනු ගෙනාපු ප්‍රමාණය වැඩි වී තිබෙනවා. මිරිස් ගෙනාපු ප්‍රමාණය වැඩි වී තිබෙනවා. කුරහන්-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයක් අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කුරක්කන් ගෙනාපු ප්‍රමාණය වැඩි වී තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයක් විධියට අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ වාගේම තමයි අපේ රටේ නිෂ්පාදනය කළ හැකි අනිකුත් බෝග විශාල ප්‍රමාණයක් ගෙන්වීම වැඩි වී තිබෙනවා. ඒ නිසා මෙහි අරමුණ සාර්ථක වී නැහැ නේද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මේ කටයුත්තේදී සහලින් මේ රට ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. සහලින් රට ස්වයංපෝෂිත

කිරීමේ අරමුණ ඇතිව පුරන් කුඹුරු අස්වැද්දීම තමයි වැඩිම අවධානයක් යොමු කරලා ක්‍රියාත්මක කරපු වැඩසටහන. ඒ වැඩසටහන මේ වන කොට සියයට සියයක්ම සාර්ථකත්වයට පත් වෙලා තිබෙනවා. පසු ගිය වසරේ නිෂ්පාදනය අපේ අවශ්‍යතාව වාගේ සියයට 114ක් වුණා. මේ වර්ෂයේ රටේ වී නිෂ්පාදනය ඊටත් වඩා වැඩි වෙයි කියලා අප බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ සියයට සියයක් සාර්ථකයි. මේ වැඩ කටයුතු ඉස්සරහට ගෙනියනවා. ඒ වාගේම අතිරේක බෝග වගාවන් සම්බන්ධයෙනුත් මේ වැඩසටහන මේ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරමින් යනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමා සඳහන් කළා වී නිෂ්පාදනය පිළිබඳව. හැබැයි ප්‍රධාන කොටම මෙහි අරමුණ බවට පත් වී තිබුණේ අපේ රටේ අනිකුත් බෝගවල නිෂ්පාදනයන් ඉහළ දැමීමයි. ඒ අරමුණ ඉටු වී නැහැ. කෙසේ වුවත්, මා ඔබතුමාගෙන් අහන්නේ මේකයි. "අපි වවමු-රට නඟමු" කියන ව්‍යාපෘතියේ ප්‍රචාරක කටයුතු සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය මේ වර්ෂයට කෝටියක මුදලක් වෙන් කරලා තිබෙනවා. එසේ මුදල් වෙන් කරලා තිබෙනවා නම් "දිවි නැඟුම" ව්‍යාපෘතියෙන් ගෙවතු හදන එකයි, ඔබතුමාගේ මේ ව්‍යාපෘතියට පැවරෙන කාර්ය භාරයයි කවරෙක්ද කියලා මා දැන ගන්න කැමැතියි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, ප්‍රචාරය අවශ්‍යයි. මොකද, ජනතාව දැනුවත් කරන්න, ජනතාව අතරට මේකේ තිබෙන වැදගත්කම පැහැදිලි කරලා දෙන්න විශාල ප්‍රචාරක වැඩසටහනක් කෙරෙනවා. ගරු කථානායකතුමනි, මේ මිලියන 8ක් වියදම් කළා කියන්නේ විශාල ප්‍රචාරක වැඩසටහනක් නොවෙයි. මේ වර්ෂයේ මිලියන 10යි. පසු ගිය වර්ෂයේ මිලියන 7.75යි. ඊට කලින් වර්ෂයේ මිලියන 8යි. ඊට කලින් වර්ෂයේ මිලියන 9යි. ඒ වාගේ වියදමක් තමයි දරලා තිබෙන්නේ. ජනතාව දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා මුද්‍රණය කිරීම වාගේ තවත් සුළු සුළු වියදම් ටිකක් තමයි කරලා තිබෙන්නේ. ඒ වාගේ සුළු ප්‍රචාරයකුත් නැති නම් මේ වැඩසටහනක් තිබෙන බවවත් මිනිසුන් දන්නේ නැහැ. ඒ නිසා ඒ කටයුත්ත ඒ ආකාරයෙන් කරලා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
"දිවි නැඟුම" ගැන මම අහන්නේ?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

"දිවි නැඟුම" වෙනම වැඩසටහනක්. "දිවි නැඟුම" වැඩසටහනේ තිබෙන්නේ කෘෂිකර්මාන්තය විතරක් නොවෙයි. කර්මාන්ත වාගේම ජීවිතයක් ගොඩ නැඟීම සඳහා අවශ්‍ය කරන සියලුම කොටස් මේ "දිවි නැඟුම" වැඩසටහන යටතේ ඇවිල්ලා තිබෙනවා. ඔබතුමා පටලවා ගෙන තිබෙනවා, මේ "දිවි නැඟුම" වැඩසටහනත් කෘෂිකාර්මික වැඩසටහනක් විදියට. කෘෂිකර්මය "දිවි නැඟුම" වැඩසටහනේ එක කොටසක් විතරයි ගරු කථානායකතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය. දැන් ගරු ඇමතිතුමා පැහැදිලි කළා 2011 වසරේ මේ සඳහා වෙන් කොට ඇති මුදල් ප්‍රමාණය තවම ගණනය කොට නැහැ කියලා. මා දන්නේ නැහැ ඔබතුමා කිවූ පරිදි ව්‍යාපෘතියක් කොහොමද දුවන්නේ කියලා. හැබැයි, ව්‍යාපෘතිය සඳහා මුදල් ප්‍රමාණය ගණනය කොට නැති වුණාට ඔබතුමා කියපු පරිදි ප්‍රචාරය සඳහා රුපියල් කෝටියක මුදලක් ඇස්තමේන්තු කර තිබෙනවා. ඒ නිසා ව්‍යාපෘතියට මුදල් ගණනය නොකොට ප්‍රචාරය සඳහා පමණක් මුදල් ගණනය කළේ ඇයි කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, එතුමා පටලවා ගෙන. මම ගණනය කළේ නැහැ කියලා කිව්වේ වැය කළ මුදලයි. වෙන් කළ මුදල තිබෙනවා, මිලියන 490ක්. ඒකෙන් වැය කළ මුදල මේ වන තුරුත් ගණනය කරලා නැහැ. එතුමා පටලවා ගෙන.

## ආදිවාසී පවුල් පදිංචි කරවීම: සේනානිගල ප්‍රදේශය
## பழங்குடிக் குடும்பங்களின் குடியமர்த்துகை: சேனானிகல பிரதேசம்
## SETTLEMENT OF "ADIVASI" FAMILIES: SENANIGALA AREA

0918/'10

2. **ගරු රවි කරුණානායක මහතා(ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Dayasiri Jayasekara)

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) සේනානිගල ප්‍රදේශයේ පදිංචි කිරීමට තීරණය කර ඇති ආදිවාසී පවුල් සංඛ්‍යාව;

(ii) මේ වන විට පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව;

(iii) එම පවුල්වලට අයත් පුද්ගලයින් සංඛ්‍යාව;

(iv) එක් පවුලක් සඳහා ලබා දීමට නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය;

(v) මේ වන විට ඔවුන්ට ලබා දී ඇති හෝ ලබා දීමට අදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආදිවාසී පවුල් වෙනුවෙන් සේනානිගල ප්‍රදේශයෙන් ලබා දීමට නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය ඔවුන් වෙත ලබා නොදීමේ වැඩ පිළිවෙළක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சேனானிகல பிரதேசத்தில் குடியமர்த்துவதற்கு தீர்மானித்துள்ள பழங்குடிக் குடும்பங்களின் எண்ணிக்கையையும்;

[ගරු රවි කරුණානායක මහතා]

(ii) இற்றைவரை குடியமர்த்தியுள்ள குடும்பங்களின் எண்ணிக்கையையும்;

(iii) மேற்படி குடும்பங்களுக்குச் சொந்தமான ஆட்களின் எண்ணிக்கையையும்;

(iv) ஒவ்வொரு குடும்பத்திற்கும் எவ்வளவு காணி வழங்கப்படுவதற்கு விதந்துரைக்கப்பட்டுள்ளதென்பதையும்;

(v) இற்றைவரை இவர்களுக்கு வழங்கப்பட்டுள்ள அல்லது வழங்குவதற்கு உத்தேசிக்கப்பட்டுள்ள காணியின் அளவு எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) பழங்குடிக் குடும்பங்களுக்காக சேனானிகல பிரதேசத்தில் வழங்கப்படுவதற்கு உத்தேசிக்கப்பட்டுள்ள காணிகளை இவர்களுக்கு பெற்றுக்கொடுக்காமல் இருப்பதற்கான வேலைத்திட்டமெதுவும் உள்ளதா என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Will he inform this House of -

(i) the number of "Adivasi" families identified to be settled in the Senanigala area;

(ii) the number of families that have already been settled there;

(iii) the number of persons belonging to these families;

(iv) the extent of land recommended to be allocated to each family ;

(v) the extent of land that has already been allocated or intended to be allocated to them by now?

(b) Will he state whether there is an arrangement to prevent the allocation of the extent of land recommended to be allocated to the aboriginal families from Senanigala area?

(c) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පවුල් 133යි.

(ii) පවුල් 26යි.

(iii) -

(iv) පර්චස් 20යි.

(v) පර්චස් 520යි.

(ආ) නොමැත.

(ඇ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3- 1220/'11-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මාසයක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අම්පාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල: වෙන් කළ මුදල
## அம்பாறை பிரதேச நீர்ப்பாசன பொறியியலாளர் அலுவலகங்கள்: நிதி ஒதுக்கீடு
## AMPARA DIVISIONAL IRRIGATION ENGINEER'S OFFICES: FUNDS ALLOCATED

1366/'11

4. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු එම්.ටී. හසන් අලි මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் -மாண்புமிகு எம்.ரீ. ஹஸன் அலி சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. M.T. Hasen Ali)
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2007, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ සඳහා,

(i) අම්පාර දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) කල්මුණේ වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසයට අයත්, එක් එක් ගොවිජන සේවා කොට්ඨාසයට වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2007, 2008, 2009, 2010, 2011 ஆகிய வருடங்களில்,

(i) அம்பாறை மாவட்டத்திலுள்ள பிரதேச நீர்ப்பாசன பொறியியலாளர் அலுவலகம் ஒவ்வொன்றிற்கும் ஒதுக்கீடுசெய்யப்பட்ட நிதிகளின் தொகையையும்;

(ii) கல்முனையிலுள்ள நீர்ப்பாசன பொறியியலாளர் பிரிவின் கீழ் வரும் விவசாய சேவைகள் பிரிவுகள் ஒவ்வொன்றிற்கும் ஒதுக்கீடுசெய்யப்பட்ட நிதிகளின் தொகையையும்

அவர் இச்சபைக்கு வெவ்வேறாக அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management :

(a) Will he inform this House separately for the years 2007, 2008, 2009, 2010 and 2011-

(i) the amount of funds allocated to each Divisional Irrigation Engineer's Office in the Ampara District ; and

(ii) the amount of funds allocated to each of the Agrarian Services Divisions comming under the Irrigation Engineer's Division of Kalmunai?

(b) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

*** *සභාමේසය මත තබන ලද පිළිතුර:***
* *சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
* *Answer tabled:*

(අ) (1)

| | 2007 මිලියන | 2008 මිලියන | 2009 මිලියන | 2010 මිලියන | 2011 මිලියන |
|---|---|---|---|---|---|
| අම්පාර | 54. 1 | 25.1 | 58.9 | 67.9 | 136.5 |
| අක්කරෙයිපත්තු | 9.7 | 14.3 | 17.6 | 25.9 | 82.0 |
| සමන්තුරෙයි | 13.5 | 18.2 | 16.2 | 35.7 | 73.8 |
| කල්මුණේ | 50.3 | 7.8 | 12.6 | 11.0 | 51.0 |
| පොතුවිල් | 15.1 | 10.7 | 11.9 | 16.6 | 19.3 |

(11.) ගොවිජන සේවා කොට්ඨාස මඟින් කොට්ඨාස වශයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදුවන්නේ නැත.

(ආ) මුදල් වෙන් කිරීමේදී වාරි ඇළි පද්ධතිවල නඩත්තු සහ ඉදි කිරීම් වෙනුවෙන් ඒ ඒ ඇළ මාර්ගවල ධාරිතාව අනුව ප්‍රතිපාදන වෙන් කරනු ලබන අතර, ගොවිජන සේවා කොට්ඨාස වශයෙන් ප්‍රතිපාදන වෙන් කරන්නේ නැත.

## පොලිස් නිලධාරීන්ට මුදල් ත්‍යාග: නතර කිරීම
## பொலிஸ் உத்தியோகத்தர் ஊக்குவிப்புப் பண அன்பளிப்புகள்: நிறுத்தம்
## CASH REWARDS TO POLICE OFFICERS: DISCONTINUANCE

0987/'10

7. **ගරු රවි කරුණානායක මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க- மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Dayasiri Jayasekara)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) අවංක ක්‍රියාශීලී පොලිස් නිලධාරීන් දිරි ගැන්වීමේ අරමුණින් 2005 වර්ෂයේ සිට මේ දක්වා ලබා දී ඇති මුදල් ත්‍යාග ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුණෙන් මුදල් ත්‍යාග ලබා දීම මේ වන විට නවතා ඇති බවත්;

(ii) එම දිරි ගැන්වීම් නතර වීම හේතුවෙන් පොලිස් නිලධාරීන් අධෛර්යයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මුදල් ත්‍යාග ලබා දීම නවතා දමා මේ වන විට ගත වී ඇති කාලය කොපමණද;

(ii) එම ත්‍යාග ලබා දීමට සුදුසුකම් ලබා සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිලධාරීන්ට ත්‍යාග ලබා දීමේ වැඩ පිළිවෙළ නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගත වන කාල වකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) நேர்மையான செயல்திறன் மிக்க பொலிஸ் உத்தியோகத்தர்களை ஊக்குவிக்கும் நோக்கத்தில் 2005 ஆம் ஆண்டு முதல் இதுவரை காலமும் வழங்கப்பட்டுள்ள பண அன்பளிப்புத் தொகை எவ்வளவென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி நோக்கத்துடன் பண அன்பளிப்பு வழங்கும் செயற்பாடு தற்பொழுது நிறுத்தப்பட்டுள்ளதென்பதையும்;

(ii) மேற்படி ஊக்குவிப்புத் தொகை நிறுத்தப்பட்டமையினால் பொலிஸ் உத்தியோகத்தர்கள் ஊக்கமிழந்துள்ளார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(இ) (i) பண அன்பளிப்பு வழங்குதல் நிறுத்தப்பட்டு எவ்வளவு காலமாகின்றது என்பதையும்;

(ii) மேற்படி அன்பளிப்புத் தொகையை பெறுவதற்கு தகைமை பெற்றுள்ள உத்தியோகத்தர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

[ගරු රවි කරුණානායක මහතා]

(iii) மேற்படி உத்தியோகத்தர்களுக்கு அன்பளிப்புத் தொகை வழங்கும் திட்டத்தை மீண்டும் ஆரம்பிப் பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iv) ஆமெனில் ஆதற்காக எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs :

(a) Will he state the amount granted as cash rewards with the intention of encouraging honest and active police officers, from 2005 up to now ?

(b) Is he aware that-

(i) granting cash rewards with the aforesaid intention has been stopped by now;

(ii) police officers have become discouraged due to the discontinuance of that incentive ?

(c) Will he state-

(i) the period of time that has elapsed since the granting of cash rewards was stopped;

(ii) the number of officers who are eligible to be granted this cash reward;

(iii) whether measures will be taken to re-commence that programme of granting cash rewards to those officers ; and

(iv) if so, the period of time that would be required to do it ?

(d) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) 2005 වර්ෂය සඳහා රුපියල් පනස් ලක්ෂ හැටපන් දහසක් (රුපියල් 50,65,000.00) ද, 2006 වර්ෂය සඳහා රුපියල් හැටපන් ලක්ෂ තිස් දහස් පන්සිය අසූදෙකක් (රුපියල් 65,30,582.00) ද, 2007 වර්ෂය සඳහා තුන්සිය හැත්තෑහය ලක්ෂ හතළිස්හය දහස් දෙසිය හැත්තෑපහක් (රුපියල් 376,46,275.00) ද, 2008 වර්ෂය සඳහා හය සිය තිස්හත් ලක්ෂ විසිදහස් දෙසිය හැත්තෑඑකක් (රුපියල් 637,20,271.00) ද, 2009 වර්ෂය සඳා තුන්සිය හැත්තෑහය ලක්ෂ අනූඅට දාහක් (රුපියල් 376,98,000.00) ද, 2010 වර්ෂය සඳහා දෙසිය අසූහතර ලක්ෂ පන්දහස් පන්සියයක්(රුපියල් 284,05,500.00) ද, 2011 වර්ෂය සඳහා අසූ දෙලක්ෂ පන්දහසක් (රුපියල් 82,05,000.00) ද මුදල් ත්‍යාග ලෙස අවංක ක්‍රියාශීලී පොලිස් නිලධාරීන් හා සිවිල් පුරවැසියන් වෙත පිරිනමා ඇත.

(ආ) (i) අවංක ක්‍රියාශීලි පොලිස් නිලධාරීන් දිරි ගැන්වීමේ අරමුණෙන් මුදල් ත්‍යාග ලබා දීම මේ වන විට නවතා නැත.

(ii) අදාළ නොවේ.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) පොලිස් නිලධාරීන් 1195ක් හා සිවිල් පුරවැසියන් 65 දෙනෙක් සඳහා ත්‍යාග මුදල් ඉදිරියේදී පිරිනැමීමට කටයුතු සූදානම් කර ඇත.

(iii) 2005 වර්ෂයේ සිට මේ වන තෙක් ත්‍යාග ලබා දීමේ වැඩ පිළිවෙළ නොකඩවා ක්‍රියාත්මක කර ඇත.

(iv) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

## ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය: කොන්ත්‍රාත් පදනම මත පත්වීම්
## இலங்கைப் போக்குவரத்துச் சபை: ஒப்பந்த அடிப்படை நியமனங்கள்
## SRI LANKA CENTRAL TRANSPORT BOARD: CONTRACT BASIS APPOINTMENTS

1367/'11

9. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු එම්.ටී. හසන් අලි මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்- மாண்புமிகு எம்.ரி. ஹசன் அலி சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. M.T. Hasen Ali)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) කිසියම් විධායක හෝ විධායක නොවන ශ්‍රේණියක සිටින සේවකයෙකුට කිසියම් තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබා දෙන්නේ දෙපාර්තමේන්තුව තුළ ඒ වෙනුවට පත් කිරීම සඳහා කිසිවෙකු නොමැති බව තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් බව දැක්වෙන 2011 අංක 2 දරන චක්‍රලේඛය ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ පිරිස් පාලන අංශය විසින් මැතදී නිකුත් කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) කිසියම් තනතුරක් සඳහා සුදුසු පුද්ගලයන් දෙපාර්තමේන්තුව තුළ නොමැති බව තීරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ පිරිස් පාලන අංශය අනුගමනය කරන ක්‍රියා පටිපාටිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (ආ) කොටසේ සඳහන්ව ඇති පරිපාටිය අනුගමනය නොකර කොන්ත්‍රාත් පදනම මත කිසිදු පත්වීමක් ලබා නොදෙන බව තහවුරු වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) திணைக்களத்தில் பொருத்தமான பதிலீடு இல்லை என்பது உறுதிப்படுத்தப்பட்ட பின்னரே ஒப்பந்த அடிப்படையில் எந்தவொரு நிறைவேற்றுத் தரத்திலான அல்லது நிறைவேற்றுத் தரத்திலில்லாத ஊழியர்க ளுக்கான நியமனங்கள் வழங்கப்படும் எனக் குறிப்பிடும் 2011ஆம் ஆண்டின் 2ஆம் இலக்கச் சுற்று நிருபத்தினை இலங்கைப் போக்குவரத்துச் சபையின் ஆளணிப் பிரிவு அண்மையில் வெளியிட்டுள்ளது என்பதை அவர் அறிவாரா?

(ஆ) ஒரு குறிப்பிட்ட பதவிக்கு திணைக்களத்தில் பொருத்த மான நபர்கள் யாரும் இல்லை என்பதைத் தீர்மானிப் பதற்கு இலங்கைப் போக்குவரத்துச் சபையின் ஆளணிப் பிரிவு பின்பற்றும் நடைமுறையை அவர் இச்சபைக்கு அறியத் தருவாரா?

(இ) பகுதி "ஆ" வில் குறிப்பிடப்பட்டுள்ள நடைமுறையைப் பின்பற்றாமல் எந்தவொரு ஊழியருக்கும் ஒப்பந்த அடிப் படையிலான நியமனங்கள் வழங்கப்படமாட்டாது என்பது உறுதிப்படுத்தப்பட்டுள்ளதா என்பதை அவர் இச்சபைக்கு அறியத்தருவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Transport :

(a) Is he aware that the Personnel Division of the SLCTB has recently issued a Circular No. 2 of 2011 to the effect that contract basis appointments would be given to any executive or non-executive grade employee only after establishing the position that no suitable replacement is available in the department?

(b) Will he inform this House of the procedure followed by the Personnel Division of the SLCTB to determine that there are no suitable persons available in the department for a particular post?

(c) Will he inform this House whether it is ensured that no contract basis appointments would be given to any employee without following the procedure referred to in the part (b) ?

(d) If not, why?

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්.

(ආ) ඔව්.

යම් සේවකයකු විශ්‍රාම යාමට මාස තුනකට පෙර අදාළ පුරප්පාඩුව සඳහා අනුප්‍රාප්තිකයෙකු නොමැති බවට කොට්ඨාස /අංශ ප්‍රධානිගේ නිර්දේශය සහිත වාර්තාව ප්‍රධාන මානව සම්පත් කළමනාකාර තැන වෙත ඉදිරිපත් කළ යුතුය. අදාළ වාර්තාව සේවා දීර්ඝ කිරීම සලකා බැලීමට පත් කර ඇති කමිටුව වෙත යොමු කරන අතර, සේවය අත්‍යවශ්‍ය නම් පමණක් සේවා දීර්ඝ කිරීමේ කමිටුවේ නිර්දේශය අනුව කොන්ත්‍රාත් පදනම මත සේවා දීර්ඝ ලබා දීම ගමනාගමන මණ්ඩලය මඟින් අනුගමනය කරන පිළිවෙත වේ.

(ඇ) ඔව්.

(ඈ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 12-1000/'10-(1), ගරු දයාසිරි ජයසේකර මහතා

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන් සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 14-1368/'11-(1), ගරු එම්.ටී. හසන් අලි මහතා

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු කථානායකතුමනි, ගරු එම්.ටී. හසන් අලි මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා මොකක් ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

[බාධා කිරීමක්] මේ ගරු සභාවේ ප්‍රශ්න අහලා ඒවායින් හරස් ප්‍රශ්න අහලා රටේ දැවෙන ප්‍රශ්නවලට උත්තර සපයන්නට ඕනෑ. අද ප්‍රශ්න පහළොවකින් ප්‍රශ්න දහයකට උත්තර ලැබුණේ නැහැ. අද මගේ ප්‍රශ්න තුනක් තිබෙනවා. තුනටම උත්තර ලැබුණේ නැහැ. ඒ සම්බන්ධයෙන් අද ගරු කථානායකතුමාගේ අවසරය පරිදි හරස් ප්‍රශ්න දෙකක් අහන්නට තිබුණා, අද රටේ දැවෙන වැදගත් ප්‍රශ්නයක් සම්බන්ධයෙන්. මා ඔබතුමාගේ අනුමතිය තුළින් කරුණාකර මෙතැන ඉන්න ඇමතිවරුන්ගෙන් ඒ ප්‍රශ්නය අහන්නට අවස්ථාව ලබා දෙන්නට පුළුවන් ද කථානායකතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒකට අවස්ථාව දෙන්න පුළුවන්කමක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මේකේ බැරෑරුම්කම කියන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මාත් කටයුතු කරන්නේ ස්ථාවර නියෝග අනුව.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම දන්නවා. මම ස්ථාවර නියෝග තුළින් තමයි අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Committee on Parliamentary Business එක දැන් තිබෙනවා. ඒකෙදි ඔය ගැන කථා කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට මොහොතක් දෙන්න. මේක අද රටේ දැවෙන ප්‍රශ්නයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක අහන්න මේ වෙලාව නොවෙයි මන්ත්‍රීතුමා, ඒක වෙනම වෙලාවක අහන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එතුමා හැම දාම දැවෙන ප්‍රශ්න අහනවා. ඉතින් අහන අහන ඒවාට ඒ අවස්ථාවේදී උත්තර දීලා තිබෙනවා. උත්තර දෙන්න බල කරන්න බැහැ. අපි ඒ උත්තර දීම සඳහා කල් ඉල්ලීමට අවශ්‍ය හේතු කාරණා ඔබතුමාට ඉදිරිපත් කරලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මන්ත්‍රීතුමා, ඒක වෙනම ප්‍රශ්නයක්. ඒක වෙන වෙලාවක අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කොහේද අහන්නේ ගරු කථානායකතුමනි? උත්තර දෙන්න-

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එහෙම නම් ප්‍රශ්න අහපු අයත් අද ඇවිල්ලා නැහැ නේ. [බාධා කිරීමක්] ඔව්. ඒක හරි. විපක්ෂයත් තමන්ගේ යුතුකම කරන්න එපායැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊ ළඟට ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

# පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 5 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊ ළඟට දිනට නියමිත කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා අනුමත කිරීම. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා.

# ධීවර හා ජලජ සම්පත් පනත : නියෝගය
## கடற்றொழில், நீரியல் வளங்கள் சட்டம்: ஒழுங்குவிதி
## FISHERIES AND AQUATIC RESOURCES ACT: REGULATION

[අ.භා. 1.32]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා.

> "2011 වර්ෂයේ අයවැය කතාවෙහි අන්තර්ගත යෝජනාව අනුව, 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මාර්තු 23 දිනැති අංක 1698/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතුය."

ගරු කථානායකතුමනි, අද දින 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ නියෝග හතරක් සංශෝධනය කිරීමට අනුමැතිය ඉල්ලා තිබෙනවා.

01. 2009 ධීවර බෝට්ටුවල ආරක්ෂාව (සැලැස්ම, ඉදි කිරීම සහ උපකරණ) නියෝග
02. මසුන් (ආනයනය සහ අපනයනය කිරීමේ) නියෝග 2010
03. 2011, (ධීවර ගාස්තු අවලංගු කිරීමේ) නියෝග
04. 1997 මසුන් ගොඩබෑමේ නියෝග (සංශෝධන)

මේ හතර තමයි ඉදිරිපත් කරන්නේ. ගරු කථානායකතුමනි, 2013වන විට මේ රටේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කරලා -දැන්

තිබෙන ප්‍රමාණය දෙගුණයකටත් වඩා වැඩි කරලා- මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීමට අපේ අමාත්‍යාංශයට වෙනම වැඩ පිළිවෙළක් තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සංඛ්‍යා ලේඛන අනුව දරුවන්ගෙන් සියයට 21ක් මන්දපෝෂණයෙන් පෙළෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අවුරුදු 5ට වඩා අඩු දරුවන්.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අවුරුදු 5ට වඩා අඩු දරුවන්. ඒක මධ්‍යම සහ උසස් පන්තියේ පවුල්වලත් තිබෙනවා. මොකද, ආහාර පරිභෝජන රටාවේ තිබෙන වෙනස නිසායි එහෙම වන්නේ. ලෝක සෞඛ්‍ය සංවිධානය බලාපොරොත්තු වනවා, 2013 අවසාන වන විට මේක සියයට 12 දක්වා අඩු වෙයි කියා. මන්දපෝෂණය ඇති වීමට ප්‍රධාන හේතුව ප්‍රෝටීන් ඌනතාවය. මේ රටේ ජනතාව සත්ව ප්‍රෝටීන්වලින් සියයට 83ක් ලබා ගන්නේ මාළුවලින්. 2009වන විට සත්ව ප්‍රෝටීන්වලින් සියයට 72ක් මාළුවලින් ලබා ගත්තා. අද වන විට ඒක සියයට 83ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒකට හේතුව මත්ස්‍ය මිල අඩු වීමයි. කුකුල් මස් පරිභෝජනය අඩු වෙලා ඒ වෙනුවට මත්ස්‍ය පරිභෝජනය වැඩි වෙලා තිබෙනවා. සියයට 83ක මත්ස්‍ය පරිභෝජනයක් තිබෙනවා නම්, මේක තමයි හොඳම උත්තරය, ප්‍රෝටීන් ඌනතාවය මේ රටින් ඉවත් කිරීමට.

ගරු කථානායකතුමනි, 2013වන විට ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළක් අපි ඉදිරිපත් කර තිබෙනවා. දැනට අපේ රටේ දිනක ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 31යි. 2013වන විට දිනක ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 60 දක්වා වැඩි කරන්න අපි බලාපොරොත්තු වනවා. එනම් අවුරුද්දකට කිලෝ ග්‍රෑම් 11.4 ක් වන ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය කිලෝ ග්‍රෑම් 22ක් දක්වා වැඩි කරන්න අපි බලාපොරොත්තු වනවා. 2009 දී මෙට්‍රික් ටොන් 339,730ක තිබුණු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 685,690කට වැඩි කිරීමට තමයි බලාපොරොත්තු වන්නේ. මේ සඳහා තමයි ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග හතර අප ගෙනෙන්නේ. පළමුවන නියෝගයේ ධීවර බෝට්ටුවල ආරක්ෂාව ගැන සඳහන් වනවා. ධීවර බෝට්ටුවක් හදලා ඒක මුහුදට යවන්න අද කිසිම රෙගුලාසියක් නැහැ. ධීවරයන්ට ආරක්ෂාවක් නැහැ; ධීවර යාත්‍රාවලට ආරක්ෂාවක් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැල් ආම්පන්න-

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
බොහොම ස්තුතියි. ඒකත් කරන්න ඕනෑ. දැනට අප ගෙනැවිත් තිබෙන්නේ ධීවර බෝට්ටු සම්බන්ධව නියෝග පමණයි. දැල් ආම්පන්න සම්බන්ධව නියෝග ඉදිරියේදී ගෙනෙන්නම්. ඒකත් ඉතා වැදගත්. ධීවර බෝට්ටු නිෂ්පාදනයට කිසිම සැලැස්මක් නැති නිසා විශාල අනතුරු සංඛ්‍යාවක් සිදු වනවා. ධීවර බෝට්ටු අනතුරට පත්වීම් ගැන බොහෝ වෙලාවට පුවත් පත්වල සඳහන් වෙලා තිබෙනවා තමුන්නාන්සේලා දකිනවා ඇති. මොකද, එන්ජින් එකේ තත්ත්වය ගැන කිසිම සැලකිල්ලක් නැහැ.

බෝට්ටු නිෂ්පාදනයේ කිසිම ප්‍රමිතියක් නැහැ. එම නිසා ඔවුන්ගේ බෝට්ටු අතර මහදී අක්‍රීය වෙනවා. බෝට්ටු පෙරළෙනවා. මේ ඔක්කොටම හේතුව නිෂ්පාදනයේදී කිසිම ප්‍රමිතියක් තිබුණේ නැති එකයි. ඒ නිසා අපි කරුණු දෙකක් කියනවා. එකක් තමයි ආරක්ෂාව. අනෙක ප්‍රමිතිය. අපි මීට පස්සේ මේ බෝට්ටු නිෂ්පාදනය කිරීමට ලැහැස්ති කරලා තිබෙන්නේ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුවයි. ඒ සඳහා අපි නියෝග කිහිපයක් ගේනවා. එකක් තමයි, 2009 ධීවර බෝට්ටුවල ආරක්ෂාව (සැලැස්ම, ඉදි කිරීම සහ උපකරණ) නියෝග. එම නියෝග පැනවීමේ මූලික අරමුණ වූයේ නියමිත ප්‍රමිතියෙන් යුක්ත ධීවර බෝට්ටු මසුන් ඇල්ලීමට යොදා ගැනීමෙන් අවදානම් සහිත මෙම රැකියාවේ සුරක්ෂිත බව ඇති කිරීමයි.

මූලික ලෙස පහත දැක්වෙන විධිවිධාන සැලසීම සඳහා මෙම නියෝග මාලාව බලාත්මක වෙනවා.

* දිගින් මීටර් 24ට වඩා අඩු තට්ටු සහිත - decked - සහ රහිත - undecked - ශ්‍රී ලංකා ජල තීරයේ යොදා ඇති නව ධීවර බෝට්ටු සම්බන්ධයෙන් අදාළ වේ.
* මෙවා yachtsවලට, සංචාරක ව්‍යාපාරයට ගේන බෝට්ටුවලට බල පවත්වන්නේ නැහැ.
* ධීවර බෝට්ටු හෝ ධීවර බෝට්ටුවක යම් කොටසක් ඉදි කරන සෑම පුද්ගලයෙකු සහ බෝට්ටු අංගන ධීවර අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලියාපදිංචි සහතිකයක් ලබා ගත යුතු බවට අනිවාර්ය කර ඇත.
* ධීවර බෝට්ටුවක් ඉදි කිරීම, ජල රෝධකතාව සහ උපකරණ, ස්ථායිතාව සහ මුහුදේ යාත්‍රා කිරීම සඳහා සුදුසු බව, යන්ත්‍රෝපකරණ සහ විදුලිය ස්ථාපනය, ගිනි ආරක්ෂාව, කාර්ය මණ්ඩලය ආරක්ෂාව, ජීවිතාරක්ෂක උපකරණ, හදිසි අවස්ථා කාර්ය පටිපාටි සහ ආරක්ෂණ පුහුණුව, රේඩියෝ සන්නිවේදන ක්‍රම, යාත්‍රා වරණ උපකරණ සහ කාර්ය මණ්ඩල නිවස්න සම්බන්ධව මෙම නියෝග මාලාවේ විධිවිධාන සලසා ඇත.

ඇත්තටම දෙවෙනි නියෝගය තිබෙන්නේ මසුන් ආනයනය සහ අපනයනය කිරීම සම්බන්ධවයි. අපි ඇත්තටම දැනට මේ රටේ ඉඳලා රුපියල් මිලියන 21,000ක වටිනාකමකින් යුත් මසුන් අපනයනය කරනවා. 2009 තිබුණේ ඔය ප්‍රමාණය. නමුත් ගිය අවුරුද්ද බැලුවාම සියයට 10කින් අපනයනය වැඩි වීමක් සිදු වෙලා තිබෙනවා. යුරෝපා සංගමයට යවන මත්ස්‍ය ප්‍රමාණය - GSP එකත් අයින් කරලා- ගිය අවුරුද්දේ සියයට 143 දක්වා වැඩි වෙලා තිබෙනවා.

ඒ වාගේම තවත් විශාල ඉල්ලුමක් තිබෙන දෙයක් තමයි මුහුදු කුඩැල්ලන් සහ ඉස්සන්. අපි මුහුදු කුඩැල්ලන් නෙදර්ලන්තය, තායිවානය, හොං කොං, සිංගප්පූරුව සහ එක්සත් ජනපද රාජධානියට යවනවා. මේ මුහුදු කුඩැල්ලන් වගාව ව්‍යාප්ත කිරීම සඳහා අපේ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියත් - NAQDA- ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයත් - NARA - පර්යේෂණ කර ගෙන යනවා. 2010 දී විතරක් අපි මුහුදු කුඩැල්ලන් අපනයනය කරලා රුපියල් මිලියන 649ක විදේශ විනිමය හොයා ගෙන තිබෙනවා. ඒ නිසා මෙම සම්පත තිරසාර ලෙස කළමනාකරණය කිරීමේ අරමුණින් අපි මෙම නියෝග පනවනවා.

ශ්‍රී ලංකාව තුළ ආර්ථික වශයෙන් වැදගත් වටිනාකමක් ඇති, කර්මාන්තයක් වශයෙන් වැදගත් වන විදේශ විනිමය උපයන මත්ස්‍ය විශේෂයක් සන්තකයේ තබා ගැනීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම, ප්‍රවාහනය, අපනයනය, ආනයනය හා ප්‍රති අපනයනය සඳහා බලපත්‍ර ලබා ගත යුතු බව මෙම නියෝග මාලාව මඟින් අනිවාර්යය කරනවා. මෙම නියෝග මාලාවේ මුහුදු කුඩැල්ලන් සම්පත කළමනාකරණය කිරීම හා ඒ සඳහා විධිවිධාන

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

සැලසීම කරලා තිබෙනවා. අනාගතයේදී කිසියම් මත්ස්‍ය විශේෂයක් ආර්ථික වශයෙන් වැදගත් වන විදේශ විනිමය උපයන මත්ස්‍ය විශේෂයක් නම්, එකී මත්ස්‍ය විශේෂය ඇතුළත් කළ හැකි පරිදි මෙම නියෝග මාලාවේ විධිවිධාන ඇතුළත් කරලා තිබෙනවා. වෙනත් මත්ස්‍ය විශේෂයක් ඉදිරියේදී අපනයනය කිරීම සඳහා ඉල්ලීමක් ඇති වුණොත් ඒකටත් මේ විධිවිධාන බලපානවා. අනික් කරුණ තමයි මෙම නියෝග මාලාවට ඇතුළත් කර ඇති මත්ස්‍ය විශේෂ මුහුදු පත්ල හැරීමෙන් හෝ ට්‍රෝලර් කිරීමෙන් ඇල්ලීම සම්පූර්ණයෙන් තහනම් කරලා තිබීම.

තමුන්නාන්සේලා දන්නවා, මේ රටේ විවිධ මාදිලියේ තහනම් ධීවර ක්‍රම තිබුණාය කියලා. දකුණේ light course කියලා එකක් තිබුණා. ඒකෙන් ඇත්තටම කුඩා මත්ස්‍යයින් මැරෙන්නේ ඒ ලයිට් එක ගැහුවාම ඇස්වල තිබෙන රුධිර නාලිකා පිපිරිලා රුධිරය ගැලීමෙන්. කිලෝ දාහක් මසුන් අල්ලන කොට ලක්ෂ ගණනක මත්ස්‍ය සංඛ්‍යාවක් විනාශ වෙලා යනවා. ඒ නිසා මාළු හැදෙන්නේ නැති තත්ත්වයක් තිබුණා. මම ඒක තහනම් කළා. ඒකට විරුද්ධව විශාල පෙළපාළි ගියා. ගාලු පාර block කළා. නමුත් අපි ඒක තහනම් කිරීම නැවැත්වූයේ නැහැ. ඒක අද සම්පූර්ණයෙන් තහනම්. අවසානයේදී ධීවරයෝ හතර දෙනෙක් හිටියා. එහේ පොලිසියටවත්, කාටවත් කියලා මට ඒ ගොල්ලන්ව පාලනය කර ගන්න බැරි වුණා. අපේ නිලධාරින් කවුරුවත් නැහැ. පසුව මම අම්බලන්ගොඩ වරාය නාවික හමුදාවට භාර දුන්නා. ඒ හතර දෙනාවත් අයින් කළා. අද light course නැහැ. ඒ නිසා වෙළඳ පොළේ මත්ස්‍ය නිෂ්පාදනය පළමුවැනි මාස තුනේ මෙට්‍රික් ටොන් 5,590කින් -සියයට දහයකට වැඩි ප්‍රමාණයකින්- වැඩි වෙලා තිබෙනවා තමුන්නාන්සේලා දැකලා ඇති. ඒකෙන් සියයට හතළිහකට වැඩි ප්‍රමාණයක් වැඩි වෙලා තිබෙන්නේ කුඩා මත්ස්‍යයින්. ඒකට ප්‍රධාන හේතුව තමයි දැන් පොඩි මාළුන්ට හැදෙන්න ඉඩ තිබෙන එක. අපේ පළාත්වල කට්ටිය කියන්නේ දැන් තමයි මෝරපු හාල්මැස්සන් වෙළඳ පොළට එන්නේ කියලා.

ත්‍රිකුණාමලයේ ඩයිනමයිට් ගහන එක තිබුණා. රාත්‍රී කාලයට ඩයිනමයිට් ගහන නිසා විශාල ශබ්ද තිබෙනවාය කියලා අපට කිව්වා. ඒකත් ඉතාම අමාරුවෙන් අපට තහනම් කරන්න සිදු වුණා. මොකද සමහර ආරක්ෂක අංශවල කට්ටියත් මූල්‍යමය හේතු නිසා මේකට සම්බන්ධ වෙලා තිබුණා. ඊට පස්සේ මම නාවික හමුදාපතිව ත්‍රිකුණාමලයට ගෙන්වා ගෙන සාකච්ඡා කළා. අද ඩයිනමයිට් ගහන එක සම්පූර්ණයෙන්ම තහනම් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි උතුරේ සහ දකුණේ ප්‍රදේශවල තිබෙන trawling කර්මාන්තය. උතුරේ trawling කර්මාන්තය කළාමත් ඒ trawling ක්‍රම නවත්වන්නය කියලා ගුරුනගර්වල වරුවක වැඩ වර්ජනයක් මට විරුද්ධව කළා. අනික් ප්‍රදේශය තමයි මන්නාරම. ඒ වාගේම තමයි මීගමුව, හලාවත ප්‍රදේශවල ඉස්සන්ට trawling ක්‍රමයක් තිබෙනවා. තමුන්නාන්සේලා දකින්න ඇති, මම ඒක තහනම් කළාම පුවත් පත්වලින් ලොකු ප්‍රචාරයක් දුන්නා; නොයෙකුත් රූපවාහිනී නාලිකාවලින් පෙන්නුවා. ඒ අනුව මා නාරා ආයතනයට දුන්නා, මේ ගැන පරීක්ෂණයක් කරන්න. ඒ පරීක්ෂණයේ වාර්තාව තිබෙනවා. ඒ මම හිතපු දේවල්ම තමයි ඒ ගොල්ලනුත් විද්‍යාත්මක කරුණු අනුව පෙන්වා දීලා තිබෙන්නේ. 2003 දී කයිසර් කියන විද්‍යාඥයා කරපු පරීක්ෂණ වාර්තාවක සඳහන් කළ ලෙසට එහිදී පැහැදිලිවම කියා තිබෙනවා, "Bottom trawl nets have been considered one of the gears that cause most serious disturbances on benthic communities" කියලා.

අනෙක් කාරණය, trawling කරන වේගය නිසා ප්‍රශ්න ඇති වෙනවා. ඒ නිසා ධීවරයන්ට අපහසුවක් නොවන විධියට trawling කරන්න මම ඔරුවලට ඉඩ දුන්නා. නමුත් මෝටර් බෝට්ටුවලින් trawling කිරීම මම තහනම් කළා. දැන් මේ සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් ඇති කර ගෙන තිබෙනවා. මා පසු ගිය කාලයේත් යාපනයට ගිහිල්ලා මේ පිළිබඳව සාකච්ඡා පැවැත්වූවා, අපේ ආරක්ෂක අංශත් එක්ක එකතු වෙලා. නමුත් කියන්න කනගාටුයි, සමහර අය නිසා මේ තත්ත්වය පාලනය කිරීම ඉතාම අපහසුයි.

යාපනයේ trawler යාත්‍රා තිබෙන්නේ ඔක්කොම 160යි. වැල්වැටිතුරේ තිබෙන 10ත් එක්ක ගත්තාම මුළු යාපනය දිස්ත්‍රික්කයටම තිබෙන්නේ 160ක ප්‍රමාණයක්. නමුත් අනෙක් යාත්‍රා හයදහස් ගණනක ප්‍රමාණයක් දැන් උතුරේ තිබෙනවා. අපි පසු ගිය කාලයේ යාත්‍රා විශාල ප්‍රමාණයක් බෙදා හැරියා. ඒවාත් ඔක්කොම ගත්තාම යාත්‍රා 6025ක් පමණ යාපනය දිස්ත්‍රික්කයේ තිබෙනවා. මේ යාත්‍රා හයදහස් ගණනින් 160ක් ගැන තමයි හැමෝම කථා කරන්නේ. මාධ්‍යයන්, ආරක්ෂක අංශ, බොහොම කනගාටුව ප්‍රකාශ කරන්නේ මේ යාත්‍රා 160 ගැන. මේ යාත්‍රා 160 මුහුදට ගිහිල්ලා ඒ ගොල්ලන්ගේ දැල් ටික දැම්මාට පස්සේ වෙන කිසි යාත්‍රාවකට මුහුදට යන්න බැහැ. මොකද, ඒ වාගේ දැවැන්ත ඒවා මුහුදට දැම්මාම ඉතිරි යාත්‍රා පන්දහස් ගණනටම එදා දවසේ ධීවර කර්මාන්තයේ යෙදෙන්න බැහැ. ඒ අනුව සතියකට දවස් තුනක් ඒ ගොල්ලන්ට ධීවර කර්මාන්තයේ යෙදෙන්න බැහැ. මන්නාරමේ තිබෙන්නේ ඔක්කොම trawler යාත්‍රා 80යි. අනෙකුත් යාත්‍රා තුන්දහස් ගණනක් තිබෙනවා මන්නාරමේ. එතකොට ඒ තුන්දහස් ගණනටම සතියකට දවස් තුනක් ධීවර කර්මාන්තය කරන්න අපහසුයි, ඒ trawler යාත්‍රා 80ට ඉඩ දුන්නාම. මන්නාරමේ තිබෙන මේ trawler යාත්‍රා 80යි, යාපනයේ තිබෙන මේ trawler යාත්‍රා160යි එකතු වුණාම 240යි. මේ 240 ගැන තමයි හැමෝම මහා විශාල ලෙස කථා කරන්නේ.

ඒ වාගේම තමයි ගම්පහ දිස්ත්‍රික්කය. ගම්පහ දිස්ත්‍රික්කය ගත්තාම මේ පර්යේෂණය අනුව, හැඳල යාත්‍රා 153ක් තිබෙනවා. මීගමුවේ යාත්‍රා 168ක් තිබෙනවා. ඒවාට අපි ඉඩ දීලා තිබෙනවා. මොකද, ඒවා ඔරු නිසා. හෝස් පවර් 25 සිට 40 දක්වා ඇති මෝටර් යාත්‍රා trawler ක්‍රමයට ඉස්සෝ ඇල්ලීම සඳහා මොකද කරන්නේ? මුහුදු පත්ලටම net එක දමලා ඇද ගෙන යනවා. එහෙම ඇද ගෙන ගියාම කොරල් ටික කැඩෙනවා. Sediment කියන එක විනාශ වෙලා යනවා. මුහුදු මඩ ඔක්කොම ඇවිස්සිලා මුළු පරිසරයම විනාශ වෙනවා.

හැඳල තිබෙනවා ඉස්සන් ඇල්ලීමට යාත්‍රා 153ක්. කල්පිටියේ තිබෙනවා 19ක්. මේ යාත්‍රා 172 වෙනුවෙන් තමයි හැමෝම කථා කරන්නේ. නමුත් මේ ප්‍රදේශයේ අනෙකුත් යාත්‍රා 12,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. මම පසු ගිය කාලයේ මීගමුව සහ පුත්තලම යන ප්‍රදේශ දෙකේ සියලුම ධීවර සංවිධාන හමු වීමට ගියා. ඒ ගොල්ලන් මගෙන් ඉල්ලුවා, ජා කොටු ටිකයි මේ මාළු අල්ලන ක්‍රමයයි තහනම් කරලා දෙන්න, නැත්නම් ඒ ගොල්ලන්ට මත්ස්‍යයන් අල්ලන්න බැහැ කියලා. "ඒ දැල් ටික දැම්මාම අපට ඒ පළාතට යන්න බැහැ, මාළු අහු වෙන්නේ නැහැ, ඒ මුළු මුහුදු ප්‍රදේශයම කැලැත්තෙනවා" කිව්වා.

අනෙක් කාරණය මේකයි. NARA පරීක්ෂණයෙන් පෙන්වා දීලා තිබෙනවා, මාළු ඇල්ලීමේ මේ ක්‍රමය නිසා අනෙකුත් මත්ස්‍යයන් මොන තරම් ප්‍රමාණයක් මේ දැලට අහු වෙලා විනාශ වෙලා යනවාද කියන කාරණය. එකයි දශම එකට තුනට අනුපාතයට අනෙක් මාළු මේ දැලට අහු වෙනවා. උඩ ඉඳලා පහළටම මේ දැල එළලා අදිනකොට කුඩා මාළුන්ගේ ඉඳලා අනෙක් ඔක්කොම මාළු අහු වෙනවා. මොකද, කුඩා හිලක් තිබෙන net එකක් තමයි ඉස්සන් ඇල්ලීමට පාවිච්චි කරන්නේ.

හැඳලදී මේ ක්‍රමයට ඉස්සන් අල්ලනකොට ඒ දැලට තව මාළු වර්ග 10ක් අහු වෙනවා. මේ දැල්වලට කල්පිටියේ වෙනත් මාළු වර්ග හතරක් අහු වෙලා විනාශ වෙලා යනවා. මේ පර්යේෂණයට අනුව වැදගත්ම දේ තමයි යාත්‍රාව ගෙන යන වේගය. අන්න ඒ

වේගය නිසා තමයි මම ඒ යාත්‍රා තහනම් කරලා තිබෙන්නේ. ඒ අනුව එන්ජින් බෝට්ටු අපි තහනම් කර තිබෙනවා. ඒ වුණාට අනෙකුත් බෝට්ටුවලට, ඔරුවලට අපි ඉඩ දීලා තිබෙනවා. මොකද ඒවා හෙමින් යන්නේ. ඒ නිසා ඒවායින් ඇති වන හානිය ඉතා අවමයි.

අපේ හිටපු ධීවර අමාත්‍ය මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාත් මාත් එක්ක ධීවරයෝ හමු වන්න ගියා. එදා ධීවරයෝ එතුමාවත් මාවත් වට කර ගෙන කියපු කථා ටික එතුමා අහ ගෙන සිටියා. ඔවුන් මේ දැල් ක්‍රමයට විරෝධය ප්‍රකාශ කළා. නමුත් මේ සුළු ව්‍යාපාරිකයන් ටික දෙනා ගැන තමයි සමහර කට්ටිය කථා කරන්නේ. මේ සුළු ව්‍යාපාරිකයන්ගේ හඬ පත්තරවලට, මාධ්‍යවලට, අපේ මහජන නියෝජිතයන්ට ඇහෙනවා. නමුත් අර දුප්පත් ධීවර ජනතාවගේ කථාව අහන්න කවුරුවත් නැහැ. ඔවුන්ගේ ප්‍රශ්න කියා ගන්න කෙනෙක් නැහැ. අපි ගියොත් විතරක් අපව හම්බ වෙලා ඔවුන් කථා කරනවා. ඒ නිසා ඒ අයගේ ධීවර කර්මාන්තය බේරලා දෙන්න අපි ලැහැස්තියි. මම කිව්වා, මේ net එක විතරයි වෙනස් කරන්න තියෙන්නේ කියලා. තමන්ට horsepower engine සහිත බෝට්ටු තිබෙනවා නම්, ඒ net එක වෙනස් කරන්න, ඒ net ඔක්කොම අපේ අමාත්‍යාංශයෙන් සල්ලිවලට දෙන්නම් අසාධාරණයක් නොවන විධියට කියලා මම කිව්වා. නමුත් ඒ ගොල්ලන්ට ඕනෑ කරන්නේ ඔවුන් පුරුදු වෙලා තිබෙන මේ ක්‍රමය දිගටම ගෙන යන්නයි.

මෙම research එකේ කියලා තිබෙනවා, "These fishing gears are designed to penetrate the surface layers of the sediment, in order to increase catching of the target species" කියලා. අර sediment එකේ යට තට්ටුවටම මේ දැල නිසා බලපෑම් ඇති වෙනවා.

ඒ වාගේම මේ වාර්තාවේ තවදුරටත් කියා තිබෙනවා, "..trawling effects on marine ecosystems..." කියලා. ඒ කියන්නේ, කොරල් පද්ධති ඔක්කොමත් එක්ක මුළු සාගර පත්ලේම තිබෙන පරිසරය විනාශ වෙලා යනවා කියනවා. ඒ විතරක් නොවෙයි, තවදුරටත් කියනවා, "Satellite images show that spreading clouds of mud remain suspended in the sea, long after the trawler has passed" කියලා. යාත්‍රාව පාස් වෙලා හුඟක් වෙලා යන තෙක් ඒ දූවිලි ප්‍රමාණය තිබෙනවා. ඒ නිසා වෙනත් කිසිම මත්ස්‍යයකු එතැන ගැවසෙන්නේ නැහැ.

අනෙක, "Shrimp trawling directly affects many fish and invertebrate species via bycatch mortality. Population declines experienced by commercially and recreationally important finfish, elasmobranchs (skate), and endangered sea turtles, as well as impacts to the benthic ecosystem, have been attributed with the shrimp-trawl fishery".

මේ trawling ක්‍රමය නිසා finfish, skate සහ ඉබ්බන් වර්ග අපට නැති වනවා. ඒ විතරක් නොවෙයි, තවත් කියා තිබෙනවා ".. suspended particles may destroy the corals by depositing on them"

අහල පහළ කොරල් තිබෙනවා නම් ඒවාත් ඔක්කොම විනාශ වෙලා යනවා. "Sediments of shallow sea may consist of many persistent organic pollutants like DDT, PCB etc." මේ නිසා අලුතින් DDT, PCB වාගේ විෂ ද්‍රව්‍ය ඇති වනවා. ඒ නිසා වහාම trawling ක්‍රමය තහනම් කරන ලෙස ඒ ගොල්ලන් ඉල්ලනවා.

ඒ විතරක් නොවෙයි, "Fishing bans need not be a source of undue worry since there are creative alternative options that affected fishing communities can adopt,..." මේ සඳහා විකල්ප ක්‍රම පාවිච්චි කරන්න පුළුවන්. මේ මත්ස්‍ය සම්පත අපි ආරක්ෂා කළොත් විතරයි මත්ස්‍ය සම්පත දියුණු කරලා අපේ ඉලක්කවලට යන්න පුළුවන් වන්නේ. එම නිසා මේ trawling ක්‍රමය දැනටමත් අපි ගැසට් මඟින් තහනම් කරලායි තිබෙන්නේ. අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මෙම නියෝග තුළින් උතුරේ සහ දකුණේ ඇති සියලුම වර්ගයේ trawling ක්‍රම සම්පූර්ණයෙන්ම තහනම් කරනවා.

ඒ එක්කම තංගුස් දැලේ - monofilament thread - තිබෙන හානිදායක තත්ත්වය අපි පෙන්නුම් කරලා දුන්නා. ඒකෙන් මාළු කැපෙනවා. ඒ යෝජනාව මම කැබිනට් මණ්ඩලයට ගෙනාපු වෙලාවේ අතිගරු ජනාධිපතිතුමා මට හොඳට සහයෝගය දුන්නා. ඒ අනුව ඒ දැල් තහනම් කළා. සමහරු තුළ මත තිබුණා ඒ දැල් වෙනත් දේවලට පාවිච්චි කරනවා කියලා. අද ලංකාවට තංගුස් ආනයනය කිරීමත් තහනම් කරලායි තිබෙන්නේ.

ඒ වාගේම තිබෙනවා සුරුක්කු දැල් සහ ලයිලා දැල්. ඒකත් හැඹිලි දැල වාගේම වෙනත් ක්‍රමයක එකක්. ඒවාත් ගල් වටේට දමනවා. ඒකෙන් ගල් වටේ සිටින නොයෙකුත් මත්ස්‍ය විශේෂ විනාශ වෙලා යනවා. ඒ නිසා අපි ඒවාත් තහනම් කරලා තිබෙන්නේ. අපට ඉදිරිපත් කර තිබෙන මේ සියලු නීති විරෝධී ආම්පන්න අපි තහනම් කරලා තිබෙන්නේ.

තුන්වැනි කාරණය තමයි ධීවර ගාස්තු අවලංගු කිරීමේ නියෝග. තමුන්නාන්සේලා දන්නවා, 2011 අය වැය ලේඛනයෙන් ධීවර කර්මාන්තයට විශේෂ සහන හතරක් දුන්න බව.

අපේ අමාත්‍යාංශය -මම- ජනාධිපතිතුමාගෙන් ඉල්ලීම් 4ක් කළා. එතුමා ඒ ඉල්ලීම් හතරම ලබා දුන්නා. ඒ එක් ඉල්ලීමක් අනුව ධීවර කර්මාන්තය අවුරුදු 5කට ආදායම් බද්දෙන් නිදහස් කරලා තිබෙනවා. මේක තමයි ආදායම් බද්දෙන් නිදහස් කළ ලංකාවේ එකම කර්මාන්තය. මේ කර්මාන්තය දියුණු කරන්නට මුළු ධීවර කර්මාන්තයම අද ආදායම් බද්දෙන් නිදහස් කර තිබෙනවා. කිසි කෙනෙක් ආදායම් බදු ගෙවන්න අවශ්‍ය වන්නේ නැහැ.

දෙවැනි කාරණය මේකයි. ධීවර ණය යෝජනා ක්‍රමයක් ඇති කරන්න මම ලංකා බැංකුවත් එක්ක කථා කර ගත්තා. ඒ කියන්නේ සුනාමියෙන් පස්සේ අපි යුද්ධයත් ඉවර කරලා මුළු මුහුදම නිදහස් වෙලා තිබෙන මේ වෙලාවේ අපි ධීවරයින්ට යම් කිසි සහනදායී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත් ධීවර කර්මාන්තයෙන්ම මේ රටේ ආර්ථික වර්ධනයට විශාල කොටසක් දායක කර ගන්න අපට පුළුවන් වෙනවා. මොකද, 2010 තුන්වැනි කාර්තුව වෙන කොට අපේ රටේ ආර්ථික වර්ධනය දෙස බැලුවොත්, අපි තුන්වැනි ස්ථානයට ගමන් කරලා තිබෙන බව පෙනෙනවා. අපේ ධීවර කර්මාන්තය දියුණු වෙලා තිබෙනවා. සංචාරක කර්මාන්තයත්, සුළු අපනයන බෝග සම්බන්ධ කර්මාන්තයත් විතරයි අපට වඩා ඉදිරියෙන් ඉන්නේ. සියයට 18.35ක වාර්තාගත වර්ධනයක් අපි ආර්ථිකයට ලබා දී තිබෙනවා.

ධීවර කර්මාන්තයේ මීටත් වඩා වර්ධනයක් ඇති කර ගන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒක තමයි අපේ ඉලක්කය. ඒ මඟින් අපේ ජනාධිපතිතුමා බලාපොරොත්තු වන ආශ්චර්යවත් රට බිහි කරන වෙලාවට සියයට 50ක පමණ ආර්ථික දායකත්වයක් ධීවර කර්මාන්තයෙන් GDP එකට ලබා දෙන්න මම බලාපොරොත්තු වෙනවා. ඒක අපට බැරි වෙන්නේ නැහැ. පසු ගිය තුන්වැනි කාර්තුව වන විට සියයට 18.35ක වර්ධනයකට ගියා. ඒ තරම් වර්ධනයක් ලබා ගත්තා. දෙසැම්බර් මාසය වන විට එය සියයට 24 දක්වා ගමන් කළා. එතකොට තව සියයට 26ක පමණ වර්ධනයක් අපි ලබා ගත යුතුව තිබෙනවා. ඒක අමාරු වෙන්නේ නැහැ. මොකද අපේ රට වටේට වර්ග කිලෝ මීටර් 517,000ක මුහුදු තීරයක් අපට තිබෙනවා. හෙක්ටයාර 303,755ක ජලාශ රට ඇතුළේ අපට තිබෙනවා. හෙක්ටයාර 160,000ක කළපු ජලාශ අපට තිබෙනවා. ඒ කියන්නේ රටේ බිම් ප්‍රමාණයෙන් සියයට 75ක්

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

නැත්නම් තුන්කාලක් තිබෙන්නේ වතුර. එහෙම නම් මේ රට දියුණු කිරීමට දායක විය හැකි ප්‍රධානම දෙයක් තමයි ධීවර කර්මාන්තය. ඒ නිසා ධීවර කර්මාන්තය ආදායම් බද්දෙන් නිදහස් කරන්නය කියලා මම ඉල්ලුවා. ජනාධිපතිතුමා ඒක අය වැය ලේඛනය මඟින් ලබා දුන්නා.

ධීවරයින්ට විශාල ණය යෝජනා ක්‍රමයක් ලබා දෙන්න අවශ්‍යයි කියලා මම දෙවනුව කිව්වා. ඒ නිසා අපි ලංකා බැංකුවත් එක්ක කථා කළා. ඒ ගොල්ලන්ගේ තිබෙන ණය යෝජනා ක්‍රමය අනුව ධීවරයෙකුට රුපියල් ලක්ෂ 20ක් දක්වා සියයට 9 ½ක පොලියට ලබා දෙන්න කථා කළා. රුපියල් ලක්ෂ 20 සිට රුපියල් ලක්ෂ 1,000 දක්වා වූ තවත් ණය යෝජනා ක්‍රමයක් තිබෙනවා. ඒක සියයට 12 පොලියට ලබා දෙන්න මම කථා කර ගත්තා. ඒකෙන් සියයට 4ක් ආණ්ඩුවෙන් ලබා දෙන්නය කියලා මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලුවා. ජනාධිපතිතුමා ඒක පසු ගිය අය වැය ලේඛනයෙන් ලබා දුන්නා. එම නිසා රුපියල් ලක්ෂ 20ක් වන තෙක් ලබා ගත් ණය වෙනුවෙන් ධීවරයා ගෙවිය යුත්තේ සියයට 5 ½ක පොලියක්. ඒ කියන්නේ මාසයකට සියයට දශම 5ක්වත් ගෙවන්න ඕනෑ නැහැ. රුපියල් ලක්ෂ 1,000 දක්වා වූ ණය ප්‍රමාණයට සියයට අටක පොලියක් ගෙවන්නට ඕනෑ. සියයට 4ක් ආණ්ඩුවෙන් ගෙවනවා. මේ ක්‍රමය අද ඉතාමත් ජනප්‍රිය වෙලා තිබෙනවා. මේ වෙන කොට 3,000කට වඩා වැඩි පිරිසක් මෙම ණය යෝජනා ක්‍රමයට බැඳෙන්න ඉල්ලුම් කර තිබෙනවා.

මේ වන විට "දියවර දිරිය" ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් බිලියන 5.02ක වටිනාකමින් යුත් ණය ඉල්ලා තිබෙනවා. බහුදින යාත්‍රා 1202ක් සඳහාත්, එක්දින යාත්‍රා -වෙරළාසන්න යාත්‍රා - outboard motor boats - 1,289ක් සහ අනිකුත් කටයුතු සඳහාත් ඇතුළුව මුළු ණය වටිනාකම වූ රුපියල් මිලියන 5,825ක් දක්වා ණය ලබා දෙන්නට අපි බලාපොරොත්තු වනවා.

2013 වන කොට බහුදින යාත්‍රා 336ක් නිෂ්පාදනය කරන්න අපි බලාපොරොත්තු වනවා. ගැඹුරු මුහුදට යන්න, ජාත්‍යන්තර මුහුදට යන්න මේ රටේ බහුදින යාත්‍රා නැහැ. මේ අවුරුද්ද අවසාන වන විට බහුදින යාත්‍රා 100ක් නිෂ්පාදනය කරන්න අපි බලාපොරොත්තු වනවා. ජුලි 25 වන දා අපි මේ ණය යෝජනා ක්‍රමය ආරම්භ කරනවා, ලංකා බැංකුවත් එක්ක. එහිදී බහුදින යාත්‍රා හිමියන් 150 දෙනකුට අපි මේ ණය ප්‍රදානය කරනවා. අනික් එක තමයි, ධීවර කර්මාන්තය සඳහා තිබෙන සියලුම බලපත්‍ර ගාස්තු ඉවත් කරනවා. ඒකටත් ජනාධිපතිතුමා එකඟ වුණා.

මෙම නියෝග මාලාව මඟින් ධීවර බෝට්ටු උකස් කිරීම, ධීවර බෝට්ටු ලියා පදිංචි කිරීම, ධීවර මෙහෙයුම් බලපත්‍ර, මසුන් ආනයනය හා අපනයනය කිරීම, පොකිරිස්සන් සහ හක්බෙල්ලන් සන්තකයේ තබා ගැනීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම හෝ ප්‍රවාහනය කිරීම සහ අපනයනය කිරීම සඳහා අය කරනු ලබන බලපත්‍ර ගාස්තු සියල්ලම අහෝසි කළා. මේ යටතේ දැනට බලපත්‍ර ගාස්තු අය වන්නේ මුහුදු කුඩැල්ලන් අපනයනය, ධීවර බෝට්ටු යාත්‍රාංගණ ලියා පදිංචි කිරීම සහ ජලජීවී වගා ව්‍යවසායන් කළමනාකරණය සඳහා පමණයි. ඒ වාගේ සමාගම් ආවාම ඒවාට විතරයි බදු අය කරන්නේ. අනික් එකකටවත් කිසිම බලපත්‍ර ගාස්තුවක් අය කරන්නේ නැතිව එම ගාස්තුවලින් නිදහස් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. පසු ගිය අය වැය ලේඛනයෙන් රුපියල් මිලියන 300ක් අපට ලබා දීලා තිබෙනවා, සංචාරක ව්‍යාපාරයත් එක්ක අනුබද්ධ වෙලා වැඩ පිළිවෙළකට යන්න. මේ තුන්වන නියෝගයයි.

හතරවන නියෝගය මසුන් ගොඩබෑමේ නියෝගයි. තමුන්නාන්සේලා දන්නවා, අද මත්ස්‍ය මිල පාලනය කිරීම දැවැන්ත අරගලයක් බවට පත් වුණු බව. ඒ අරගලයේදී ඇත්තටම අපට පාවිච්චි කරන්න වුණේ ලංකා ධීවර සංස්ථාවයි. මාළු මිල පාලනය කරන්න ලංකා ධීවර සංස්ථාව තමයි අපි යොදා ගත්තේ. දැනට අපි ලංකා ධීවර සංස්ථාවේ වෙළෙඳ සැල් 92ක් ආරම්භ කරලා තිබෙනවා. හෙටත් ගනේමුල්ලේ ධීවර වෙළෙඳ සැලක් ආරම්භ කරනවා.

තව පහක් විතර අපි හෙට අනිද්දා ආරම්භ කරනවා. මගේ බලාපොරොත්තුව ධීවර වෙළෙඳ සැල් 250ක් රට පුරා පිහිටුවන්නටයි. ඒ එක්කම අපි ලක් සතොස ශාඛා 204ක දැන් මාළු විකිණීම කරනවා. ජංගම අලෙවි රථ 45ක මාළු විකිණීම දැන් අපි ආරම්භ කරලා තිබෙනවා. Co-op City අලෙවි සල් 46කට සහ රෝහල් 36කට අපි මාළු සපයනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ වාගේ මිල ගණන් කොහොමද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මිල පහත දමා තිබෙනවා. අපි කෙලවල්ලන් මාළුවල මිල රුපියල් 490 ඉඳලා 430 වන තෙක් අඩු කළා. මොකද, මත්ස්‍ය වෙළෙඳ පොළේ සියයට 40ක් විකිණෙන්නේ කෙලවල්ලන් මාළු. කෙලවල්ලන්ගේ මිල පහත දැම්මොත් විතරයි අනෙකුත් මත්ස්‍යයන්ගේ මිල පහත දමන්නට පුළුවන්. කෙලවල්ලන්ගේ මිල කීයද තිබෙන්නේ ඒ මතයි මත්ස්‍ය මිල රඳා පවතින්නේ. ඒ හා සමානව තමයි තෝරා, පරව්, ගල් මාළු හා කුඩා මාළුවල මිල අඩු වෙලා යන්නේ. රුපියල් 500ට තිබුණු කෙලවල්ලන් මිල ජනාධිපතිතුමා කිව්වා 490කට වාගේ ගෙනෙන්න කියලා. දැන් අපි 430ක් දක්වා ගෙනැල්ලා තව රුපියල් 60ක් අඩු කරලා තිබෙනවා.

ශ්‍රී ලංකාවේ මත්ස්‍ය පරිභෝජනයේදී වැඩිම ඉල්ලුමක් ඇත්තේ ටූනා වර්ගයේ මසුන්ටයි. ධීවර සංස්ථාවේ සමස්ත අලෙවියෙන් සියයට 40ක් ටූනා වර්ගයේ මසුන්ට තිබෙනවා. දැන් ඒ අනුව අපි මේකට කළේ මොකද? මම මේ අමාත්‍යාංශය භාර ගන්න කොට අපනයනකරුවන්ගෙන් සියයට 5ක මාළු ප්‍රමාණයකුයි ධීවර සංස්ථාව ගත්තේ. ඒ නිසා ධීවර සංස්ථාවට මාළු තිබුණේ නැහැ. මම ඒ ගොල්ලොත් එක්ක සාකච්ඡා කරලා බොහොම අමාරුවෙන් ඒක සියයට 10ක් කර ගත්තා. ඒ අනුව අපනයනකරුවන් හොඳ කෙලවල්ලන් මාළු සියයට 10ක ප්‍රමාණයක් අද ධීවර සංස්ථාවට ලබා දෙනවා. මම ඒ නියෝග ගැසට් කරලා ගෙනාවාට තවම නීතියක් වුණේ නැති නිසා තමයි අද අනුමැතිය සඳහා ගෙනෙන්නේ.

අපේ පළමුවැනි ටින් මාළු කර්මාන්තශාලාව අගෝස්තු මාසයේ අපේ ධීවර සංස්ථාවත් එක්ක ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස දේශීය නිෂ්පාදකයෙක් ආරම්භ කරනවා. අපේ විශාල cold room එකක් තිබෙනවා, ගාලු වරායේ. ඒක පාවිච්චි කරලා දවසකට මාළු ටින් 10,000ක් නිෂ්පාදනය කරන පළමුවැනි ටින් මාළු කර්මාන්තශාලාව එන මාසයේ ගාල්ලේදී අපි විවෘත කරනවා. ඒ වාගේම මම විදේශීය සමාගම් කිහිපයකටම කථා කරලා තිබෙනවා. අපිට ටින් මාළු කර්මාන්තශාලා 4ක්, 5ක් විතර ඕනෑ වෙනවා. මොකද, අපි මාසයකට මාළු ටින් මිලියන 10ක් විතර ලංකාවට ගෙන්වනවා. ඒ නිසා විශාල වශයෙන් විදේශ විනිමයක් අපෙන් නැති වෙලා යනවා. ටින් මාළු කර්මාන්තය මෙහි ආරම්භ කරලා ඒ ටින් මාළු ආනයනය අපි නවත්වා ගන්නට ඕනෑ. දැන් අපිට ආරංචි වෙනවා, මේ සියයට 10 පන්නන්නට සමහරුන් ජාත්‍යන්තර මුහුදෙන් මාළු ගෙනැල්ලා, අපේ මුහුදට ඇවිල්ලා, අපේ වෙන බෝට්ටුවල දාලා, වෙන වෙන තැන්වලට යවනවා කියලා. ඒ නිසා මේ නියෝගයයි අපි යෝජනා කරන්නේ,

"ශ්‍රී ලංකා ජල තීරය තුළදී කවර හෝ දේශීය හෝ විදේශීය ධීවර බෝට්ටුවකට පැටවීම, මාරු කිරීම හෝ ප්‍රතිනැව්ගත කිරීම නොකළ යුතුයි." කියලා. අපිට මේ සියයට 10 ගන්න පුළුවන් වෙන්නේ ලොකු යාත්‍රාවලින් පමණයි. ඒ ලොකු යාත්‍රා එන්න පුළුවන් මෝදර වරායට විතරයි.

එතකොට මෝදර තමයි මේ ක්‍රමය තිබෙන්නේ. අපට හැම වරායකම මේ ක්‍රමය ක්‍රියාත්මක කරන්නට බැහැ. ඒ නිසා සමහරු හඳනවා හොර පාරෙන් වෙනත් ඒවාවලින් ගෙනැල්ලා මේකෙන් පිට පනින්න. ඒක නැවැත්වීම සඳහායි අපි මේ එක නියෝගයක් ගෙනැවිත් තිබෙන්නේ. අනෙක, සියයට 5 ගාස්තුව සියයට 10 කිරීම සඳහායි. මෙන්න මේ නියෝග හතර තමයි අපි අද තමුන්නාන්සේලාට ඉදිරිපත් කරන්නේ. මේකෙන් අපි බලාපොරොත්තු වන්නේ කාටවත් අපහසුවක් කරන්න නොවෙයි. මේවා මෙම කර්මාන්තය දියුණු කරන්න ගන්නා වූ ක්‍රියාමාර්ග. මොකද, තමුන්නාන්සේලා දන්නවා මේ රටේ ධීවර කර්මාන්තය තියා කිසිම දෙයක් අද ජාත්‍යන්තරයත් එක්ක සම්බන්ධ වෙන්නේ නැතිව කරන්න බැහැ කියන එක. ජාත්‍යන්තර ප්‍රමිතියට අපි ගෙනෙන්නට ඕනෑ.

ඇත්තටම මම මේ අමාත්‍යාංශය භාර ගන්න කොට බොහොම නරක තත්ත්වයක් තිබුණේ. අපි ඉන්දියානු සාගර ටූනා කොමිසමේ සාමාජිකයින්. දැනට මම පත් කරලා තිබෙනවා නාරා ආයතනයේ සභාපති ආචාර්ය හිරාන් ජයවර්ධන මහතා. එතුමා තමයි පළමුවැනි යෝජනාව ගෙනාවේ ඉන්දියානු සාගර ටූනා කොමිසම ගෙනෙන්න. ඒ, එතුමාගේ IOMAC කියන සංවිධානය හරහා. ඒක එක්සත් ජාතීන්ගේ සංවිධානය භාර අරගෙන, පිහිටුවන කොට පළමුවෙන්ම පිහිටුවූවේ අපේ නාරා ආයතනයේ. නමුත් අපේ පසු ගිය රජයන්වල තිබුණු වැරදි නිසා පසු කලෙක ඒක නාරා ආයතනයෙන් ගිලිහිලා ගිහිල්ලා Seychelles වලට ගියා. මහාචාර්ය වන්නිනායක, මහාචාර්ය ඔස්කා අමරසිංහ වැනි අය මේ ධීවර කර්මාන්තයට විශාල උනන්දුවකින් වැඩ කරපු කට්ටිය. ඒ නිසා අද මම නැවතත් ආචාර්ය හිරාන් ජයවර්ධන මහතා, ලංකාවේ පළමුවෙන් බෙල්ලන් පිළිබඳ ගවේෂණය කරපු අපේ වයඹ විශ්වවිද්‍යාලයේ පීඨාධිපති මහාචාර්ය වන්නිනායක මහතා -ඒ ඔක්කෝම- ගෙනැල්ලා සියලුම මත්ස්‍ය වගාවන් ආරම්භ කිරීමට වැඩ පටන් අරගෙන තිබෙනවා. අපි කින්නියාවල ආරම්භ කරලා තිබෙනවා පළමුවැනි බෙල්ලන් වගාව. රුපියල් 25,000යි වියදම වන්නේ. රුපියල් ලක්ෂ දෙකහමාරක් ලංකාවේ වෙළෙඳ පොළෙන් ලැබෙනවා. ඒ ධීවරයින්ට ඒ වියදම් වන මුදල මෙන් දහගුණයක වෙළෙඳ වටිනාකමක් ලැබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ටූනා කොමිසමේ සාමාජිකත්වය ලබා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා රජය කොච්චර මුදල් ප්‍රමාණයක් ගෙවන්න ඕනෑද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඉන්දියානු සාගර ටූනා කොමිසම පත් කරද්දී, අපි එක්සත් ජාතීන්ගේ සාගර ප්‍රඥප්තියට අත්සන් කරලා තිබෙනවා. ඉන්දියානු සාගරය බලා ගන්නේ මේ ඉන්දියානු සාගර කොමිසමයි. නමුත් මම එනකොට 2007 ඉඳලා අපේ රටේ කවුරුවත් මේ ඉන්දියානු සාගර ටූනා කොමිසම නියෝජනය කරලා නැහැ. මට බොහෝ අය කිව්වා, අපේ ජාතික කොඩිය ලෙළ දෙනවා. නමුත් කිසිම කෙනෙක් මේ කොමිසම ඉදිරියේ නැහැ කියලා. ඒ වාගේම ඒ ගොල්ලන්ට අපි යවන්න ඕනෑ වාර්ෂික වාර්තා. අපේ බෝට්ටු ප්‍රමාණය කීයද, ඒ බෝට්ටුවල දිග ප්‍රමාණය කීයද, පළල ප්‍රමාණය කීයද, පාවිච්චි කරන දැල් මොනවාද, මේවා නීතිවිරෝධී ඒවාද, නැද්ද කියන එක සම්බන්ධයෙන්.

ඒ අයගේ තිබෙනවා IUU -Illegal, Unreported and Unregulated.- කියලා category එකක්. ඒ කියන්නේ වාර්තා කරන්නේ නැතිව හොරෙන් පවත්වාගෙන යන ඒවා. එතකොට අපිව හඳුනා ගෙන තිබුණේ ඒ වෙනකොට සෝමාලියානු රාජ්‍යය වාගෙයි. මොකද, අපේ කවුරුවත් එම කොමිසම නියෝජනය කළේ නැති නිසා මොවුන් නොයෙකුත් චෝදනා අපට දැම්මා. ඒ චෝදනාවලට උත්තර දෙන්න අපේ රටේ නියෝජනයක් එතැන නැහැ.

අපි රුපියල් ලක්ෂ 40ක් වාර්ෂිකව ගෙවනවා. මම පළමුවෙන්ම කෝබේ 2 සමුළුවට ගියා. ඇත්තටම මම උත්සාහ කළා නිලධාරියකු යවන්න. ඒ, ඒ වනකොට මට ඒ ගැන හරිම අවබෝධයක් තිබුණේ නැති හින්දායි. මොකද ඒ වනකොට මා පත් වෙලා මාස දෙකයි. නමුත් ඒ ගොල්ලෝ කිව්වා, අමාත්‍යවරයකු මට්ටමෙන්ම එන්න ඕනෑ කියලා. ඒ ගොල්ලන්ට තිබුණා අපේ රටත් එක්ක විශාල ප්‍රශ්න. ඒ වෙලාවේදී එතැනදී බොහෝ දරුණු ප්‍රහාරයන්ට මුහුණ දෙන්න මට සිද්ධ වුණා. ඒ, අපේ රට හා සම්බන්ධ සාගර ප්‍රශ්න පිළිබඳවයි.

එකක් තමයි අපේ රටේ යාත්‍රා නීති විරෝධීව වෙනත් රටවලට -ඉන්දියාව, ඩියාගෝ ගාෂියාව, මාෂල් අයිලන්ඩ්ස් වාගේ තැන්වලට- ගමන් කිරීම. යුරෝපා සංගමයේ සාමාජික රටවල් තිබෙනවා. ඒ ගොල්ලන් කියන්නේ European Waters, British Waters -බ්‍රිතාන්‍ය මුහුද- කියලායි. මාෂල් අයිලන්ඩ්ස් ඒ ගොල්ලන්ගේ දූපතක්. ඩියාගෝ ගාෂියා ඒ ගොල්ලන්ගේ කොලනි. ඒ කොලනි අල්ලා ගෙන ඒ ගොල්ලෝ ඒ ගොල්ලන්ගේ අයිතිය ප්‍රකාශ කරනවා. ඒ ගොල්ලන් විශාල ව්‍යාපාරයකට ඇවිල්ලා කථා කළා. නමුත් මම පෙන්වා දුන්නා ඒ වෙනකොට යුරෝපා සංගමය ඇවිල්ලා ඉන්දියානු සාගරය වනසන විශාල වැඩ පිළිවෙළ. අන්තිමේදී මම ඔවුන්ට කිව්වා, "ලංකාවට එන්න, ඇවිල්ලා දැන් තත්ත්වය බලා ගන්න. මෙතෙක් කල් සිදු වූ දේවල් ගැන කථා කරන්නේ නැතිව දැන් අප ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද කියලා බලන්න." කියලා. ඒ අනුව ඒ විධායක ලේකම්වරයා ඇවිල්ලා ඉතාම සතුටු වුණා. අවසානයේදී මම ගිය අවුරුද්දේ මාර්තු මාසයේ ඉල්ලීමක් කළා, අනෙක් IOTC සැසි වාරය ලංකාවට ගෙනෙන්න කියලා. ඔවුන් සාකච්ඡා කරලා අවසානයේදී ඒ අවස්ථාව අපට ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, ඔවුන් අපේ රටේ වර්තමාන තත්ත්වය ඉතාම ප්‍රශංසනීයයි කියන සහතිකය අපට දීලා ඉන්දියානු සාගර කොමිසමේ සැසි වාරය මාර්තුවල පවත්වන්න පළමුවැනි වරට අපේ රටට අවස්ථාව දුන්නා. ඒකට රටවල් 28න් 25ක් සහභාගි වුණා. වැඩිම සහභාගි වීම පෙන්නුම් කරමින් අමාත්‍යවරුන් ඇතුළුව 250ක නියෝජිත පිරිසක් එයට සහභාගි වුණා. ඒ එක්කම මා කියන්න ඕනෑ මේ 28 වැනිදා සහ 29 වැනිදා ලංකා ඉතිහාසයේ පළමුවැනි වරට FAO එකේ -ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ- ආසියානු සැසි වාරය අපේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ලංකාවේ පවත්වන බව. ඒ තමයි FAO එකේ සම්මේලනයක් පළමුවෙන්ම පවත්වන්න ලංකාවට ලැබෙන අවස්ථාව. ඒ, 28, 29 දෙදිනයි. ඒ අනුව අද ඔවුන් පිළිගෙන තිබෙනවා ලංකාවේ ධීවර කර්මාන්තය ජාත්‍යන්තර තලයේ තිබෙන ඉතාම දියුණු රටක තිබෙන ධීවර කර්මාන්තයක් ලෙස.

මේ තත්ත්වයට අප අපේ රටේ ධීවර කර්මාන්තය ගෙනෙන්න ඕනෑ. එහෙම නැත්නම් අපට විශාල ගැටීම්වලට යන්න වෙනවා. මේවායේ සාමාජිකත්වය අපි දරනවා. මෙහි තිබෙනවා Infofish කියලා ලෝක සංවිධානයක්. එහි හිටපු ආචාර්ය සුභසිංහ මහත්මයාට මම එහේදී ආරාධනාවක් කළා. දැන් එතුමා ඇවිල්ලා මගේ උපදේශකවරයා වශයෙන් ක්‍රියා කරනවා අපේ මත්ස්‍ය අපනයනය දියුණු කිරීම සඳහා. එතුමා Director-General වශයෙන් අවුරුදු 15ක් ක්‍රියා කළා. ඒ අය ගෙනැල්ලා අද එවැනි

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

තත්ත්වයකට ලංකාවේ ධීවර කර්මාන්තය ගෙනාපු නිසා අපට පැහැදිලි අනාගතයක් තිබෙනවා.

අපි දන්නවා, 2013 දී අපේ ඉලක්කවලට අපි ගමන් කරනවාය කියා. ඒ විතරක් නොවෙයි ගිය අවුරුද්දේ අපේ මත්ස්‍ය නිෂ්පාදනයේ අප ඉලක්කගත කළ ඒවායින් සියයට 94ක් 2010 අවසාන වෙනකොට අප ලබා ගෙන තිබෙනවා. ඒ වනකොට අපි අමාත්‍යාංශයට ඇවිල්ලා මාස හයයි ගත වෙලා තිබුණේ. අපි ගිය අවුරුද්දේ සියයට 94ක ඉලක්කයක් පහු කළා. මෙට්‍රික් ටොන් 4,04,932ක් ලබා ගත්තා. මෙට්‍රික් ටොන් 4,05,000කට කිට්ටු ප්‍රමාණයක් අපි නිෂ්පාදනය කළා. මෙට්‍රික් ටොන් 3,39,000 ඉඳලා එතරම් ප්‍රමාණයක් වැඩි කර ගත්තා. මේ අවුරුද්දේ ඉලක්කය මෙට්‍රික් ටොන් 2,26,000යි. මේ වනකොට අපි මෙට්‍රික් ටොන් 2,05,410ක ඉලක්කයක් කරා ගමන් කර තිබෙනවා, සියයට 90.9කට. මේ අනුව ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදන ඉලක්කවලින් සියයට 74.4ක් අපි ලබා ගෙන තිබෙනවා. වෙරළාසන්නව සියයට 111.3ක ඉලක්කයකට ගිහින් තිබෙනවා. ජල ජීවී වගාව සියයට 73.8ක් දක්වා ගිහින් තිබෙනවා. අපේ රටට ධීවර යාත්‍රා 45,613ක් තිබෙනවා. ඒකෙන් 41,817ක් වෙරළාසන්නවයි යාත්‍රා කරන්නේ. 3,346ක් ගැඹුරු මුහුදේ යාත්‍රා කරනවා. 2011 පළමුවන මාය හය තුළ අපේ අපනයනය සියයට 67කින් වැඩි වෙලා තිබෙනවා. මතක තියා ගන්න, GSP අයිතිය නැතිව තමයි මේ වර්ධනය. GSP එක තිබෙන ප්‍රමාණයට පස්සේ වැඩියෙන් අපි මේ වර්ධනය -සියයට 67ක්- ඇවිල්ලා තිබෙන්නේ.

අපි හැම බහුදින යාත්‍රා හිමියෙක්ම ගෙනල්ලා ඒ අය එක්ක කතා කළා. දැන් තිබෙන අලුත්ම, හොඳම ක්‍රමය තමයි RSW සහ CSW. RSW කියන්නේ Refrigerated Sea Water කියන එකයි. දැන් අපි මාළුවාව ගෙනෙන්නේ අයිස් දමලායි. එතකොට මාළුවා තැලෙනවා. ඒ වාගේම මාළුවා සීරෙනවා. එහෙම වුණාම මාළුවාගේ ගුණාත්මක අගය අඩු වෙනවා.ඒක අපේ අපනයනවලට බලපානවා. ඒ නිසා අපි ඒ අයට උදව් කළා, ඒ ගොල්ලන්ගේ යාත්‍රාවල ශීතකරණ පද්ධතිය RSW ක්‍රමය අනුව සකස් කරන්න.

මම සන්තෝෂයෙන් කියනවා, මේ වනකොට අපට RSW යාත්‍රා 94ක් තිබෙන බව. අපි ඒ සඳහා ධීවර ව්‍යාපාරිකයන් 94 දෙනෙක් කතා කර ගත්තා. මෝදරදී මම පළමුවන යාත්‍රාව දියඹට යැව්වා. මේ මාස ගණනාවට යාත්‍රා 94ක ශීතකරණ අයින් කළා. ඒක කරනකොට ඔවුන්ට පාඩුයි. මොකද, ඒ සඳහා කාලයක් ගත වෙන නිසයි. එතකොට ඒ යාත්‍රා දියඹට යවන්න බැහැ. නමුත් ඔවුන් ඒ ක්‍රමයට එකඟ වුණා. ඒකෙදි මාළුවා ඉන්නේ වතුරේයි. නමුත් වතුරේ උෂ්ණත්වය minus 4යි. ඒ කියන්නේ, අංශක සෘණ හතරක ප්‍රමාණයකට ඒ මාළුවා ශීතල වෙනවා. එතකොට ගොඩට ගෙනාවාම ඒ වෙලාවේම අල්ලපු මාළුවකුගේ වාගේ ගුණාත්මකභාවය හොඳින් තිබෙනවා.

අපනයනය කිරීමේදී එම මාළුවලට විශාල ඉල්ලුමක් තිබෙනවා. එංගලන්තයට ගිය වෙලාවේදී මේ රටේ මාළු ආනයනය කරන සියලුම ඒරටේ සමාගම් හමු වුණා.

ඒ කියන්නේ Marks and Spencer, Tesco එක, එතකොට, Sainsbury, Seafish, Eurofish කියන සමාගම් පහ. ඒවා තමයි මුළු යුරෝපයටම මාළු බෙදා හරින දැවැන්ත බහුජාතික සමාගම් පහ. මම එතැනට ගිහින් වාඩි වෙනකොටම ඒ ගොල්ලෝ කිව්වේ "We have a basketfull of allegations against you all" කියලායි. මම ඒකට හිනා වෙලා අපි අරගෙන තිබෙන ක්‍රියාමාර්ග, දියුණුව පිණිස ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළවල්, ඒ ඔක්කොම ඒ අයට ඉදිරිපත් කළා. මේ සියල්ලම ඉදිරිපත් කරලා මම ඇහුවා, "Have you got anything more?" කියලා; "ඊට වඩා වැඩිපුර මොනවා හරි තිබෙනවාද?" කියලා. ඔවුන් කිව්වා, නැහැ, -Excellent! - අති ප්‍රශංසනීයයි! කියලා.

ගරු කථානායකතුමනි, අන්තිමට ඔවුන් ඔක්කොම කථා කර ගත්තා අපට උදවු කරන්න. එහෙම කථා කරලා ඔවුන් ජාත්‍යන්තර නිරීක්ෂක කණ්ඩායමක් එව්වා. දැන් ඒ ගොල්ලෝ ඇවිල්ලා ලංකාවේ වැඩ. පසු ගිය පෙබරවාරි මාසයේ තමයි ඒ ගොල්ලන් එවන්න පොරොන්දු වුණේ. ඒ ගොල්ලන්ගේ මුදල් ගෙවන්න අපේ ව්‍යාපාරිකයන් එක්ක අප කථා කර ගත්තා. ඒ මුදල් ප්‍රමාණය අපේ අපනයනකරුවන් ගෙවනවා. පළමුවෙන්ම ඒ ගොල්ලන් pre-assessment එක කරනවා. අගෝස්තු මාසය වෙනකොට ඒ pre-assessment එක ඉවර කරනවා. ඊට පස්සේ ඒ ගොල්ලෝ assessment එකකට යනවා. අපට දෙනවා pre-assessment එක, වාර්තාව. අප ඒකට අනුව ඉතිරි දියුණු කිරීම් කළාට පස්සේ අපේ දියුණුව හා ඒවා ක්‍රියාත්මක වීම පිළිබඳව ඒ ගොල්ලෝ assessment එකක් කරනවා. ඒක කරලා මේ අවුරුද්ද අගදී හෝ එන අවුරුද්ද මුල වෙනකොට ඒ ගොල්ලෝ අපට දෙනවා Marine Certificate කියන එක. ඒක තමයි සාගර සහතිකය. ඒක දුන්නාට පස්සේ ඒ ගොල්ලෝ අපට පොරොන්දු වුණා අපේ මුළු මත්ස්‍ය ප්‍රමාණයම -අපේ exportsවල තිබෙන, අපට නිෂ්පාදනය කරන්න පුළුවන් හැම කිලෝ එකක්ම- ඒ ගොල්ලෝ ගන්නවා කියලා.

ගරු කථානායකතුමනි, එහෙම කරනවා විතරක් නොවෙයි ලංකාව යුරෝපයේ පළමුවෙනි මත්ස්‍ය අපනයනකරුවා බවට පත් කරනවා කියලා ඔවුන් මට සහතික වුණා. ඒ අනුව තමයි අප දැන් ක්‍රියාත්මක වන්නේ. අපේ අපනයනකරුවන් එක්ක එකතු වෙලා ඔවුන්ට තව තවත් අප උදවු කරලා අපි ඒ වෙළෙඳ පොළ අල්ලා ගන්න ඕනෑ. මේ ක්‍රමය තුළ තමයි අපේ අපනයනයන් සියයට 67කින් -ජීඑස්පී සහනයත් නැතිව අලාභදායී තත්ත්වයක තිබියදී, සියයට 18ක් අප පාඩු විඳිද්දීත්- වැඩි කර ගන්න අපට පුළුවන් වුණේ. මෙන්න මේක දියුණු කිරීම සඳහා තමයි ගරු කථානායකතුමනි අද අප ධීවර හා ජලජ සම්පත් පනත යටතේ මේ නියෝගය ඉදිරිපත් කරන්නේ.

ගරු කථානායකතුමනි, අපේ අතිගරු ජනාධිපතිතුමා මට මේ සඳහා සෙවණැල්ලක් වාගේ ඉඳ ගෙන උදවු කරනවා. මොකද මේක එතුමාගේ හොඳම සහ ජනප්‍රියම විෂයය. මට හමු වුණා FAOගේ Secretary-General. එතුමා හුඟක් කථා කළේ අපේ හිටපු ධීවර ඇමතිතුමා -වර්තමාන අතිගරු ජනාධිපතිතුමා- ගැනයි. එතුමා ඉතාමත්ම විශිෂ්ට අන්දමින් ධීවර කර්මාන්තය දියුණු කළාය කියලා ඔහු කිව්වා. එතුමා 26 වැනි දා ලංකාවට එනවා මේ සම්මේලනයට සහභාගි වන්න. එතුමා කිව්වා එහි දී අපේ අතිගරු ජනාධිපතිතුමා දැක බලා ගන්න ඕනෑය කියලා. එතුමා මේ කර්මාන්තයේ මට තිබෙන සියලු බාධක ඉවත් කරලා දුන්නා.

Trawling ක්‍රමය පිළිබඳව මා එතුමාත් එක්ක කථා කළා. කැබිනට් මණ්ඩලයේදී කථා කරලා ඉවර වෙලා මම කිව්වා, "මෙන්න මෙහෙම ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා අතිගරු ජනාධිපතිතුමනි, මේ trawling ක්‍රමය නිසා" කියලා. එතුමා කිව්වා, "වහාම තහනම් කරන්න රාජිත, මම පුළුවන් තරම් හැදුවා තහනම් කරන්න. නමුත් අපේ දේශපාලකයෝ හින්දා තහනම් කර ගන්න බැරි වුණා" කියලා. අතිගරු ජනාධිපතිතුමා එහෙමයි කිව්වේ. එහෙම කියලා ඒ කට්ටියගේ නම් කිව්වා. ඒ, තහනම් කරන්න විරුද්ධ වුණු අයගේ. ඒක නිසා මට කර ගන්න දෙයක් නැහැ. මමත් අත ඇරලා තිබුණේ. නමුත් මම ප්‍රතිපත්තියක් වශයෙන් සියලුම වර්ගයේ trawling තහනම් කළා. මම කිව්වා "මීගමුවේ සහ කල්පිටියේ මට මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා, නොයෙකුත් අයගේ බලපෑම් තිබෙනවා" කියලා.

එතුමා පැහැදිලිව කිව්වා, කිසිම බලපෑමකට යටත් වෙන්න එපා, ඔබතුමා ඕක ක්‍රියාත්මක කරන්න කියලා. තවදුරටත් එතුමා කිව්වා, එතුමා හොඳටම අධ්‍යයනය කරලා තිබෙනවා මේකේ තිබෙන අපරාධය; මේකේ තිබෙන විනාශය, ඒ නිසා බය නැතුව ක්‍රියාත්මක කරන්න කියලා. අද මට මේ ජනාධිපතිතුමාගෙන් ලැබෙන සහාය ධීවර ඇමතිවරයා වශයෙන් එදා එතුමාට එවකට

හිටපු ජනාධිපතිවරයකුගෙන් නම් ලැබුණේ නැති බව මම දන්නවා. මට ජනාධිපතිතුමාගෙන් ලැබෙන සහාය නිසා මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යැම මට ඉතාමත් පහසු වෙලා තිබෙනවා.

මේ වැඩ පිළිවෙළත් එක්කම අපි බේරුවල පළමුවැනි marina එක ආරම්භ කරනවා. බේරුවල තමයි ලංකාවේ තිබෙන පළමුවැනි ධීවර වරාය. මේක තමයි පෞරාණිකම ධීවර වරාය. රෝමයට පවා අපේ රටින් ගියේත්, මේ රටට ගොඩ බැස්සේත් බේරුවල වරායෙන්. බේරුවල වරායේ එක කොටසක සංචාරක ව්‍යාපාරයේ yacht කර්මාන්තයක් අපි ආරම්භ කරනවා. එහි marina එකක් හදලා ඒකේ aquarium එකක්, exhibition centre, business centre, museum කියන මේවා තිබෙන අංග සම්පූර්ණ ගොඩනැඟිලි සංකීර්ණයක් සහ හෝටල් සංකීරණයක් හදනවා. ඒකත් එක්ක අපි ලංකාවේ පළමුවැනි වරට ආරම්භ කරනවා, ලෝකයේ දියුණු යුරෝපීය රටවල තිබෙනවා වාගේ සංචාරක ව්‍යාපාරයත් එක්ක ඒකාබද්ධිත වූ ධීවර කර්මාන්තයක්. ඒ අනුව අපි බලාපොරොත්තු වනවා ඉන්දියාව, මාලේ, සිංගප්පූරුව වැනි රටවලට ඒ yacht services ආරම්භ කරන්නට. මේ අවුරුද්ද ඉවර වෙන්න ඉස්සෙල්ලා විදේශ ව්‍යාපාරිකයන් සම්බන්ධ කර ගෙන ඒ වැඩ පිළිවෙළ අපි ආරම්භ කරනවා.

ධීවර කර්මාන්තය දියුණු කරන්නට හැකි සෑම අංශයකටම අපි අද යොමු වෙලා තිබෙනවා. අපේ පර්යේෂණ ඉතාමත් ඉහළ මට්ටමකට අපි ගෙනැල්ලා තිබෙනවා. නාරා ආයතනයේ ඉතා හොඳ විශේෂඥයන් පිරිසක් අද ඉන්නවා. අපට පර්යේෂණ සහායකවරුන් 40 ගණනක් ඕනෑ. අපේ පර්යේෂණ වැඩි කරන්නට අපි පසු ගිය කාලයේ 18 දෙනෙක් අලුතෙන් ගත්තා. අද ඉතාමත් හොඳ වැඩ පිළිවෙළක් ඔවුන් ගෙන යනවා. මේ සියලුම ඒවායින් අපි බලාපොරොත්තු වන්නේ 2013 අපේ ඉලක්කයට යාමටයි.

ඊ ළඟට, අපේ මිරිදිය කර්මාන්තය ගැන බලමු. අපි බලාපොරොත්තු වනවා, ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය සියයට 194කින් ඒ කියන්නේ තුන් ගුණයකින් වැඩි කරන්නට. ඒ වාගේම මිරිදිය කර්මාන්තය අපි දෙගුණයකින් වැඩි කර ගන්නට එනම් සියයට සියයකින් වැඩි කර ගන්නට බලාපොරොත්තු වනවා. ගරු කථානායකතුමනි, මිරිදිය කර්මාන්තය ගැන කථා කරන විට වියට්නාමය එක දවසකට මිරිදිය මාළු - Cat fish කියන මාළුවා- ඩොලර් මිලියන එකක් වටිනා ප්‍රමාණයක් අපනයනය කරන බව කියන්නට ඕනෑ. අපේ වැඩ සැලැස්මට අනුව 2013 වන කොට අපේ ඉලක්කයට යන්න අපි කාලීන ජලාශ 12,000න් 8,000ක් අර ගෙන තිබෙනවා, ඒ හැම ජලාශයකම මිරිදිය මාළු නිෂ්පාදනය ආරම්භ කරන්න. මෙන්න මේ විධියට අපි මුහුදු -කරදිය- මාළු විතරක් නොවෙයි, මිරිදිය මාළු පවා අලෙවි කරන්න බලාපොරොත්තු වෙනවා. දැනටත් අපේ ධීවර සංස්ථාවේ බොහෝ අලෙවි සැල්වල අපි මිරිදිය මාළුත් -තිලාපියා, කැට් ෆිෂ්, ලූලා- විකිණීමේ කටයුතු කරනවා. ඒවා ඉතාමත් ම ජනප්‍රිය වෙලා තිබෙනවා.

මේ අනුව අද අප ගෙනෙන මේ ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග හතරම උපයෝගී කර ගෙන 2013 මේ රටේ මත්ස්‍ය කර්මාන්තයේ දේශීය වෙළඳ පොළට අවශ්‍ය මත්ස්‍ය ප්‍රමාණය වන මෙට්‍රික් ටොන් හයලක්ෂ අසූපන්දාහේ ඉලක්කය කරා අප ගමන් කරනවාය කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරනවා. ඒ සඳහායි මා මේ නියෝග ගෙන එන්නේ. අද මේ නියෝග සම්මත කර ගැනීම සඳහා මට තමුන්නාන්සේලාගේ උදවු උපකාර ලබා දෙන්නටය කියා පාර්ලිමේන්තුවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් මා ඉල්ලා සිටිනවා. ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[ අ.භා. 2.15]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී විනාඩි තුන හතරක් හෝ මට කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මගේ පාර්ලිමේන්තු සගයෙක් වන ගරු රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ධීවර අමාත්‍යාංශය ගැන වචන කිහිපයක් කථා කරනවාට වඩා මේ අවස්ථාව උපයෝගී කර ගෙන රටේ තිබෙන වැදගත් ප්‍රශ්නයක් මතු කරන්නයි මා බලාපොරොත්තු වන්නේ. ධීවර අමාත්‍යතුමා මහන්සියෙන් වැඩ කර ගෙන යන බව පෙනෙනවා. ඒකට උදවු කරන්න එතුමාට ගණපූරණයවත් ලබා දෙන්නේ නැති අවස්ථාවක ගරු අමාත්‍යතුමාට හය නැතිව වැඩ කර ගෙන යන්නය කියා මා කියනවා. ඒක ආණ්ඩුවෙන් ලැබුණේ නැති වුණත් අප මෙහෙන් ලබා දෙන්නම්.

මේ මාළු ටික අල්ලන්න යන විධිය පෙන්නුවා නම් හොඳයි. අපේ ලංකාව වටාම තිබෙන මුහුදේ මාළු ටික වයසට පත් වෙලා මැරෙන එක නවත්වලා දැන් පුළුවන් තරම් ඉක්මනට අල්ලා ධීවර කර්මාන්තය දියුණු කරන සලකුණු පේන්නට තිබෙනවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. ගරු කථානායකතුමනි, මේ මාළු අල්ලා ගත්තාට පස්සේ විකුණන්නට තිබෙන්නේ පාරිභෝගිකයන්ටයි.

අද උදේ මම මේ ගරු සභාවේ නැඟිට ප්‍රශ්නයක් අහන්නට ගියේ මොකද? කොළඹ දිස්ත්‍රික්කයේ ගෙවල් ගණනාවක් කඩන්නට පටන් අර ගෙන තිබෙනවා. ඉතාමත් ශෝකජනක කාරණාවක් හැටියටයි මා මේක කියන්නේ. හැව්ලොක් පාරේ අංක 507, අංක 509, අංක 660 දරන නිවෙස්වල ඉන්න ලක්ෂ්මන්, කුසුම්, විමලාවතී යන අයට ඒ ගෙවල්වලින් අයින් වෙන්න කියලා ඊයේ දැනුම් දීලා තිබෙනවා. ලක්ෂයක දෙකක චෙක් එකක් ගෙනැවිත් දීලා පැය අටක්වත් යන්නේ නැතිව අද මාර්ග සංවර්ධන අධිකාරිය මේ අයගේ ගෙවල් කඩන එක බලා ඉඳලා තමයි මම මෙතැනට ආවේ. ධීවර ඇමතිතුමා මාළු ටික මහන්සියෙන් අල්ලලා කාට ද විකුණන්නේ, කට්ටිය නැත්නම්? එක පැත්තකින් පාරිභෝගිකයනුත් ඉන්න ඕනෑ නේ මේක දියුණු කරන්න. එම නිසා මේ අවස්ථාවේදී මා ඉතාමත් ඕනෑකමින් මේ කැබිනට් මණ්ඩලයට මතක් කරනවා මේ වාගේ අමානුෂික ක්‍රියා කරන්න එපාය කියා. ඒ වාගේම උතුරු කොළඹ, මෝදර ගෙවල් 58කට ඇවිත් ලේබල් ගහලා ගිහින් තිබෙනවා, තව සුමාන දෙකකින් මේවා අයින් කරනවාය කියා. ඒවා ඉලක්ක කර තිබෙන්නේ පත්තරයේ තිබෙන හැටියට චීන කොම්පැනියකට. අපේ ලංකාවේ කම්කරුවෝ නැද්ද?

දැන් චීනයෙන් වැඩකරුවෝ ගෙනැල්ලා තිබෙනවා. අපි මේක හෙළිදරවු කළාම කිව්වා චීනයේ වැඩකරුවෝ ඕනෑ නැහැ කියලා. දැන් චීනයේ වැඩකරුවෝ ගෙනැල්ලා වරාය ඇතුළේ වැඩ කරන නිසා පරක්කු වෙනවා.

මම සුමාන හය-හතකට ඉස්සෙල්ලා ඇමතිතුමා උතුරු කොළඹ, මෝදර ඒ ස්ථානවලට එක්ක ගෙන ගිහිල්ලා ඒ තිබුණු ප්‍රශ්නය නිරාකරණය කරන්න හැදුවා. එතුමා ඉතාමත් වෙහෙස මහන්සියෙන් සිටි අවස්ථාවක ඒ වෙහෙස මහන්සිය පැත්තකට දාලා ඒ ගැන සාකච්ඡා කරලා ඒකේ සාර්ථක ප්‍රතිඵලයක් අමාත්‍යාංශයෙන් ලැබුණාට, ආරක්ෂක අමාත්‍යාංශයෙන් තවම සාර්ථක පිළිතුරක් ලැබිලා නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

මේකේ තිබෙන අන්තර්ගතය මොකක්ද? මේ අහිංසක පවුල් 25ක් පදිංචිව සිටින ගෙවල් නේද මේ කඩන්නේ? මේ වාගේ දවසින් දවස ගෙවල් කඩමින් ගිහිල්ලා අන්තිමට ලොකු ප්‍රශ්නයක්

[ගරු රවි කරුණානායක මහතා]

ඇති වෙනවා. එක පැත්තකින් මේ රටේ ප්‍රශ්න ටික විසඳා ගෙන යන අවස්ථාවක ඇයි මේ වාගේ දේවල් කරලා ආයෙත් ජනතාව කුලප්පු කරන්න හදන්නේ කියන එක මම මේ අවස්ථාවේදී ඒ අය වෙනුවෙන් අහනවා. ඔවුන් වෙනුවෙන් හඬක් නගන්න බැරි අවස්ථාවක අඩු ගණනේ පාර්ලිමේන්තුවේදී ධීවර අමාත්‍යාංශය යටතේ මම මේ හඬ නගන්නේ ඒ අයගේත්, අනෙක් අයගේත් ආරක්ෂාව සම්බන්ධයෙන්ය කියන එක මතක් කරන්න කැමැතියි.

මම ඉතාමත් දුකෙන් තවත් කාරණයක් මතක් කරනවා. එනම් ලුම්බිණි පාසලේ ඉගෙන ගන්නා ලක්ෂාන් මෙනෙවිය තව සුමානයකින් විභාගයට පෙනී සිටිනවා. ඒ සිසුවියට දැන් පාඩම් කරන්න ගෙයක් නැහැ. ඉතින් මේ වාගේ දේවල්වලින් ආණ්ඩුව මොකක්ද කරන්න හදන්නේ? එක ප්‍රශ්නයක් විසඳලා තව ප්‍රශ්න ගණනාවක් ඇති කරන්නද හදන්නේ? කොළඹ මහ නගර සභාවේ ඡන්දය තියන්නේ නැතිව, මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරලා ඒ දේවල් තුළින් උත්තර දීමෙන් ප්‍රශ්නයක් ඇති වෙනවා.

ඉතින් මම මීට වැඩිය වෙලාව ගන්න හදන්නේ නැහැ. ධීවර අමාත්‍යාංශයේ මහන්සියෙන් වැඩ කරන මේ ඇමතිතුමා සහ ඒ නිලධාරි මණ්ඩලය අල්ලපු මාළු ටික විකුණන්න පාරිභෝගිකයෝ ඉන්න ඕනෑ නේ. ඒ අය නැති වන නිසා තමයි මම මේ උදවු කරන්න හදන්නේ. මේ ඇමති මණ්ඩලය අද ඔබතුමාට ගණපූරණයක් දෙන්න උදවු කරන්නේ නැති නමුත්, විපක්ෂයෙන් මේ ගැන හඬ නගන්නේ නැතිව උදවු කරන්න හදන මේ අවස්ථාවේදී කරුණාකරලා ඔබතුමාවත් මේ වෙනුවෙන් කථා කරලා කියන්න, මේ ගෙවල් කඩන්න ඉස්සෙල්ලා විකල්ප ගෙවල් ලබා දෙන්න කියන එක. මේක මම නැවත මතක් කරනවා. මොකද අද හැන්දෑවේ කැබිනට් රැස්වීම තිබෙනවා.

මැගිනෝනා, අංක 660, හැව්ලොක් පාර; ලක්ෂ්මන්, අංක 658, හැව්ලොක් පාර; කුසුම්, අංක 666, හැව්ලොක් පාර; විමලාවතී, අංක 664, හැව්ලොක් පාර; ඒ වාගේ ඒ ප්‍රදේශයේ ගෙවල් 24ක් කඩලා තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරිය ඊයේ සවස දෙකට චෙක් එකක් ගෙනැල්ලා දෙනවා. මේ චෙක් එක බැංකුවට දීලා සල්ලි ලබා ගන්න පෙර අද මාගා කොම්පැනිය ඇවිල්ලා මේ ගෙවල් කඩලා. මම ඒක ඇස්වලට දැකලා තමයි මෙතැනට ඇවිල්ලා කථා කරන්න බැලුවේ.

ගරු ඇමතිතුමනි, ඒ කියන ගමන්ම මට දුරකථනයෙන් තවත් පණිවුඩයක් ආවා. උතුරු කොළඹ, මෝදර පවුල් 66ක් පදිංචිව සිටින තැනටත් දැන් නිවාස අධිකාරියෙන් ඇවිල්ලා ලේබල් අලවා තිබෙනවා ගෙවල් 15ක් කඩන්න. ගෙවල් කඩන්න හදන්නේ "වරාය හදන්න ඇතුළේ ඉන්න ඕනෑ" කියා චීන ජාතිකයන්ට දුන්න කොන්දේසියක් තිබෙන නිසායි. එතැන ඉන්න බැරි නිසා මෙතැනට දමන්න හදනවා. අපේ ලංකාවේ අය පැත්තකට දමා චීන ජාතිකයන්ට තැන දීලා, මොකක්ද මේ කරන්න හදන්නේ? කෝටි 2900ක් ෂැන්ග්‍රි-ලා, කැටික් ආයතනවලින් ලබා ගෙන ඒවා නැති කරන්නට කටයුතු කර තිබෙනවා. අවුරුදු 30ක් 35ක් තිස්සේ පීටර් කෙනමන් මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා දුන්න ඉඩම්වලින් තමයි ඒ අය ඉවත් කරන්න හදන්නේ. මේක දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. කරුණාකර, ඔබතුමන්ලා සියලු දෙනා මානුෂික මට්ටමින් සිතා බලා මේකට උත්තරයක් දෙන්න. ධීවර කර්මාන්තය දියුණු කිරීමට ඇමතිතුමාට පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා. ඒ අහිංසක ජනතාව වෙනුවෙන් කථා කරන්න මට අවස්ථාවක් ලබා දීම මම බොහොම අගය කරනවා. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඊ ළඟට ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා. ඊට ප්‍රථමයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මේ අවස්ථාවේ "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ.භා. 2.22]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ හිඳීම පිළිබඳව මා බෙහෙවින්ම සන්තෝෂ වනවා. ධීවර අමාත්‍යාංශය යටතේ නියෝග කිහිපයක් ගෙනෙන මේ වෙලාවේ අපි බොහොම සාවධානව ඉතාමත්ම ඕනෑකමින් අපේ ධීවර අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ කථාවට ඇහුම්කන් දීගෙන හිටියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමාගේ කථාව අනුව මත්ස්‍ය අපනයනය රුපියල් මිලියන 21,000යි. ඒ කියන්නේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. ධීවර නිෂ්පාදනය සියයට 18.35 දක්වාත්, දෙසැම්බර් මාසය වන විට සියයට 24 දක්වාත් වැඩි වෙලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

GDP එකෙන් සියයට 18.3යි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

හරි. රුපියල් 500ට තිබුණු කෙලවල්ලා කිලෝව ජනාධිපතිතුමා මැදිහත් වෙලා රුපියල් 10කින් - මහ විශාල ගණනකින්- අඩු කර තිබෙනවා. සැමන් කර්මාන්තය සඳහා -ටින් මාළු කර්මාන්තය සඳහා- කර්මාන්තශාලා ගණනාවක් ආරම්භ කරන්න යනවා. මීට ඉස්සෙල්ලා ධීවර අමාත්‍යතුමන්ලා ගණනාවක් හිටියා. අපේ මහින්ද විජේසේකර මැතිතුමා ඒ කාලයේ -[බාධා කිරීමක්] හිටියේ කොයි පැත්තේද කියන ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ. අවසානයේ ඔබතුමන්ලාගේ පැත්තේ ඉඳලා තමයි එතුමා විනාශ වුණේ. [බාධා කිරීමක්]කොයි පැත්තේ ඉඳලා හෝ එතුමාත් සැමන් කර්මාන්තශාලා ආරම්භ කළා. සැමන් කර්මාන්තය ආරම්භ කරන්න යද්දි ලංකාවේ සැමන් මාළු අසු වෙනවාද කියන ප්‍රශ්නය මතු වනවා. [බාධා කිරීමක්]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඉන්දියන් මැකරල් කියලා කියන්නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මගේ කථාව කරගෙන යන්නම්. කවුරු හරි පිළිතුරු දෙන ඇමතිතුමෙක් ඇති නේ. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අන්දමට මත්ස්‍ය නිෂ්පාදනය වැඩි වෙලා සියයට 67කින් මත්ස්‍ය අපනයනය වැඩි වෙලා තිබෙනවා. ලංකාවෙන් පිට රට යවන ප්‍රමාණය සියයට 67 කින් පසු ගිය මාස හය ඇතුළත වැඩි වෙලා තිබෙනවා. සියයට 67ක් කිව්වාම පොඩි සෙල්ලමක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ වී නිෂ්පාදනය කරනවා. ගොයම් කපන කාලය වන විට වී මිල බොහොම පහළට වැටෙනවා. අන්තිමට වී කිලෝව රුපියල් 18වත් විකුණා ගන්න බැරිව වී ගොවියෝ අපහසුතාවට පත් වනවා. පොලොන්නරුව ප්‍රදේශයේ වී විකුණා ගන්න බැරුව ගෙනැල්ලා පිච්චූ බව අපට මතකයි. ලූනු අස්වැන්න ගන්නා කාලයට ලූනු විකුණා ගන්න බැරුව දඹුල්ලේ ලූනු ගොවියෝ පාරට බැහැලා උද්ඝෝෂණය කරන අවස්ථා සිය ගණනක් අප දැක තිබෙනවා. අල වගාකරුවෝ අල ගලවන කාලය වන විට අල ටික විකුණා ගන්න බැහැ කියා රටේ මහා ජංජාල කරනවා. එදා නිෂ්පාදනය වැඩියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ස්‍ය නිෂ්පාදනය සියයට 24 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ කියන විධියට සියයට 18.35 නොව දෙසැම්බර් වන විට සියයට 24 දක්වා වැඩි වෙලා තිබෙනවා. මත්ස්‍ය අපනයනය සියයට 67 දක්වා වැඩි වෙලා තිබෙනවා. මත්ස්‍ය අපනයනය සියයට 67 දක්වා වැඩි වෙලා තිබෙන රටේ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 24 දක්වා ඉහළ ගිය රටේ මාළු විකුණා ගන්න බැහැ කියා කිසිම නිෂ්පාදකයෙක් කෑ ගහන්නේ නැහැ. අලුතෙන් cold room බිහි කරලත් නැහැ. ගරු ඇමතිතුමාගේ කථාවේදී හොඳ සංඛ්‍යා ලේඛන ටිකක් ඉදිරිපත් කළා.

මම ඉදිරියේදී ඒ සංඛ්‍යා ලේඛනත් එක්ක කථා කරන්නම්. හැබැයි සංඛ්‍යා ලේඛන කථාව නම් ඉතාමත්ම හොඳයි. සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීමේ හොඳ හැකියාවක්, හොඳ දක්ෂකමක් අපේ ධීවර ඇමතිතුමාට තිබෙනවා. හොඳට සංඛ්‍යා ලේඛන ගණනාවක් අපට ඉදිරිපත් කළා. ඒ සංඛ්‍යා ලේඛන අනුව මාළු තිබෙනවා නම් හලාවත market එකට ගිහිල්ලා හුරුල්ලෝ කිලෝ එකක් රුපියල් 250ට මට ගෙනෙන්න වෙන්නේ නැහැ; පරව් කිලෝ එකක් රුපියල් 550ට ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ; සාලයෝ කිලෝ එකක් රුපියල් 150ට ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කථා කරන්නේ හලාවත මාළු market එකට ගිහිල්ලා මාළු ගන්න මන්ත්‍රීවරයෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුහුදුකරයේ මාළු නිෂ්පාදනය කරන තැන මාළු වෙළෙඳ පොළේ මාළු මිල එසේ නම් රට අභ්‍යන්තරයේ මාළුවල මිල තත්ත්වය කොහොමද? සංඛ්‍යාත්මකව මේ කතන්දර ටික අපේ ධීවර ඇමතිතුමා එහාට ගිහිල්ලා කියවන්න ගත්තොත් එහෙම එහේ ධීවරයෝයි, පාරිභෝගිකයෝයි දෙගොල්ලෝම එකතු වෙලා අපේ ධීවර ඇමතිතුමාගේ මාළු කන්න පටන් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
දහස් ගණනක ධීවරයෝ එක්ක මම කථා කළා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුල් වතාවේ එක තැනක නොවෙයි අපේ ධීවර ඇමතිතුමා රට වටේම ගියා. දැන් මේක කරනවා, අරක කරනවා, වහාම කරනවා කියලා මෙතුමා පොරොන්දුත් දුන්නා. [බාධා කිරීමක්] ගිය ටික ගැන මම කථා කරන්නම්, ගරු ඇමතිතුමනි. [බාධා කිරීමක්] දන්නා දේවල් කියන්නේ, ගරු ඇමතිතුමනි. ඔබතුමා අහ ගන්න ඉස්සෙල්ලා. [බාධා කිරීමක්] ඔබතුමාටත් පුරුද්දක් තිබෙනවා නේ, අහ ගෙන ඉන්න බැරි. ඔබතුමා තමයි සියල්ල කරලා තිබෙන්නේ. ඔබතුමා විතර මිනිහෙක් වෙන නැහැ. හැබැයි, ඔබතුමාට අහගෙන ඉන්න බැහැ. ඒක තමයි තිබෙන දුර්වලතාව. චුට්ටක් අහගෙන හිටියා නම් වඩාත් හොඳයි ගරු ඇමතිතුමනි. ඊට පස්සේ ඔබතුමාගේ ඇමතිවරයෙක් හරි එහෙම නැත්නම් ඔබතුමාම හරි කමක් නැහැ පිළිතුරු කථාව කරන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. අපිත් ඒක අහ ගෙන ඉන්නම්. දැන් ඔබතුමා කථා කරන කොට අපි බොහොම සාවධානව අහ ගෙන හිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ නිෂ්පාදනයේ වැඩි වීමක් තිබෙනවා නම්, දියුණුවක් තිබෙනවා නම් රටේ මාළු ප්‍රමාණය වැඩි වෙලා මිල ප්‍රමාණය අඩු වෙන්න ඕනෑ කියලායි. මේක ආර්ථික විද්‍යාවේ න්‍යාය නේ. ආර්ථික විද්‍යාවේ න්‍යාය නේ නිෂ්පාදනය වැඩි වන කොට මිල අඩු වනවාය කියන එක. ඉතින් එහෙම මාළු නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා නම් මිල අඩු වෙන්න ඕනෑ. ප්‍රායෝගිකව ලංකාවේ එහෙම එකක් නැහැ නේ. හුරුල්ලෝ කිලෝ එකක් රුපියල් 100ට ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ ලංකාවේ කොතැනද? මොන Market එකේද? වෙන්නප්පුවේ ගන්න පුළුවන්ද? අපේ හිටපු ධීවර ඇමතිතුමා - ජොෂ්ය ඇමතිතුමා, ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා- ඉන්නවා.

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා (සමාජ සුබසාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து - சமூக நலன்புரி அமைச்சர்)
(The Hon. Milroy Fernando - Minister of Social Welfare)
මම උත්තර දෙන්නම්.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබතුමා උත්තර දෙන්න. මම අහන්නේ වෙන්නප්පුවේ හුරුල්ලෝ කිලෝ එකක් රුපියල් 100ට ගන්න පුළුවන්ද? හුරුල්ලෝ කිලෝ එකක් අද market එකේ රුපියල් 100ට ගන්න බැහැ. මේකයි යථාර්ථය. මෙහෙම සංඛ්‍යා ලේඛනවලින් නම් ලස්සන කථාවක්, සුන්දර කථාවක් පෙන්වනවා. අපි ලෝකයේ දියුණුම රාජ්‍යයක්, දියුණුම මත්ස්‍ය නිෂ්පාදනයක් තිබෙන රාජ්‍යයක් කියන ඒ මට්ටමින් නවීන තාක්ෂණය පාවිච්චි කරන රාජ්‍යයක් විධියට තමයි අපේ ගරු ඇමතිතුමා සඳහන් කළේ. මම ගරු ඇමතිතුමාත් එක්ක ප්‍රශ්නයකට නොවෙයි කථා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනික් කාරණය, මුහුදුකරයේ ඔහොම නම් රට අභ්‍යන්තරයට -රට මැදට- එන කොට මොකද වෙන්නේ? රට මැද්දේ මාළු ප්‍රවාහනයට වැඩි වියදමක් යනවා. තවත් කොටසක් කප්පම්කරුවන්ට යනවා. එච්චරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාළු මිල වැඩි වෙන්න හේතුව මොකක්ද? මේ රෙගුලාසිවල තිබෙන පරිදි license කිරීමේදී ඒ ගාස්තු ප්‍රමාණයන් අඩු කරන එක හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවරයා මුහුදට ගිහිල්ලා මාළු market එකට මාළු ටික ගෙනෙන කොට හතර වතාවක් බදු ගෙවන්න වෙලා තිබෙනවා. එකක් තමයි තමන්ගේ බෝට්ටුව license කර ගැනීමට ආණ්ඩුවට නිල වශයෙන් බද්දක් ගෙවීම. [බාධා කිරීමක්] ඒක තමයි කිව්වේ. හොඳයි කියලා දැන් කිව්වා නේ. හොඳ දේ කිව්වාමත් කලබල වෙනවා. හොඳයි කියන එක අහන්නම කැමැති නැහැ වාගේ. මේ මෙතෙක් තිබුණු තත්ත්වය; අද වන තුරු තිබුණු තත්ත්වය. අද නේ මේ රෙගුලාසි ගෙනෙන්නේ. මේ වන කොට බෝට්ටුව license කරන්නට ධීවරයා මුදල් ගෙවන්නට ඕනෑ. ඒ license කරපු

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

බෝට්ටුවේ ගිහිල්ලා මාළු ටික අල්ලා ගෙන ඇවිල්ලා මාළු market එකට එන කොට - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හලාවත ප්‍රායෝගික තත්ත්වය.- වෙළෙඳ පොළේ තරාදියෙන් කිරන්නට ඕනෑ. තරාදිය කාගේද? ආණ්ඩුවේ ආශීර්වාදය යටතේ ක්‍රියාත්මක වන කප්පම් කණ්ඩායමේ තරාදිය.

හලාවත වැල්ලේ ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ ක්ලෝඩ් පියතුමා පෙරටු කර ගෙන හලාවත ප්‍රදේශයේ එගොඩවැල්ල, රත්න උයන, අලුත්වත්ත, මැදවත්ත, සුදුවැල්ල ප්‍රදේශයේ ධීවර ජනතාව මේ තරාදියෙන් කිරනවාට, කප්පම් ගැනීමට විරුද්ධව එළියට බැහැලා උන් වහන්සේත් එක්ක මාළු market එකට තරාදියක් ගෙනාවා. ගෙනැල්ලා තරාදිය තියලා පියතුමා තරාදිය බෙන්සාරු කරලා එදා ඉඳලා ධීවර ජනතාවට නොමිලයේ මාළු ටික කිරා ගැනීමට අවස්ථාව හරි ගස්සලා ගියා. ඊට පස්සේ මොකක්ද වුණේ? පියතුමා ගියා. ඊ ළඟ දවසේ තරාදිය මාළු market එකේ කාමරේකට දැම්මා.

කාමරය ලොක් කරලා යතුර ගත්තා. ඒ නිසා අදත් ආණ්ඩුවේ ආශිර්වාදය යටතේ ක්‍රියාත්මක වන කප්පම්කරුවාට කප්පමක් ගෙවලා කප්පම්කරුවාගේ තරාදියෙන් මාළු ටික කිරා ගන්න ඕනෑ. මෙන්න මාළු මිල වැඩි වන්න හේතු. බෝට්ටුව ලයිසන් කරනකොට එක පාරක් ගෙවනවා; ඊළඟට මාළු ටික කිරනකොට කප්පම්කාරයාට ගෙවනවා.

ඊට පස්සේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාළු මිලදී ගන්න ව්‍යාපාරිකයන් එනවා, විවිධ ප්‍රදේශවල ඉඳලා. ඒ ව්‍යාපාරිකයන් ඇවිල්ලා මාළු ටික මිලදී ගත්තාම, ඒ ව්‍යාපාරිකයන් මිල දී ගත් මාළු ප්‍රමාණය අනුව ඔහුගෙන් කප්පම් මුදලක් ගන්නවා. එතකොට මේ වනකොට ඒ මාළු ටික සඳහා අනවශ්‍ය විධියට තුන් වතාවක් මුදල් ගෙවලා හමාරයි. ඒ ව්‍යාපාරිකයාට ඒ මාළු ටික මාර්කට් එකේ ඉඳලා කරේ තියා ගෙන එළියට ගෙනි යන්න බැහැ. ඒ මාළු ටික ගෙනි යන්න වාහනයක් ගෙනෙන්න ඕනෑ. වාහනය ගෙනැල්ලා නතර කළාම වාහනයට තව කප්පමක් ගන්නවා. මේ විධියට අපේ පැත්තේ තොඩුවාව, ඉරණවිල, කරකුපනේ, වැල්ල, රත්න උයන, මැදවත්ත, සුදුවැල්ල, අලුත්වත්ත, එගොඩවැල්ල කියන ප්‍රදේශවල පදිංචි ධීවර ජනතාව දවස් ගණනක් මුහුදු ගිහින් කරදිය එක්ක පොර බදලා, අව්වේ වේළිලා, වේළිලා, දහලලා අමාරුවෙන් අරගෙන එන මාළු ටිකට හතර අවස්ථාවක් ආණ්ඩුවටත්, ආණ්ඩුවේ ආශිර්වාදය යටතේ ක්‍රියාත්මක වන මැර කණ්ඩායමටත් -කප්පම් කණ්ඩායමටත්- කප්පම් ගෙවන්න සිදු වෙලා තිබෙනවා.

මට මතකයි ඒ දවස්වල ධීවර ඇමතිතුමා කිව්වා, "මේ කප්පම් ගැනීම සම්පූර්ණයෙන් නතර කරනවා, මෙතැනින් එහාට ඉඩ දෙන්නේ නැහැ" කියලා. හලාවත මාළු මාර්කට් එකේ කප්පම් ගැනීම පිළිබඳව මම මීට පෙරත් ධීවර පනතක් ගැන කථා කරද්දීත්, හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව විවාදයේදීත් මේ ගරු සභාවේ කථා කළා. හැබැයි ගරු ඇමතිතුමනි, අදටත් හලාවත මාර්කට් එකේ කප්පම් ගැනීම ඒ විධියටම තිබෙනවා. ශිරෝන් කියන තැනැත්තාගේ ප්‍රධානත්වයෙන් තමයි මේ කප්පම් එකතු කිරීම කරගෙන යන්නේ. තවමත් ඒක නවත්වා ගන්න බැරි වෙලා තිබෙනවා. හලාවත ධීවරයෝ එළියට බැස්සේ ඒකයි. එදා මාර්කට් එක කුඩු වුණේ ඒකයි. මේ අසාධාරණයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක නොවෙනකොට, කප්පම්කරුවන් බිහිවනකොට ඒ අයට ක්‍රියාත්මක වන්නට වෙනවා. මම හිතන්නේ නිහඬව සිටියාට ජොෂ්ඨ ඇමතිතුමා මේ ගැන දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කල්පිටියේ ධීවරයාට අදටත් නිදහසේ මුහුදට යන්නට බැහැ. ත්‍රස්තවාදය අවසානයි. දැන් මේ රට නීතිය ක්‍රියාත්මක වන රටක් බවට පත්වෙලා. සාමය තිබෙන රටක් බවට පත් වෙලා. හැබැයි නීතිය ක්‍රියාත්මක වන, සාමය තිබෙන රටක් වුණාට, අදටත් කල්පිටියේ ධීවරයාට නාවික හමුදාවට ගිහිල්ලා බලපත්‍රයක් ගන්න සිදු වෙලා තිබෙනවා, මුහුදට යන්න. නමුත් මේවා අදටත් ක්‍රියාත්මක වනවා. නැහැ කියනවාද? දැන් කථා කරන්න කෝ, කල්පිටියේ ධීවර සංගමයට. කල්පිටියේ ඉන්න නාවික හමුදාවේ අණ දෙන නිලධාරිතුමාට කථා කරලා අහන්න කෝ. වග කීමක් ඇතිවයි මා මේ ගරු සභාවේ කථා කරන්නේ, ආවාට ගියාට නොවෙයි. මම ඊයේත් නාවික හමුදාවෙන් ඇහුවා. අද වෙනතුරු රජයෙන් ඒ ගැන නියෝගයක් ලැබිලා නැහැ. හදිසි නීතිය තිබෙන නිසා අපි තවමත් ඒ විධියටම කටයුතු කර ගෙන යනවා කියලා නාවික හමුදාවේ අණ දෙන නිලධාරි ඊයේත් මට දැනුම් දුන්නා. ඉතින් එහෙම තිබියදී මත්ස්‍ය සම්පත වැඩි කරන්න කථා කරනවා.

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து )
(The Hon. Milroy Fernando)
වෙලාව ගැන ප්‍රශ්නයක් නැහැ නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

වෙලාවේ ප්‍රශ්නයක් නොවෙයි, බලපත්‍රයේ ප්‍රශ්නයක් තිබෙන්නේ. ධීවරයා මුහුදට යනකොට මොකටද වෙලාව? මාළු ඉන්න වෙලාවට මුහුදට යන්නේ. ධීවරයා වෙලාව දන්නවා ගරු ඇමතිතුමනි. උතුර-නැඟෙනහිර කියන්නේ ත්‍රස්තවාදය තදින්ම ක්‍රියාත්මක වුණු ප්‍රදේශ. ඒ උතුරේ, නැඟෙනහිරේ, මන්නාරමේ, වන්නියේ ධීවර රැකියාවේ යෙදී හිටපු මිනිසුන්ට අද බලපත්‍රයක් නැතිව මුහුදට යන්නට පුළුවන්. හැබැයි, පුත්තලමේ කල්පිටියේ ධීවරයාට අදටත් නාවික හමුදාවට ගිහිල්ලා පෝලිමේ ඉඳලා බලපත්‍රයක් අරගෙන තමයි මුහුදට යන්න සිදු වෙලා තිබෙන්නේ. මේකෙන් ධීවරයා උනන්දු වනවාද මේ ක්‍රියාවලියට? කර කියා ගන්න දෙයක් නැති නිසා වෘත්තියේ යෙදෙනවා හැරෙන්නට ධීවරයා උනන්දු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ ධීවර ජනතාව දිරි ගන්වන්නට මෑත භාගයේදී ඔවුන් වෙනුවෙන් මොනවාද කරලා තිබෙන්නේ? ෆෙස්ටස් පෙරේරා මැතිතුමා ධීවර ඇමතිවරයා වශයෙන් කටයුතු කරපු කාලයේ, ඒ වාගේම ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා ධීවර ඇමතිවරයා වශයෙන් කටයුතු කරපු කාලයේ ධීවර සමුපකාර සමිති ක්‍රමය ක්‍රියාත්මක වුණා ඔබතුමාට මතක ඇති. ධීවර ණය යෝජනා ක්‍රම ගණනාවක් ක්‍රියාත්මක වුණා. ධීවර නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක වුණා. අද මොකක්ද සිද්ධ වන්නේ? අද රාජිත සේනාරත්න ඇමතිතුමා ප්‍රකාශ කරපු අන්දමට ලංකා බැංකුවේ ණය ක්‍රමය හැරෙන්නට වෙන කිසිවක් ක්‍රියාත්මක, - [බාධා කිරීමක්] ණය නොවෙයි, ගරු මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිතුමනි.

එදා රජයේ සහනාධාර ක්‍රමය යටතේ නිවාස ව්‍යාපෘතිය ලබා දුන්නා. සමුපකාර සංගමය ඇති කළා. සමුපකාර සංගමය ඇති කරලා ධීවර ජනතාවට සමුපකාර සංගමය හරහා ආධාර උපකාර කළා. අද ධීවර සමුපකාර සංගමයට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? මට කියන්න, ලංකාවේ අද කොතැනද එක ධීවර නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන්නේ කියලා? එක තැනකවත් නැහැ. එහෙනම් මේ ධීවරයා උනන්දු කරවීමට, දිරි ගැන්වීමට මොකක්ද තිබෙන වැඩ පිළිවෙළ? සියයට 67කින් අපනයනය වැඩි වුණාය කියනවා. මම එතැනට එන්නම්. නිෂ්පාදනය සියයට 18.35කින් නැත්නම් සියයට 24කින් වැඩි වුණාය කියනවා. එහෙම වැඩි වෙන්න ධීවරයා ශක්තිමත් වන්නට ඕනෑ; ධීවරයා උනන්දු වන්නට ඕනෑ. ධීවරයා උනන්දු වන තැනට කොහොමද වැඩ කරලා තිබෙන්නේ?

අද සුළු ධීවරයා ගැන කථා කරනවා. දැන් ඇමතිතුමා ප්‍රකාශ කරපු හැටියට ලංකා බැංකුව හරහා ධීවර ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. ලංකා බැංකුව හරහා ක්‍රියාත්මක වන ඒ ධීවර ණය යෝජනා ක්‍රමයෙන් ණයක් ගන්න පිරිසිදු ඔප්පුවක් තියෙන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ, නැහැ. මොකුත් ඕනෑ නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබතුමා එන්න, හලාවත ධීවර සංගමයත් එක්ක සාකච්ඡා කරන්න. ඔබතුමා එන්න, හලාවත ධීවර සංගමයත් එක්ක, ලංකා බැංකුවත් එක්ක අපි කථා කරමු හලාවත වැල්ලේ ඉඳ ගෙන. [බාධා කිරීමක්] ඔබතුමා නැහැ කියනවා. නමුත් ධීවරයා එතැනට ගියාම පිරිසිදු ඔප්පුවක් තියෙන්න ඕනෑ කියනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මොන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඕනෑ නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නම් මම දන්නේ නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඕනෑ නැත්තේ රාජිත ඇමතිතුමාට වෙන්න ඇති.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඕනෑ නැහැ බැංකුවට. [බාධා කිරීමක්] තමුන්නාන්සේනේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විධියට කථා කරන්නේ. තමුන්නාන්සේනේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගැන කථා කරන්නේ. තමුන්නාන්සේනේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විධියට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගැන කතන්දර කියන්නේ. මම කථා කළේ වැදගත් විධියට ඔප්පුවක් පිළිබඳව. තමුන්නාන්සේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගැන කථා කරනවා. [බාධා කිරීමක්]

ධීවරයාට ණයක් ගන්න නම් බැංකුවට පිරිසිදු ඔප්පුවක් අවශ්‍යයි. බෝට්ටුවේ ලියකියවිලි සියල්ලම බැංකුව බාරයේ තියා ගන්නවා. හරි. ඒකේ ගැටලුවක් නැහැ. නමුත් අර ගැටලුව තියෙනවා.[බාධා කිරීමක්] නැහැ කියන්නේ මොකද? පුරුෂයාගෙයි භාර්යාවගෙයි අතර,- [බාධා කිරීමක්] ඔබතුමා කථා කරනකොට උත්තර දෙන්න කෝ, කලබල නැතිව. තම කලත්‍රයා සමඟ හවුල් ගිණුමක් තියෙන්න ඕනෑ. මෙන්න තියෙන කොන්දේසි. ඒ විතරක් නොවෙයි, සියයට පහහමාරේ පොලියක්. ඉතින් විශේෂ ණයක් කියන්නේ මොකක්ද? සියයට පහහමාරේ පොලියක්, සියයට නවයහමාරේ පොලියක් ගන්නවා. සහනදායී ක්‍රමයක් නොවෙයි මෙතැන තියෙන්නේ. ඒකත් ක්‍රියාත්මක වෙන්නේ අර පුංචි ධීවරයාට නොවෙයි; ඔරුවෙන් යන, පාරුවෙන් යන, තෙප්පමෙන් යන සුළු ධීවරයාට නොවෙයි. මේ රටේ ධීවරයන්ගෙන් සියයට 30ත් 50ත් අතර ප්‍රමාණයක් ඉන්නේ සුළු ධීවරයෝ. මේ සුළු ධීවරයන් සඳහා කිසිදු ව්‍යාපෘතියක් නැහැ; ණය යෝජනා ක්‍රමයක් නැහැ; සහන ක්‍රමයක් නැහැ. [බාධා කිරීමක්]

හරි, මම රක්ෂණය ගැන කියන්නම්. ඔබතුමා රක්ෂණය ගැන කියන නිසා මම රක්ෂණය ගැන කථා කරන්නම්. රක්ෂණ ක්‍රමයක් ආරම්භ කළා. වැඩිහිටි වයසට පත් වෙච්ච ධීවරයෙක් රක්ෂණ ක්‍රමයට දායක වෙලා ඔහුගේ වයස අවුරුදු 68 සම්පූර්ණ වුණාම, ඔහුට ගෙවන්නේ රුපියල් 1,000ක දීමනාවක්. වැඩිහිටි බවට පත් වෙලා වයෝවෘද්ධ බවට පත් වෙලා ධීවර කර්මාන්තයේ යෙදෙන්න බැරි තත්ත්වයට එනකොට ඔවුන් රැක බලා ගන්න ක්‍රමයක් නැහැ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
රුපියල් දහදාහයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වග කීමෙන් කියන්නේ. එතුමා ඔය විධියට තමයි සියයට 24කින් මාළු නිෂ්පාදනය වැඩි වුණා; සියයට 64කින් අපනයනය වැඩි වෙලා තිබෙනවා කිව්වේ. ඒ වාගේ තමයි එතුමාගේ මේ රුපියල් 10,000ත්. එතුමාට මම කියනවා, ධීවරයෝත් එක්ක සාකච්ඡා කරන්න හලාවත වැල්ලට එන්න කියලා. රුපියල් 1,000ට වැඩියෙන් ලැබෙන එක වයෝවෘද්ධ ධීවරයෙක් ඉන්නවාද? රුපියල් 1,200ට වැඩියෙන් ලැබෙන එක්කෙනෙක්වත් නැහැ. වැඩිහිටි ධීවරයන් සඳහා ලැබෙන උපරිම මුදල රුපියල් 1,200යි. මම ප්‍රායෝගිකව ගිහිල්ලා සොයලා බලලායි කථා කරන්නේ. ඒ වාගේම තරුණ ධීවරයෙක් රක්ෂණ ක්‍රමයට දායක වෙලා ඔහුගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වුණාම ඔහුට ලැබෙන්නේ රුපියල් 2,000යි. ධීවරයකු මිය ගියොත් රුපියල් 25,000ක දීමනාවක් දෙනවා. ඒ රුපියල් 25,000ක වන්දිය ලබා ගන්න අකැමැති නම් ඔහුගේ කලත්‍රයාට මාසයක් පාසා රුපියල් 1,000ක දීමනාවක් ලැබෙනවා. මේකද සුළු ධීවරයාට කරලා තිබෙන උදව්ව? මේවා කියනකොට අහ ගෙන ඉන්න බැහැ. පුළුවන් නම් මගේ කථාවෙන් පස්සේ කථා කරනකොට මේවාට උත්තර දෙන්න. අපි එතකොට ගිහින් ධීවරයන් එක්ක කථා කරන්නම්. එතකොට කෝකද ඇත්ත කෝකද බොරුව කියලා බලන්න පුළුවන්. ඇමතිතුමා කියන

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

එකත් කියන්නම්. මම කියන එකත් කියන්නම්. ඇමතිතුමාට හරියට කේන්ති යනවා ඒ ගැන කිව්වාම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර වරායන්වල තත්ත්වය බලන්න. හලාවත ධීවර ජැටියක් හැදුවා. දැන් ජැටිය තියෙනවා. හැබැයි ඒ ජැටියේ අවම අවශ්‍යතාවත් නැහැ. දැන් මෙතුමා වැඩ පිළිවෙළක් ලස්ති කරලා තිබෙනවා, ඇමෙරිකන් ඩොලර් මිලියන 10ක් වෙන් කරලා. ඒ කටයුතු සූදානම් කර ගෙන යනවා කියන එකයි මට ලැබී තිබෙන ආරංචිය. ඒක විදෙස් නෞකා අධීක්ෂණය කිරීමේ නිරීක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක්. ඒක බොහොම හොඳයි. අපේ මුහුදු සීමාවට එන, අපිත් එක්ක ගනුදෙනු කරන ඒ විදෙස් නෞකා අධීක්ෂණය කරන නිරීක්ෂණය කරන ක්‍රමයක් ඇති කරන්න ඕනෑ. ඒකේ කිසි ගැටලුවක් නැහැ. අපි ඒකට එකඟයි. අපි හොඳ වැඩවලට හොඳයි කියනවා. ඒකට එතුමා කලබල වෙලා කෑ ගහන්නේ නැහැ. නරකයි කිව්වොත් එහෙම කෑ ගහනවා.

ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්, ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක් වෙන කොට ඒ දෙකම දරා ගන්නටත් පුළුවන් වන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් කෝටි ගණනක මුදලක් වියදම් කරලා දැන් හලාවත ධීවර ජැටිය හදලා තිබෙනවා. හැබැයි, හලාවත ධීවර ජැටියේ, අද ධීවරයාට අවම පහසුකමවත් නැහැ. ඒ ධීවර ජැටියේ ඩීසල් පොම්පය සවි කරලා තිබෙනවා. ටැංකිය සවි කරලා තිබෙනවා. විවෘත කරලා අවුරුදු දෙකහමාරක් ගත වෙලා තිබෙනවා. අද වන විට ඩීසල් බින්දුවක්වත් නැහැ. ඔන්න ජැටියේ තත්ත්වය. විවෘත කරලා අවුරුදු දෙකහමාරක් වනවා. වතුර බින්දුවක්වත් නැහැ. ජැටියක -මාළු තොටුපොළක- තිබිය යුතු සුවිශේෂී අංගයක් තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අයිස් ලබා ගැනීමට හැකියාවක් තිබීම. මෙතැන අයිස් කර්මාන්තයක් -අයිස් නිෂ්පාදනයක්- ඇත්තේත් නැහැ. අයිස් ලබා ගැනීමට හැකියාවකුත් නැහැ. මෙන්න හලාවත ධීවර ජැටියේ තත්ත්වය. එතැන තිබෙන market එකේ කිසිම විධිමත් භාවයක් නැහැ. දැන් ව්‍යාපාරිකයෝ ටික තමන්ගේ වියදමින් අලුතින් කඩ කාමර ටිකක් හදලා තිබෙනවා. ඒ තමන්ගේ වියදමින් හදා ගෙන තිබෙන අලුත් කඩ කාමරවලට යන්න විධියක් නැහැ. ඒ අය තමන්ගේ තැනට ගියාට පස්සේ අනෙක් උදවියට කප්පම් ගන්න විධියක් නැහැ. ඒක නිසා දැන් ව්‍යාපාරිකයෝ ටික ඔක්කොම අර market එකේ තියා ගෙන ඉන්නවා.

ධීවරයෝ market එකේ බිම් කොටසට තමයි මාළු ටික ගෙනැල්ලා දමන්නේ. එතැන මඩ ගොහොරුවක් වාගෙයි. පුංචි ධීවරයාට - සුළුපන්න ධීවරයාට - තමන්ගේ මාළු ටික ගෙන යන්න වෙලා තිබෙන්නේ මඩ ගොහොරුවකටයි. මෙන්න සැබෑ තත්ත්වය. මම අසත්‍ය කියනවා නම් ගරු ඇමතිතුමාට පුළුවන් වෙලාවක් දැනුම් දෙන්න, මමත් එන්නම්. අපේ ජ්‍යෙෂ්ඨ ඇමතිතුමා ඉන්නවා. අපි කැඟහ ගන්න අවශ්‍ය නැහැ. අපි කට්ටියම ගිහිල්ලා මේකේ ඇත්ත නැත්ත මොකක්ද කියලා බලමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න හලාවත තිබෙන තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක මෝය කට. හලාවත මෝය කට, කන්දක්කුලිය මෝය කට කියන මේ ස්ථාන අද පුත්තලම් දිස්ත්‍රික්කයේ ධීවරයින්ගේ ධීවර කර්මාන්තයට දැවැන්ත බාධාවක් වෙලා. හැම අවුරුද්දේම මාස හයක කාල පරිච්ඡේදයක් ධීවරයන්ට මුහුදු යන්න විධියක් නැහැ. මේ මෝය කට හරහා ධීවර පවුල් 10,000කට වඩා යැපෙනවා. දවසකට කුඩා සහ විශාල ප්‍රමාණයේ බෝට්ටු, ඔරු, තෙප්පම් 3,000කට වැඩි සංඛ්‍යාවක් මුහුදට යනවා. 3,000කට වැඩි සංඛ්‍යාවක් මුහුදේ ඉඳලා මාළු ටික අර ගෙන ආපහු එනවා. ඒ විධියට ක්‍රියාත්මක වන තැනක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන කොට ඔබතුමාත් පුත්තලම් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සංවිධායකවරයා වශයෙන් සිටියා. දැන් නම් මොකක්වත් දීලා නැහැ වාගෙයි. ඒකට කමක් නැහැ. ඒ කොහොම වුණත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මම දැන් උසස් ආසනයේයි වාඩි වෙලා ඉන්නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
වාඩි වෙලා ඉන්න එක තමයි දැන් ඔබතුමාට කරන්න වෙන්නේ. එතැනින් එහාට නම් මොකුත් කරන්න වෙන්නේ නැහැ. වාඩි වෙලා ඉන්නවත් තැනක් දීලා තිබෙන එකත් ලොකු දෙයක් නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අපි මත්ස්‍යයන් ගැන -මාළු ගැන- කථා කරමු.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔව්, මාළු ගැන කථා කරමු. නැත්නම් අපේ ඇමතිතුමාගේ වාගේ තමුන්නාන්සේගේ ඇඟේ මාළුත් නටන්න පටන් ගනීවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ස්ථානයෙන් දවසකට යාත්‍රා 3,000කට වැඩි ප්‍රමාණයක් එහාට මෙහාට යනවා. ඒ, අලුත්වත්තේ, මැදවත්තේ, රත්නඋයනේ, වැල්ලේ, එගොඩවැල්ලේ, ඉරණවිල, කරුප්පනේ, අඹකඳවිල, තොඩුවාව කියන මේ ප්‍රදේශවල ධීවරයන්ගේ යාත්‍රා. ඒ නිසා මේ ජැටිය පාවිච්චි කිරීම තුළින් පවුල් 10,000කට වැඩි ප්‍රමාණයක් යැපෙනවා. ඒ ජනතාවට අද තමන්ගේ බෝට්ටුව දැල් ආම්පන්න ටික පටවා ගෙන කිලෝ මීටර් භාගයක, තුන් කාලක දුරක් තල්ලු කර ගෙන යන්න සිදු වෙලා තිබෙනවා. කලපුවේ ඉඳලා මෝය කටට ගිහිල්ලා, මෝය කටෙන් තල්ලු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ජ්‍යෙෂ්ඨ ඇමතිතුමා ආවොත් ඒක බලන්න පුළුවන්. මේ තිබෙන අමාරුකම ඊයේ පෙරේදා "සිරස" රූපවාහිනියෙනුත් පෙන්වනවා මම දැක්කා. "දෙරණ" රූපවාහිනියේ ප්‍රවෘත්තිවලිනුත් ඒ ධීවරයාගේ අමාරුකම පෙන්නුවා කියලා මට කට්ටියක් කථා කරලා කිව්වා.

දැල් ආම්පන්න ටික පටවා ගෙන බෝට්ටුව මුහුදට තල්ලු කරනවා. ඊට පස්සේ දවසක් හරි, දෙකක් හරි, සතියක් හරි මුහුදේ ගත කරලා, විඳින්න ඕනෑ දුක් කන්දරාවම විඳලා, දහදිය වගුරලා, මාළු ටික අල්ලා ගෙන ආපසු ඇවිල්ලා නැවතත් බෝට්ටුව තල්ලු කරනවා. මේ මෝය කට ළඟ අවස්ථා ගණනාවකදීම බෝට්ටු පෙරළුණා. බෝට්ටුවලට වෙච්ච දෙයක් නැති වුණා. පුද්ගලයින් ගණනාවක් ජීවිතක්ෂයට පත් වුණා. හලාවත මැතිවරණ කොට්ඨාසයේ ජයබිම තරුණයෙක් මේ ළඟදීත් ජීවිතක්ෂයට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට වරාය හදන්න රුපියල් කෝටි 4,200ක් වැය කළා. හම්බන්තොට වරායේ ආශ්චර්ය දකිනවා කියන්නේ 2025ලු. දැන් වරාය අධිකාරියේ නිලධාරින් දෙදෙනෙක් එතැන ඉඳ ගෙන වරාය බලන්න යන දරුවන්ට දේශනා දෙනවා. ඒ ගොල්ලෝ කියනවා, 2025 දී තමයි හම්බන්තොට වරායේ ආශ්චර්ය දකින්න ලැබෙන්නේ කියලා. ඉතින් 2025 දී ආශ්චර්ය දකින්න රුපියල් කෝටි 4,200ක් වියදම් කරලා හම්බන්තොට වරාය ඉදි කරලා තිබෙනවා. රුපියල් කෝටි 20ක් වියදම් කරලා බංකරින් එක හරියට ගහලා මෝයකට වැලි

ඇවිල්ලා හිර වන එක නතර කරලා දුන්නා නම් හලාවත ආශ්චර්ය හැමදාම දකින්න තිබුණා.

ඇමතිතුමන්ලා ගොඩක් ඉන්නවා. මන්ත්‍රීතුමන්ලා ගොඩක් ඉන්නවා. කැබිනට් එකේ කථා කරන්න තිබුණා. ජ්‍යෙෂ්ඨ ඇමතිතුමාත් ඉන්නවා. කථා කරලා මේ කර්තව්‍යයට රුපියල් කෝටි 10ක් දීලා ධීවර ඇමතිතුමාට සහාය වන්න තිබුණා. මේ වන විට එතුමා නිෂ්පාදනය සියයට 24කින් වැඩි කරලා තිබෙනවා. දැන් සියයට 50ක ඉලක්කයේ ඉන්නේ. ඒ සියයට 50 ඉලක්කයට යන්න ගරු ඇමතිතුමාට උදව් වෙන්න තිබුණා. එතුමාට උදව් කරන්න බැරි වෙන්න කුහක කමක්, එහෙම නැත්නම් වෙනත් මොකක් හරි හේතුවක් තිබෙනවාද කියා මම දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක කළා නම් හලාවත ධීවරයා නිදහසේ මුහුදට යන, මුහුදේ ඉඳලා මත්ස්‍ය සම්පත අරගෙන එන පුද්ගලයින් බවට පත් වෙනවා.

දැන් බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර අමාත්‍යාංශයේ කාර්ය භාරය මොකක්ද කියා. පුත්තලම දිස්ත්‍රික්කය ගත්තාම, කන්දකුලියේ වරායක් තිබෙනවා. කන්දකුලිය වරායේ මෝය කට සම්පූර්ණයෙන්ම වැල්ලෙන් වැහිලා. කිරින්ද වරාය සහ පානදුර වරාය ධීවර කර්මාන්තය සඳහා ඉදි කළ වරායන් දෙකක්. කිරින්ද සහ පානදුර වරායන් දෙකේ ප්‍රධාන කර්මාන්තය මොකක්ද? ධීවර කර්මාන්තයේ ප්‍රධාන අරමුණු දෙක ඉෂ්ට වෙනවාද? කිරින්ද සහ පානදුර වරායන් දෙක අද වැලි පටවන, ගල් පටවන, වැලි විකුණන, ගල් විකුණන මධ්‍යස්ථාන දෙකක් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
කවුද කිරින්ද වරාය හැදුවේ?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
කවුරු හැදුවත් සිද්ධ වෙලා තිබෙන්නේ ඒකයි. ඊ ළඟට හික්කඩුව වරාය ගැන බලන්න. හික්කඩුව වරායෙන් භාගයක් අද වැල්ලෙන් වැහිලා. [බාධා කිරීමක්] අපි හදපුවා තමුන්නාන්සේලාට නඩත්තු කර ගන්න බැහැ. ඒකයි මේ කියන්නේ. හදා ගන්නත් බැහැ, හදපු එක නඩත්තු කර ගන්නත් බැහැ. ඉතින් මොකද කරන්නේ? [බාධා කිරීමක්] හදන්නත් දන්නේ නැහැ, හදලා දුන්නාට පස්සේ නඩත්තු කර ගන්න දන්නේත් නැහැ. ඒකයි වෙලා තිබෙන්නේ. දැන් බලන්න, හම්බන්තොට වරාය, හික්කඩුව වරාය? ඒ දෙකම දැන් භාගයක් වැල්ලෙන් පිරිලා. ධීවර අමාත්‍යාංශය විශාල කාර්ය භාරයක් කරනවා නම් ධීවරයාගේ මත්ස්‍ය සම්පත වැඩි වෙන්න ඕනෑ නේ. මේ කියන අන්දමට මත්ස්‍ය සම්පත වැඩි වුණා නම් ධීවරයාට තොටුපොළට එන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ නේ; ධීවර වරායට එන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ නේ. ධීවර වරායට බෝට්ටු එන්න බැරිව තිබියදී කොහොමද මෙච්චර මාළු නිෂ්පාදනය වෙන්නේ? මේවා විහිළු කථා නේ ගරු ජ්‍යෙෂ්ඨ ඇමතිතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ඇමතිතුමා කිව්වා, මත්ස්‍ය සම්පත බොහොම වැඩි වෙලා අපනයනයත් සියයට 67ක් දක්වා වැඩි වෙලා තිබෙනවාය කියලා. මත්ස්‍ය සම්පත රටේ බහුල කිරීමත්, අපනයනය වැඩි කිරීමත් තමයි ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් දෙක විධියට අපි දකින්නේ. ඒ විධියට රටේ මත්ස්‍ය සම්පත වැඩි වුණා නම් රටේ ජනතාවට, පාරිභෝගිකයාට ඇඟේ මාළු නටන්නේ නැතුව මාළු ටිකක් ගන්න පුළුවන්කම තිබෙන්නට ඕනෑ. දැන් ඒ තත්ත්වය නැහැ. ඒ නිසා එතුමා මේ ගරු සභාවට අසත්‍යයක් කියලා තිබෙන්නේ. මමද අසත්‍ය කියන්නේ එතුමාද අසත්‍ය කියන්නේ කියන එක දැන් ඒකෙන් පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 67ක් පිට රට යවන්න පටන් ගත්තා කියලා දැන් ගරු ඇමතිතුමා කිව්වා. 2010 අප්‍රේල් මාසයෙන් පස්සේ තමයි මෙතුමා අමාත්‍යාංශය භාර ගත්තේ. අප්‍රේල් 8 වැනිදා නේ මැතිවරණය පැවැත්වුවේ. අප්‍රේල් මාසයේ වුනා මෙට්‍රික් ටොන් 4,619ක් අපනයනය - export - කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2010 මැයි මාසයේ අපනයනය කර තිබෙන්නේ වුනා මෙට්‍රික් ටොන් 1,811යි. අප්‍රේල් මාසයේ මෙට්‍රික් ටොන් 4,619ක් අපනයනය කරපු රටේ මැයි මාසය වන විට අපනයනය කර තිබෙන්නේ මෙට්‍රික් ටොන් 1,811යි. එතකොට ජූනි මාසය වෙන කොට අපනයනය කර තිබෙන්නේ මෙට්‍රික් ටොන් 1,114යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට ජූලි මාසය වෙන කොට වුනා මසුන් මෙට්‍රික් ටොන් 1,326යි අපි අපනයනය කළේ. අගෝස්තු මාසය වන විට මෙට්‍රික් ටොන් 798යි. සැප්තැම්බර් මාසය වන විට මෙට්‍රික් ටොන් 693යි. 2010 ඔක්තෝබර් මාසය වන විට මෙට්‍රික් ටොන් 767යි. මෙට්‍රික් ටොන් 4,619 ඉඳලා 2010 වර්ෂයේ අන්තිම වෙන කොට දිගින් දිගටම අඩු වෙලා තිබෙනවා. මේ අවුරුද්ද වෙන කොට තවත් අඩු වෙයි. අඩු වෙන්න හේතුව මොකක්ද? හේතු ගණනාවක් තිබෙනවා. මම ඒවා කියන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊ ළඟට, ඇයි මේ මත්ස්‍ය අපනයනය අඩු වුණේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ කාල වේලාව නම් හරි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
TNA පක්ෂයේ කාලයත් ගන්න කිව්වා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක අපට දැනුම් දීලා නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කථානායකතුමාට දැනුම් දුන්නා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තව කොච්චර කාලය ගන්නවාද?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
විනාඩි 10ක් වාගේ කාලයක්. අවශ්‍ය වුණොත් තවත් දිග කර ගමු.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ, ඒක ඒ වෙලාවට බලමු.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මම විනාඩි 10කින් අවසන් කරන්නම්.

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමා කොයි අන්දමින් කිව්වත් මම කියපු විධියට විදේශයට යවන මත්ස්‍ය සම්පත දැන් අඩු වෙලා තිබෙනවා. රටේ සැබෑ තත්ත්වය ඒකයි. ඒ විධියට තමයි මාළු අපනයනය අඩු වෙන්නේ. මොකක්ද හේතුව? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශයට මාළු යවන ප්‍රධාන ව්‍යාපාරිකයෝ හතර දෙනයි මේ රටේ ඉන්නේ. මොන කතන්දර කොහොම කිව්වත්, ප්‍රධාන වශයෙන් process කරලා මාළු පිට රට යවන ව්‍යාපාරිකයෝ ඉන්නේ 4 දෙනෙක් පමණයි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මාළු පිට රට යවන ප්‍රධාන factories 32ක් තිබෙනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
Factories 32යි, ප්‍රධාන ව්‍යාපාරිකයෝ 4 දෙනායි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] ඔක්කෝම ව්‍යාපාරිකයෝ තමයි, ප්‍රධාන ව්‍යාපාරිකයෝ 4යි. මම මේ කරුණු ඇතුවයි කථා කරන්නේ. අවශ්‍ය නම්, නම් ටිකත් කියන්නම්. එතකොට දැන් මොකද වෙන්නේ? දැන් ඒ ව්‍යාපාරිකයින්ගෙන් මත්ස්‍ය සම්පත මිලදී ගන්නේ විදේශීය කොම්පැනිවල යාත්‍රා. ඒ companyවල යාත්‍රා මත්ස්‍ය සම්පත මිල දී ගන්න ආපුවාම සාමාන්‍යයෙන් කිලෝ එකකට කීයක හෝ commission එකක් කාට කාට හෝ දුන්නා. කාට දුන්නාද කියන එක මං කියන්නේ නැහැ. ඕනෑ නම් කියන්නත් පුළුවන්. ඒක අවශ්‍ය නැහැ නේ. කාට කාට හෝ රුපියල් හතරක වාගේ commission එකක් ලැබුණා. ඉතින් ඒ ව්‍යාපාරිකයන් අවුරුද්දකට වරක්, දෙ වරක් ඒ උදවිය හම්බ වෙලා, කෑම ටිකක් කාලා බීලා එනවා. එතකොට ඒ ලැබෙන්න ඕනෑ කොටස් ටිකත් ලැබුණා. එවැනි ගනුදෙනුත් සිද්ධ වුණා. හැබැයි දැන් මේක එක වරටම වැඩි වුණා. එක වරට වැඩි කළාම අර විදේශීය නවුකා - vessels - එන්නේ නැහැ. විදේශීය vessels එන්නේ නැති වුණාම ලංකාවේ ව්‍යාපාරිකයෝ තායිලන්තය වැනි රටවල් සමඟ එකතු වෙලා, ඒ රටවල ඉඳ ගෙන මත්ස්‍ය ව්‍යාපාරය පටන් ගෙන තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අමූලික අසත්‍යයක්.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
අමූලික අසත්‍යයක් නොවෙයි. මීගමුවේ "ට්‍රොපික්" නමැති process කරන ආයතනය ලංකාවේ ප්‍රධාන පෙළේ මත්ස්‍ය ව්‍යාපාරය කරන ආයතනයක්. ට්‍රොපික් ආයතනයේ ප්‍රධානියා තමයි රොෂාන්. මේ කප්පම් - commission - සිද්ධිය නිසා, commission එක වැඩි කරන්න ගිහිල්ලා ඒ රොෂාන්ගේ රුපියල් ලක්ෂ 60ක මාළු මුහුද මැද්දේදී කුණු වුණා. මම අමූලික අසත්‍යයක් කියනවා නම් බලන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම වග කීමක් ඇතිවයි කියන්නේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මේ පාර්ලිමේන්තුව නොමඟ යවන්න එපා. රොෂාන් ප්‍රනාන්දුගේ සමාගම තමයි මට සහයෝගය දුන්නේ සියයට 10කින් වැඩි කරන්න. පසු ගිය මාසයේ මේ සියයට දහයේ ප්‍රශ්නය ගැන මා නැවත කථා කළ වෙලාවේ ට්‍රොපික් සමාගමේ අයිතිකරු පැහැදිලි ප්‍රකාශයක් කළා, "ඒක අඩු කරන්න එපා. අපට ඒක ප්‍රශ්නයක් නොවෙයි. මොකද, අපනයන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ආණ්ඩුවේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න අපි ඒ මුදල ආණ්ඩුවට ලබා දෙන්නම්" කියලා. අපි සියයට 5, සියයට 10 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ ගොල්ලෝ අමාරුවෙන් කර ගෙන යනවා. නමුත් ඒ ගොල්ලෝ ප්‍රකාශයක් කළා. මේ අමූලික අසත්‍යයක් කියන්නේ. ඒ පිළිබඳව ප්‍රකාශයක් ඕනෑ නම්, මා ඔවුන්ගෙන් ප්‍රකාශයක් අරගෙන දමන්නම්. මේක පාර්ලිමේන්තුව. වේදිකාවේ ඕනෑ පවයක් කිව්වාට කමක් නැහැ. පාර්ලිමේන්තුවේ කථා කරන කොට යම් කිසි සදාචාරයක් තිබෙන්න ඕනෑ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වැඩිපුර වෙලාවක් දෙනවාද? [බාධා කිරීමක්] අනිවාර්යයෙන්ම ඇමතිතුමාට ප්‍රකාශ ගන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ප්‍රකාශයක් නොවෙයි. අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඇමතිතුමාට ඕනෑ විධියට ප්‍රකාශයක් නොදුන්නොත් ඒ ව්‍යාපාරය කරන්න හම්බ වන්නේ නැහැ. රටේ මාළු market එකේ ඉඳලා, බිලී පිත්තේ ඉඳලා කප්පම් ගන්න තැනක් බවට පත් වෙලා තිබෙන රටේ, මේ වාගේ කථාවකදී ඒ ව්‍යාපාරිකයා ප්‍රකාශයක් නොදුන්නොත් ඒ ව්‍යාපාරිකයාගේ ව්‍යාපාරය හෙට ඉඳලා කර ගෙන ඉවරයි. එම නිසා ඇමතිවරයාට ප්‍රකාශ ගන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකේ කිසිම තර්කයක් නැහැ. ඒ බලපෑමට ඕනෑ තරම් ප්‍රකාශ දෙයි. ඇයි? [බාධා කිරීමක්] "කුඩු කාපු එකාගේ නහය දනවා ලු" මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] "කුඩු කෑ එකාගේ නහය දනවා" ය කියා ගමේ කථාවක් තිබෙනවා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවා නැත්නම් නිහඬව ඉන්න පුළුවන් මූලාසාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවා නැත්නම් නිහඬව අහ ගෙන ඉඳලා උත්තර දෙන්න පුළුවන්. අපි කථා කරන්නේ වග කීමක් ඇතිවයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා උත්තර දෙන්න කලින් පොඩ්ඩක් ඇහුම් කන් දීලා සිටියා නම් හොඳයි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පාර්ලිමේන්තුව නොමඟ යවන්න එපා. මේක උත්තරීතර සභාවක්.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඊ ළඟට, දැන් ධීවර ඇමතිතුමා කිව්වා, මේ මත්ස්‍ය සම්පත විදේශගත කරන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවාය කියලා. [බාධා කිරීමක්] ඔව්, ඔව්. [බාධා කිරීමක්] හරි, හරි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔය ඔළුව නිසා තමයි ගුටි කෑවේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
සමහර අයට නඩු වැටුණේත් ඒකයි. මන්ත්‍රීකම් නැතුව ගියේත් ඒකයි. [බාධා කිරීමක්]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ජනාධිපතිතුමාට කේලාම් කිව්වා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මා ජනාධිපතිතුමාට කේලාම් කියන්න ගිහිල්ලාත් නැහැ. මම ගිහින් පාවා දීලාත් නැහැ. මම එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්දය අරගෙන එක එක සාටකවල එල්ලෙන්න ගිහිල්ලාත් නැහැ; කේලාම් කියන්න යන්නේත් නැහැ; එක එක දාම් boardවල එක එක් කෙනාට ඕනෑ හැටියට දෝලනය වන ඉත්තෙක් වන්නේත් නැහැ. මගේ උත්පත්තිය එක්සත් ජාතික පක්ෂයයි. මා සටන් කරන්නේ නිවැරැදි තැන ඉඳ ගෙනයි. එම නිසා මා මෙතැන ඉන්නවා. සමහර අය කරපු වංචා නිසා තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීකම් නැතුව ගියේ. රනිල් වික්‍රමසිංහ මහතාට පිං සිද්ධ වන්න නැවත මන්ත්‍රීකමට පත් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගඳ ගහන ඉතිහාසයක් තිබෙන මිනිස්සු තමයි වැදගත් මිනිස්සු වාගේ කථා කරන්නේ. ඉතිහාසය අවුස්සා ගන්න එපා කියලා මා ඉතාමත් පැහැදිලිව ප්‍රකාශ කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කිව්වා, මාළු ක්ෂේත්‍රයේ දියුණුවක් තිබෙනවාය, මේ අනුව -[බාධා කිරීමක්] අහගන්නේ නැහැ නේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මට පෙන්වන්න කෝ පොලිසියේ වාර්තාව.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මත්ස්‍ය අපනයන වැඩි වෙලා තිබෙනවාය කිව්වා. විදේශ නැවුකා එන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවාය කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මා ළඟ තිබෙනවා. ඒ වාර්තාවට අනුව 2010 මැයි මාසයේ ඇවිත් තිබෙන්නේ නැවුකා 29යි; 2010 ජූනි මාසයේ ඇවිත් තිබෙන්නේ නැවුකා 24යි; 2010 ජූලි මාසයේ ඇවිත් තිබෙන්නේ නැවුකා 16යි; 2010 අගෝස්තු මාසයේ ඇවිත් තිබෙන්නේ නැවුකා 15යි; 2010 සැප්තැම්බර් මාසයේ ඇවිත් තිබෙන්නේ නැවුකා 14යි; 2010 ඔක්තෝබර් මාසයේ ඇවිත් තිබෙන්නේ නැවුකා 7යි. මෙතුමා මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ විදේශ නැවුකාවල පැමිණීම 29 සිට 7 දක්වා අඩු වෙලා තිබෙනවා. විදේශ නැවුකා එනවා අඩු නම් අපනයනය වැඩි වන්නේ කොහොමද? සියයට 64කින් අපනයන වැඩි වුණේ කොහොමද? එහෙම නම් මාළු ටික flight එකේ එවන්න ඇති. මේවා කියන්න පුළුවන් දන්නේ නැති මිනිස්සුන්ට.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මාළු flight එකේ ගෙනෙනවා නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හරි, හරි. ඇත්ත, ඇත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා බොහොම උජාරුවෙන්, ඉතා ආඩම්බරයෙන් පසු ගිය වතාවේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, " ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ - 2008 වාර්ෂික වාර්තාව, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව. ඒ වාර්තාවේ මෙන්න මෙහෙම කියනවා:

"සංස්ථාවේ සම්පත් කුණු කොල්ලයට බඳු දීම සහ වැරදි මූල්‍ය පාලනය මෙම තත්ත්වයට වගකිය යුතුවන අතර, දැනටමත් එම දුර්වලතා හඳුනා ගෙන ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතින බවද මාගේ පාලනය යටතේ වසරක් ඇතුළත අලාභ යන වචනය වෙනුවට ලාභ යන වචනය ආදායම් ප්‍රකාශවල ආදේශ කිරීමට කටයුතු කරන බවද සඳහන් කරමි."

ඒ 2008 වාර්ෂික වාර්තාව. 2009 වාර්ෂික වාර්තාවේ නිරීක්ෂණයත් මෙතුමා දැන් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙනවා. තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි. හැබැයි මේ වාර්තාවේ කොතැනකවත් එහෙම එකක් සඳහන් කරලා නැහැ. එහි තිබෙන්නේ, "කෙසේ වෙතත් සංස්ථාවේ යහපාලනය හා මූල්‍ය විනය ස්ථාපිත කිරීම මඟින් එවැනි තත්ත්වයක් වළක්වා ගැනීමට උපදෙස් දී ඇති අතර, 2009 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය ලබා දෙනමෙන් කාරුණිකව ඉල්ලමි." කියලා. අලාභ කියන වචනය ලාභ කරනවාය කියා කිව්වා. ඒ කිව්වේ 2008. හැබැයි මේකේ කොතැනකවත් එහෙම සඳහන් වෙලා නැහැ. 2009ට එනකොට මෙතුමා අලාභ, ලාභ කරලා තිබෙන්න ඕනෑ. නමුත් ලාභ කියන වචනය කොතැනකවත් සඳහන් වෙලා නැහැ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම 2008 නිරීක්ෂණ ඉදිරිපත් කරන්නේ කොහොමද? මම එතකොට- [බාධා කිරීමක්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා නැහැ කියලා කියන නිසා ඔබතුමාට දැන ගන්නත් එක්ක "වෛද්‍ය රාජිත සේනාරත්න, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ - 2008 වාර්ෂික වාර්තාව, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව" නැමැති වාර්තාව මම **සභාගත*** කරනවා, මේ ගරු ඇමතිවරයා මේක නැහැ කියලා කියන නිසා අනික් අයටත් බලා ගැනීම සඳහා. [බාධා කිරීමක්]

අපේ ඇමතිතුමාට හරියට කේන්ති යනවා මේවා ගැන කථා කරන කොට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේවා ලාභ ලබන තැන්නේ. ලාභ ලබන්න කටයුතු කරනවා ලු. [බාධා කිරීමක්] ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ප්‍රධාන කොටස් 4යි තිබෙන්නේ. එකක් ලංකා ධීවර සංස්ථාව. ඊ ළඟ එක ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව. ඊ ළඟ එක සී-නෝර් ආයතනය. අනෙක් එක ධීවර දෙපාර්තමේන්තුව. දැන් ධීවර දෙපාර්තමේන්තුව ගැන කථා කරන්න වැඩක් නැහැ. ධීවර දෙපාර්තමේන්තුවේ

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

සාමාන්‍යාධිකාරියි, කළමනාකාර අධ්‍යක්ෂයි -Managing Director - අද Board Meeting එකේ ගහ ගන්න තැනට ගිහිල්ලා තිබෙනවා. මම ඒ දෙදෙනාගේ නම් කියන්නේ නැහැ. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඇතුළේ ගෝරි. ඔබතුමන්ලාට හිතා ගන්න පුළුවන් මොන මොන ප්‍රශ්න ද කියලා. මම අර කලින් කියපු ඒවා අදාළ වෙනවා. පුළුවන් නම් නැහැයි කියලා කියන්න ඒකත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ලාභ ලබනවා කිව්වා නේ. මේ ලාභ ලබනවා කියපු කතන්දරයේ අද EPF එකෙයි, ETF එකෙයි සල්ලි ටික ගෙවන්නත් බැහැ. ලංකා ධීවර සංස්ථාවේ, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවකයෝ වෙනුවෙන් ගෙවිය යුතු EPF එකේ, ETF එකේ මුදල් අද ගෙවා ගන්නත් බැහැ. අද පඩි ගෙවන්න හැම අවුරුද්දකම මිලියන 8ක්- [බාධා කිරීමක්] රුපියල් මිලියන 8ක් හැම මාසයේම මහා භාණ්ඩාගාරයෙන් ලංකා ධීවර සංස්ථාව ගන්නවා, ධීවර දෙපාර්තමේන්තුව ගන්නවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ධීවර ඇමති වුණාට පස්සේ ගෙවන්න තිබුණු ඒවා ටික ගෙවන්න කටයුතු කළා. මම ආවාට පස්සේ ගෙවන්න කිසිම හිඟයක් නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා ඉදිරිපත් කරපු තවත් එකක් තිබනවා. යුද ජයග්‍රහණයෙන් පස්සේ දෙවර්ෂය සම්පූර්ණ වීම වෙනුවෙන් 2010 නොවැම්බර් මාසයේ 19 වනදා "ලංකාදීප" පත්තරය විශේෂ අතිරේකයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මෙතුමා ඒ විශේෂ අතිරේකයට "අනාගතය උපන් දවස" කියලා අතිගරු ජනාධිපතිතුමාගේ ඡායා රූපයක් දාලා ඒකේ කරුණු ගණනාවක් පළ කරලා තිබෙනවා. ඒ ලිපියේ ඔක්කෝම කියන්න වෙලාව නැහැ. ඒකේ එකක් කියනවා, "දියුණු යුරෝපයේ ප්‍රමිතීන්ට අනුකූලව අපගේ ධීවර වරායන් ඉහළ යටිතල පහසුකම් සපයන කේන්ද්‍රස්ථානය බවට පත් කරමින් ආසියාවේ ප්‍රමුඛ මට්ටමට ගෙන ඒමට අවශ්‍ය විධිමත් පාලන ව්‍යුහයක් සකස් කිරීමට පියවර ගන්නවා." කියලා. හැබැයි හලාවත market එකට ඇවිල්ලා බලන්න, තවමත් මඩ ගොඩේ මාළු ටික තියා ගෙන ඉන්නවා. ඔන්න- [බාධා කිරීමක්] ආසියාවේ කේන්ද්‍රය. [බාධා කිරීමක්]

ලංකාවත් ආසියාවේ ආශ්චර්ය කරනවානේ කිව්වේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් ධීවර දෙපාර්තමේන්තුවත් ලංකාවේ ආශ්චර්යට ගෙනෙන්න යනවා. නිකම් නොවෙයි කේන්ද්‍රය. මේ විධියට පට්ටපල් අසත්‍ය කිය කියා යනවා නම් මම කියනවා, "කේන්දරය බලා ගන්න එක හොඳයි" කියලා. [බාධා කිරීමක්] තව කියනවා, "ධීවර වරායෙන් එන ආදායම ප්‍රවර්ධනය කිරීම. 2010 මැයි මස ධීවර වරායෙන් පැවති ආදායම රුපියල් මිලියන ලක්ෂ 158ක් වූ අතර, සැප්තැම්බර් මාසය වන විට එය මිලියන ලක්ෂ 280 දක්වා වැඩි කරමි" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිලියන ලක්ෂ-

රුපියල් මිලියන ලක්ෂ 158යි. ඒක මිලියන ලක්ෂ 280 දක්වා වැඩි කරනවාලු. මේ, මා කියන එකක් නොවෙයි. මේකත් බොරු කියලා කියාවි. මේ තිබෙන්නේ. මේ, තමුන්නාන්සේලා දමපු දැන්වීම.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මොකක්ද?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මේ තිබෙන්නේ. රුපියල් මිලියන ලක්ෂ 280 දක්වා ඉහළට ගෙන යනවාලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පට්ටපල් අසත්‍ය නේ. ගල් පැළෙන බොරු නේ. කවුරු රවටන්නද මේවා කරන්නේ? රටේ ජනතාවගේ සල්ලිවලින් රටේ ජනතාව රැවටීම සඳහා ජනතාව ගොනාට ඇන්දවීම සඳහා පිටු භාගයක දැන්වීමක් දමනවා. මෙන්න මේකයි අද තිබෙන තත්ත්වය මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ බොරුව නොකර කරුණාකර ඇත්ත කථා කරලා රටේ ජනතාව වෙනුවෙන් ධීවර සම්පත වැඩි කරන්න. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න. අපත් ඇත්තට උදවු කරන්නම්. බොරුව කරන්න නම් අපට උදවු කරන්න පුළුවන් වන්නේ නැහැ. අපට බොරුව වර්ණනා කරන්නත් බැහැ. කරන හොඳ දේ කියන්න අපට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කථාව අවසන් කරන්නයි හදන්නේ. කරන හොඳ දේ අපි අගය කරන්නම්. බොරුව කරන එක අනුමත කරන්න අපට පුළුවන්කමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හරියට ගත්තොත් දැන් ධීවර අමාත්‍යාංශයේ හඬ විතරයි, වැඩ නැත. හරියට බෙරය වාගේ තමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට ස්තුති කරමින් මම නවතිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා.

[අ.භා.3.02]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැල්ලව හිටපු පොලිස් ස්ථානාධිපතිතුමාගේ කථාවෙන් පස්සේ-

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මම ඉතාම ආඩම්බරයෙන් එය ප්‍රකාශ කරනවා.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
ඒ ඉතිහාසය අපි දන්නවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වයඹ පළාත නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි දන්නවා වැල්ලව පොලිස් ස්ථානයේ ඒ කාලයේ වෙච්ච දේවල්. එහෙම ඉතාම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අතීතයක් තිබෙන කෙනෙක්. සම්පූර්ණයෙන්ම බොරු වාර්තා අර ගෙන කථා කළා. ධීවර අමාත්‍යාංශය සම්බන්ධයෙන් කාගෙන් හරි බොරු වාර්තා රාශියක් අර ගෙන මේ උත්තරීතර පාර්ලිමේන්තුව නොමඟ යවන විධියට කථා කිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මොකක්ද point of Order එක?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ තවත් කෙනකුට අපහාස වන විධියට කථා කරන්න පුළුවන්කමක් නැහැ. මම වැල්ලව පොලිස් ස්ථානාධිපතිවරයා වශයෙන් හිටියා. පොලිස් කොස්තාපල්වරයකු වශයෙන් පොලිසියට බැඳුණා. මම ආඩම්බර වෙනවා අද මේ තත්ත්වයට -මෙතැනට- ආපු එක පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නින්දිත ඉතිහාසයක් තිබෙනවා කිව්වා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මොකද නැත්තේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
( மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
නැහැ, ඒකේ point එකක් නැහැ නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ ප්‍රකාශය මට ඇහුණා. ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීම්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාගේද නින්දිත විධිය? මොකක්ද නින්දිත විධිය?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා වාඩි වෙන්න. [බාධා කිරීමක්] ඔබතුමාගේ නම කිව්වේ නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ නම කිව්වේ නැහැ. ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඒක ඉල්ලා අස් කර ගන්න කියන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! ඔබතුමාගේ නම කිව්වේ නැහැ. [බාධා කිරීම්]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මේ සභාවේදී විශේෂයෙන්ම ගරු මන්ත්‍රීවරුන් නොමඟ යවන විධියට කථා කළා. ධීවර අමාත්‍යාංශයේ ඉතිහාසය ගත්තාම මා හිතන්නේ මෙච්චර ක්‍රමවත් විධියට ධීවර අමාත්‍යාංශය වැඩ කරපු යුගයක් මේ රටේ ඉතිහාසයේවත් නැහැ. මේ ගරු අමාත්‍යතුමා පත් වුණාට පස්සේ- [බාධා කිරීම්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මේ පැත්තේ ඉඳලා ඒ පැත්තට යනවා. ඒක නින්දිත නැද්ද? මේ පැත්තේ ඉඳලා එහා පැත්තට යන එකත් නින්දිත වැඩක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
වාඩි වෙන්න. ඔබතුමා මෙච්චර වෙලා කථා කළා. එතුමාට කථා කිරීමේ නිදහස දෙන්න.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අමාත්‍යතුමා පත් වුණාට පස්සේ මුලින්ම එතුමා ඒ පළමුවැනි කාර්තුවම ගත කළේ- [බාධා කිරීම්]

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කළ ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
එතුමා ඒ පළමුවැනි කාර්තුවම ගත කළේ ධීවර අමාත්‍යාංශය සම්බන්ධයෙන් අධ්‍යයන කටයුතු කරන්න. [බාධා කිරීම්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඒ ප්‍රකාශය හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න කියන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
ධීවර අමාත්‍යාංශයේ තිබෙන ගැටලු, ධීවර ජනතාවගේ ගැටලු ධීවර සම්පත් පිළිබඳ ගැටලු ගැන අධ්‍යයනය කරන්න තමයි එතුමා පළමුවැනි කාර්තුවම ගත කළේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න කොට මම කාටවත් අපහාස කරලා නැහැ. කරුණාකර ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Hon. Palitha Range Bandara, do not disturb. වාඩි වෙන්න.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

අපි ඉතාම සතුටු වෙනවා ධීවර අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරුන් හැටියට- [බාධා කිරීමක්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

දැන් වෙන විෂයයක් ගැනයි කථා කරන්නේ.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර අමාත්‍යාංශයේ රැස්වීම්වලට සහභාගි වෙච්ච සෑම අවස්ථාවකම අපි දැක්කා එතුමා මේ විෂයය හොඳින් හදාරලා, ඒ කටයුතු හරියට අධ්‍යයනය කරලා මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරන ආකාරය. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා අද මේ රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා - [බාධා කිරීමක්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කළ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා මේ කරුණු කාරණා හරියට අවබෝධ කර ගන්නේ නැතිව කවුරු හරි දෙන බොරු වාර්තා එක්ක-

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Point of Order එක මට හොඳට ඇහුණා; දැනුණා. ස්ථාවර නියෝගවලට විරුද්ධව යම් දෙයක් කියලා තිබෙනවා නම් එය ඉවත් කරනවා. එච්චරයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ඔය ටික කිව්වා නම් ඉවරයි නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඒක තමයි කිව්වේ, "Order, please!" කියලා. මන්ත්‍රීවරුන් disciplined වෙන්න ඕනෑ. එතකොටයි අහ ගන්න පුළුවන් මූලාසනයෙන් දෙන නියෝග. [බාධා කිරීමක්]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු අමාත්‍යතුමා පළමුවැනි කාර්තුවම ගත කළේ ධීවර අමාත්‍යාංශය සම්බන්ධයෙන් හරියට අධ්‍යයන කටයුතු කරන්නයි. එතුමා ඒ නිලධාරින් එක්ක හරියට සාකච්ඡා කළා. අධීක්ෂණ මන්ත්‍රීවරුන් හැටියට අපි දන්නවා එතුමා ඒ නිලධාරින් එක්ක හරියට සාකච්ඡා කරලා තමයි මේ අමාත්‍යාංශයේ මූලික වැඩ කටයුතු ආරම්භ කළේ කියන කාරණය. අද වන කොට අපට සතුටු වන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මන්ත්‍රීතුමා කථා කළා රක්ෂණය ගැන. මේ එක උදාහරණයක්. එතුමා කථා කළේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ධීවරයන් සඳහා වෙන් කරපු රක්ෂණ ක්‍රමය ගැනයි. කෘෂිකර්ම අමාත්‍යාංශය -කෘෂි රක්ෂණ මණ්ඩලය- ධීවරයන් වෙනුවෙන් ඒ රක්ෂණ ක්‍රමය ආරම්භ කරලා තිබුණා.

ඒ රක්ෂණ ක්‍රමය ගැන තමයි මේ සභාවේ සාකච්ඡා කළේ, කථා කළේ. නමුත් අද වන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර අමාත්‍යාංශය සියලුම ධීවරයින් සඳහා නව රක්ෂණ ක්‍රමයක් ආරම්භ කරලා තිබෙනවා. ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඒවා දන්නේ නැහැ. තමුන්නාන්සේට කවුරු හරි ලියලා දුන්නු එකක් ගැන තමයි තමුන්නාන්සේ කථා කළේ.

ඊළඟට එතුමා කථා කළා ධීවර ණය යෝජනා ක්‍රමය ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදෑසනත් වෙන්නප්පුවේ ලංකා බැංකුවට ධීවරයින් පස් දෙනකු ගිහිල්ලා ඒ ණය යෝජනා ක්‍රමයට දායක වෙන්න බැංකුවත් සමඟ සාකච්ඡා කර තිබෙනවා. ඔය කියන විධියට කිසිම ආකාරයකින් ඒකට ඇපකර ඉල්ලන්නේ නැහැ. එක එක බැඳුම්කර ඉල්ලන්නේ නැහැ. සමහර වෙලාවට මේ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරද්දී තමන්ගේ බෝට්ටුව ඇපයට තියන්න ඕනෑ වෙන්න පුළුවන්. ඔය කියන විධියට ඉඩම් ඔප්පු ඇප තියන්න, ගෙවල් බැංකුවට උගස් කරන්න වන්නේ නැහැ. ඒක නිසා අපි හිතනවා මේ ණය යෝජනා ක්‍රමය ඉතාමත් හොඳින් ක්‍රියාත්මක වෙනවා කියලා.

ඒ වාගේම විදේශ යාත්‍රාවලින් ලබා ගන්නා මසුන් ප්‍රමාණය සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කිරීම සම්බන්ධයෙන් අපි ඉතාමත් සතුටු වෙනවා. ගරු ඇමතිතුමනි, අපි සතුටු වෙනවා තමුන්නාන්සේට ඒ කටයුත්ත කිරීමට කොන්දක් තිබුණු එක ගැන.

මොකද, කිසිම කෙනකුට කොන්දක් තිබුණේ නැහැ මේක කරන්න. අපි මේකට ඉංග්‍රීසියෙන් කියන්නේ wet fish කියලායි. මේක අපේ ධීවර සංස්ථාවට ලැබෙන්න ඕනෑ දෙයක්. විදේශ සමාගම්වල ඩව් යාත්‍රා ඇවිල්ලා අපේ මත්ස්‍ය සම්පත නෙළා ගෙන යන කොට සමහර වෙලාවට ඒ සියයට 5 අපට දුන්නේ නැහැ. ඒ සියයට 5 වෙනුවට අපේ අය කප්පම් ගත්තා සමහර කාලවල. අපේ රජය පැවැති කාලවල පවා ඒවා සිද්ධ වුණා. ඉතින් අපි හිතනවා තමුන්නාන්සේට කොන්දක් තිබුණා කියලා ඒක සියයට 10 දක්වා වැඩි කරන්න. අපි හිතනවා ඒ සියයට 10 සම්පත ධීවර සංස්ථාවට අරගෙන ඒක ක්‍රමවත් කරලා කටයුතු කිරීම තුළින් විශේෂයෙන්ම අපේ දේශීය පරිභෝජනයට අවශ්‍ය කෙලවල්ලන් වැනි මත්ස්‍යයින් ලබා ගන්න අපට ඉදිරි කාලයේදී පුළුවන් වේවි කියලා.

අද මේ ගරු සභාවට ධීවර අමාත්‍යතුමා ඉදිරිපත් කරපු නියෝග සහ නියමය ගැන කථා කරද්දී ධීවර බෝට්ටුවල ආරක්ෂාව පිළිබඳවත් කථා කළ යුතුයි. පසු ගිය කාලය ගත්තාම මේ ධීවර බෝට්ටුවල ආරක්ෂාව සම්බන්ධයෙන් විශාල ගැටලු මතු වුණු අවස්ථා තිබෙනවා. අද ඒක ක්‍රමවත් කරන්නට කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම තමයි මසුන් ආනයනය කිරීමේදීත් ඇති වී තිබෙන තත්ත්වය. විශේෂයෙන් ඉස්සන් කර්මාන්තය. අද අපේ රටේ ප්‍රධාන වශයෙන් ඉස්සන්, මුහුදු කූඩැල්ලන්, ජලජීවී පැළෑටි, විසිතුරු මසුන් වාගේ දේවල් ආනයනය කරනවා. ඒ ආනයනය කරද්දී ඒවා ක්‍රමවත් කිරීමට වාගේම ට්‍රෝලින් ක්‍රම වැනි වැරදි ක්‍රම නැති කිරීමට තමුන්නාන්සේ නියෝග ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම මසුන් ගොඩ බෑමේදී සිදු කෙරෙන කටයුතු සම්බන්ධයෙන් අදාළ වන නියෝග ගෙනැල්ලා තිබෙනවා. අපි ඉස්සෙල්ලා කිව්වා වාගේ විදේශ යාත්‍රාවලින් ලබා ගන්නා මසුන් ප්‍රමාණය සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කිරීම සම්බන්ධයෙන් නියෝග ගෙනැල්ලා තිබෙනවා. ඒ සියල්ලක්ම ධීවර කර්මාන්තයේ දියුණුව සඳහා ගෙනැල්ලා තිබෙන නියෝග. ඒවා තුළින් ඉදිරි කාලයේදී ධීවර කර්මාන්තයේ දියුණුවට වැඩ කටයුතු සිද්ධ වේවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය තරම් ධීවරයින් දිහා බලපු වෙනත් රජයක් නැහැ. අතිගරු ජනාධිපතිතුමා ධීවර ප්‍රදේශයක කෙනෙක්. එතුමා ධීවර ජනතාව පිළිබඳව විශේෂ අවධානය යොමු කරපු කෙනෙක්. හිටපු ධීවර අමාත්‍යවරයෙක්. එතුමාගේ ඉල්ලීමට සම්පූර්ණයෙන්ම ධීවරයින් ආදායම් බද්දෙන් නිදහස් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකම ඇති.

ඒ වාගේමයි අද වන කොට බලපත්‍ර සම්බන්ධයෙන් තිබෙන තත්ත්වයත්. ඉස්සර අපේ ධීවරයින්ට ඉතා විශාල අමාරුකම්වලට, අපහසුතාවලට මුහුණ දෙන්නට සිද්ධ වුණා, බලපත්‍ර ගාස්තු ගෙවන්න වුණා. බලපත්‍ර ලබා ගන්න සිදු වුණා. අද වන කොට ඒවා සියල්ලක්ම ලිහිල් කරලා තිබෙනවා. විශේෂයෙන්ම අද වන කොට තමුන්නාන්සේ තහනම් ධීවර ක්‍රම නවත්වන්න ඉතා නිර්භීතව වැඩ කටයුතු කරපු එක ගැන අපි ඉතාමත් ආඩම්බර වෙනවා. අපටත් ඒ ප්‍රශ්නය දිගටම තිබුණා. අපි නියෝජනය කරන පුත්තලම් දිස්ත්‍රික්කය ඇතුළත් වයඹ පළාතේ ඒ තත්ත්වය තිබුණා. සම්පූර්ණයෙන් කිලෝ මීටර් 274ක දිගින් යුත් මුහුදු තීරය තිබෙන්නේ වයඹ පළාතේ. ඒ වයඹ පළාත තුළ පවා වැරදි ධීවර ක්‍රම රාශියක් තිබුණා. ගරු ඇමතිතුමා ජනප්‍රිය දේවල් කරන්නේ නැතිව මේ රටේ අනාගතය වෙනුවෙන්, මේ රටේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන්, විශේෂයෙන් ධීවරයින් වෙනුවෙන්, ධීවර සම්පත වෙනුවෙන් ගත්ත පියවර නිසා ඒ වැරදි ක්‍රම නවත්වන්න හැකියාව ලැබුණා. විශේෂයෙන් උතුරුකරයේ, නැඟෙනහිර, දකුණේ light course වාගේ ක්‍රම නවත්වන්න තමුන්නාන්සේ ගත්ත පියවර අපි සියලු දෙනාම අනුමත කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශේෂයෙන්ම මිරිදිය ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් මේ වෙලාවේදී තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමනි, මා වයඹ පළාත් සභාවේ ධීවර ඇමතිවරයා හැටියට සිටියදී අපට ලොකු වුවමනාවක් තිබුණා, මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීමට. මිරිදිය ධීවර කර්මාන්තය තුළින් තමයි දරුවන්ට පෝෂ්‍ය පදාර්ථ සහිත ආහාරයක් ලබා දිය හැකි වන්නේ. පෝෂ්‍ය පදාර්ථ සහිත ආහාරයක් මේ දරුවන්ට ලබා දෙන්න නම්, ගම්වල දිළිඳුකමින් පෙළෙන -දරිද්‍රතාවෙන් පෙළෙන- අහිංසක දරුවන්ගේ පෝෂ්‍ය ගුණය වැඩි කරන්න නම්, මන්ද පෝෂණය නැති කරන්න නම් කළ යුතුව තිබෙන ප්‍රධානම දෙය තමයි මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීම. ඒ නිසා මම හිතන්නේ මිරිදිය ධීවර කර්මාන්තය පිළිබඳ අපේ අවධානය තව තවත් යොමු වෙන්න ඕනෑය කියායි.

විශේෂයෙන්ම මා වයඹ පළාත් සභාවේ ධීවර ඇමති වෙලා සිටි කාලයේදී අපටත් ලොකු උනන්දුවක්, ලොකු වුවමනාවක් තිබුණා ධීවර කර්මාන්තය දියුණු කරන්න. නමුත් ඒකේ අඩු පාඩු ගොඩාක් තිබෙනවා. ඒ නිසා ඒ ගැන අපි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. විශේෂයෙන්ම මිරිදිය ධීවර කර්මාන්තයේ මත්ස්‍ය අභිජනනය -මත්ස්‍ය පැටවුන් බෝ කිරීම- ගැන බැලුවත් අඩු පාඩුකම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. වී නිෂ්පාදනයට අදාළව ආසනික් පිළිබඳව අද රටේ විවිධ කතා පැතිරෙනවා. ඒ නිසා ධීවර කර්මාන්තයට අදාළව එවැනි තත්ත්වයක් ඇති නොවන්නට ඉදිරි කාලයේදී අපි ඒ ගැනත් සැලසුම් සකස් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අපේ රටේ සමහරක් වැව්වල පතුලේ බැරලෝහ වාගේ දේවල් තිබෙනවා. එවැනි දේවල් සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න ඕනෑ. වතුර පිළිබඳව හොඳ පරීක්ෂණයක් කරන්න ඕනෑ. රටේ එවැනි කතාවක් පැතිරුණොත් මිනිස්සු මිරිදිය මත්ස්‍ය පරිභෝජනයට යන්නේ නැහැ. ඒක නිසා ඉදිරි කාලයේදී ඒ වතුර පිළිබඳව හොඳින් පරීක්ෂණ කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ පරීක්ෂණ කටයුතු කිරීම සහ මත්ස්‍ය අභිජනනය කියන දෙපැත්තම මිරිදිය ධීවර කර්මාන්තයේ දියුණුවට ඉතාමත් වැදගත් වෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා කතා කරමින් හලාවත යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සඳහන් කළා. ඒක ධීවර අමාත්‍යතුමාගේ, ධීවර අමාත්‍යාංශයේ ප්‍රශ්නයක් නොවෙයි. හලාවත නගර සභාව විසින් විශේෂයෙන්ම හලාවත මාළු මාර්කට් එක බදු දීලායි තිබෙන්නේ. ඒ බදු ගත්ත පුද්ගලයාගේ ක්‍රියා කලාපය පිළිබඳවයි ගැටලුව තිබෙන්නේ. එවැනි ප්‍රශ්න තිබෙනවා නම් ඉදිරි කාලයේදී අප ඒවාට මැදිහත් වෙනවා. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට අපි තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා. අවුරුදු ගණනාවක් තිස්සේ පුත්තලම දිස්ත්‍රික්කයේ අපේ ප්‍රධාන ඉල්ලීමක් තමයි ධීවර වරායක්. විශේෂයෙන්ම හලාවත ධීවර වරායේ යම් යම් ගැටලු ගැන කිව්වා. හලාවත ධීවර ජැටිය, මෝය කටේ තිබෙන ගැටලු ගැන කතා කළා. හලාවත තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි ඒ මෝය කට වැලිවලින් පිරෙන එක. පුත්තලම දිස්ත්‍රික්කයේ මේ වැලි ප්‍රශ්නය නිසා සමහර තැන්වල නැංගුරම් පොළවල්, ධීවර වරායයන් ආදිය ඉදි කරන්න බැහැ. ස්වභාවික පරිසර තත්ත්වයන් යටතේ එවැනි තත්ත්වයක් තිබෙනවා. විශේෂයෙන් අපි ගරු ඇමතිතුමාගේ

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

අවධානය යොමු කරනවා, මේ ගැන සුදුසු පරීක්ෂණයක් කරන්නටය කියා. ධීවර වරාය නීතිගත සංස්ථාව තමුන්නාන්සේ යටතේයි තිබෙන්නේ. ඒ නිසා ඒ නිලධාරින් ගෙන්වා හරි පරීක්ෂණයක් කරලා, පුත්තලම දිස්ත්‍රික්කය තුළ සුදුසු තැනක ධීවර වරායක් ඉදි කර දෙන්නය කියා අපි තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ඇත්තෙන්ම අපේ රටේ දිගම මුහුදු තීරයක් තිබෙන වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන ධීවර වරායක් නැහැ. උතුර, නැඟෙනහිර, දකුණ යන ඒ හැම ප්‍රදේශයකම ධීවර වරායයන් තිබෙනවා. නමුත් පුත්තලම දිස්ත්‍රික්කයේ නැහැ. පුත්තලම දිස්ත්‍රික්කයේ අපට තිබෙන්නේ නැංගුරම් පොළවල් කිහිපයක් විතරයි. හලාවත, කල්පිටිය වැනි ස්ථානවල ධීවර ජැටි තිබෙනවා. රටේ ඉතා විශාල වැඩ කොටසක් කරන ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා මේ අවස්ථාවේ මේ සභාවේ ඉන්නවා. ඒ වාගේම අපේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා ඉන්නවා. ඒ දෙදෙනාම ඉන්න වෙලාවේ පුත්තලම දිස්ත්‍රික්කයට ප්‍රධාන ධීවර වරායක් ලබා දෙන්නය කියා අපි ඉල්ලීමක් කරනවා. ගරු අමාත්‍යතුමා ඒ සම්බන්ධයෙන් නිලධාරින් එවා තිබුණා. ඒ නිලධාරින් අපත් සමඟ ගියා. වෙන්නප්පුවේ බැලුවා; නාත්තණ්ඩියේ බැලුවා; හලාවත බැලුවා; පුත්තලමේ බැලුවා. ඒ ප්‍රදේශවල අධ්‍යයන කටයුතු කරලා ධීවර වරායක් හදන්න පුළුවන් තැනක් සොයා බලන්නය කියා ඒ නිලධාරින් එවීම ගැන අප සතුටු වෙනවා.

ප්‍රධාන ධීවර වරායක් ලබා දෙන්නය කියන එක තමයි අපේ ප්‍රධාන ඉල්ලීම වෙන්නේ. මොකද, පුත්තලම දිස්ත්‍රික්කය ප්‍රධාන කළපු තුනක් තිබෙන, දිගම මුහුදු තීරුවක් තිබෙන, මත්ස්‍ය සම්පත විශාල වශයෙන් තිබෙන, ඉස්සන් කර්මාන්තය වැනි ප්‍රධාන ආර්ථික වැදගත්කමක් ඇති ධීවර කර්මාන්ත කරන, ධීවර කර්මාන්තයට ලොකු රුකුලක් දෙන්න පුළුවන්, අත්වැලක් දෙන්න පුළුවන් ප්‍රදේශයක් නිසා ධීවර වරායක් පිළිබඳ අපේ සිහිනය සැබෑ කර දෙන්නය කියා අප ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, දිවංගත සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය කාලයේ අපට මතකයි, වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ ධීවර වරායක් හදන්න මුල්ගලක් තැබූ බව. පුත්තලම් දිස්ත්‍රික්කය තුළ ධීවර වරායක් හදනවා නම් සුදුසු තැනක හදන්න ඕනෑ. සමහර වෙලාවට හලාවත මෝය කටේ වැලි පිරෙනවා. එවැනි දේ වෙන්නේ ස්වභාවික පරිසර හේතූන් නිසායි. ඒවා කාගේවත් වැරදි නොවෙයි. නමුත් හරි තැනක ඒ ධීවර වරාය ඉදි කර දෙන්න කියලා අප තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර කර්මාන්තය ගැන කථා කරන කොට, මේ රට දියුණු කරන්න පුළුවන් ප්‍රධානම අංශ තුන ධීවර කර්මාන්තය, කෘෂිකර්මාන්තය සහ සංචාරක ව්‍යාපාරයයි කියන එක මා කියන්න ඕනෑ. අද ධීවර කර්මාන්තය අප ආර්ථිකයට ශක්තියක් කර ගන්න පුළුවන් ලොකු සැලැස්මක් මේ අමාත්‍යාංශය, එහි නිලධාරින් සහ එයට අනුබද්ධ ආයතන සියල්ල තුළම තිබෙනවා.

ඊළඟට අපේ අවධානය යොමු වෙන්න ඕනෑ අනික් කාරණය මේකයි. කරදිය, මිරිදිය වාගේම කිවුල්දිය ධීවර කර්මාන්තයත් අප දියුණු කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපට කළපු රාශියක් තිබෙනවා. මේ රටේ හැම පැත්තකම ගොඩබිමත් එක්ක සම්බන්ධ වන කළපු රාශියක් තිබෙනවා. විශේෂයෙන්ම අප ඒ කළපු ආරක්ෂා කර ගන්න ඕනෑ. මුහුදේ ඉන්න මත්ස්‍යයන් ඇවිල්ලා තමන්ගේ පැටවු බිහි කරන ප්‍රධානම තැන තමයි කළපුව කියලා කියන්නේ. ඒ නිසා විශේෂයෙන්ම ඒ කළපු ආරක්ෂා කිරීමේ, ඒ ආශ්‍රිතව තිබෙන කඩොලාන පරිසරය ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ ඔබතුමා ආරම්භ කර තිබෙනවා. ඒකට තවත් ශක්තිය, ධෛර්යය දීලා විශේෂයෙන්ම මේ රට තුළ කඩොලාන තවත් ඇති කරන්න අප උනන්දු වෙන්න ඕනෑ. මොකද අප දන්නවා කඩොලාන තුළින් තමයි කළපුව පෝෂණය වන්නේ කියලා. ඒ කඩොලාන පරිසරය ආරක්ෂා කරන්න, ඒවා වැඩි දියුණු කරන්න වැඩ කටයුතු කරන්නය කියලාත් අප තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

මම කලින් කිව්වා වාගේ ධීවර අමාත්‍යාංශයට අයිති, මේ රටේ ආර්ථිකයට ශක්තියක් දෙන්න පුළුවන් ඉස්සන් කර්මාන්තය වැනි ඒවායේ තිබෙන යම් යම් දුර්වලතා නැති කරන්නත් කටයුතු කරන්න ඕනෑ. විශාල වශයෙන් මුදල් වැය කරලා ඉස්සන් කර්මාන්තය ආරම්භ කරලා සමහර කාලවලදී ඉතා විශාල වශයෙන් අප එයින් ලාභ ගත්තා. නමුත් ඉස්සන්ට වැළඳෙන සමහර රෝග නිසා ඒ කර්මාන්තය සමහර වෙලාවට විනාශ වුණා. ප්‍රධාන වශයෙන් අපේ පුත්තලම දිස්ත්‍රික්කය තුළින් ගලන හැමිල්ටන් ඇළ, නැත්නම් ඕලන්ද ඇළ පිරිසිදු කිරීම තුළින් මේ ඉස්සන් කර්මාන්තයේ යෙදෙන අයට විශාල වශයෙන් සහනයක් ලබා ගන්න පුළුවන්. මොකද අපි එහෙම කියන්නේ? ඕලන්ද ඇළේ වතුර තමයි අපේ කළපු තුන වන පුත්තලම, මුන්දලම සහ හලාවත කියන කළපු තුනටම යන්නේ. ඒක හරියට පිරිසිදු කළොත් ඒ වතුර මඟින් විශේෂයෙන්ම ඉස්සන් කර්මාන්තය කරන ටැංකිවල අපද්‍රව්‍ය හරියට බැහැර කිරීමේ ක්‍රමවේදයක් ඇති වෙනවා. තමුන්නාන්සේගේ නිලධාරින් හරහා තමුන්නාන්සේ මේ කරන්නා වූ වැඩ පිළිවෙළත් එක්ක ඒ ඕලන්ද ඇළ පිරිසිදු කරලා ඉස්සන් කර්මාන්තය දියුණු කිරීමේ වැඩ පිළිවෙළ ඉදිරි කාලයේදී ශක්තිමත් වෙයි කියලා අප බලාපොරොත්තු වෙනවා.

අද අප එක පැත්තකින් සතුටු වෙනවා. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමනි, තමුන්නාන්සේගේ කථාවේදී කිව්වා වාගේ අද ජාත්‍යන්තරයට ධීවර කර්මාන්තය ගෙන යන්න ඔබතුමා වැඩ කටයුතු කර තිබෙනවා. තමුන්නාන්සේත් එක්ක වැඩ කටයුතු කිරීමට අප ආසයි. ධීවර අමාත්‍යාංශයට ගිහිල්ලා අධීක්ෂණ මන්ත්‍රීවරු හැටියට, තරුණ මන්ත්‍රීවරු හැටියට අපි ඉඳ ගෙන බලා ඉන්න කොට, තමුන්නාන්සේ වැඩ කරන විධිය දැක්කාම අපට ආසයි. උදේ ඉඳන් සවස් වෙනකම් තමුන්නාන්සේ ඉතාමත් මහන්සි වෙමින් වැඩ කරනවා. අර කිව්වා වාගේ සමහරක් වෙලාවට ඉතාමත් දූෂිත වෙලා තිබුණු ආයතන හරි මාර්ගයට අරගෙන තමුන්නාන්සේ වැඩ කටයුතු කරපු ආකාරය අප දැකලා තිබෙනවා. ඒ නිසා ඉදිරි කාලයේදී මේ රටේ ධීවර කර්මාන්තයේ සුවිශේෂී යුගයක් උදා කරන්නට තමුන්නාන්සේට පුළුවන් වෙයි කියලා අපේ ලොකු විශ්වාසයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසාන වශයෙන් ධීවර ආම්පන්න පිළිබඳවත් යමක් කියන්න ඕනෑ. ඔරු, තෙප්පම්, දැල් වාගේ දේවල් අපේ ධීවරයන් විශාල වශයෙන් බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඔවුන් එක්දින ධීවර යාත්‍රා, බහුදින ධීවර යාත්‍රා බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම අපේ රටේ තිබෙන ආර්ථිකමය තත්ත්වයත් එක්කලා සියලු දෙනාට ඒවා දෙන්න බැහැ. නමුත් අද තමුන්නාන්සේ ආරම්භ කර තිබෙනවා වාගේ ණය යෝජනා ක්‍රම ඉදිරියටත් ශක්තිමත් කරලා ඒ සියලුම ජනතාවට ඒ ප්‍රතිලාභ ලැබෙන විධියට ඒවා ක්‍රමවත් කිරීම මා හිතන්නේ ඉදිරි කාලයේදී සිදු විය යුතු දෙයක් කියලායි. ඒක දැනටමත් ආරම්භ කර තිබීම පිළිබඳවත් අප සතුටු වෙනවා. විශේෂයෙන් තමුන්නාන්සේ ධීවර කර්මාන්තය කෙරෙහි මේ දක්වන්නා වූ අවධානයත් එක්ක මේ රටේ ආර්ථිකයට වැඩිම ශක්තියක් දෙන්න පුළුවන් කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපාරය හා එක්ව ශක්තියක් දෙන්න පුළුවන් මේ කර්මාන්තයේ දියුණුවට තමුන්නාන්සේ ඉදිරි කාලයේ වැඩ කරයි කියන ලොකු බලාපොරොත්තුවත් එක්ක මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.20]

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර අමාත්‍යාංශයට අදාළ යම් කරුණු පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට අදහස් ඉදිරිපත් කරන්නට මටත් අවස්ථාවක් ලැබීම ගැන මා සතුටු වෙනවා.

වර්තමාන ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා මගේ මිත්‍රයෙක් පමණක් නොවෙයි මගේ ඥාතියෙක්. ඒ නිසා මම හිතන හැටියට එතුමාගේ හොඳ වැඩ අගය කරන්නත්, එතුමාට උපදෙස් දෙන්නත් මට වග කීමක් හා යුතුකමක් තිබෙනවා. මම මගේ කථාව ආරම්භ කරන්නේ පළමුවෙන්ම එතුමාට ස්තුති කරලා.

ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට, එක්සත් ජාතික පක්ෂයේ මීගමුව ආසනයේ ප්‍රධානසංවිධායකවරයා හැටියට එදා මම මේ පාර්ලිමේන්තුවට සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනාවා, මීගමු කළපුව ආරක්ෂා කිරීම පිළිබඳව. එදා වර්තමාන රජය -මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ රජය- මීගමු කළපුව සහමුලින්ම විනාශ කරන්න මුහුදු ගුවන් යානා බැස්ස වීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන්න කටයුතු කරන්න හැදුවා. ඒ අවස්ථාවේ මීගමුව කළපුවෙන් ජීවනෝපාය ඉටු කර ගන්න 10,000කට වඩා අධික ධීවර පවුල් ඒ ප්‍රදේශයේ ආගමික උතුමන්ලාත් සමඟ දැවැන්ත උද්ඝෝෂණයක් පැවැත්වූවා.

විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට, මහජන නියෝජිතයකු හැටියට ඒ සඳහා මටත් ආරාධනා ලැබුණා. මෙතැන දේශපාලන පක්ෂ ප්‍රශ්නයක් නොවෙයි තිබුණේ. කොළ පාට, නිල් පාට, රතු පාට ප්‍රශ්නයක් නොවෙයි තිබුණේ. ඒ මීගමු කළපුව කේන්ද්‍ර කර ගෙන ජීවනෝපාය කර ගන්නා එක්සත් ජාතික පක්ෂයට හෝ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හෝ, වෙනත් දේශපාලන පක්ෂයකට හෝ අයිති ඒ අහිංසක ධීවරයන්ගේ ජීවත් වීම පිළිබඳ බරපතළ ප්‍රශ්නයක් තමයි තිබුණේ. ඒ ප්‍රශ්නය පිළිබඳව පාර්ලිමේන්තුවේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ඉදිරිපත් කරපු වේලාවේදී වර්තමාන රජය වෙනුවෙන් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා ලෙස දොස්තර රාජිත සේනාරත්න මැතිතුමා සහතිකයක් දුන්නා, මීගමු කළපුවේ ඒ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන්නේ නැති බවට. ඇත්ත වශයෙන්ම ඒ දූරදර්ශී ජනහිතකාමී ක්‍රියාව අගය කරන්න, එයට ස්තුති කරන්න මේ අවස්ථාවේදී විපක්ෂයේ මන්ත්‍රීවරයකු ලෙස මම නැඟී සිටිනවා. අද-

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මම ඒ ප්‍රකාශය කළේ රජය වෙනුවෙන්.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

ඔව්. මම කිව්වේ ඒකයි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා සාකච්ඡා කරලා, මහජනතාවගේ අදහස උඩ ඒ තීන්දුව ගත්තා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

හැබැයි ඔබතුමාට පමණයි ධීවර ඇමතිවරයා හැටියට ඒ සහතිකය මේ පාර්ලිමේන්තුවට දෙන්න ඒ ශක්තිය, පිට කොන්ද හයිය තිබුණේ. ඔබතුමා අද ආණ්ඩුවේ හිටියත්, රජය අනුගමනය කරන යම් යම් ක්‍රියාමාර්ගවලදී රජය හරි මඟට ගෙන යන්නට උත්සාහ දරන ඇමතිවරයකු හැටියට මම දකිනවා. ඒකට හොඳම උදාහරණය තමයි මේ වර්ගවාදී අර්බුදයට -ජාතික ප්‍රශ්නයට- දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මුල් කර ගෙන විසඳුමක් හොයන්න උත්සාහ දරන වෙලාවේ, "රටේ යුද්ධය දිනුවාට සාමය දිනලා නැහැ" කියලා ඔබතුමා මාධ්‍ය හරහා කරලා තිබෙන ප්‍රකාශය.

ඉන්දියාවට ගණන්කාරකම් දාලා, ඉන්දියාවට වන්ඩිකම් පෙන්වලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ, ඒ සඳහා බුද්ධිය පාවිච්චි කළ යුතුයි, බුද්ධිමත්ව ක්‍රියා කළ යුතුයි කියන්න තරම් ආණ්ඩුවේ ඇමතිවරයකු හැටියට ඔබතුමාට හැකියාව තිබීම ගැන විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපි ආඩම්බර වනවා. මගේ මේ කථාව ඔබතුමාට සුදු හුනු ගාන්න උත්සාහ කිරීමක් නොවෙයි; ඥාතිකම නිසා කියනවා නොවෙයි. මම හිතන හැටියට අඩු තරමින් ඔබතුමා වැනි ඇමතිවරු තව කීප දෙනෙක් හිටියොත් මේ කරන පිස්සු නැටීම, මේ කරන දූෂණය, මේ කරන වංචා, මේ කරන ජනතා රැවටිලි නවත්වන්නට පුළුවන්කම ලැබෙනවා. අඩු තරමින් ඔබතුමා වැනි ඇමතිවරු එක්කෙනෙක්, දෙන්නෙක්වත් කැබිනට් මණ්ඩලයේ සිටියා නම් ඒවා වෙන්නේ නැහැ කියන එක මා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර ප්‍රශ්නය ගැන කථා කළත්, ආර්ථික ප්‍රශ්න ගැන කථා කළත්, කෘෂිකර්ම ප්‍රශ්න ගැන කථා කළත්, සංචාරක ප්‍රශ්න ගැන කථා කළත් අද මේ රටේ තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි මේ ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා අපි දරන උත්සාහය. මේ සඳහා හැම දාම යුද ජයග්‍රහණය විකුණ විකුණා ඉන්න බැහැ. හිඟන්නාගේ තුවාලය වාගේ හැම දාම ඒ ගැන කතා කරලා හරි යන්නේ නැහැ.

අද සාමය දිනා ගැනීමේ වැඩ පිළිවෙළක් අවශ්‍ය වනවා. විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර ඡන්දයක් පවත්වන්න යන මේ වෙලාවේ උතුරු, නැඟෙනහිර ධීවර ජනතාව ගැන පමණක් නොවෙයි, අනෙකුත් අහිංසක ජනතාව පිළිබඳවත් අපේ දැඩි අවධානය යොමු වන්නට ඕනෑ. ගරු ධීවර හා ජලජ සම්පත් ඇමතිතුමනි, ඔබතුමා මේ කාරණය සම්බන්ධව මා සමඟ එකඟ වනවා ඇති. අදත් උතුරේ තිබෙන්නේ අර්ධ මිලිටරි එහෙම නැත්නම් යුද පරිපාලනයක්. අද තවමත් උතුරේ සිටින ආණ්ඩුකාරවරයා සිවිල් වැසියෙක් නොවෙයි, විශ්‍රාමලත් හමුදා නිලධාරියෙක්.

මේ තත්ත්වය නැති කරන තෙක්, මේ භීතිය නැති කරන තෙක්, සාමකාමී වාතාවරණයක් ඇති කරන තෙක් ජූලි 23 වන දා පවත්වන පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල ගැන, ජයග්‍රහණ ගැන කුමන කථා කියන්න රජය සූදානම් වුණත් එය ජනතාවගේ නියම අභිලාෂය, ජනතාවගේ කැමැත්ත ප්‍රකාශ නොවන මැතිවරණයක් බවට පත් වෙමින් පවතිනවාය කියන එක මම මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා දන්නවා අද උතුරේ ධීවර ජනතාව සමුපකාර සමිති හරහා සංවිධාන වෙලා තිබෙන බව. මම එදා උතුර භාරව පුනරුත්ථාපන නැවත පදිංචි කිරීම හා සරණාගතයන් පිළිබඳ ඇමතිවරයා හැටියට අවුරුදු දෙකක් කටයුතු කරපු කාලසීමාව තුළ උතුරේ පමණක් ධීවර ජනතාව නවදහසකට ආසන්න ප්‍රමාණයක් සංවිධානය වෙලා හිටියා. අද ඒ ප්‍රමාණය තවත් වර්ධනය වෙලා තිබෙනවා.

[ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා]

අද රටේ සාමය ගැන කථා කරනවා. ජනාධිපතිවරයා යාපනයට ගිහින් තිබෙනවා. ඒක බොහොම හොඳ වැඩක්. ප්‍රජාතන්ත්‍රවාදීව ඡන්දයෙන් පත් වෙච්ච අය ඒ ප්‍රදේශවලට යන්න ඕනෑ. ඒ ප්‍රදේශවල හමුදාකරණය තවත් තිබෙනවා නම්, ඒ ප්‍රදේශවල අධිආරක්ෂිත කලාප තවත් තිබෙනවා නම්, ධීවර තහංචි තවත් තිබෙනවා නම් එවැනි අවස්ථාවල ඒ ප්‍රදේශවල ජනතාව බියෙන් සැකෙන් ගත කරන බව කියන්න ඕනෑ. එපමණක් නොවෙයි ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා කථා කරන විලාසයටම, ඒ දරන මතය හා සමානවම රට තුළ සාමය දිනා ගැනීමේ වැඩ පිළිවෙළක් තවම මේ රජය සකස් කර නැති බව මම පැහැදිලිව කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැවත වරක් මා මීගමුව පිළිබඳව මගේ කථාව යොමු කරනවා. මීගමුව කළපුව ආරක්ෂා කරන්න ඔබතුමා ඒ ගුවන් යානා බැස්සවීමේ ව්‍යාපෘතිය නැවැත්වූවා. අද මීගමුව කළපුවේ විවිධ ආකාරයෙන් අනවසර ගොඩ කිරීම් සිදු වෙමින් පවතිනවා. මීගමුව කළපුවේ පරිසරය පිළිබඳව බරපතළ ප්‍රශ්න තිබෙනවා. මා තමුන්නාන්සේගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. ඒ, මීගමු කළපුව ආරක්ෂා කරන්නය කියන ඉල්ලීමයි. දේශපාලන බලපෑම්වලින් තොරව ඒ අනවසර ගොඩ කිරීම් නවත්වන්නට තමුන්නාන්සේ කටයුතු කරන්න ඕනෑ. ස්වර්ණවාහිනියෙන් ඉතා ලස්සනට පෙන්නුවා මා දැක්කා, දේශපාලන නායකයෝ, දේශපාලන බලධාරින්, දේශපාලන අධිකාරිය විසින් විකිණීම සඳහා මීගමුව මුහුදු වෙරළේ වැලි නීති විරෝධීව ගොඩ දමන හැටි. ඒක තමුන්නාන්සේත් දකින්න ඇති කියා මා හිතනවා. දූෂණය, භීෂණය, වංචාව ගැන නිවැරදිව කථා කරන තමුන්නාන්සේ වැනි ඇමතිවරයෙක් මීගමුව මුහුදු වෙරළේ වැලි විකුණන ඒ දේශපාලුවන් පිළිබඳවත් වහාම දැඩිව ක්‍රියා කරයි කියා මා විශ්වාස කරනවා.

මීගමු කළපුවේ තිබෙන මේ අනවසර ඉදිකිරීම් ඉවත් කරලා, අනවසර ගොඩකිරීම් ඉවත් කරලා, එය නියමාකාරයෙන් මැනලා ඒ කළපුව ආරක්ෂා කරන්න කටයුතු කරන ලෙස මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින්න කැමතියි. මිල්රෝයි ප්‍රනාන්දු ජ්‍යෙෂ්ඨ ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. බහුතර කතෝලික ජනතාවක් ජීවත් වන මීගමුවේ ධීවර කටයුතු සංවර්ධනය කිරීම සඳහා, ධීවර කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා ඒ කතෝලික ජනතාව නියෝජනය කරන කතෝලික සභාවේ යම් යම් ව්‍යාපෘති, යම් යම් වැඩ පිළිවෙළවල්, යම් යම් සැලසුම් තිබෙනවා. මේ අවස්ථාවේදී ඒ කාරණය සම්බන්ධයෙන් මා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. තමුන්නාන්සේ කාදිනල් අතිඋතුම් මැල්කම් රංජිත් හිමිපාණන් වහන්සේ සමඟ ඉතා මිත්‍රශීලිව කටයුතු කරනවා. ඒ නිසා මීගමුවේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේදී ඒ කතෝලික සභාවේ ඒ උපදෙස්, අවවාද, සැලසුම් පිළිබඳව අවධානය යෙමු කරන්න කියා විශේෂයෙන් කියන්න කැමැතියි.

ධීවර රක්ෂණ ක්‍රමය පිළිබඳව දැන් කථා වුණා. අපේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා ඒ ගැන කථා කළා. ඒ වාගේම ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඒ ගැන කථා කළා. ධීවර රක්ෂණ ක්‍රමය සක්‍රිය කරන්න කටයුතු කරන්න ඕනෑ. අද ලංකාවේ ක්‍රියාත්මක වන දේශීය හා විදේශීය රක්ෂණ සමාගම්වලින් උපරිම ප්‍රතිඵල ලැබෙන ආකාරයට, තරගකාරී ආකාරයට ඒ රක්ෂණ ක්‍රමය සකස් කිරීම කලෝචිත වෙනවා. ධීවර ණය ක්‍රමය ගැන දැන් තමුන්නාන්සේ කථා කළා. මා හිතන විධියට රාජ්‍ය බැංකු හා සමානවම පෞද්ගලික බැංකු රාශියක් අද අපේ රටේ තිබෙනවා. ඒ බැංකුත් සම්බන්ධ කර ගත්තොත් තරගකාරී පදනම යටතේ, තරගකාරී පොලී අනුපාත යටතේ ධීවරයාට වැඩි ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට ඒ ණය ක්‍රම සකස් කරන්න පුළුවන්.

අද අපේ රටේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කරනවා හා සමානවම මත්ස්‍ය සම්පත ආරක්ෂා කරන්නත් ශීතාගාර වාගේම අයිස් නිෂ්පාදනාගාර මීගමුවේත්, රට පුරාත් ඇති කිරීම ඉතාම වැදගත් වෙනවා. ඒ සඳහා තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලීමක් කරන්න කැමැතියි.

ඒ වාගේම නීති විරෝධි, සමාජ විරෝධි ධීවර ආම්පන්න ක්‍රමවලින් මත්ස්‍යයන් ඇල්ලීම පිළිබඳව දැන් යම් යම් තහනම් ක්‍රියාත්මක වෙනවා. යම් යම් ප්‍රදේශවල බලවත්, ප්‍රබල දේශපාලනඥයන්ගේ හස්තය නිසා, තමුන්නාන්සේට ඉහළින් ගිය විවිධ දේශපාලන බලවතුන්ගේ ආශිර්වාදය නිසා තමුන්නාන්සේගේ අණ අනුව ක්‍රියා නොකර, තමුන්නාන්සේගේ නියෝග පිළිපදින්නේ නැතිව මේ trawling ක්‍රම ඇතුළු නීති විරෝධි ක්‍රම මඟින් මත්ස්‍යයන් ඇල්ලීම තවමත් ක්‍රියාත්මක වනවා. එය මීගමුව ප්‍රදේශයේත් ක්‍රියාත්මක වන බව මම තමුන්නාන්සේට වාර්තා කරන්න කැමැතියි.

මේවා ගැන හොයලා බලන්න. මොකද මම දන්නවා, ඒ අය සමහර වෙලාවට තමුන්නාන්සේත් සමඟ වාඩි වෙලා ඉන්න මැති ඇමතිවරු වෙන්න පුළුවන් කියලා. නමුත් ධීවරයා පිළිබඳව අවංකව තමුන්නාන්සේගේ අවධානය යොමු වෙනවා නම් ඒ කවුරු ඇමති වුණත් ප්‍රශ්නයක් නැහැ. මම හිතන්නේ ගරු මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිතුමා හෘදය සාක්ෂියට එකඟව මේවා දන්නවා. එතුමා ඒකයි නිහඬව ඉන්නේ. ප්‍රබල ඇමතිවරුන්ගේ මේ හස්තය ඉවත් කරන්න, මේ නීති විරෝධි ක්‍රියාමාර්ග ඉවත් කරන්න කියා ඒ සඳහා වහාම නියෝග දීම පමණක් නොවෙයි, ඒවා පිළිබඳව පසු විපරමක් කරන ලෙසත් තමුන්නාන්සේගෙන් ඉතා දැඩිව ඉල්ලීමක් කරන්න මම කැමැතියි. මොකද මම මේ අවස්ථාවේදී ද්වේෂ සහගතව කථා කරන්න සූදානම් නැහැ. මුහුදු වැලි විකුණන දේශපාලන බලවතුන්ගේ, ඒ වාගේම මේ නීති විරෝධි ක්‍රම භාවිතා කරන්න අනුබල දෙන දේශපාලන බලවතුන්ගේ නම් පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා මේ ස්ථානයේ කියන්න මම සූදානම් නැහැ. නමුත් සාක්ෂි සහිතව ඒ සියලුම තොරතුරු මා ළඟ තිබෙන බව මම තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි. මේ පිළිබඳව තමුන්නාන්සේගේ හෘදය සාක්ෂිය ඉතා හොඳින් දන්නා බව මම මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්නට කැමැතියි.

මීගමුව කලාපයට අයිති, නමුත් කල්පිටිය ආශ්‍රිතව තිබෙන අපේ ගරු මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිතුමාගේ ප්‍රදේශයට ඉතාමත්ම කිට්ටු සම්බන්ධකම් තිබෙන බත්තලන්ගුණ්ඩුව, පල්ලියවත්ත ධීවර දූපත් පිළිබඳව මීට වඩා දැඩි අවධානයක් යොමු කිරීම වටිනවා කියන එක මම කියනවා. මේ බත්තලන්ගුණ්ඩුව සහ පල්ලියවත්ත කියන්නේ, පසු ගිය යුද සමයේ ඉතාමත්ම අපහසුතාවට පත් වුණු අහිංසක ධීවරයෝ ජීවත් වන දූපත් රැසක්. මේවා සංක්‍රමික ධීවරයින් ජීවත් වන ප්‍රදේශ. මේවායේ අවශ්‍ය කරන මූලික පහසුකම්, එනම් ජලය වෙන්නට පුළුවන්, විදුලිය වෙන්නට පුළුවන්, පාසල් වෙන්නට පුළුවන්, ළදරු පාසල් වෙන්නට පුළුවන්, වැසිකිළි - කැසිකිළි පද්ධතිය වෙන්නට පුළුවන්, නිවාස පද්ධතිය වෙන්නට පුළුවන්, මේ පිළිබඳව එදාට වඩා අද දැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍යයි. මම දන්නවා, තමුන්නාන්සේ ඒ ප්‍රදේශවල -ඒ දූපත්වල- සංචාරය කරලා තිබෙනවා කියලා. ඒ දූපත්වල සංචාරය කරලා ඒ ධීවරයෝ සමඟ රැයක් දෙකක් ගත කරලා තිබෙන මන්ත්‍රීවරයෙක් හැටියට මම කියනවා, ඒ ප්‍රද්ශවල තවමත් තිබෙන්නේ එදා තිබුණු තත්ත්වයමයි කියලා. ඒ අයට අවශ්‍ය කරන මූලික පහසුකම් ලබා දීම තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ වග කීමක් කියන එකත් මම මේ අවස්ථාවේදී කියනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඇත්තටම බත්තලන්ගුණ්ඩුවේ ඒ මුළු මත්ස්‍ය සම්පත අරගත්තේ එක මුදලාලි කෙනෙක්. එයා තමයි විදුලිය දුන්නේ.

බල්බ් දෙකයි පත්තු කරන්න පුළුවන් වුණේ. විදුලිය සඳහා මාසයකට රුපියල් 4,000ක් ගත්තා. දැන් ධීවර සංස්ථාව හරහා රුපියල් ලක්ෂ 60ක් වියදම් කරලා වෙනම ජෙනරේටරයක් දීලා අපි නිකම් විදුලිය දීලා තිබෙනවා. ඒ ගොල්ලන්ට අපි කියලා තිබෙනවා, වෙළෙඳ පොළ වටිනාකමට ඒ ගොල්ලන්ගේ මත්ස්‍ය සම්පත අපි ගන්නවා කියලා. ඒ එක්කම ඔවුන්ගේ වැසිකිළි පහසුකම් සහ ඔවුන්ගේ පාසල දියුණු කරන්න දැන් අපි මුදල් වියදම් කර ගෙන යනවා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

බොහොම ස්තුතියි. දේශපාලන, ජාති, ආගම්, කුලමල භේදවලින් තොරව ඒ අහිංසක ධීවරයෝ පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කිරීම ගැන. ඒකම තමයි මගේ මේ උත්සාහයත්.

අද මීගමුව ප්‍රදේශයේ ජීවත් වන සංක්‍රමික ධීවරයෝ මුලතිව්, මන්නාරම, කිලිනොච්චිය වැනි ප්‍රදේශවලට සංක්‍රමණය වෙනවා. මම හිතන්නේ මේ අයගේ ආරක්ෂාව පමණක් නොවෙයි, මේ අයගේ පහසුකම් පිළිබඳවත් අපේ දැඩි අවධානය යොමු විය යුතු කාලයක් දැන් පැමිණ තිබෙනවා කියා. දැ න්යුද්ධය අවසන්. ඒ අය නිදහසේ බයක් සැකක් නැතිව ඒ ප්‍රදේශවලට සංක්‍රමණය වෙන කොට ඒ අයට අවශ්‍ය කරන මූලික පහසුකම් ලබා දීම වැදගත් වනවා.

ගරු අමාත්‍යතුමනි, එදා මෙදා තුර, හැම දාම මොන රජයක් යටතේ වුණත් මේ රටට මුහුණ දෙන්න සිදු වී තිබෙන දකුණු ඉන්දියාවේ ධීවර ප්‍රශ්නයත්, ශ්‍රී ලංකාවේ ධීවරයෝ අතර ඇති ගැටුමත් බරපතළ ප්‍රශ්නයක්. මේ සඳහා නීති ගේන්නට පුළුවන්. මේ සඳහා රාජ්‍ය තාන්ත්‍රිකව දෙපාර්ශ්වය අතර සාකච්ඡා කරන්න අපට පුළුවන්. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම තමුන්නාන්සේට මේ යෝජනාව කරන්න කැමැතියි. මීගමුවෙන් ගත්තොත්, මීගමුවේ ඉඳලා හලාවත, පුත්තලම ප්‍රදේශය දක්වා මේ මුහුදු තීරයේ බහුතරයක් ඉන්නේ කතෝලික ධීවරයෝ. ඒ කතෝලික ධීවර ජනතාවගේ ආගමික නායකයන් හැටියට කොළඹ අගරදගුරු හිමිපාණන් වහන්සේත්, ඒ වාගේම හලාවත රදගුරු හිමිපාණන් වහන්සේත්, ඒ වාගේම යාපනයේ, මන්නාරම රදගුරු හිමිපාණන් වහන්සේලාත් ක්‍රියා කරනවා.

දකුණු ඉන්දියාව ගත්තොත් රාමේෂ්වරම් ප්‍රදේශය ඇසුරු කොටගෙන සිවගංගේ ප්‍රදේශයේ ආගමික නායකයා හැටියට - Bishop of Sivagangai - Bishop Jebalamai Susaimanickam තමයි ඒ ප්‍රදේශය භාරව ක්‍රියා කරන්නේ. ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා, ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා සහභාගි වුණු කතෝලික සභාවේ රද ගුරු හිමිපාණන්ලාගේ සම්මේලනයේදී පවා මම මේ පිළිබඳව අදහස්, යෝජනා ඉදිරිපත් කළා. දෙරටේම ඉන්න ආගමික නායකයෝ අතර සම්බන්ධතාවක් ගොඩ නඟලා, මේ ප්‍රශ්නය සුහදව සහෝදරත්වයෙන් විසඳා ගන්න ක්‍රියා කිරීම සඳහා යාන්ත්‍රණයක් ඇති කරන ලෙස විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මේ අවස්ථාවේදී යෝජනා කරන්න කැමැතියි. අප කොච්චර නීති ගෙනාවත්, රාජ්‍ය තාන්ත්‍රිකව මොන දේ ගැන කථා කළත්, මේ ප්‍රශ්නය විසඳීමේදී මානුෂිකත්වය පිළිබඳව අපේ අවධානය යොමු කිරීම වැදගත් වනවා.

ලංකාවේ නාවික හමුදාව ගැන අපි කථා කරනවා; අපි ආරක්ෂා කරනවා. ඉන්දියාව ගත්තොත් ඉන්දියාවේ නාවික හමුදාව ගැන ඉන්දියාවේ ජනතාවත් දේශපාලන නායකයොත් කථා කරනවා. විශේෂයෙන්ම ජයලලිතා මහ ඇමතිවරිය මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කර තිබීම ලංකාවේ අපට ඉතාමත් වැදගත් වේවි. මේ ආගමික නායකයෝ අතර පවතින සුහදතාවය, සම්බන්ධතාවය, පිළිගැනීම භාවිතා කර මේ ප්‍රශ්නය සඳහා තිරසාර විසඳුමක් හොයා ගන්න අපට හැකියාව ලැබෙනවා කියන එකත් මා පෞද්ගලිකව විශ්වාස කරන කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර ප්‍රශ්නය කථා කරන විට විශේෂයෙන්ම මිරිදිය මසුන් ගැන කථා කළා. මිරිදිය මසුන් ගැන කථා කරන හැම මොහොතකම මා කියන දෙයක්, දේශීය මිරිදිය මසුන් පිළිබඳව අපේ අවධානය යොමු කර නැහැ කියන එක. ඇමතිතුමාත් වෛද්‍යවරයෙක්. මමත් වෛද්‍යවරයෙක් හැටියට කියන්න ඕනෑ, ඉපරණි දේශීය මිරිදිය මත්ස්‍යයන් රාශියක් - කාවයියෝ, ලූල්ලු වාගේ- අද විනාශ වෙමින් යනවා. ඔබතුමා මන්දපෝෂණය ගැන කථා කරනවා. එදා අම්මලා තමුන්ගේ ගැබ්බර දියණියන්ට -කිරි දෙන අම්මලාට- ලූල්ලු මාළු තමයි දුන්නේ. හේතුව, ඒ මාළු ආහාරයට ගත්තාම කිරි හොඳින් එරෙනවා කියා ඒ අය අතර විශ්වාසයක් තිබුණා. නමුත් අද වන විට ඒ දේශීය මිරිදිය මත්ස්‍ය වර්ග ඉතාමත්ම දරුණු ලෙස විනාශ වෙමින්, තුරන් වෙමින් යනවා.

අපේ රටේ විවිධ ශාක වර්ග තිබෙනවා. විවිධ කුරුල්ලන් සිටිනවා. විවිධ සතුන් සිටිනවා. අපේ පරිසරයෙන් ඔවුන් ඉවත් වෙමින් පවතිනවා. විවිධ කෘෂිනාශක භාවිතා කිරීම සහ අනෙකුත් හේතුන් නිසා එදා වෙල්වල, ඇළ දොළ, වැව් ආදියේ හිටපු ලූල්ලු, කාවයියෝ අද අපේ වැව්වල දකින්න නැහැ. අද ලූල්ලු දකින්න නැහැ. කාවයියෝ දකින්න නැහැ. නමුත් අලුත් අභිජනන ක්‍රම පාවිච්චි කරලා දේශීය මත්ස්‍ය සම්පත ආරක්ෂා කරන්න, එදා මෙදාතුර අපේ රටට ආවේනික මත්ස්‍ය සම්පත ආරක්ෂා කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ පර්යේෂණ නිලධාරින්, තාක්ෂණ නිලධාරින්, විද්‍යාඥයන් ඒ සඳහා යොමු කිරීම තුළින් අපේ රටේ ජනතාව හුරු, අපේ රටේ ජනතාව වඩාත් කැමැති, අපේ රටේ ජනතාව අතර වඩාත් ජනප්‍රිය දේශීය මත්ස්‍ය සම්පත මීට වඩා දියුණු කර ගන්න පුළුවන්කම ලැබෙයි කියා වෛද්‍යවරයෙක් හැටියට මා විශ්වාස කරනවා.

ධීවර විශ්වවිද්‍යාල ගැනත් තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්න කැමැතියි. ධීවර විශ්වවිද්‍යාල පිළිබඳව අද කථා කරනවා; විවිධ උපාධි පිළිබඳව අද කථා කරනවා; ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම පිළිබඳව කථා කරනවා. ධීවර තාක්ෂණය, පරිගණක තාක්ෂණය, නාවික තාක්ෂණය වැනි නව තාක්ෂණික ක්‍රම පාවිච්චි කරලා මසුන් සිටින තැන් -මත්ස්‍ය සම්පත- සොයා ගැනීම පිළිබඳව, මාළු කල් තබා ගැනීමේ අලුත් ක්‍රම හඳුන්වා දෙන පාඨමාලා ධීවර විශ්වවිද්‍යාලයේ තිබෙනවාද කියන එක මට නම් ප්‍රශ්නයක්. අපි කාලය අනුව වෙනස් වන්න ඕනෑ. අලුත් තාක්ෂණික අංශ පිළිබඳව ධීවර විශ්වවිද්‍යාලයේ අලුත් පාඨමාලා ආරම්භ වනවා නම් ධීවර ජනතාවට මීට වඩා ලොකු සෙතක් ශාන්තියක් කරන්න අපට, මේ පාර්ලිමේන්තුවට හැකියාව ඇති බව මා විශ්වාස කරනවා.

ධීවර ජනතාවට සෞඛ්‍ය දැනුම ලබා දීම පිළිබඳ, ලෙඩ රෝග වළක්වා ගැනීම පිළිබඳ වැඩසටහන් මෙම අමාත්‍යාංශයෙන් මීට වඩා කෙරෙන්න ඕනෑ. රෝග වළක්වා ගැනීම තමයි රෝගවලට ප්‍රතිකාර කිරීමට වඩා වැදගත් වන්නේ කියන එක වෛද්‍යවරයෙක් හැටියට අමාත්‍යතුමා දන්නවා.

මම ආඩම්බරයෙන් කියනවා නොවෙයි. අවුරුදු 15ක් තිස්සේ ටීඑන්එල් රූපවාහිනිය හරහා තාමත් විකාශනය වන මගේ "වෛද්‍ය හමුව" අද ලෝක ගිනස් වාර්තාවට පවා එක් වෙලා තිබෙන්නේ රෝග වළක්වා ගැනීම රෝගවලට ප්‍රතිකාර කිරීමට වඩා වැදගත් වන නිසායි. මම ආරාධනා කරනවා. තමුන්නාන්සේත් සහභාගි වෙලා තිබෙනවා. සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ අපේ මන්ත්‍රීතුමිය සහභාගි වෙලා තිබෙනවා, ඒ වැඩසටහනට. මම හිතන හැටියට තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ තමුන්නාන්සේගේ පෞද්ගලික ලේකම්තුමාත්

[ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා]

වෛද්‍යවරයෙක්; දන්ත වෛද්‍යවරයෙක්. මේ අයට ඒ වැඩසටහන මඟින් අපි අවස්ථාව දෙන්නම්. මගේ වැඩසටහන තුළින් ධීවර ජනතාවගේ නිරෝගීකම පිළිබඳව, රෝග වළක්වා ගැනීම පිළිබඳව ඒ අවස්ථාව ලබා දෙන්න මම සූදානම්. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට අලුත් සම්ප්‍රදායක් ඇති කරන්න මම සූදානම් කියන එක මම තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මාගේ අවධානය මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ උත්තරීතර බලතල පිළිබඳව යොමු කරන්න මම ඉල්ලීමක් කරනවා. මේ පාර්ලිමේන්තුවේ බලතල පිළිබඳව, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව පෙනී සිටින ඇමතිවරයකුගේ අමාත්‍යාංශයේ කටයුතු ගැන කථා කරන මේ මොහොතේ මම හිතනවා ඉතාමත්ම සුදුසුයි කියලා ඒ පිළිබඳව අවධානය යොමු කිරීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජුලි මාසයේ 23 වන දා -මේ මාසයේ 23 වන දා- ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවත් සාමාජිකත්වය දරන පොදු රාජ්‍ය මණ්ඩලයේ පාර්ලිමේන්තු සංගමයේ 57 වෙනි මහා සැසිවාරය පවත්වනවා ලන්ඩන් නුවරදී. ලෝකයේ රටවල් 61ක් මේ පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය දරනවා. අපේ කලාපයේ, මේ කලාපයට ශ්‍රී ලංකාව, පාකිස්ථානය, බංගලාදේශය සහ මාලදිවයින අයත් වෙනවා. මේ රටවල් හතර අපේ කලාපයට අයත් වෙනවා. මේ කලාපයේ පොදු රාජ්‍ය මණ්ඩලයේ ප්‍රධානියා වෙන කවුරුවත් නොවෙයි අපේ කථානායකතුමා; ඔබේ කථානායකතුමා; මේ පාර්ලිමේන්තුවේ කථානායකතුමා; ගරු චමල් රාජපක්ෂ අපේ කථානායකතුමා. මේ කලාපයේ සභාපතිත්වය දරන්නේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු රාජ්‍ය මණ්ඩලයේ ශාඛාව. පොදු රාජ්‍ය මණ්ඩලයේ 57 වෙනි සම්මන්ත්‍රණයට සහභාගි වීම සඳහා, නිරීක්ෂකයෝ හැටියට සහභාගි වීමට මේ කලාපයට නිරීක්ෂක අවස්ථාවන් හයක් පොදු රාජ්‍ය මණ්ඩලයේ මහ ලේකම් විලියම් සීජා මහතා විසින් ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටවල් 4න් 1835 අවුරුද්දේ ඉඳලා අඛණ්ඩව පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගෙන යන මේ කලාපයේ එකම රට ශ්‍රී ලංකාව. අපි දෙවෙනි වන්නේ ඉන්දියාවට පමණයි. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමනි, වැඩිම කාල සීමාවක් තුළ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන මේ කලාපයේ ප්‍රධානම රට ශ්‍රී ලංකාව. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ඒ පැත්තේ හෝ මේවා, මේ පැත්තේ හෝ වේවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225 දෙනෙකු සිටිනවා. මේ මන්ත්‍රීවරු අතරින් කිහිප දෙනකුට නිරීක්ෂකයෝ හැටියට යන්නට අවස්ථාව තිබුණා. අවස්ථාව ලබා දීලා තිබෙනවා. හැබැයි ඒ නිරීක්ෂකයෝ හැටියට යන හැම මන්ත්‍රීවරයකුටම තමන්ගේ ගුවන් ටිකට්පත්, තමන්ගේ ඉඳුම් හිටුම් සඳහා යන වියදම් සියල්ලම තමන්ගේ අතින් වියදම් කර ගන්නට ඕනෑ. එපමණක් විතරක් නොවෙයි, නිරීක්ෂක ගාස්තුව හැටියට පවුම් 490ක් එංගලන්තයේ පොදු රාජ්‍ය මණ්ඩලයේ පාර්ලිමේන්තුවට අපි ගෙවන්නට ඕනෑ. නිරීක්ෂකයෙක් හැටියට යන මන්ත්‍රීවරයකුට ඒ සම්මේලනයට ගිහින් කථා කරන්නට බැහැ. ඒ සම්මේලනයට ගිහින් අත උස්සන්නට බැහැ. ඡන්දය දෙන්න බැහැ. එයා නිරීක්ෂකයෙක් පමණයි.

ලංකාවේ අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 දෙනකුගෙන් කැමැති කෙනකුට තමුන් ඒ නිරීක්ෂක ගාස්තුව ගෙවන්න කැමැති නම්, තමුන් වියදම් කරන්න කැමැති නම්, තමුන්ගේ අතින් වියදම් කර ගන්න කැමැති නම් නිරීක්ෂකයෙක් හැටියට ඒ අවස්ථාව ලබා ගන්න පුළුවන්. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවෙන් ශත පහක්වත් - අපේ නියෝජ්‍ය මහ ලේකම්තුමා ඉන්නවා. එතුමා සාක්ෂි දරාවි.- වියදම් වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවාසනාවකට අපේ කලාපයට ලැබිලා තිබෙන මේ නිරීක්ෂක අවස්ථා 6න් එකම අවස්ථාවක්වත් ශ්‍රී ලංකාවේ ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ එකම මන්ත්‍රීවරයකුටවත් ලබා ගන්න අද අවස්ථාව නැහැ. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ පොදු රාජ්‍ය මණ්ඩලයේ ශාඛාව අද තීන්දුවක් අරන් තිබෙනවා, ශ්‍රී ලංකාවේ කිසිම මන්ත්‍රීවරයකුට මේ නිරීක්ෂක තනතුර ලබා ගන්න බැහැ කියලා. රාජිත සේනාරත්න ඇමතිතුමනි, තමුන්නාන්සේගේ හෘදය සාක්ෂියට එකඟව තමුන්නාන්සේ මේ තීරණයට එකඟද කියලා මම තමුන්නාන්සේගෙන් අහනවා? මම තමුන්නාන්සේව අපහසුතාවට පත් කරන්නේ නැහැ. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය මෙකද? පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද මෙකද? ඒ පැත්තේ වේවා මේ පැත්තේ වේවා ඔබතුමාට හෝ වේවා පාර්ලිමේන්තු වරප්‍රසාදයක් තිබෙනවා. ඒ පාර්ලිමේන්තු වරප්‍රසාදය මෙකද? මෙහෙමද ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට-[බාධා කිරීමක්] අද පාකිස්තානයේ මන්ත්‍රීවරුන්ට ඒකට සහභාගි වන්න අවස්ථාව තිබෙනවා. බංගලාදේශයේ මන්ත්‍රීවරුන්ට ඒකට සහභාගි වන්න අවස්ථාව තිබෙනවා. මාලදිවයිනේ මන්ත්‍රීවරුන්ට ඒ අවස්ථාව තිබෙනවා. නමුත් මේ කලාපයේ 1835 අවුරුද්දේ ඉඳලා වැඩිම කාලයක් අඛණ්ඩව ක්‍රියාත්මක වන මේ ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුවේ, අපේ රටේ - ශ්‍රී ලංකාවේ- පාර්ලිමේන්තුවේ කිසිම මන්ත්‍රීවරයකුට අද ඒ අවස්ථාව ලැබිලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය තමුන්නාන්සේගේ හෘදය සාක්ෂියටවත් එකඟද කියන එක මම තමුන්නාන්සේගෙන් පැහැදිලිව අහනවා. මම අද දිනයේ ගරු කථානායක චමල් රාජපක්ෂ මැතිතුමාව එතුමාගේ නිල මැදිරියේ හමු වෙලා එතුමාට මම ලිපියක් දුන්නා. ඒ ලිපියත් සමඟ මා විසින් අපේ පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික කිතුල්ගොඩ මැතිතුමාට මැයි මාසයේ 11 වැනිදාත් 13 වැනිදාත් යවන ලද ලිපි දෙකක පිටපත් යා කළා.

ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට පවුම් 490ක ඒ නිරීක්ෂක ගාස්තුව යැවූ ඊ- මේල් පණිවුඩය ලැබුණු බවට මට ලබා දුන් ඊ-මේල් පණිවුඩයේ පිටපතක් මම දුන්නා. ඒ වාගේම ධම්මික කිතුල්ගොඩ අපේ මහ ලේකම්තුමා මට එවලා තිබෙන ලංකාවේ කිසිම මන්ත්‍රීවරයකුට මේ නිරීක්ෂක අවස්ථාව ලබා නොදෙන්නට ලංකාවේ පාර්ලිමේන්තුවේ ශාඛාව තීරණය කරයි කියන ලිපියත් ඇතුළු සියලු ලිපි මම එතුමාට ලබා දුන්නා. මේ සියලුම ලිපි ඉදිරිපත් කරන්නේ මගේ සුබසිද්ධිය සඳහා පමණක් නොවෙයි. එම නිසා විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් සියලුම මන්ත්‍රීවරුන්ගේ පොදු යහපත සඳහා හැන්සාඩ් වාර්තාගත කරන්න තමුන්නාන්සේගේ අවසරය ඉල්ලනවා. මම ලේඛන ඉදිරිපත් කරනවා. හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා මම ලේඛන **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය මම මතු කළේ මොකද? මම කලින් කිව්ව වාගේ අපේ රාජිත සේනාරත්න ඇමතිතුමා වැරදි දෙයට වැරදියි කියන හරි දේට හරියි කියන්න පුළුවන් පිට කොන්දක් තිබෙන අද අමාත්‍ය මණ්ඩලයේ ඉන්න නිර්භීත ඇමතිවරයෙක් කියන එක මම මේ අවස්ථාවේදී -

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඒ සම්මේලනයට නිරීක්ෂකයකු හැටියට යෑමට ඉල්ලුම් පත් යවා තිබෙන්නේ ඔබතුමා පමණද?

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ඒක ඔබතුමාට කථානායකතුමාගෙන් දැන ගන්න පුළුවන්. අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා එනවා. එතුමා ඒ පිළිබඳව හොඳින් දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා මා සමඟ එකඟ වෙච්චි. මේ සම්ප්‍රදායට පිටින් යන්න, මේ සම්ප්‍රදාය කඩ කරන්න, පාර්ලිමේන්තු ක්‍රමය නැති කරන්න; වරප්‍රසාද පිළිබඳව -

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙතුමා ධීවර අමාත්‍යාංශය යටතේ කථා කරන්නේ. එතුමාට මේකට යන්න කරපු ඉල්ලීම පිළිබඳව අපේ -

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මේ point of Order එක මොකක්ද කියන්න කෝ කරුණාකරලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව මට දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்களை
(The Presiding Member)
Let me hear him.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
අපේ පාර්ලිමේන්තු සංගමය කියලා කියන්නේ පක්ෂ විපක්ෂ සියලු දෙනාගෙන්ම එකතු වෙච්ච පාර්ලිමේන්තු සංගමයක්. අපේ කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අවස්ථාවේදී මෙයට මන්ත්‍රීවරුන් ගණනාවක් ඉල්ලුම් කරලා තිබුණා. ඒ නිසා අපට එක මන්ත්‍රීවරයකු තෝරා ගැනීම ප්‍රශ්නයක් වුණා. ඒ නිසා අපි තීන්දු කළා-

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
හරි ෂෝක්, හරි ෂෝක්. බොහොම හොඳයි, බොහොම හොඳයි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒ නිසා අපි තීන්දු කළා-[බාධා කිරීමක්] ඒ නිසා අපට මෙහෙම මන්ත්‍රීවරයෙක් ගෙන යාම අනවශ්‍යයි. කථානායකතුමා ඇතුළු විපක්ෂ නායකතුමා, සුමන්තිරන් මැතිතුමා, මම, මහින්ද සමරසිංහ මැතිතුමා ශ්‍රී ලංකාව නියෝජනය කරන්නයි යන්නේ. පක්ෂ විපක්ෂ නියෝජනය කරන්න නොවෙයි. ඒ නිසා -

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
Delegatesලා හැටියට යනවා වෙන්න ඇති.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා ඉතා හොඳ ශක්තිමත් කණ්ඩායමක් යන නිසා -

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැන point of Order එකක් නැහැ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
තවත් අය අනවශ්‍යයි කියන තීන්දුව අපි ගත්තා. ඒ තීන්දුවට අභියෝග කරන්න පාර්ලිමේන්තු ඇවිල්ලා මේ කඩදාසි කොළ ඉදිරිපත් කරලා බැහැ. ඒ වාගේම මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ කිසි දෙයක් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න එපා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා විවාදයට අදාළ කරුණු නොවෙයි ඔබතුමා ඉදිරියේ ඉදිරිපත් කරන්නේ. මේක අපේ කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් ගත්ත තීන්දුවක්. ඒ නිසා ඒ තීන්දුව කිසි ආකාරයකින් අභියෝගයට ලක් කිරීමට බැරි බව මම ප්‍රකාශ කරන්නට කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. දැන් අපි විෂයයට අදාළව කථා කරමු.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව මට දෙන්න. එතුමා point of Order එකක් ගැන නොවෙයි කථා කළේ. එතුමා කථා කළේ මගේ කථාවට විවාදයක්. එතුමාට ඕනෑ නම් වෙලාව ඉල්ලා ගෙන කථා කරන්න පුළුවන්.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මට මේ පාර්ලිමේන්තුවේ කථා කරන්නට තිබෙන අයිතිය, අදහස් උදහස් ප්‍රකාශ කිරීමට තිබෙන අයිතිය වළක්වන්න, උදුරා ගන්න ඇමතිවරයෙකුටවත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාටවත් හැකියාවක් නැති බවත්, ඔබතුමා එයට ඉඩ නොදිය යුතු බවත් මා මේ අවස්ථාවේ දී පැහැදිලිවම කියන්නට ඕනෑ. මේ සියලු ලිපි ලේඛන ඉදිරිපත් කිරීමේ වගකීම මා භාර ගන්නවා. මා ගරු කථානායකතුමාව එතුමාගේ නිල මැදිරියේ දී අද උදේ හමු වෙලා ලබා දුන් ලිපි ලේඛනයි මේ සභාගත කළේ. මම හොර ලිපි ලේඛන නොවෙයි සභාගත කළේ. දැන් එතුමාම කියනවා ලංකාවේ පාර්ලිමේන්තුවේ

[ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා]

කිසිම මන්ත්‍රීවරයෙකුට නිරීක්ෂකයකු හැටියට යැමට අවස්ථාව ලබා නොදෙන්නට තීන්දුවක් ගෙන තිබෙනවාය කියලා. අන්න ඒකයි මා මතු කළේ. ජයලත් ජයවර්ධනට යන්න ලබා නොදීම පිළිබඳව ප්‍රශ්නයක් නොවෙයි. ජයලත් ජයවර්ධන පෞද්ගලිකව එංගලන්තයට යනවා. මම එංගලන්තයට යනවා. ඒක නවත්වන්න පුළුවන්කමක් නැහැ, ඒක මගේ අයිතිය. ඒක නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. මම මේ කථා කළේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගැන පමණක් නොවෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි, අපි විෂයට අදාළව කථා කරමු.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

ඔබතුමා එතුමාට අදහස් ප්‍රකාශ කරන්නට ඉඩ දුන්නා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඒ point of Order එක ඉදිරිපත් කරන්න මූලාසනයෙන් ඉඩ දෙන්න ඕනෑ. ඒක challenge කරන්න බැහැ.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මම ඔබතුමාට challenge කරනවා නොවෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

පොඩ්ඩක් ඉන්න. Order, please! Now, you have deviated from the subject that is under discussion and you have spoken for a long time. Let us come back to the subject now and finish it off.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

I will, Sir.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

If you proceed on those lines, I may have to expunge it.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයේ දී මම කථා කරන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගැන පමණක් නොවෙයි, ආණ්ඩු පක්ෂයේත් මන්ත්‍රීවරුන්ගේ අයිතිය වෙනුවෙනුත් කියන එක මම තමුන්නාන්සේට මතක් කරනවා. ඒ වගකීම, ඒ අයිතිය මන්ත්‍රීවරයකු හැටියට තමුන්නාන්සේ ආරක්ෂා කරයි කියලා මම විශ්වාස කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

විෂයට අදාළව ඕනෑම දෙයක් කථා කිරීමේ අයිතිවාසිකම මේ අවස්ථාවේ දී ලබා දීම මගේ යුතුකමක්.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හැටියට අපිට මේ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

විෂයට අදාළව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

පාර්ලිමේන්තුවේ කථා කරන්න තමුන්නාන්සේ අවස්ථාව දෙන්නේ නැත්නම් තමුන්නාන්සේගේ නියෝගයට අවනත වෙලා මම වාඩි වෙන්නම්. නමුත් මේ වැරදි පූර්වාදර්ශය දෙන්නට එපා. මන්ත්‍රීවරුන්ට තිබෙන කථා කිරීමේ අයිතිය ආරක්ෂා කර දෙන ලෙස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීවරයා ලෙස තමුන්නාන්සේගෙන් මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටින්න කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

May I draw your attention to the relevant Standing Order? If you deviate from the subject, the Chair has the power to stop you from speaking.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

Definitely, you have that power.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

It is stated in the Standing Orders.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

I do not challenge your power.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The Chair has to carry out the Standing Orders. Please come back to the subject.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

Please give me the due right to express my opinion. If I cannot express my opinion on the Floor of this House, where can I go? Do you want me to go to some other parliament?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

There are a lot of occasions for you to raise this matter. So, you can raise it and discuss it fully. You may have that opportunity.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

I will be doing it.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Not now; not on this subject.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

It is not up to the Hon. Nimal Siripala de Silva to decide and dictate to me on what to talk and when to talk; it is my privilege and my right.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

I only brought to the notice of the House the decision taken by the Sri Lanka Branch of the CPA.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

They can take any decision.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

It is the Sri Lanka Branch of the CPA which decides on all these matters. He, himself is a Member of that. He should canvass there, not here.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

How? Canvass -

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

You always go to the wrong forum.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

Right, right; only you are going on the correct track.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

You go to the proper forum and canvass if you have a case.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! At least now, let us come back to the subject.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද මගේ මේ කථාවේදී සංක්ෂිප්තයක් ලෙස මෙය ඉදිරිපත් කළේ අයුක්තියට, අසාධාරණයට විරුද්ධව මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වෙනුවෙන් කථා කරන්න පුළුවන්, පෙනී සිටින්න පුළුවන් හැකියාව තිබෙන රාජිත සේනාරත්න ඇමතිතුමා වැනි ඇමතිවරුන් මේ අමාත්‍ය මණ්ඩලයේ සිටින නිසායි. අන්න ඒ නිසා තමයි මේ නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා එන්නට ඉස්සර වෙලා මේ සභා ගර්භයේ දී මම එය පැහැදිලිව ප්‍රකාශ කළේ. රාජිත සේනාරත්න ඇමතිතුමාගේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අදාළ නියෝග පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේ දී මා මේ ප්‍රශ්නය මතු කළේ මේ ප්‍රශ්නය පිළිබඳව සාධාරණය ඉටු කරන්න, නිර්භීතව කථා කරන්න එතුමාට පුළුවන් නිසායි. මන්ත්‍රීවරුන්ට පමණක් නොවෙයි මේ රටේ ජනතාවටත් අසාධාරණයක් සිදු වන කොට එතුමා ඒ පිළිබඳව කථා කරනවා. "දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරියට ක්‍රියාත්මක කරන්න, ඉන්දියාවට චණ්ඩිකම් පෙන්වන්නට එපා, ඉන්දියාවට ගණන්කාරකම් පෙන්වන්නට එපා, මේ ප්‍රශ්නය පිළිබඳව ඉන්දියාවත් සමඟ බුද්ධිමත්ව හැසිරෙන්න" යි කියලා පිට කොන්දක් තිබෙන ඇමතිවරයෙක් හැටියට රාජිත සේනාරත්න ඇමතිවරයා ප්‍රකාශ කර තිබීම නිසායි මා මෙම ප්‍රශ්නය මේ අවස්ථාවේ දි මතු කළේ කියන එක මම තමුන්නාන්සේට මතක් කරන්නට ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ධීවර ජනතාව නියෝජනය කරන මහජන නියෝජිතයෝ හැටියට අපට යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් අපේ වරප්‍රසාද උල්ලංඝනය වෙනවා නම් ධීවර ප්‍රශ්න පිළිබඳව කථා කරන මේ වෙලාවේ ධීවරයෝ ගැන කථා කරන මේ වෙලාවේ ඒ ගැන කථා කරන්නට අපට හැකියාව තිබෙනවා. මන්ත්‍රීවරයකුට යම් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා නම්, වරප්‍රසාද උල්ලංඝනය වීමක් සිදු වෙලා තිබෙනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදී විරෝධී ක්‍රියාවක් සිදු වෙලා තිබෙනවා නම් ඒ ගැන කථා කරන්න ගම්පහ දිස්ත්‍රික්කයේ ජාඇල, වත්තල සහ මීගමුව යන ධීවර කලාපවල ධීවර ජනතාවගේ ඡන්දයෙන් පත් වී, එම ධීවර ජනතාව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මට හැකියාවක් තිබෙන්නට ඕනෑ. අන්න ඒ නිසයි මම මේ ප්‍රශ්නය මතු කළේ. මා නැවත වරක් තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, ධීවර ජනතාව නියෝජනය කරන මහජන නියෝජිතයෙක් හැටියට මා වග කීමෙන් ඉදිරිපත් කරපු සියලුම ලිපිලේඛන හැන්සාඩගත කරන්නය කියා.

මා උතුරේ ධීවර ජනතාව ගැන කථා කළා. උතුරේ ධීවරයින්ගේ ප්‍රශ්න පිළිබඳව මා කථා කළා. ඇයි, මම එහෙම කථා කරන්නේ? මම උතුරේ ධීවර ජනතාවගේ ඡන්දයෙන් පත් වුණු මන්ත්‍රීවරයෙක් නොවෙයි. නමුත් රටේ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ ප්‍රශ්නය පිළිබඳව කථා කරන්න මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හැටියට අපට වග කීමක් හා යුතුකමක් තිබෙනවා; ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපට ඒ සඳහා අයිතියක් තිබෙනවා. අන්න ඒ අයිතිය පාවිච්චි කරලා තමයි උතුරේ ධීවර ජනතාව අද අත් විඳින ප්‍රශ්න පිළිබඳවත්, මේ රාජ්‍ය ත්‍රස්තවාදය භාවිත කරමින් උතුරේ පවත්වන්න සූදානම් වන පළාත් පාලන මැතිවරණය පිළිබඳවත් අපි මේ අවස්ථාවේදී කථා කළේ. මේවා irrelevant කියලා -අදාළ නැහැයි කියලා- කිසි කෙනෙකුට කියන්න පුළුවන්කමක් නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon Member, your time is up. You may wind up now.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව කොච්චර වෙලාවක් තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Your time is up.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

තව විනාඩියකින් මගේ කථාව අවසන් කරන්නම්. අපි මතු කරන ලද මේ ධීවර ප්‍රශ්න පිළිබඳව රාජිත සේනාරත්න ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.58]

**ගරු පී. පියසේන මහතා**
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தச் சந்தர்ப்பத்தில் எனக்கும் பேசுவதற்கு வாய்ப்புக் கிடைத்ததையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். எங்கள் நாட்டின் அபிவிருத்தியையும் எங்கள் மக்களின் முன்னேற்றத்தையும் மட்டுமே கருத்திற்கொண்டு நாங்கள் செயற்படவேண்டும். மற்றவர்கள் பார்த்துக்கொண்டிருக்கிறார்கள் என்பதற்காக, ஏதோ நாங்களும் பேசுகின்றோம் என்று பேசாமல், உரிமைகளுக்காகச் சண்டை பிடிப்பதாகக் காட்டிக்கொள்ளாமல், எங்களின் பேச்சின் மூலம் மக்களுக்கு நாங்கள் எதைச் சொல்லுகிறோம், அதன்மூலம் அவர்கள் என்ன நன்மையைப் பெறப்போகிறார்கள், எங்கள் நாட்டின் அபிவிருத்திக்கு நாங்கள் எதைக் கூறக் கடமைப் பட்டிருக்கிறோம் என்பதைக் கருத்திற்கொண்டே நாம் பேச வேண்டும். மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் நமது நாட்டில் கடந்த 30 வருட காலமாக நிலவிய பெரும் அச்சுறுத்தலான பயங்கரவாதத்தை வேரோடும் வேரடி மண்ணோடும் துடைத்தெறிந்து, இன்று வடக்கு, கிழக்கு உட்பட நாட்டின் அனைத்துப் பகுதிகளிலும் மூவின மீனவர்களும் ஒற்றுமையாகவும் சுதந்திரமாகவும் தமது தொழிலை மேற்கொள்ள வழிசமைத்துள்ளார். அதற்காக அவருக்கு நாங்கள் எங்கள் நன்றியைத் தெரிவித்துக்கொள்ள வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை கடற்பரப்பிற்குள் இந்திய மீனவர்கள் அடிக்கடி வேண்டுமென்றோ அல்லது தவறுதலாகவோ நுழைவதன்மூலம் எங்கள் கடல் வளத்தைச் சுரண்டிக்கொண்டிருக்கின்றார்கள். ஆனால், அங்குள்ள அரசியல்வாதிகளோ இதற்கு எதிர்மாறான கருத்துக்களைத் தெரிவித்துக்கொண்டிருக்கிறார்கள். அதுமட்டுமன்றி, முழு இலங்கை மக்களையும் பிழையானவர்களாகச் சித்தரிப்பதுபோல், 'சிங்கள தேசம்' மற்றும் 'சிங்கள நாடு' என்று பத்திரிகைகளிலே வெளியிட்டுக்கொண்டும், இங்கே அப்பாவித் தமிழ் மக்களைக் கொல்கிறார்கள், கைது செய்கிறார்கள் என்று உலக நாடுகளிலே வீணான புரளிகளைப் பரப்பியும் வருகின்றார்கள். மேலும், இலங்கைத் திருநாட்டு மக்கள் பொல்லாதவர்கள்; வஞ்சக மானவர்கள்; ஏனைய மக்களை வாழவிடாதவர்கள் என்றவாறு பிழையான கருத்துக்களையும் கூறிக்கொண்டிருக்கின்றார்கள். எனவே, இந்திய மீனவர்களின் அத்துமீறல்கள் சம்பந்தமாக இந்திய அரசுடன் பேசி, அவர்கள் எங்கள் கடல் எல்லைக்குள் பிரவேசித்து வளங்களைச் சுரண்டுவதைத் தடுப்பதற்கான நடவடிக்கைகளை எடுப்பதன்மூலம் எங்கள் நாட்டு மக்கள் சம்பந்தமாக இத்தகைய தவறான கருத்துக்கள் உலக நாடுகளில் பரப்பப்படுவதை நாம் தவிர்க்க முடியுமென நினைக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அம்பாறை மாவட்டத்திலே யுத்தம் மற்றும் சுனாமிப்பேரலை போன்ற காரணங்களினால் கரையோரப் பிரதேச மீன்பிடி வளங்கள் அனைத்தும் அழிக்கப்பட்டுவிட்டன. மீன்பிடித் தொழிலை மேற்கொள்ளும் மக்கள் மிகவும் வறுமையிலே வாடிக்கொண்டிருக் கின்றார்கள்; மிகவும் கஷ்டத்தின் மத்தியில்தான் தங்களது மீன்பிடித் தொழிலைச் செய்துகொண்டிருக்கின்றார்கள். இந்த நிலை அங்கே மாற வேண்டும். பழைமையான முறைகளைக் கையாண்டு திறமையாக மீன் பிடித்து வந்த மீனவர்கள் பலர் அந்தச் சுனாமிப்பேரலையின்பொழுது கொல்லப்பட்டுவிட்டார்கள். எனவே, நவீன முறைகளைக் கையாள்வதற்கு அந்த மீனவ மக்களுக்குப் பயிற்சியளிப்பதோடு, நவீன மீன்பிடி உபகரணங் களும் வழங்கப்படவேண்டியிருக்கிறது. குறிப்பாக, அம்பாறை மாவட்டக் கரையோரப் பிரதேசங்களான பெரிய நீலாவணை, மருதமுனை, பாண்டிருப்பு, கல்முனை, சாய்ந்தமருது, காரைதீவு, ஒலுவில், சின்னப்பாலமுனை, அட்டாளைச்சேனை, அக்கரைப் பற்று, தம்பட்டை, திருக்கோவில், ஆலையடிவேம்பு, தாண்டியடி, கோமாரி, ஊறணி, பொத்துவில், அறுகம்பை போன்ற பிரதேச மீனவர்கள் நவீன மீன்பிடி உபகரணங்களின்றித் தமது தொழிலைச் சிறப்பாகச் செய்யமுடியாது தத்தளிக்கின்றனர். கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர் அவர்கள் இவர்களுக்கான அனைத்து உதவிகளையும் முடியுமானவரை வழங்கி அவர்களின் வாழ்வை வளப்படுத்த உதவ வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அம்பாறை மாவட்டத்திலுள்ள அறுகம்பைக்குடாப் பகுதியில் நவீன வசதிகளைக்கொண்ட மீன்பிடித் துறைமுகமொன்றை ஆசிய அபிவிருத்தி வங்கியின் உதவியுடன் அமைப்பதற்கு அரசு தீர்மானித்திருப்பதாக நான் அறிகின்றேன். இதேவேளை, பாணமை கிராமத்தை ஆழ்கடல் மீன்பிடிக் கிராமமாக மாற்றுவதற்கும் அரசு நடவடிக்கையெடுத்துள்ளது. அதற்காக எமது மக்கள் சார்பாக அரசுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அதுபோல, அம்பாறை மாவட்டத்திலுள்ள திருக்கோவில் பகுதியிலும் பல்வேறு வசதிகளைக் கொண்ட நவீன மீன்பிடித் துறைமுகம் ஒன்று அமைக்கப்பட வேண்டும் என்று கௌரவ கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர் அவர்களிடம் நான் பணிவாகக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் ஸ்தாபகர் மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரஃப் அவர்களினால் ஆரம்பிக்கப்பட்ட ஒலுவில் துறைமுகத்தின் நிர்மாண வேலைகள் தற்போது ஜனாதிபதி அவர்களின் அதீத முயற்சியினால் முடிவடையும் தறுவாயில் உள்ளன. இது மிக விரைவில் திறக்கப்படவிருப்பதாகவும் நான் அறிகின்றேன். அதேநேரம் இத்துறைமுகம் அமைக்கப்பட்டதன் விளைவாக ஒலுவில், திராய்க்கேணி, பாலமுனை, சின்னப்பாலமுனை, அட்டாளைச்சேனை ஆகிய கிராமங்களில் மீன்பிடி தொழில் வெகுவாகப் பாதிக்கப்பட்டது. இதனைக் கருத்தில் கொண்ட அரசு ஒலுவில் மற்றும் பாலமுனைப் பிரதேச மீனவர்களுக்கு உடனடியாக நிவாரணங்களை வழங்கியது. ஆனால் அட்டாளைச்சேனைப் பிரதேச மீனவர்கள் சுமார் 650 பேருக்குரிய சம்பந்தப்பட்ட ஆவணங்கள் மற்றும் அவர்கள் பற்றிய தகவல்கள் வழங்கப்பட்டு உரிய அதிகாரிகளினால் அவை அங்கீகரிக்கப்பட்டும் இதுவரை காலமும் அவர்களுக்கு இந்த நிவாரணங்கள் வழங்கப்படவில்லை. ஆகவே, கௌரவ கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர் அவர்கள் இந்த மீனவர்களுக்கான நிவாரணங்களை வழங்க வேண்டும். இவர்கள் இந்த நிவாரணத்தைப் பெறாததனால்

மிகவும் கஷ்டமான நிலையில் தங்களது ஜீவியத்தை நடத்திக்கொண்டிருக்கின்றார்கள். மேலும், இரண்டாம் உலக மகா யுத்தத்தின்போது அட்டாளைச்சேனை - திருக்கோயில் கடல் பிரதேசத்தில் மூழ்கிய யுத்தக் கப்பல்கள் மூன்று, இன்றும் அங்கு மண்ணினால் மூடப்பட்ட நிலையில் காணப்படுகின்றன. இதனால் இப்பிரதேச மீனவர்களின் கரைவலைகள் சேதமடைவதனால் அவர்கள் அங்கு மீன்பிடித் தொழிலைச் செய்ய முடியாது தத்தளிக்கின்றனர். நான் அங்கு நேரடியாகச் சென்று இதனை அவதானித்திருக்கின்றேன். ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் அந்தக் கப்பல்களை அங்கிருந்து அப்புறப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். அப்படிச் செய்வதன்மூலம் அந்த மக்களின் ஆசி அவருக்குக் கிட்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று மேதகு ஜனாதிபதி அவர்கள் வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள மீனவச் சமூகத்தின் அபிவிருத்திக்காகப் பல மில்லியன் ரூபாய் நிதியை ஒதுக்கியுள்ளதுடன், அமைச்சர் அவர்களுடன் இணைந்து அந்த மீனவர்களுக்காக அரும்பாடுபட்டுக் கொண்டிருக்கின்றார். அம்பாறை மாவட்டத்தைப் பொறுத்தவரையிலே அங்குள்ள மீனவர்கள் காலாகாலமாக மீன்பிடித் தொழிலை நம்பியே வாழ்ந்து கொண்டிருக்கிறார்கள். ஆனால், இன்று அந்த மீனவர்கள் பலவிதமான இன்னல்களை அனுபவித்துக் கொண்டிருக்கின் றார்கள். குறிப்பாக நான் இங்கு முன்னர் குறிப்பிட்டதுபோல், ஒலுவில் துறைமுகம் அமைக்கப்படுவதனால் மீன்பிடி நடவடிக்கை களில் அவர்களுக்குச் சில இடர்பாடுகள் ஏற்பட்டுள்ளன. எனவே, இந்த விடயத்தையும் கௌரவ கடற் றொழில் அமைச்சர் அவர்கள் கவனத்திலெடுத்துத் தீர்த்துவைப்பதுடன், அங்கு வருகை தந்து அந்த மீனவர்களின் பிரச்சினைகளை நேரடியாகக் கேட்டறிந்து, அவர்களுக்குரிய நிவாரணங்களை வழங்கி வைப்பதன்மூலம் அந்த மக்கள் அங்கே சிறந்த முறையில் வாழ்வதற்கும் வழிசமைக்க முடியும். காற்றின் சுழற்சியினால் மீனவர்கள் எந்நேரமும் கடலுக்கு மீன்பிடிக்கப் போக முடியாமல் இருப்பதனால், அங்கு குறிப்பிட்ட காலத்தில்தான் மீன்பிடித் தொழில் செய்யக்கூடியதாக இருக் கின்றது. இருந்தபோதிலும் அந்தப் பகுதியின் அபிவிருத்திக்காக அவர்கள் அரும்பாடுபட்டுக் கொண்டிருக்கின்றார்கள். அரசு பலவிதமான உதவிகளை அந்த மக்களுக்கு வழங்கியிருந்தாலும் அந்த உதவிகள் ஒருசில பகுதிகளைச் சென்றடையவில்லை. குறிப்பாக திருக்கோயில் பிரதேசம் சுனாமியினால் பாதிக்கப்பட்ட போது, அங்கு அரச நிறுவனங்கள் வழங்கிய நிதியுதவிகளை அந்தக் காலகட்டத்திலே அங்கிருந்த பயங்கரவாத அமைப்புடன் தொடர்புடையவர்கள் சுரண்டியதால், அந்த மக்களுக்கு அந்த நிவாரணங்களும் சரியாகக் கிடைக்கவில்லை. எனவே, அரசு அந்த மக்களின் துயர் துடைப்ப தற்காக மிக விரைவாக நடவடிக்கை எடுப்பதுடன், அவர்களுக்குக் குறித்த நிவாரணங்களையும் வழங்க வேண்டும் என்று கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன். வணக்கம்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ඊට පෙර මූලාසනය සඳහා ගරු ආචාර්ය සරත් වීරසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේ ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* THE HON. (DR.) SARATH WEERASEKARA *took the Chair.*

[අ.භා. 4.07]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ධීවර අමාත්‍යතුමා විසින් ගැසට් පත්‍රයේ පළ කර තිබෙන නියෝග ගණනාවක් පිළිබඳව පාර්ලිමේන්තුවේ පවත්වනු ලබන විවාදයට සහභාගි වන්නට ලැබීම සතුටක් කොට හිතෙනවා. විශේෂයෙන්ම ඇමතිතුමා මෙම නියෝග මඟින් අපනයනය, ආනයනය සහ ප්‍රතිඅපනයනය සඳහා යොදා ගත හැකි මත්ස්‍ය විශේෂ සඳහා බලපත්‍ර ලබා ගැනීම අනිවාර්යය කරලා තිබෙනවා. ඒ අතර, ඒ සඳහා අයදුම් පත්‍ර සහ බලපත්‍ර ආකෘතීන් ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම මුහුදු කුඩැල්ලන් සම්පත් කළමනාකරණය මෙමඟින් දැනටමත් හඳුනා ගෙන ඇති අතර, ඉදිරියේ දී වෙනත් මත්ස්‍ය විශේෂ ද ඇතුළත් කළ හැකි පරිදි මෙම නියෝග ඇතුළත් කරන්න ඇමතිතුමාගේ බලාපොරොත්තුවක් තිබෙනවා. අදාළ මත්ස්‍ය විශේෂ මුහුදු පත්ල හැරීමෙන් හෝ රෝල් දැලක් ජලාශ පතුල දිගේ යාන්ත්‍රිකව එළීමෙන් අල්ලා ගැනීම නොකළ යුතුය කියා ඇමතිතුමා මේ නියෝගවලින් ඉදිරිපත් කර තිබෙනවා.

2010 මසුන් ආනයන හා අපනයන නියෝග යටතේ ඇමතිතුමා පනවා තිබෙන්නේ අපේ රටේ මත්ස්‍ය සම්පත ආරක්ෂා කිරීමටත් ධීවර ක්ෂේත්‍රයේ වර්ධනයටත් ඉතාමත් හිතකර නියෝග ටිකක් බව පෙනෙනවා. නමුත් අපි කල්පනා කර බැලිය යුතු කරුණක් තිබෙනවා. මේ අනුව යම් මත්ස්‍ය ප්‍රභේදයක් ආනයනය, අපනයනය, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය, ප්‍රවාහනය, සන්තකයේ තබා ගැනීම සඳහා සීමා පැනවීමට ඇමතිතුමා ගන්නා ලද තීරණය හිතකරයි. නමුත් අප එහිදී සැලකිලිමත් විය යුතු කරුණක් තිබෙනවා. අපේ රටේ මහා පරිමාණ වංචාවන්ට, ඒ වාගේම යම් යම් ක්ෂේත්‍ර තුළ ආධිපත්‍ය පතුරුවන්න අද මේ බලපත්‍ර ඉවහල් වෙලා තිබෙන බව අප දන්නවා. ගල් වලක් නම් ගල් වලේ බලපත්‍රය, වැලි ගොඩ දැමීමේ බලපත්‍රය, ගස් ප්‍රවාහන බලපත්‍රය, බාර් බලපත්‍රය ආදී වශයෙන් අපේ රටේ බලපත්‍ර තිබෙනවා. ඒ ක්ෂේත්‍රයේ යම් ස්ථාවරභාවයක් අත් පත් කර ගැනීමක් සඳහා, යම් නියාමනයක් කර ගැනීමක් සඳහා සකස් කරන මේ බලපත්‍ර නිසා ප්‍රායෝගිකව සිදු වී තිබෙන්නේ ඒ නියාමන සීමාවේ ආරක්ෂා වනවා වෙනුවට, ඒ බලපත්‍ර නිකුත් කිරීමට බලය තිබෙන ආයතන හෝ පුද්ගලයන් මත යම් අධිකාරී බලයක් සහ යම් ප්‍රමාණයකට ඒ බලපත්‍ර උපයෝගී කර ගනිමින් ඔවුන් අයථා ගනුදෙනුවල නිරතවීමයි. මේ බලපත්‍ර දීමේ ආයතන සියල්ලම අවුස්සලා බැලුවොත් පෙනී යන්නේ ඒකයි.

අපේ රටේ බලපත්‍ර විශාල ප්‍රමාණයක් ලබා දෙන ආයතනය තමයි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව; RMV එක. ඒක අවුස්සලා බැලුවොත් අපට සොයා ගන්න පුළුවන් සැබවින්ම මේ බලපත්‍ර යම් ක්ෂේත්‍රයක් නියාමනය සහ සුරක්ෂිත කිරීමෙන් එහාට ගිහිල්ලා එම ක්ෂේත්‍රයේ වංචාව, දූෂණය, යම් යම් අයගේ වුවමනාවන්, තම තමන්ගේ අපේක්ෂාවන් පමණක් ඉටු කර ගැනීම සඳහා දරන ප්‍රයත්නයක් තිබෙන බව. ඒ නිසා ඔබතුමා ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. මේ බලපත්‍ර දීමේ දී එවැනි තත්ත්වයක් ඇති වීමේ අනතුරක් තිබෙනවා. කෙසේ වුවත් අය

[ගරු අනුර දිසානායක මහතා]

වැය විවාදයෙන් පසුව ධීවර අමාත්‍යාංශය පිළිබඳව පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්න අවස්ථාවක් ලැබී තිබෙන්නේ අදයි. ඒ නිසා ධීවර අමාත්‍යාංශයට අදාළ කරුණු කිහිපයක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා රටක් සංවර්ධනයේ දී ඒ රට තමන්ගේ ප්‍රධාන ආර්ථික උපාය මාර්ග තෝරා ගත යුතුව තිබෙන බව. ලෝකයේ ඕනෑම රටක් තමන්ගේ ආර්ථික උපාය මාර්ග තෝරා ගැනීමේ දී තමන්ගේ රටේ පිහිටීම, ඒ රටේ ඉතිහාසය, ඒ රටේ මිනිසුන් තුළ තිබෙන විශේෂ ශක්‍යතාවන්, ස්වභාවික සම්පත් මේ ආදී දේ සැලකිල්ලට ලක් කරනවා. විශේෂයෙන්ම අපි සිංගප්පූරුව ගත්තොත් එය ඉතා කුඩා රටක්. ඒ නිසා ඔවුන්ගේ ආර්ථික උපාය මාර්ගය බවට පත් වුණේ මොකක්ද? ඔවුන්ගේ රට supermarket එකක් කිරීම තමයි ඔවුන්ගේ ආර්ථික උපාය මාර්ගය වුණේ.

කොළඹ නගරයේ පර්චස් 4ක් තිබෙන කෙනෙක් ඒකේ බතල වගා කරන්න යන්නේ නැහැ. එතැන වෙළෙඳ පොළක් බවට පත් කරන්න ඕනෑ. ඒක තමයි කොළඹ නගරයේ පර්චස් 4ක් තිබෙන පුද්ගලයෙක් අනුගමනය කළ යුතු ආර්ථික උපාය මාර්ගය. ඒ වාගේ දෙයක් තමයි, සිංගප්පූරුව තමන්ගේ ආර්ථික උපාය මාර්ගය බවට පත් කර ගත්තේ. තමන්ගේ රට ඉතා කුඩා රටක්. ඒ වාගේම වෙළෙඳ කේන්ද්‍රයකට අවශ්‍ය වන පිහිටීමක් තිබෙනවා. ඔවුන් ඒ පිහිටීම උපයෝගී කර ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව කෙටියෙන්ම ගත්තොත් සිංගප්පූරුව අද ලෝකයේ තිබෙන ලොකුම supermarket එකයි.

වෙළෙඳ කේන්ද්‍රයක් මූලිකව ඔවුන්ගේ රට ගොඩ නැංවීමේදී, වෙළෙඳ කේන්ද්‍රයකට අවශ්‍ය වන යටිතල පහසුකම් ඔවුන් හඳුනා ගන්නවා. ඒ නිසා තමයි සිංගප්පූරු වරාය ලෝකයේ කාර්යක්ෂම වරායක් බවට පත් වෙලා තිබෙන්නේ; සිංගප්පූරු බැංකුව ලෝකයේ කාර්යක්ෂම බැංකුවක් බවට පත් වෙලා තිබෙන්නේ; සිංගප්පූරු ගුවන් තොටුපොළ සහ සිංගප්පූරු ගුවන් සේවය ලෝකයේ දෙවැනි කාර්යක්ෂම ගුවන් සේවය බවට පත් වෙලා තිබෙන්නේ. තමන්ගේ රට වෙළෙඳ කේන්ද්‍රයක් බවට පත් කර ගන්න, ඒ වෙළෙඳ කේන්ද්‍රයට අතිශය වැදගත් වන බැංකු පද්ධතිය, නාවුක ගමනාගමනය සහ ගුවන් ගමනාගමනය තමන්ගේ ආර්ථික උපාය මාර්ග හැටියට ඔවුන් ඉලක්ක කරනවා. ඒ ඉලක්ක අනුව තමයි ඔවුන්ගේ රටේ ආර්ථිකය ඔවුන් සකස් කළේ. ඒ නිසා තමයි ඔවුන්ට කාර්යක්ෂම ගුවන් සේවයක් තිබෙන්නේ, Development Bank of Singapore වැනි කාර්යක්ෂම බැංකු සේවයක් තිබෙන්නේ සහ කාර්යක්ෂම වරායක් තිබෙන්නේ. ඒ තමයි ඔවුන්ගේ ආර්ථික උපාය මාර්ගය. ඒ නිසා ඕනෑම රටක් තම ආර්ථික උපාය මාර්ගය තෝරා ගත යුතු වන්නේ, ඒ රටේ පිහිටීම, ඒ රටේ ඉතිහාසය, ඒ රටේ මිනිස්සුන්ගේ ශක්‍යතාවන් යන ඒ සියල්ල සැලකිල්ලට භාජන කර ගෙනයි.

ඒ වාගේම තමයි චිලී රට. චිලී රට කියන්නේ ඉතා දිගටි රටක්. අපේ කොඳු ඇට පේළිය වාගේ තමයි චිලී රටේ සිතියම තිබෙන්නේ. ධීවර කර්මාන්තය තමයි ඔවුන්ගේ රටේ ප්‍රධාන ආර්ථික උපාය මාර්ගය බවට පත් කර ගෙන තිබෙන්නේ. දිගටි රටක් තිබෙන නිසාම විශාල මුහුදු සීමාවක් ඔවුන්ගේ රටට අයත්ව තිබෙනවා. ඒ නිසා ඔවුන්ගේ ප්‍රධාන ආර්ථික උපයා මාර්ගය බවට පත් කර ගත්තා, ධීවර කර්මාන්තය. ඒ නිසා තමයි අපට තවමත් "චිලී රටෙන් දැන් ඇල්ලූ අරලිය ටින් මාළු" එන්නේ. ඔවුන් තමන්ගේ ආර්ථික උපාය මාර්ගය ඒ විධියට සකස් කර ගත්තා.

දැන් අපි කල්පනා කර බලන්නට ඕනෑ අපේ ආර්ථික උපාය මාර්ගය කවරක්ද කියලා. එක පැත්තකින් අපේ ඉතිහාසය අනුව මල්වතු ඔය අසබඩ විජිත ග්‍රාමය, අනුරාධ ග්‍රාමය වැනි ජනාවාස පිහිටා තිබුණා වාගේම, බෞද්ධ දර්ශනය අනුවත් කෘෂි කර්මාන්තයට අවශ්‍ය වන සංස්කෘතික පසුබිමක් තිබීම හේතු කොට ගෙන කෘෂි කර්මාන්තය අපේ ආර්ථික උපාය මාර්ගයේ ප්‍රධාන කොටසක් බවට පත් කරගත හැකිව තිබෙනවා.

හැබැයි, අද තත්ත්වය හැටියට ගත්තොත්, අපේ රටේ ආර්ථික උපාය මාර්ගයේ ඉතාම වැදගත් කොටසක් නියෝජනය කළ යුතුයි, අපේ රටේ ධීවර ක්ෂේත්‍රය. මොකද, රට වටේ මහ මුහුදක් තිබෙනවා. අපි සාමාන්‍යයෙන් කියමනට කියන්නේ රට වාගේ අට ගුණයක මුහුදු සීමාවක් අපට තිබෙනවා කියලායි. රට වාගේ අට ගුණයක මුහුදක් තිබෙනවා. සැබැවින්ම ගත්තොත්, රට ඇතුළ පාලනය කරන්න ඇමතිවරු ගොඩක් හිටියාට, රට වටේ තිබෙන මුහුද පාලනය කරන්න ඉන්නේ එක අමාත්‍යවරයායි. මුහුද රට වාගේ අට ප්‍රමාණයක්. නමුත් ක්ෂේත්‍ර අඩුයි. ඒ වුණත් විශාල මුහුදු සම්පතක් තිබෙනවා. ඒ වාගේම තමයි රට මධ්‍යයේ හෙක්ටයාර 140,000කට අධික ජලාශ තිබෙනවා. සාමාන්‍යයෙන් ගත්තොත් කුඩා වැව් අමුණු 14,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා මිරිදිය ධීවර කර්මාන්තයටත්, ඒ වාගේම කරදිය ධීවර කර්මාන්තයටත් යෝග්‍ය පිහිටීමක අපේ රට තිබෙනවා. ඒක අපි සැලකිල්ලට ලක් කර ගන්න ඕනෑ.

අපේ ප්‍රජාව ගත්තොත්, විශේෂයෙන්ම වෙරළාසන්න ධීවර ප්‍රජාවගෙන් බහුතරයක ආගම කතෝලික ආගම බවට පත් වී තිබෙනවා. කතෝලික ආගමේ ආභාසයෙන් සහ එහි ශික්ෂණයෙන් ධීවර ක්ෂේත්‍රය යම් ප්‍රමාණයකට ඉදිරියට ගෙන යනවා. කන්ද උඩ රටට වඩා, වෙරළ තීරයේ තිබෙන ආගමික පසු බිමත්, ඒ පසු බිම සහිත ප්‍රජාවක් ජීවත් වීමත් අපට මෙම ක්ෂේත්‍රයේ වර්ධනයට හිතකර තත්ත්වයක් හැටියට තිබෙනවා. ඒ වාගේම තමයි අපේ පාරම්පරික ධීවරයන් සතුව තිබෙන ඥානය.

විශේෂයෙන්ම අපේ රට කාර්මිකකරණයේ මහා විප්ලවයන් අත් පත් කර නොගත් රටක් වුවත්, අපට මුහුදේ තිබෙන මාළු සම්පත නෙළා ගැනීම සඳහා සාම්ප්‍රදායික ධීවර කර්මාන්තයක් තමන් විසින්ම ගොඩනඟා ගන්නා ලද ධීවර ප්‍රජාවක් සිටිනවා. එවැනි ඓතිහාසික ගොඩ නැංවීමක් තිබෙනවා වාගේම, අපේ රටේ ධීවර ආම්පන්න, මාළු සම්පත නෙළා ගැනීමේ ක්‍රමවේද අනුවත් අපට ඓතිහාසික උරුමයක් තිබෙනවා. මා කියන්නේ ඒවා පොදි බැඳ ගෙන ඉදිරියට යන්න කියලා නොවෙයි.

මේ සියල්ලම එක්ක අපේ රටේ ධීවර ක්ෂේත්‍රය අපේ රටේ ආර්ථිකයේ ප්‍රධාන උපාය මාර්ගයක් බවට පත් කර ගත යුතුයි. නමුත් අපි තවමත් මෝදර ටින් මාළු කර්මාන්තශාලාවක් ගැන කථා කරනවා. කවදා ඉඳලාද මන්දා ඒක ගැන කථා කරන්නේ. මා දන්නවා, මේ පාර්ලිමේන්තුවේ මා සිටින කාලයේ ඉඳලාම හැම අය වැය විවාදයකදීම ටින් මාළු කර්මාන්තශාලාවක් පිළිබඳව සාකච්ඡා වුණා; ධීවර ජනතාව පිළිබඳව සාකච්ඡා වුණා. නමුත් සැබැවින්ම ආණ්ඩුව තමන්ගේ ආර්ථිකයේ කවර ස්ථානයක්ද ධීවර ක්ෂේත්‍රයට ලබා දී තිබෙන්නේ? මම හිතන විධියට මේ රටේ ආර්ථිකයට ධීවර ක්ෂේත්‍රයෙන් ලබා ගත හැකි උපරිමය ලබා ගැනීම ඉලක්ක කොට ගත් ආර්ථික උපාය මාර්ගයකට රජය අවතීර්ණ වෙලා නැහැ. එය තවත් එක් අමාත්‍යාංශයක කොටසක් ලෙස තමයි පවතින්නේ. මම හොඳම උදාහරණයක් කියන්නම්. ආණ්ඩුවේ ප්‍රධාන ආර්ථික උපාය මාර්ගය බවට පත් වී තිබෙන්නේ මොකක්ද?

අද ආණ්ඩුවේ ප්‍රධාන ආර්ථික උපාය මාර්ගය බවට පත් වී තිබෙන්නේ සංචාරක ව්‍යාපාරය. ඒ නිසා සංචාරක ව්‍යාපාරයට අදාළ අමාත්‍යාංශයක් ගොඩ නැඟෙනකොට -ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය- සංචාරක ව්‍යාපාරයට කුඩා හෝ ප්‍රමාණයකින් දායකත්වයක් සපයන ඒ හැම ආයතනයක්ම ඒකට බද්ධ කරනවා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ගොඩ නැගෙන්නේ එහෙමයි. ඒ විධියට ආයෝජන මණ්ඩලයත් ආර්ථික සංවර්ධන

අමාත්‍යාංශය යටතට එනවා. ඒ විධියට සංචාරක මණ්ඩලයත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතට එනවා. වනජීවී දෙපාර්තමේන්තුවත් එක අවස්ථාවක තිබුණා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සතුව. මට මතක හැටියට විල්පත්තු වනෝද්‍යානය පවා තිබුණේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ.

ආණ්ඩුව යුද්ධය අවසන් වුවාට පසුව තමන්ගේ ආර්ථිකයේ ප්‍රධානතම ඉලක්කය බවට පත් කර ගෙන තිබෙන්නේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වන සංචාරක ව්‍යාපාරය. ඒ නිසා ඊට අවශ්‍ය වන පරිදි ඉඩම් නීති ලිහිල් කරනවා. ඊට අවශ්‍ය වන පරිදි ඉඩම් පවරා දීම් කරනවා. ඊට අවශ්‍ය වන පරිදි ආයෝජන මණ්ඩලයේ යම් යම් නීති රෙගුලාසි ලිහිල් කරමින් තිබෙනවා. ලක්ෂ්මන් යාපා අබේවර්ධන ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රකාශ කර තිබුණා, සංචාරක ව්‍යාපාරය සංරක්ෂණය කරන ලද වන භූමි දක්වාම ව්‍යාප්ත කරන්න ඕනෑ කියලා. ඒකට අපේ රටේ තිබෙන වනජීවී සහ වෘක්ෂලතා පනත බාධා කරනවා. ඒ නිසා ඒ නීතිය පවා වෙනස් කරන්න උත්සාහ කරනවා. ඒ වාගේම තමයි කැසිනෝ සඳහා පනත් ඇති කර දෙනවා.

ඒ වාගේම තමයි හෝටල් ව්‍යාපාරය. මා අද පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් අසා තිබුණා. අවාසනාවකට ඇමතිතුමා ඒකට උත්තර දුන්නේ නැහැ. සංචාරක ව්‍යාපාරයේ මුවාවෙන් මොන තරම් ඉඩම් ප්‍රමාණයක් ගැසට් කරලා සංචාරක මණ්ඩලය අත් පත් කර ගෙන තිබෙනවාද කියලා අපි සොයලා බලන්න ඕනෑ. ඒ වාගේම අපේ රටට විදේශ ආයෝජනයක් ගෙන ඒමේදී, ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් හැටියට එය අර්ථකථනය වෙලා අනුමත වෙන්න ඩොලර් මිලියන පහක සීමාවක් තිබුණා. ඒ ඩොලර් මිලියන පහේ සීමාව ඩොලර් මිලියනය දක්වා අඩු කළා, පසු ගිය අය වැය ලේඛනයෙන්. එම නිසා සමස්ත ඉලක්කය, සමස්ත අරමුණ බවට පත් වී තිබෙන්නේ තමන්ගේ ආර්ථිකයේ ප්‍රධාන සාධකය සංචාරක ව්‍යාපාරය බවට පත් කර ගන්නයි. හැබැයි ඊට වඩා වැඩි ශක්‍යතාවක් තිබෙන, වැඩි හැකියාවක් තිබෙන, අපේ රටේ ආර්ථිකයේ ජාතික නිෂ්පාදනයට වැඩිම අගයක් එකතු කළ හැකි ක්ෂේත්‍රයක් වන ධීවර ක්ෂේත්‍රයට මේ අවධානය යොමු කරලා නැහැ.

ඇමතිතුමනි, ඔබතුමාට අමාත්‍යාංශයක් ලබා දීලා තිබෙනවා. එම අමාත්‍යාංශයේ ඔබතුමාට ලැබී තිබෙන විෂය පථය තුළ යමක් කරන්න උත්සාහ කළා. මා කියන්නේ මේ ක්ෂේත්‍රය එහෙම නංවන්න බැහැයි කියලායි. මෙය රජය තමන් තෝරා ගන්නා ලද ආර්ථික සැලැස්මේ කවර ස්ථානයකද තිබෙන්නේ? මා හිතන හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ -වේදිකාවේ කියන වැඩ පිළිවෙළ නොවෙයි. සැබැවින්ම ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ- ඇතුළේ ධීවර කර්මාන්තයට හිමි වී තිබෙන්නේ එයට ලබා දිය යුතු ස්ථානය නොවෙයි. ඊටත් වඩා ගව් ගණනක් යටින් තිබෙන්නේ. අවම වශයෙන් ධීවර අමාත්‍යාංශයට ඒකාබද්ධ විය යුතු ආයතන ටිකවත් ඒකාබද්ධ වන්නේ නැහැ. හැබැයි සංචාරක අමාත්‍යාංශය ගත්තොත් කුඩා හෝ ප්‍රමාණයකින් සංචාරක අමාත්‍යාංශයට ගැටෙන ආයතනයක් තිබුණා නම් ඒක ඒ අමාත්‍යාංශය යටතට ගන්නවා. මොකද ඒක තමයි ඔවුන්ගේ ආර්ථිකයේ ඉදිරි ක්‍රියාමාර්ග බවට ප්‍රධාන කොට සලකන්නේ. නමුත් ධීවර අමාත්‍යාංශයේ එහෙම අරගෙන නැහැ.

ධීවර අමාත්‍යාංශය යටතේ තිබුණා, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව. මා ඒ පිළිබඳව කලිනුත් කිව්වා. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ධීවර අමාත්‍යාංශයට අතිශය වැදගත් දෙපාර්තමේන්තුවක්. ධීවර අමාත්‍යාංශය අමාත්‍යාංශයක් වශයෙන් වෙන් කරපු දවසේ සිට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව තිබෙන්න ඇත්තේ ධීවර අමාත්‍යාංශය යටතේ බව මා විශ්වාස කරනවා. මොකද, ඒ දෙපාර්තමේන්තුව අවශ්‍ය ධීවර අමාත්‍යාංශයටයි. නමුත් ඒක ගලවලා පැත්තකින් තබනවා. ඒකෙන්ම පෙන්නුම් කරනවා, ආර්ථික උපාය මාර්ගය ඇතුළේ අපේ රටේ ධීවර ක්ෂේත්‍රයට අත් පත් කර තිබෙන ස්ථානය අපේ රට පවතින ස්ථානයත් එක්ක එය කිසි සේත්ම සුදුසු ස්ථානය නොවෙයි කියලා. අපේ රටේ ජාතික නිෂ්පාදනය ඉහළට දැමීමේදී අතිශය වැදගත් වනවා, මේ ධීවර ක්ෂේත්‍රය අපේ රටේ තබා තිබෙන ස්ථානය. කිසි සේත්ම සෑහීමකට පත් විය යුතු ස්ථානයක නොවෙයි එය තිබෙන්නේ.

අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? දළ දේශීය නිෂ්පාදිතයට ධීවර ක්ෂේත්‍රයේ දායකත්වය හැටියට ඔබතුමා කිව්වේ සියයට දහනවයයි දශම ගණනක්. මා ළඟ තිබෙනවා, ඔබතුමාගේ අමාත්‍යාංශයෙන්ම නිකුත් කරන ලද වාර්තාවක්. ඒ වාර්තාව වැරදිද කියා මා දන්නේ නැහැ. ධීවර අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබෙනවා, 2010 - 2013 දක්වා වූ වාර්තාව. [බාධා කිරීමක්] මේ අනුව ධීවර ක්ෂේත්‍රයෙන් දළ ජාතික නිෂ්පාදිතයට සපයන්නේ සියයට 1.17යි. එයින් අපට සෑහීමකට පත් විය හැකිද? අපේ දළ ජාතික නිෂ්පාදිතයට සේවා ආර්ථිකයෙන් සපයනවා, සියයට 62කට ආසන්න ප්‍රමාණයක්. මට මතක විධියට මේ වන කොට කෘෂිකර්මාන්තය දළ දේශීය නිෂ්පාදිතයට සියයට 14ක් විතර සපයනවා. හැබැයි ධීවර ක්ෂේත්‍රය සපයන්නේ සියයට 1.17යි. එම ප්‍රමාණය ගැන කිසි සේත්ම සෑහීමකට පත් වන්න බැහැ. රට වටේ මුහුදක් තිබෙන, හෙක්ටයාර් 3,00,000කට වඩා වැඩි ප්‍රමාණයක් ගොඩ බිම ජලාශ තිබෙන රටක දළ දේශීය නිෂ්පාදිතයට ධීවර ක්ෂේත්‍රයේ දායකත්වය තිබෙන්නේ සියයට 1.17ක් නම්, අපට හිතා ගන්න පුළුවන්, එයට දක්වන දායකත්වයේ ප්‍රමාණය.

ඒ විතරක් නොවෙයි. අපේ අපනයන ආදායම කීයද? ඩොලර් මිලියන 21යි. 2009 වසරේදී මත්ස්‍ය සම්පත අපනයනය කිරීම හරහා අපේ රටට ලැබී තිබෙන ආදායම ඩොලර් මිලියන 21යි. රුපියල් මිලියන 21යි. [බාධා කිරීමක්] නැහැ. ඔබතුමාගේ වාර්තාවේ තිබෙන්නේ රුපියල් මිලියන 21යි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මිලියන 21,000යි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, මිලියන 21,015යි. බිලියන 21යි සපයා දී තිබෙන්නේ. මා හිතන හැටියට ඒ බිලියන 21 සෑහීමකට පත් විය හැකි මුදල් ප්‍රමාණයක් නොවෙයි. අපනයන ආදායම තවත් වර්ධනය කළ හැකි ක්ෂේත්‍රයක් හැටියට අපනයන ක්ෂේත්‍රය තිබෙනවා.

ඊ ළඟට, අපේ රටේ සාමාන්‍ය මනුෂ්‍යයකුට දෛනිකව මාළු ග්‍රෑම් 60ක් අවශ්‍ය වන බවට වෛද්‍ය පර්යේෂණ ආයතනයෙන් නිර්දේශ කරලා තිබෙනවා. දෛනික මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 60ක් තිබෙන්න ඕනෑය කියලා නිර්දේශ කර තිබෙනවා. හැබැයි දැන් තිබෙන්නේ ග්‍රෑම් 31ක මත්ස්‍ය පරිභෝජනයකුයි. වාර්ෂිකව ගත්තොත් කිලෝග්‍රෑම් 21.9ක ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනයක් තිබෙන්න ඕනෑකම තිබෙනවා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට තිබෙන්නේ කිලෝ ග්‍රෑම් 11ක් පමණ ප්‍රමාණයක්. අපේ රට වටේම මහ මුහුද තිබෙනවා. නමුත් අපේ රටේ ජනතාවට අවශ්‍ය මත්ස්‍ය සම්පතෙන් සියයට 50කටත් වඩා අඩු ප්‍රමාණක් තමයි සපයන්නේ. කල්පනා කරලා බලන්න. අපිට පිට රටින් ලැබෙන ආදායම රුපියල් බිලියන 21 දක්වා අඩු වී තිබෙනවා. රුපියල් බිලියන 21යි.

අපේ රැකියා ක්ෂේත්‍රයේ ඉන්නවා මිලියන 2.4ක් පමණ. ආසන්න වශයෙන් ලක්ෂ 25ක් විතර ඉන්නවා. ඒ අය අපේ රටේ

[ගරු අනුර දිසානායක මහතා]

ජාතික නිෂ්පාදිතයට එකතු කරන්නේ සියයට 1.1යි. සෘජු සහ වක්‍ර රැකියාවල ලක්ෂ 25කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. එය රටේ ජනගහනයෙන් අටෙන් එකක්. මම හිතන්නේ ශ්‍රම බලකායෙන් ගත්තොත් හතරෙන් එකකට ආසන්න ප්‍රමාණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට ශ්‍රම බලකායෙන් හතරෙන් එකක් නියෝජනය කරන ධීවර ක්ෂේත්‍රය දළ ජාතික නිෂ්පාදිතයට එකතු කරන්නේ සියයට 1.17යි. රට වටේම මුහුද, රට වාගේ අට ගුණයක් විශාල මුහුදු කලාපයක් අයිති අපට, රටේ ජනතාවට අවශ්‍ය වන මත්ස්‍ය ප්‍රමාණයෙන් සපයනු ලබන්නේ සියයට 50කට ආසන්න ප්‍රමාණයක්. ඒ කියන්නේ සත්ත්ව ප්‍රෝටීන් ප්‍රමාණයෙන් ගත්තොත් සියයට 70ක් මත්ස්‍ය සම්පතින් තමයි අපි සපයා ගන්නේ.

අපේ රටේ බෞද්ධ දර්ශනය අනුව ආහාරය සඳහා සතුන් ඝාතනය කිරීමේදී අනෙකුත් සතුන් මරනවාට වඩා මත්ස්‍ය ඝාතනයට වෙනත් ස්ථානයකුයි හිමි වෙන්නේ. ඒක කොහොමද කියලා මම හරියට දන්නේ නැහැ. නමුත් හිත් තුළ ඇති වෙලා තිබෙන්නේ එහෙම. ඒ නිසා අපේ ආහාරයට මත්ස්‍ය සම්පතින් සියයට 70ක් පමණ අපි සපයා ගන්නවා. මම මේ දත්ත ටිකක් කිව්වේ වෙන මොකවත් නිසා නොවෙයි. මේ දත්තවලින් පෙන්නුම් කරන්නේ ධීවර ක්ෂේත්‍රය අපේ රටේ තිබිය යුතු ස්ථානයේ නැහැ කියන එකයි. ඒ පැති දෙකකින්. එකක්, අපේ රටේ ජාතික නිෂ්පාදනයට එය දක්වන දායකත්වය. දෙක, අපේ රටේ ජනතාවගේ පෝෂ්‍යදායක තත්ත්වයට එය දක්වන දායකත්වය. ඒ ක්ෂේත්‍ර දෙකේම මෙය තබා ගත යුතු ස්ථානයේ නැහැ. ඒ නිසා දැන් අවශ්‍ය වී තිබෙන්නේ මොකක්ද? මේක වෙනත් දිශාවකට තල්ලු කරන්න. හැබැයි සිද්ධ වෙමින් තිබෙන්නේ මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර ක්ෂේත්‍රය දිරිගැන්වීමේ දිශාවටද මේ ක්‍රියාමාර්ග සකස් වෙන්නේ? නැහැ. රජයක් හැටියට මුළු මහත් ක්‍රියාමාර්ග සකස් වෙන්නේ ධීවර ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යෑමේ වුවමනාවෙන් නොවෙයි. රජයක් හැටිය ක්‍රියාමාර්ග සකස් වෙන්නේ කොහොමද?

දැන් ප්‍රසම්පාදන දැන්වීමක් පළ කරලා තිබෙනවා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ, වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින්. වාරි මාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාශවල සංචාරක බෝට්ටු සේවාවක් ඇරඹීම සඳහා සේවා බදු දීමට සුදුසු ආයෝජකයන්ගෙන් මිල ගණන් කැඳවීම සඳහා. ඒ කියන්නේ අපේ රටේ වැව් 22කට. දිවයින පුරා ප්‍රධාන ජලාශ 22ක් තිබෙනවා. ඒ යටතේ මහියංගනය ප්‍රදේශයේ සොරබොර වැව, තිස්සමහාරාමයේ තිස්ස වැව සහ යෝධ වැව, අනුරාධපුරයේ තිසා වැව සහ නාච්චදූව වැව, මින්නේරිය වැව, පදවිය වැව, පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය සහ ගිරිතලේ වැව, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගල්ල වැව, හිරියාල බතලගොඩ වැව, අම්පාර නගරයේ පිහිටි කොන්ඩවටුවාන වැව, මන්නාරමේ යෝධ වැව, නුවර එළිය කන්දෙ ඇළ, වැල්ලවායේ හඳපානගල වැව, කන්තලේ වැව, බත්තරමුල්ල තලංගම වැව, මහරගම ප්‍රදේශයේ පිහිටි බොරලැස්ගමුව වැව, මහනුවර නුවර වැව, ගලේවල දේවාහුව වැව, මඩකලපුව වහනේරි වැව, බදුල්ල අඹේවෙල වැව යන ජලාශ 22ක් නම් කර තිබෙනවා. එතකොට මේ ජලාශ 22ට අදාළව දැන්වීම දාලා තිබෙන්නේ මොකටද? වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාශවල සංචාරක බෝට්ටු සේවාවක් ඇරඹීමට සේවා බදු දීම සඳහා සුදුසු අයෝජකයන්ගෙන් මිල ගණන් කැඳවීමට.

ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන කටයුත්තක් හැටියට අපි කෘෂි කර්මාන්තයයි, ධීවර කර්මාන්තයයි ගැන කල්පනා කරනවා නම්, මේ දැන්වීම දැමීමට පෙර ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයත් එක්ක කථා කළ යුතු වෙනවා; කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක කථා කළ යුතු වෙනවා. මොකද, එක පැත්තකින් අපේ රටේ මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන බොහෝ පිරිස් මේ ජලාශ 22 අවටයි ජීවත් වෙන්නේ. ඒ වාගේම තමයි අපේ රටේ වගා කරන බොහෝ කුඹුරු මේ ජලාශත් එක්ක ගැට ගැහිලායි තිබෙන්නේ. හැබැයි ආණ්ඩුව මෙය ආරම්භ කරන්නේ මොකටද? සංචාරක ව්‍යාපාරයට. හැබැයි සංචාරක ව්‍යාපාරය ප්‍රධාන කොට ගෙන කටයුතු කරන කොට අඩුම තරමේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයත් එක්ක හෝ කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක මේ පිළිබඳව සාකච්ඡා කළ යුතු වෙනවා. නමුත් මා දන්නා පරිදි අවම ප්‍රමාණයෙන්වත් සාකච්ඡාවක් කෙරිලා නැහැ. පත්තරේ දැන්වීම දැම්මාට පස්සේ වෙන්න ඇති ඔබතුමන්ලාත් දකින්න ඇත්තේ. ඇත්ත කථාව ඒක නේ. එහෙම නම් ප්‍රමුඛ කොතැනද?

මා දැක්කා පසු ගිය දවසක "තල්මසුන් ලංකාව අවට මුහුද හැර යාමේ අවධානමක්" කියලා සාගර ජීව විද්‍යාඥවරියක වන ආශා ඩි වොස් මහත්මිය පවසා තිබෙනවා කියා පළවී තිබුණා. ඇය එසේ පවසා ඇත්තේ ලංකා සංචාරක මණ්ඩලයේ පැවති සම්මන්ත්‍රණයකදීයි. එතුමිය මෙසේ කියා තිබෙනවා, ල්මසුන් නැරඹීමේදී උන්ට හැරිහැර වන ලෙස සමහරුන් කටයුතු කිරීම නිසා උන් ගැඹුරු මුහුදට යාමේ අවදානමක් තිබෙන බවත්, එසේ වුවහොත් ලංකාවට එම කර්මාන්තය පවත්වා ගෙන යාම ඇසීරු විය හැකි බවටත්, මේ නිසා ලංකාව අවට මුහුදේ තල්මසුන් නැරඹීමට සංචාරකයින් රැගෙන යන කර්මාන්තයේ යම් නියාමනයකට ලක් විය යුතු බවත්.

සංචාරකයන්ට තල්මසුන් පෙන්වීම සඳහා දැනට යොදා ගෙන තිබෙන යාත්‍රා බොහොමයක් විධිමත් නොවන අයුරින් පවත්වා ගෙන යන බවත්, ඒවායේ ජීවිත ආරක්ෂණ උපකරණ පැළඳීම හෝ තල්මසුන් නැරඹීමේදී යම් දුර සීමාවක සිට නැරඹීම වැනි ක්‍රම අනුගමනය නොකරන බවත් ඇය පෙන්වා දුන්නාය. එක් තල්මසකු පෙන්වීම සඳහා යාත්‍රා රැසක් ඌ පිටුපස පන්නා යන තත්ත්වයක්ද දැක ගත හැකි බවද ඇය ප්‍රකාශ කළාය."

මේ තත්ත්වය ඇති වෙන්නේ මොකක් නිසාද? ආර්ථික උපාය මාර්ගයේ ප්‍රමුඛකොට සංචාරක ව්‍යාපාරය සලකන නිසා. ඒ ධීවර ක්ෂේත්‍රය හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රය හෝ නොවෙයි. ඒ නිසා මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? සාගර ජීව විද්‍යාඥවරියක වන ආශා ඩි වොස් මහත්මියට ඇත්තටම අප ස්තුතිවන්ත වන්න ඕනෑ. එතුමිය මෙය කියලා තිබෙන්නේ සංචාරක මණ්ඩලයේ පැවැති සම්මන්ත්‍රණයකදීමයි. ස්තුතිවන්ත වෙනවා එතුමිය ඒ කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. එහෙම නම් හරි පැහැදිලියි. මෙයිනුත් පෙන්නුම් කරන්නේ මොකක්ද? ධීවර ක්ෂේත්‍රයට අපේ රටේ ආර්ථිකයේ ලබා දිය යුතු ස්ථානය ලබා දෙනවා වෙනුවට වෙන මොකක්දෝ ආර්ථික උගුලක පැටලිලායි මේ තිබෙන්නේ. මේ වෙන මොකවත් නොවෙයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තියේ ඉතිරි ඉනිම නේ. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මේ තරගය පටන් ගත්තා. එතුමා පළමුවැනි ඉනිම සෙල්ලම් කර ගෙන ආවා. එතුමාට අවසන් කර ගන්න බැරි වුණා. හැබැයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා පළමුවැනි ඉනිම අවසන් කළා. අසාර්ථක අවසන් කිරීමක්.

එය අසාර්ථක බව දැන ගෙනම දැන් ඒ හා සමාන ලෙස තමයි දෙවැනි ඉනිමත් සෙල්ලම් කරන්න මේ යන්නේ. ඔබතුමන්ලා මොන තරම් දේවල් කිව්වත් ඒ දෙවැනි ඉනිමේ ප්‍රධාන උපාය මාර්ගය කෘෂිකර්මාන්තය නොවෙයි. ඒ ප්‍රධාන උපාය මාර්ගය ධීවර කර්මාන්තය නොවෙයි. එය අපේ රටේ ජාතික නිෂ්පාදනය ඉදිරියට ගෙන එමින් ජාතික නිෂ්පාදනය වර්ධනය කරමින් අපේ රටේ ශක්තිමත් ස්වජාතික ආර්ථිකයක් නිර්මාණය කිරීම දක්වා යන ශක්තිමත් ගමනක් නොවෙයි. එය විදේශීය ආයෝජන සහ

සංචාරක ව්‍යාපාරය මත පැවැත්වෙන ආර්ථිකයක් බවට පත් වී තිබෙනවා. එහි ප්‍රතිවිපාක තමයි අද කෘෂිකර්ම ක්ෂේත්‍රයටත් භුක්ති විඳින්න සිද්ධ වෙලා තිබෙන්නේ; ධීවර ක්ෂේත්‍රයටත් භුක්ති විඳින්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා දැන් අප මොකක්ද කරන්න ඕනෑ? ධීවර ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න ඕනෑ. මෙය අපේ රටේ ආර්ථිකයේ ප්‍රධාන එකක් බවට පත් කර ගත යුතුයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කාලාන්තරයක් තිස්සේ අමාත්‍යවරු එනවා. සමහර අය කියනවා, "මම ධීවර පවුලකින් පැවත ගෙන එන්නේ." කියලා. එහෙම නැත්නම් කියනවා, "මම ධීවර ගම්මාන අසබඩ ජීවත් වන්නේ. ඔවුන්ගේ ගුණ සුවඳ තිබෙනවා." කියලා. එහි නොවෙයි වැදගත්කම තිබෙන්නේ. ධීවර ක්ෂේත්‍රයට ආර්ථිකයේ අත් විය යුතු ස්ථානය හිමි කර ගෙන තිබෙනවාද, ඒ මොන තරම් ප්‍රමාණයකටද යන්න පළමුවැනි වැදගත් කාරණයයි. දෙක, මෙය කවර කර්මාන්තයක් ලෙස තේරුම් අර ගෙන තිබෙනවාද යන්නයි. මෙය තවදුරටත් මසුන් අල්ලා ඒ මසුන් විකිණීමේ කර්මාන්තයක් පමණක් නොවෙයි. අපේ රටේ ස්වාධීන ආර්ථිකයක් ගොඩ නැංවීමේදී අපට සංවර්ධනය කර ගත හැකි ඉතා වැදගත් ක්ෂේත්‍රයක් මේක. එහෙම නම් ඒ ක්ෂේත්‍රයට යොදන මෙවලම් අප තේරුම් ගන්නේ කොහොමද? අප මාළු අල්ලන්න යන ධීවරයාව තේරුම් ගන්නේ කොහොමද? ඔහුව තේරුම් ගන්න ඕනෑ, "ඔහු මාළු අල්ලන්නයි යන්නේ. ඔහු ඒ අල්ලන මාළු විකුණා තමන්ගේ ජීවිකාව පවත්වා ගන්නා පුද්ගලයෙක්." කියන අර්ථයෙන් පමණක්ද? සමහර විට ඔහු ඔහුගේ පෞද්ගලික ජීවිකාව පවත්වා ගැනීම සඳහා තමයි මුහුදට යන්නේ මාළු ටික අල්ලන්න. හැබැයි ඔහු අල්ලන මාළු ටික මොකක්ද? අපේ රටේ ජාතික ආර්ථිකයේ ප්‍රධාන පංගුවක්. ඒ නිසා අප ඒ ධීවරයාව තේරුම්ගත යුත්තේ කොහොමද? ඔහු හුදු පෞද්ගලික ජීවන උපාය වෙනුවෙන් ධීවර කර්මාන්තයේ නිරතවන්නකු නොවෙයි.

අපේ රටේ ජාතික ආර්ථිකයේ විශාල පංගුවක් උර මත තබා ගත් පුද්ගලයකු ලෙසයි අප ධීවරයාව තේරුම් ගත යුත්තේ. එහෙම තේරුම් ගත්තොත් විතරයි අපට ඔහු මුහුණ දී තිබෙන ගැටලු තේරුම් ගන්න පුළුවන්කම තිබෙන්නේ. ඔහු මුහුදේ අතර මං වීම, ඔහුගේ බෝට්ටු විනාශයට පත් වීම, විශේෂයෙන්ම ඔහු ඉන්දියාවේ ධීවරයන්ගේ සහ රාජ්‍යයේ අඩන්තේට්ටම්වලට ලක්වීම ආදිය අප තේරුම් ගන්න ඕනෑ කොහොමද? "ඔහු ඔහුගේ ජීවිකාව රැක ගැනීම සඳහා කරන පෞද්ගලික රැකියාවක්." කියන අර්ථයෙන්ද අප ඒක තේරුම් ගන්න ඕනෑ. නැහැ. එයින් ඔහුට, ඔහුගේ පවුලට ජීවත් වීම සඳහා යම් ආදායමක් ලැබෙනවා තමයි. හැබැයි අප ඒක තේරුම් ගත යුත්තේ ඔවුන්ගේ පෞද්ගලික ජීවිත නඩත්තු කර ගැනීම සඳහා නිරත වන රැකියාවක් ලෙස පමණක්ම නොවෙයි. ඒ අපේ රටේ ජාතික ආර්ථිකයේ විශාල පංගුවක් නියෝජනය කරන පිරිසක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් ගත්තොත් අපේ කථා බහේ තිබෙනවා, මඩ සෝදා ගත්තාම ගොවියා රජකමටත් සුදුසුයි කියලා. ගොවියාට ඒ ඇන්දිල්ල හරි කරලා තිබෙනවා නේ. ඔහු ජාතික ආර්ථිකයේ කොටස්කරුවකු නිසා තමයි ගොවියාට ඒ අර්ථ කථනය දීලා තිබෙන්නේ. ඒ ඇන්දිල්ල හරි කරලා තිබෙන්නේ. හැබැයි ධීවරයාට දීලා තිබෙනවාද එවැනි තැනක්? නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් ගත්තොත් මිරිදිය කර්මාන්තයේ යෙදෙන ධීවර වෘත්තිය නිකම් වෙන ශ්‍රේණියක තලයක් ලෙස තමයි ගම්වල සලකන්න පුරුදු වෙලා තිබෙන්නේ. මම දන්නවා, ඔහු ගැන කෙරෙන අර්ථ කථනයේ පවා තිබෙන්නේ "මාළු අල්ලන්නා" "මාළුකාරයා" යනුවෙනුයි කියලා. ඒ තුළම ඔහුට ඔහු යෙදෙන වෘත්තියේ ගරුත්වය ආරක්ෂා කරලා දෙන්න අපි සමත් වෙලා නැහැ සමාජයක් ලෙසත්, රජයක් ලෙසත්. ඒ නිසා පළමුකොටම ඔහුගේ වෘත්තියේ ගරුත්වය අපි ආරක්ෂා කළ යුතුයි. ඒ වෘත්තියේ ගරුත්වය ආරක්ෂා නොකරන ප්‍රමාණයට මේ ක්ෂේත්‍රයේ ධීවරයා රැඳෙන ප්‍රමාණය අඩු වන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් පුවත් පතක මංගල දැන්වීමක් බැලුවොත් ඒ පුද්ගලයා හඳුන්වනවා තමා වතු හිමි වැවිලිකරුවෙක්, එහෙම නැත්නම් විධායක ශ්‍රේණියේ රැකියාවක නිරත කෙනෙක්, එහෙම නැත්නම් උගත් උපාධිධාරියෙක් කියලා. හැබැයි ඔහු හඳුන්වන්නේ නැහැ තමන් ධීවරයකුය කියා. ඒකට හේතුව, ඔහුට සමාජයේ අත් වී තිබෙන ඉරණම ඔහු දන්නා නිසායි. ඒ නිසා ඒ දෙමාපියන් පෙළඹෙන්නේ තමන්ගේ දරුවන් තවදුරටත් මේ ක්ෂේත්‍රයේ රඳවනවා වෙනුවට ඒ ක්ෂේත්‍රයෙන් ගලවා ගැනීමටයි. ඔවුන්ටත් ඕනෑකම තිබෙන්නේ අර මංගල දැන්වීමේ තිබෙන නිර්ණායකයන්ට සරිලන දරුවෙක් බිහි කර ගැනීමටයි. ධීවර ක්ෂේත්‍රය තවමත් අපේ රටේ විධිමත් කර්මාන්තයක් බවට පත් වෙලා නැහැ. ඒ කර්මාන්තය ඇතුළේ විශාල සේවයක් කරන ගෞරවාන්විත වෘත්තියක් බවට එය පත් කළ යුතුයි. ඒ සඳහා රජයට විශාල කාර්ය භාරයක් තිබෙනවා. අත් හරින්න බැරි කාර්ය භාරයක් තිබෙනවා.

එම ධීවරයාගේ ජීවිතය, ආර්ථිකය සුරක්ෂිත විය යුතුයි. දැන් මොකක්ද මේ සිද්ධ වෙච්ච දේ? දැන් යම් මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයකු අතට පමණක් ධීවර ක්ෂේත්‍රය කොටු වෙමින් යනවා. මේකෙදී අපි තේරුම් ගන්න ඕනෑ ප්‍රශ්නයක් තිබෙනවා. මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් අතට පමණක් ධීවර ක්ෂේත්‍රය කොටු වෙමින් යමින් කුඩා පරිමාණ ධීවරයා ක්‍රමානුකූලව ක්ෂේත්‍රයෙන් ඉවත් වෙමින් තිබෙනවා. දැන් අපට කියන්න පුළුවන් ධීවරයන් මෙච්චර ප්‍රමාණයක් මුහුදු යනවා කියලා. හැබැයි මුහුදු ගියාට ඔහුන්ගෙන් බහුතරයක් කුලීකරුවන්. මොකක් හරි බෝට්ටුවක වැඩ කරන කුලීකරුවන් බවට ඔවුන් පත් වී තිබෙනවා. ඒ නිසා අවශ්‍යකම තිබෙන්නේ මොකක්ද? මධ්‍ය පරිමාණ ආයෝජකයන් සහිත ධීවර ප්‍රජාවක් ඉන්නත් ඕනෑ තමයි. හැබැයි සුළු ධීවර කර්මාන්තය යටපත් කරන ධීවර ප්‍රජාවක් බවට එය පත් විය යුතු නැහැ. දැන් සිදු වී තිබෙන දේ මධ්‍ය පරිමාණ ධීවර ප්‍රජාව විසින් සැලකිය යුතු ප්‍රමාණයකින් කුඩා පරිමාණ ධීවරයා යටපත් කරලා ඔහු ඒ අයගේ කම්කරු වෘත්තියක් බවට පත් කර තිබෙන එකයි. එය අපි වෙනස් කළ යුතුව තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ ආර්ථිකය සුරක්ෂිත විය යුතුයි. ඔහුගේ ආර්ථිකය දැන් සුරක්ෂිත වන්නේ කොහොමද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? දැනට ඔහු මුහුදු ගිහිල්ලා මාළු ඇල්ලුවොත් ඔහුගේ ආර්ථිකය හොඳයි. ඔහු මුහුදු ගිහිල්ලා මාළු ඇල්ලුවේ නැත්නම් ඔහුගේ ආර්ථිකය දුර්වලයි. එහෙනම් දැන් ඔහුගේ ආර්ථිකයේ ශක්තිමත් භාවය රඳා පවතින්නේ කුමක් මතද? මුහුදේදී ඔහුට ඇල්ලෙන මාළු ප්‍රමාණය මතයි. එය සාධාරණ නැහැ. ඔහුගේ වෘත්තීයේ, ආර්ථිකයේ සුරක්ෂිතභාවය ආරක්ෂා කළ යුතු වන්නේ ඔහුගේ දැලට මුහුදේදී බැඳෙන මාළු ප්‍රමාණය මත නොවේ. එයට අපි මොකක්ද දීලා තිබෙන සුරක්ෂිතභාවය? මුහුදු යන්නට බැරි කාලයකට ඔහුගේ ජීවිතයේ සුරක්ෂිත භාවය අපි කොහොමද හදලා තිබෙන්නේ? ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර කර්මාන්තයේ යෙදෙන්නාගේ ආර්ථිකය නිරන්තරයෙන් චලනය වන ආර්ථිකයක්; උච්චාවචනය වන ආර්ථිකයක්.

උදාහරණයක් විධියට කිව්වොත්, කුඩාවැල්ල ප්‍රදේශයට ගිය වෙලාවක එක ධීවර කණ්ඩායමක් කිව්වා, "අපි මාසයක් විතර ගිහිල්ලා ආවට පස්සේ සති දෙකක් විතර යනකම් ජොලියේ ඉන්නවා. ඊට පස්සේ ආයෙත් සාමාන්‍ය ජීවිතයට එනවා" කියා. දැන් රාජ්‍ය සේවකයකුගේ වැටුප ගත්තොත් යම් ස්ථාවර භාවයක් පෙන්නුම් කරලා තිබෙනවා. සුළු පරිමාණ ව්‍යාපාරිකයෙක් ගත්තොත් ආදායමේ යම් ස්ථාවර භාවයක් හදලා තිබෙනවා. ඒකට ගැළපෙන පරිදි, තමන්ගේ ජීවිතය ඔවුන් පවත්වා ගන්නවා. තමන්ගේ දරුවා දැමිය යුතු ඉස්කෝලය, තමන්ගේ දරුවාට ලබා දිය යුතු අධ්‍යාපනය, තමන්ගේ ගෙදර තබා ගත යුතු වාහනය, තමන් සකස් කළ යුතු නිවසේ ප්‍රමාණය ආදී වශයෙන් ඒ අයට වෘත්තීය ස්ථාවර භාවයක් හදලා දීලා තිබෙනවා. හැබැයි ධීවරයාගේ වෘත්තියේ එවැනි ස්ථාවර භාවයක් නැහැ. ඒ නිසා සිද්ධ වෙලා තිබෙන දේ තමයි නිරන්තර උච්චාවචනයක් තිබෙන ජීවිතයක් ඔහුට තිබීම. ඒ නිසා අපි කල්පනා කරලා බලන්න ඕනෑ

[ගරු අනුර දිසානායක මහතා]

කාරණයක් තිබෙනවා. ඔහුගේ ආර්ථිකය හොඳද, නරකද කියලා තීරණය කරන්නේ මුහුදේ අල්ලන මාළු ප්‍රමාණයෙන් නොවෙයි. එය අතිරේක ආදායමක් ලෙස තිබෙන අතර ඔහුගේ ආර්ථිකය සුරක්ෂිත කිරීම සඳහා වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයි. ඒ සඳහා යෝජනා කරන්නේ වෙන මොනවත් නොවෙයි. ධීවර බැංකුවක් පටන් ගන්න ඕනෑය කියන එකයි.

ලෝකයේ ධීවර කර්මාන්තය ප්‍රමුඛ කොට ගත් ස්ථානවල ධීවර බැංකු තිබෙනවා. ඒ ධීවර බැංකුවලින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහුට ආදායම් ලැබෙන වෙලාව, නොලැබෙන වෙලාව පිළිබඳව අවධානය යොමු කර ඔවුන්ගේ ආර්ථිකයේ ස්ථායිකරණය පවත්වා ගෙන යාම සඳහා බැංකුවේ දායකත්වයක් සපයනවා. සමහර විට ඔහුගේ ආදායම ලැබෙන වෙලාවට තැන්පතුවක් තබා ගන්නවා. ඒ වාගේම ආදායම් නැති වෙලාවට ක්‍රමානුකූලව එය ලබා දෙන වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ නිසා යම් මධ්‍ය රේඛාවක නිරන්තරයෙන් ඔවුන්ගේ ආදායම් මාර්ගය පවතිනවා. හැබැයි අපේ තිබෙන්නේ මොකක්ද? මාළු ඇල්ලීම, නොඇල්ලීම මත තමයි එය තීරණය වන්නේ. සමහර අය කියනවානේ "පවු කරලා තිබෙන ප්‍රමාණය අනුව" කියලා. ඒ අනුව තමයි ඔහුගේ ජීවිතයේ සුරක්ෂිත භාවය රඳා පවතින්නේ. එය කිසි සේත්ම සාධාරණ තත්ත්වයක් නොවෙයි. ඒ නිසා ඔහුගේ ජීවිතය යම් මධ්‍ය රේඛාවක ස්ථායි කර ගැනීම සඳහා මූල්‍යමය වැඩ පිළිවෙළකට තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යොමු විය යුතුව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි ඔවුන්ගේ සංස්කෘතික ජීවිතය. ඕනෑම මනුෂ්‍යයකුගේ අවශ්‍යතා ආහාරවලින් පමණක් සැපයෙන්නේ නැහැ.

විශේෂයෙන්ම මිනිසාගේ අවශ්‍යතා සංකීර්ණයි. ඒක තමයි මිනිසාගේ තිබෙන විශේෂත්වය. නිරන්තරයෙන් තමන්ට තිබෙන අවශ්‍යතාවන් බොහොමයක් පොදි බැඳ ගෙන, ඒ අවශ්‍යතාවන් කුඩා ප්‍රමාණයක් භුක්ති විඳිමින්, විශාල ප්‍රමාණයක් අහිමි කර ගනිමින් ළතැවුල් වන ජීවිතයක් තමයි මිනිසුන්ට උරුම වෙලා තිබෙන්නේ. අප කළ යුතු වන්නේ කුමක්ද? මේ ධීවර ප්‍රජාවට තමන්ගේ සංස්කෘතික ගමන් මඟෙහි ඉදිරියට යන්න මොකක්ද තිබෙන්නේ? අඩුම තරමින් ඉස්සර තිබුණු චිත්‍රපටශාලාවවත් නැහැ. ඒ නිසා ඔවුන්ට තිබෙන්නේ මුහුදු ගිහිල්ලා මුහුදේදී හෝ හවස මත්පැන් උගුරක් පාවිච්චි කරන එකයි. ඒක තමයි ඔවුන්ගේ එකම විනෝදාංශය බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔවුන්ගේ ජීවිත මුහුදත් එක්ක පොර බදන, බෝතලයත් එක්ක නිදා ගන්නා ජීවිත බවට පත් වෙලා තිබෙනවා. එය කිසිසේත්ම සාධාරණීකරණය කළ යුතු ජීවිතයක් නොවෙයි.

මිනිසුන් හැටියට ඒ ප්‍රජාවගේ අවශ්‍යතාවන් සංකීර්ණ වන කොට ඒ සංකීර්ණ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි ඒ ජීවිතවල අවශ්‍යතාවන් සපුරාලිය යුතුව තිබෙනවා. මම හිතන්නේ ධීවර අමාත්‍යාංශයට ඒ පිළිබඳ විශාල කාර්ය භාරයක් පැවරෙනවා. ඒ සඳහා ඔවුන්ගේ නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතුව තිබෙනවා. ඒ වාගේම තමයි ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයත්. මා සතුව ඒ සම්බන්ධ සංඛ්‍යා ලේඛන නැහැ. නමුත් ගරු ඇමතිතුමනි, බැලූ බැල්මට අපට හිතන්න පුළුවන් ධීවර ජනතාවගේ දරුවන් ඉන්නේ අධ්‍යාපන මට්ටම අතින් බලන කොට යම් පහළ ශ්‍රේණියකය කියා. මා දන්නේ නැහැ, ධීවර අමාත්‍යාංශයෙන් එවැනි සංගණනයක් කර තිබෙනවාද කියා. මා ඒ ගැන සොයා බැලුවත් එවැනි සංගණනයක් ගැන සංඛ්‍යා ලේඛනයක් සොයා ගන්න පුළුවන් වුණේ නැහැ. නමුත් බැලූ බැල්මටම ඒ ප්‍රජාවත් එක්ක ඇසුරු කරන කොට, ඒ ගම්මානවල ජීවත් වන කොට අපට ඉතා හොඳින් තේරෙනවා සාමාන්‍යයෙන් අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටමට වඩා පහළ මට්ටමක් තමයි ඔවුන්ගේ දරුවන්ට හිමි වෙලා තිබෙන්නේ කියා. ඒක සාධාරණද?

රටේ ජාතික නිෂ්පාදනයට විශාල කාර්ය භාරයක් ඉටු කරන ඒ ජනතාවගේ දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය, අධ්‍යාපන තත්ත්වය, නිරෝගීකම ඔවුන්ගේ ජීවිතවලට ලැබී තිබෙන්නේ අඩු ප්‍රමාණයෙනුයි. ඔවුන් අපේ ජාතික ආර්ථිකයේ පංගුකරුවන් හැටියට, කොටස්කරුවන් හැටියට කල්පනා කරනවා නම් ඔවුන්ගේ සංස්කෘතික ජීවිතයත්, ඔවුන්ගේ සමාජ ජීවිතයත් නැංවීම සඳහා වැඩ පිළිවෙළක් අවශ්‍යයි. හිටපු ගමන් එන දියවර ගම්මාන ආදිය දේශපාලන ව්‍යාපෘතියි. ඒ නිසා ඒවායින් වැඩක් නැහැ. එතැනින් එහා යන ඒ ජනතාවගේ සංස්කෘතික ජීවිතය සහ සමාජ ජීවිතය නැංවිය යුතුමයි. එහෙම කරන්නේ නැතිව මෙය කර්මාන්තයක් බවට පත් කරන්න බැහැ; මෙය අයාලේ යන එක වළක්වන්න බැහැ; මේ ඇතුළේ සිදු වන විවිධ ගැටුම්කාරී තත්ත්වයන් පාලනය කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා වැඩ පිළිවෙළක් අවශ්‍යයි.

ඇත්තෙන්ම අල්ලා ගන්නා මාළු ප්‍රමාණය නොවෙයි ධීවර අමාත්‍යාංශය විසින් මනින්න ඕනෑ. ධීවර ජනතාවගේ ජන ජීවිතය මොන තරම් ප්‍රමාණයකට ඔසවා තබන්න සමත් වෙනවාද නැද්ද කියන සාධකය මෙහිදී අතිශයින්ම වැදගත් වෙනවා. මේ කාර්යයන්හි විශේෂ වැදගත්කමක් තිබෙනවා. මෙහිදී ඔවුන්ගේ වෘත්තිය කර ගැනීම සඳහා, ඔවුන්ගේ වෘත්තිය ඉදිරියට ගෙන යාම සඳහා ඔවුන්ට දෙන පහසුකම් ප්‍රමාණය වැදගත් වෙනවා.

ගරු ඇමතිතුමා ධීවර ජනතාව සඳහා බෝට්ටු රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනවා. සමහර බෝට්ටු රක්ෂණය කිරීම සඳහා වර්ෂයකට රුපියල් ලක්ෂ තුන හමාරකට වැඩි මුදලක් යනවා. [බාධා කිරීමක්] ඒ ජීවිත රක්ෂණයටයි. බෝට්ටුවක් රක්ෂණය කරන්නත් රුපියල් ලක්ෂ තුන හමාරකට වැඩියෙන් යනවා. ඒක අධික මුදලක්. ඒ නිසා අපි මොකක්ද කළ යුතු වන්නේ? ඒ මුදල ධීවරයන්ටම දරා ගන්න දෙනවාද? එහෙම නැත්නම් රක්ෂණයෙන් පංගුවක් අමාත්‍යාංශයට දරන්න පුළුවන්ද කියන එක ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරාවිය කියා මා හිතනවා. මොකද, ඒක අත්‍යවශ්‍ය කරුණක් බවට පත් වී තිබෙනවා.

ඒ වාගේම ඔවුන්ගේ තවත් විශාල දුක් ගැනවිල්ලක් තිබෙනවා. බෝට්ටු රක්ෂණය කරන්න පුළුවන් වුණාට රක්ෂණ සමාගම් බොහොමයක් දැල් ආම්පන්න රක්ෂණය කරන්න පෙළඹෙන්නේ නැහැ. බෝට්ටුවලට වඩා වටිනා සමහර දැල් ආම්පන්න තිබෙනවා. ඒ නිසා ඒවා රක්ෂණය කරන්න ක්‍රමයක් නැහැ. ඉන්දියාව අවට මුහුදේදී ඒ දැල් ආම්පන්න විශාල ප්‍රමාණයක් කපා ගෙන ගිහින් තිබෙනවා. කාලයක් මන්නාරම පැත්තේදී නාවික හමුදාවෙන් ඒවා කපා තිබුණා. ඒ නිසා ඒ ධීවරයන්ට විශාල පාඩුවකට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා. විශේෂයෙන්ම ඒ ධීවර බෝට්ටු, දැල් ආම්පන්න, ඔවුන්ගේ ජීවිත රක්ෂණය කිරීම කෙරෙහි මීට වඩා විධිමත් වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුව තිබෙනවා. ඒ වාගේම ඔවුන්ට මත්ස්‍ය සම්පත නෙළා ගන්න බැරි අවස්ථාවලදී ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත කළ යුතුව තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි. දැන් ඔබතුමාගේ කතාව අවසන් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
විනාඩි 50 කාලයක් නියමිතව තිබුණා. [බාධා කිරීමක්] නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ටීඑන්ඒ සංවිධානයේ වෙලාවත් දෙන බව කියනවා.

ඊට අමතරව මේ සම්බන්ධ තවත් කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරවන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා ඇති, දික්ඕවිට ධීවර වරාය ගැන. දික්ඕවිට ධීවර වරාය සකස් කිරීමේදී ඒ ස්ථානයේ තිබුණු නිවාස කිහිපයක් ඉවත් කරන්න සිද්ධ වුණා. ඔබතුමා කැබිනට් පත්‍රිකාවක් දමා ඒ නිවාස ඉවත් කරලා, ඔවුන්ට අලුතින් නිවාස ලබා දෙන තෙක් මාස හයක කාලයකට ගෙවල් කුලිය ගෙවන්න කැබිනට් පත්‍රිකාවක් සම්මත කරලා දුන්නා. මාස හයේ කාලය ඇතුළත ඒ නිවාස සකස් කරලා අවසන් කරන්න බැරි වුණු නිසා ඔබතුමා නැවත කැබිනට් පත්‍රිකාවක් දමලා තව මාස හයකට ඒ නිවාස කුලිය දීර්ඝ කරලා දුන්නා. ඒක හොඳ ව්‍යායාමයක්. දැන් ඒ හදපු නිවාසවල තිබෙන තත්ත්වය මොකක්ද?

මා ළඟ තිබෙනවා දික්ඕවිට නිවාස ව්‍යාපෘතියේ පොකුරු නිවාසවල ඇති වූ පලුදු වීම්, පිළිසකර කිරීම් පිළිබඳ වර්තමාන තත්ත්වය සොයා බැලීම සඳහා පත් කළ විශේෂ කමිටුමේ වාර්තාව. මේ වාර්තාවේ තිබෙන කරුණු බැලුවාම ඒ නිවාස අවශ්‍ය ප්‍රමිතියෙන් යුතු නොවන බව තමයි පෙනෙන්නේ. ඒ වාගේම ඒ නිවාස විශාල ගිලී යාමකට ලක් වී තිබෙනවා. විශේෂයෙන්ම මොරටුව විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයකු විසින් ඒවා පිළිබඳව කරන ලද සමීක්ෂණ වාර්තාව තිබෙනවා. ඒ සමීක්ෂණ වාර්තාවේ පෙන්වා දී තිබෙනවා ඒ නිවාස විශාල ප්‍රමාණයක් කඩා වැටෙමින් තිබෙනවා, ගිලා බැසීමකට ලක් වී තිබෙනවාය කියලා. ඒ නිසා එම කොන්ත්‍රාත් පිළිබඳවත්, එම ධීවරයන්ට එම නිවාස යථා පරිදි සකස් කර දීම කෙරෙහිත් තමුන්නාන්සේගේ අවධානය යොමු කරයි කියලා මා බලාපොරොත්තු වනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මේ කාරණය කෙරෙහිත් විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. අප දන්නවා යුද්ධය අවසාන වූවාට පසුව අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව අතර සුහදතාව වර්ධනය කිරීම අතිශය වැදගත් දෙයක් බව. ඒ සුහදතාව වර්ධනය වන්නේ අපි යාළුයි, අපි යාළුයි කියන එකෙන්වත්, සිංහල දෙමළ මුස්ලිම් සියලු දෙනාගේ නායකයා මමය කියන එකෙන්වත්, දෙමළෙන් කථා කරන එකෙන්වත් නොවෙයි. ඒවායින් සහෝදරත්වය වර්ධනය කරන්න බැහැ. ප්‍රායෝගිකව අප ඔවුන්ට පෙන්නුම් කරන්න ඕනෑකම තිබෙනවා ඔවුන්ටත් මේ රට තුළ සමාන අවස්ථා ලැබෙනවාය කියලා. ඒ වාගේම ඔවුන්ගේ ආර්ථික වර්ධනයට අප මොන තරම් දායකත්වයක් සපයනවාද, ඒ සඳහා අප මොන තරම් යටිතල පහසුකම්, දිරිගැන්වීම් දෙනවාද කියන එකත් අතිශය වැදගත්. එම නිසා වේදිකාවේ කරන ප්‍රකාශවලින් පමණක් ජාතික සමගිය ගොඩ නඟන්න පුළුවන්කමක් නැහැ. ප්‍රායෝගික භාවිතාවන් විධි, ජාතික සමගිය ගොඩ නැඟීම සඳහා වූ ක්‍රියාදාමවලට අවතීර්ණ වෙන්න ඕනෑකම තිබෙනවා. නමුත් අවාසනාවකට මොකක්ද වෙලා තිබෙන්නේ? දකුණු මුහුදේ යන ධීවරයාට නැති තහංචි විශාල ප්‍රමාණයක් උතුරේ ධීවරයාට අත් පත් වී තිබෙනවා.

මා දැක්කා මැතිවරණ කාලය හේතු කොට ගෙන මෙතෙක් උතුරේ යම් ස්ථානවල ධීවරයන්ට තිබුණු බාධා ඉවත් කර තිබෙන ආකාරය. මේක ඡන්දය ඉලක්ක කර ගෙන ඉවත් කරපු එක අපට පැහැදිලියි. නමුත් ඒක හොඳයි. ඡන්දය ඉලක්ක කර ගෙන හරි ඒ සීමා ඉවත් කරපු එක හොඳයි. හැබැයි මම කියන්නේ ඡන්දයෙන් පස්සේ නැවත ඒවා පනවන්න එපා කියලායි. ඔන්න ඔය ඉල්ලීම ඉටු කරන්න කියලා මම ඔබතුමාට කියන්නේ. මොකද සාමාන්‍යයෙන් ඕක වෙනවා. ඡන්ද කාලෙට ඔවැනි මොනවා හරි කරනවා. ඡන්දය ඉවර වුණාට පස්සේ ඒක අත් හරිනවා. නැවත සුපුරුදු විධියට යනවා. හැබැයි මේ තහංචි තවමත් ඉවත් නොවුණු ප්‍රදේශයක් තිබෙනවා. ඒ තමයි තලෙයිමන්නාරම පේසාලෙයි ප්‍රදේශය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තලෙයිමන්නාරම පේසාලෙයි ප්‍රදේශයේ ධීවරයන් මුහුදු යන්න අවසර පත්‍රයක් ගන්න ඕනෑ. ඒ අවසර පත්‍රය වාර්ෂිකව දීර්ඝ කර ගන්න ඕනෑ. මුහුදු යන කොට සාමාන්‍යයෙන් බෝට්ටුවේ සහායකයෙකුත් එක්කයි යන්නේ. ඒ සහායකයාටත් අවසර පත්‍රයක් ගන්න ඕනෑ. එතකොට බැරි වෙලාවත් මේ දෙන්නාගෙන් එක් කෙනෙකුට අසනීප වුණොත් අමතර අවසර පත්‍රයක් ලබා ගන්න තව සතියකට වඩා වැඩි කාලයක් ගත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා සිදු වී තිබෙන දෙය මොකක්ද? දෙන්නාම නිරෝගීව සිටියොත් මුහුදු යනවා, එක් කෙනෙකුට හරි අසනීප වුණොත් මුහුදු යන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම තමයි යන සහ එන බෝට්ටු සියල්ල පරීක්ෂාවට භාජනය කරනවා. මා දන්නේ නැහැ ඇයි එහෙම කරන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාවික හමුදාව පසු ගිය යුද්ධයේදී විශාල කාර්ය භාරයක් කරපු එක ඇත්ත. ඒ පිළිබඳ ඇගයීමක් ඔවුන් කෙරෙහි අපට තිබෙනවා. නමුත් මේ කරන වැඩේ අප පිළි ගත යුතු නොවෙයි. මොකද විශේෂයෙන්ම ඔවුන් විසින් අටවා තිබෙන අට්ටාලයක් ළඟට ඒ බෝට්ටුව ගෙන යන්න ඕනෑ. සමහර බෝට්ටු තිබෙනවා එතැනට ගෙනියන්න බැරි ඒවා. එහෙ මෙහෙ තැන්වල වදිනවා. ඊට පස්සේ ආයේ ඒක වැල්ලට වදිනවා. මත්ස්‍ය සම්පත නෙළා ගැනීමේදී තලෙයිමන්නාරම ප්‍රදේශයේ ජීවත් වන ධීවරයන් මේ විධියේ විශාල දුෂ්කරතාවන්ට මුහුණ දීලා තිබෙනවා.

ඒකේ අනික් විහිළුජනක තත්ත්වය මේකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තලෙයිමන්නාරමේ ධීවරයන්ට ඒ තහංචි තිබෙන කොට, ඉන්දියාවේ ධීවරයන්ට ඒ තහංචි නැහැ. මමත් පේසාලෙයි ඉන්න වෙලාවක ගරු රාජිත සේනාරත්න ඇමතිතුමනි, මම ඔබතුමාටත් කිව්වා. තලෙයිමන්නාරමේ ධීවරයෝ බදාදා සහ සෙනසුරාදා දිනවල මුහුදු යන්නේ නැහැ. ඇයි ඒ? බදාදා සහ සෙනසුරාදා දිනවල ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රා විශාල ප්‍රමාණයක් එනවා. බැලූ බැල්මටම පේනවා ඒවා මුහුදට එන ආකාරය. අපේ නාවික හමුදාව ඉන්නවා. ඒ ඉන්දියන් ධීවරයන්ට එන්න අවසර ඕනෙත් නැහැ: අවසර පත්‍ර බලන්නෙත් නැහැ; තහංචිත් නැහැ; බෝට්ටුවේ ගෙනියන්නේ මොනවාද කියලා බලන්නෙත් නැහැ. හැබැයි තලෙයිමන්නාරමේ ඉන්න අපේ ධීවරයා නිරන්තර පරීක්ෂාවකට ලක් කරනවා. එය කිසිසේත්ම සාධාරණ නැහැ. ඒ නිසා දැන් රට පුරාම මේක නිදහස් කරන්න. තවදුරටත් විවිධ අණපනත් පනවමින්, බලපත්‍ර, අවසර පත්‍ර ලබා දීම්, පරීක්ෂා කිරීම් කිසිදු තේරුමක් නැති දේවල් බවට පත් වී තිබෙනවා. මේ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර විට ධීවර අමාත්‍යාංශය මැදිහත් වෙලා මෙය නතර කරන්න කිව්වත්, සමහර හමුදා නිලධාරින් තමන්ගේ හිතුවක්කාරී බලය පාවිච්චි කරලා මේ වැඩය කරමින් ඉන්නවා. විශේෂයෙන්ම කල්පිටියේත් මේ ප්‍රශ්නය මතු වුණා. මම ගියා කල්පිටියේ නොරොච්චෝලේ ප්‍රදේශයට. ඒ ප්‍රදේශයේ ධීවරයන්ගේත් චෝදනාවක් තිබෙනවා මේ කලාපයේ මුහුදු සීමාව ඉක්මවා මේ ගොල්ලෝ එමින් තිබෙනවා කියලා. ඒ නිසා ඒ කෙරෙහි තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න ඕනෑ. මෙය ජාත්‍යන්තරයත් එක්ක ගැට ගැහිච්ච ප්‍රශ්නයක්. ඔබතුමා කිව්වා GSP සහනය අහිමි වෙච්ච නිසා අපේ අපනයන ප්‍රමාණය ඉහළ ගිහිල්ලා කියලා. මා දන්නේ නැහැ, මා ළඟ තිබෙන තොරතුරු අනුව නම් අඩු වෙලා. නමුත් මේ මත්ස්‍යයින් වැඩි දියුණු කරලා - process කරලා - යවන කර්මාන්තශාලා 32ක් අපට තිබුණා. මේ 32න් දැන් තුනක් වැහිලා තිබෙනවා. එකක් තමයි Yuh Fa Lanka Fisheries (Pvt.) Limited කියන එක. ඒක වැහිලා තිබෙනවා. Global Seafoods (Pvt.) Limited කියලා කර්මාන්තශාලා දෙකක් තිබුණා. ඒ දෙකෙන් එකක් වැහිලා තිබෙනවා. SLIC Lanka කියන එක වැහිලා තිබෙනවා. ඒ නිසා කර්මාන්තශාලා තුනක් වැහිලා තිබෙනවා. මේවා විශාල ලෙස මත්ස්‍ය අපනයනය කරපු කර්මාන්තශාලායි. ඒ කර්මාන්තශාලා තුන වැහිලා තිබෙනවා. ඇමතිතුමාට මා ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්නම්.

[ගරු අනුර දිසානායක මහතා]

ඇමතිතුමා දන්නවා, අපේ EU Agreement එකක් තිබෙන බව. EU Agreement එක අනුව අප එකඟ වෙලා තිබෙන කාරණයක් තිබෙනවා. EU Agreement එක අනුව ඒ ගොල්ලන් අපේ මාළු සම්පත -මත්ස්‍ය සම්පත- මිලදී ගන්න කොට අප ඒ ගොල්ලන්ට එකඟතාවක් වනවා, 2015වන කොට අපි පහසුකම් වර්ධනය කරන්නේ කොහොමද කියලා. ඔවුන් එය වාර්ෂිකව යම් පරීක්ෂණයකට ලක් කරනවා. දැන් ඇමතිතුමා එකඟ වෙලා තිබෙනවා, 2015වන කොට මීටර් 20 බෝට්ටු 300ක් දානවාය කියලා; 2015වන කොට මීටර් 30 බෝට්ටු 500ක් දානවාය කියලා. මා දන්නේ නැහැ, 2015 වන කොට මේ ඉලක්කයට යාම සඳහා ඇමතිතුමා ළඟ තිබෙන සැලැස්ම මොකක්ද කියලා. මට ඇහුණා, මීටර් 22 කණ්ඩායමක් ගේන්න හදනවාය කියලා ඇමතිතුමා කියනවා. [බාධා කිරීමක්] ඔව්. කිව්වා.

නමුත් 2015වන කොට මේ 300, 500 ඉලක්කවලට අපට යන්න බැරි වුණොත් අපට සිද්ධ වන්නේ තායිලන්තයේ මාළු අල්ලන විවිධ සමාගම් අපේ රටේ ලියාපදිංචි කරලා අර සංඛ්‍යා දත්ත පුරවලා ඒ පහසුකම් හදලා පෙන්වන්නයි. එය කිසිසේත්ම අපේ රටේ ධීවර ක්ෂේත්‍රයේ දියුණුවට හේතු සාධක වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඇමතිතුමා නියෝග ගණනාවක් ඉදිරිපත් කරලායි තිබෙන්නේ. ඇත්තටම දැන් අපේ රටේ නීතියක් තිබෙනවාද කියන ප්‍රශ්නය නේ පැන නැඟිලා තිබෙන්නේ. ඒක තමයි ප්‍රධාන ප්‍රශ්නය. මේ පාර්ලිමේන්තුව -ව්‍යවස්ථාදායක සභාව- හැටියට අපට පැවරී තිබෙන ප්‍රධාන කාර්යභාරය තමයි නීති සම්පාදනය කිරීම. අපි විටින් විට නීති සම්පාදනය කරලා දෙනවා. අපි දැන් බලන්න ඕනෑකම තිබෙන්නේ මේ සම්පාදනය කරන නීති ක්‍රියාත්මක වෙනවාද, ක්‍රියාත්මක වීමේදී තිබෙන අඩු ලුහුඬුකම් මොනවාද, ඒවා අපක්ෂපාතිත්වයෙන් ක්‍රියාත්මක වෙනවාද කියන එකයි. එහෙම සිද්ධ වෙන්නේ නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ඒ සඳහා තිබෙන හොඳම උදාහරණය තමයි, ජෙනරල් සරත් ෆොන්සේකා මැතිතුමා 2010 වසරේ පෙබරවාරි මාසයේ 08වැනි දා පැහැර ගෙන යාම. ඒ පැහැර ගෙන යාම විශාල ආන්දෝලනයකට තුඩු දුන්නා. එතුමා සිවිල් පුරවැසියකු හැටියට හමුදාව අත් අඩංගුවට ගත්ත එක හරිද, එතුමා අත් අඩංගුවට ගත යුතු වන්නේ පොලිසියෙන්ද, එහෙම නැත්නම් අත් අඩංගුවට ගැනීමේදී එතුමාට අත් අඩංගුවට ගැනීමේ හේතු පැහැදිලි කළාද, අරන් ගිහින් තියා ගත්තේ කොතැනද කියන කාරණා විශාල ආන්දෝලනයකට තුඩු දී තිබුණා. මොකද ජනාධිපතිවරණය ඉවර වෙලා -ජනවාරි 26වැනි දා ඉවර වනවා.- සති දෙකක් යන්න මත්තෙන් එතුමා අත් අඩංගුවට ගන්නවා.

මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ ගණනාවක සහායෙන් එතුමා ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණා. ඒ නිසා එතුමාගේ අත් අඩංගුවට ගැනීම -විශේෂයෙන්ම එතුමාගේ පැහැර ගැනීම- රටේ විශාල ආන්දෝලනයකට තුඩු දුන්නා. ඒය ජාත්‍යන්තර වශයෙන් විශාල ආන්දෝලනයකට තුඩු දෙන කාරණයක් බවට පත් වුණා. එයට මොකක්ද කළේ? එවකට හිටපු විදේශ අමාත්‍යතුමා -රෝහිත බෝගොල්ලාගම අමාත්‍යතුමා- කරපු දේ තමයි ලංකාවේ ඉන්න විදෙස් රටවල්හි සියලුම තානාපතිවරුන්ට ආරාධනා කරලා මෙම අත් අඩංගුවට ගැනීම පිළිබඳවත්, පසුව සිද්ධ වන නීති කෘත්‍යය පිළිබඳවත් පැහැදිලි කිරීමක් කළ එක. ඒ පැහැදිලි කරපු ප්‍රකාශය මා ළඟ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2010 පෙබරවාරි මාසයේ 11වැනි දා -අත් අඩංගුවට ගෙන දින තුනකට පසුව- ඒ තානාපතිවරුන්ට කරන ලද ප්‍රකාශයයි මේ තිබෙන්නේ. ඒ ප්‍රකාශයෙන් එතුමා පැහැදිලි ලෙසම කියනවා, "මෙතුමා හමුදා පනතට අනුව අත් අඩංගුවට ගත්තේ. යුද අධිකරණය වෙත පමුණුවන්නේ. එම යුද අධිකරණයෙන් ලබා දෙන ලද තීරණයකට තමන්ට එකඟ වන්න බැරි නම් යුද හමුදා පනතේ 79(1) වගන්තිය යටතේ එතුමාට ඊට ඉහළ අධිකරණයකට අභියාචනාවක් ඉදිරිපත් කරන්න පුළුවන්"ය කියලා.

හමුදාවේ හිටපු නිලධාරියෙකු හැටියට ඔබතුමාත් දන්නවා, යුද අධිකරණයෙන් ලබා දෙන තීරණයක් ඒ තීරණයට ලක් වූ පුද්ගලයා සෑහීමකට පත් වන්නේ නැත්නම් ඊට වඩා ඉහළ අධිකරණයකදී එය අභියාචනාවකට ලක් කළ හැකිය කියන එක. හිටපු හමුදා නිලධාරිවරයෙකු හැටියට ඔබතුමාත් ඒක දන්නවා. සමහර විට ඔබතුමාත් සමහර අය එහෙම යොමු කරලාත් ඇති. ඒ වාගේම බෝගොල්ලාගම අමාත්‍යතුමා තානාපතිවරු කැඳවලා පැහැදිලි ලෙසම මේ කථාව කියනවා. මේ රජයේ ස්ථාවරය. තානාපතිවරුන්ට මෙය පැහැදිලි ලෙසම ප්‍රකාශයට පත් කරනවා. දැන් මොකක්ද සිදු වෙලා තිබෙන්නේ?

යුද්ධාධිකරණය දෙන ලද තීරණයට විරුද්ධව ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා අභියාචනයක් ගොනු කළාම රජයේ ප්‍රධාන තර්කය බවට පත් වී තිබෙන්නේ, යුද්ධාධිකරණයෙන් දෙන ලද තීරණය අභියාචනයට ලක් කළ නොහැකිය කියායි.

රජයේ නීතිවේදීන් දිගින් දිගටම මේ ගැන තර්ක කරමින් තිබෙනවා. එය කිසිසේත් ම සාධාරණ නැහැ. විශේෂයෙන් ම හමුදාවේ සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරිවරයෙක් මූලාසනයේ ඉන්න වෙලාවේ ම මට මේ කාරණාව පිළිබඳව අවධානය යොමු කරන්නට ලැබීම භාග්‍යයක් කොට සලකනවා. ඔබතුමා දන්නවා, යුද්ධාධිකරණයකින් ලබා දෙන තීරණයක් ඉහළ අධිකරණයකට අභියාචනය කළ හැකියි; එය හමුදා පනතට අනුකූලයි කියා. හමුදාවේ සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරියකු හැටියට ඔබතුමාත් ඒක දන්නවා; ඒ වාගේම හිටපු බෝගොල්ලාගම අමාත්‍යතුමා රජයේ ස්ථාවරය ලෙස එය ප්‍රකාශයට පත් කර තිබෙනවා. එසේ තිබියදී මෙය අභියාචනයට ලක් කළ නොහැකිය කියා නීතිපති දෙපාර්තමේන්තුව මේ වෙලාවේ කරන තර්කය කිසිසේත්ම පිළිගත හැකි තර්කයක් නොවෙයි. ඒ කෙරෙහිත් රජයේ අවධානය යොමු කරනවා. මා ඒ කරුණ මතක් කළේ වෙන මොකුත් නිසා නොවෙයි.

නීති සම්පාදනයේදී නීති මොන තරම් ප්‍රමාණයක් වුවත් මේ පාර්ලිමේන්තුවේදී අපට සම්මත කර දෙන්නට පුළුවන්. වැදගත්කම තිබෙන්නේ ඒ නීති ඉතාමත් ස්වාධීනව, අපක්ෂපාතිත්වය අනුව, පක්ෂ පාට භේදයකින් තොරව, ආණ්ඩු පක්ෂ - විපක්ෂ භේදයකින් තොරව, පුද්ගලයා කවුද කියන භේදයකින් තොරව, තියෙනවා ද නැද්ද, හැකි ද බැරි ද කියන භේදයකින් තොරව හැම දෙනාටම සාධාරණව මේ නීති ක්‍රියාත්මක විය යුතුයි. නමුත් අවාසනාවකට දැන් පෙන්නුම් කරමින් තිබෙන්නේ මේ සකස් කර දෙන නියෝග, සම්මත කර දෙන නියෝග ඒ හා සමාන ලෙස ස්වාධීනව ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ නැහැ කියන එකයි. මනෝරාජික ලෝකයක් ගැන මා කියනවා නොවෙයි. සර්ව සාධාරණ ශුද්ධ වූ අපක්ෂපාතිත්වයක් මා මේ රජයෙන් කිසිසේත් බලාපොරොත්තු වන්නේ නැහැ. හැබැයි, යම් නීතියකදී අවම සාධාරණයක් තිබෙනවා. මෙතෙක් නීති අර්ථ කථනයකදී තිබෙන නීති අප සැලකිල්ලට ලක් කරනවා. ඒ වාගේම සම්ප්‍රදායයන් අප සැලකිල්ලට ලක් කරනවා. ඒ වාගේම අතීත භාවිතාව අප සැලකිල්ලට ලක් කරනවා. ඒ පිළිබඳව කරුණු අප යොමු කරන්න ඕනෑ. ඒ පිළිබඳව අවධානය යොමු කරමින් මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින්, ගරු ධීවර ඇමතිතුමාටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ඇමතිතුමාට යම් දෙයක් කියන්න ඕනෑලු.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමා.

[අ. භා. 4.56]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවට බාධා කරන්න මා කැමති වුණේ නැහැ. මොකද, ඉතාමත්ම ලස්සනට, ඉතාම වැදගත් කරුණු කාරණා කිව්ව නිසා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවේ සඳහන් කළ කරුණු කිහිපයක් ගැන මා යම් දෙයක් කියන්නට කැමතියි. ඔබතුමාට මා බාධා කරන්න කැමති වුණේ නැහැ, මොකද ඒ තරම් ලස්සනට, ඒ තරම් වැදගත් විධියට ඉතා හොඳ කරුණු ටිකක් මට ඉදිරිපත් කිරීම නිසා පසුව කථා කරනවාය කියා මා සිතුවා.

එකක් තමයි, ධීවරයාගේ ආරක්ෂාව ගැන ඔබතුමා කථා කළා. ඒක බොහොම වැදගත්. ඒ සඳහා අප වෙනම රක්ෂණයක් ආරම්භ කරනවා, ලක්ෂයේ සිට ලක්ෂ තුනකටත් ණයක් ගත්තොත් ඒ ණය ලක්ෂයක් ගෙවන්නත්. දෙවන කාරණය තමයි විශ්‍රාම වැටුප. රුපියල් දහ දාහක විශ්‍රාම වැටුපක්. වයස අවුරුදු හැටේදී ආරම්භ කරන්නේ. [බාධා කිරීම්] නැහැ. නැහැ. ඒක නොවෙයි. ඒක අසාර්ථකයි.

ඔබතුමා කථා කළ තුන්වන කාරණය අධ්‍යාපනය. මුල් කාරණා දෙකෙන් අප දැනට ධීවර රක්ෂණය ආරම්භ කරලායි තිබෙන්නේ. ධීවර විශ්‍රාම වැටුප අප තව ටික දවසකින් ආරම්භ කරනවා. ඒ වාගේම ධීවරයන්ගේ දරුවන් සඳහා අප ශිෂ්‍යත්ව ආරම්භ කරනවා. ඒ දුප්පත් දරුවන් සියලු දෙනාටම විශ්වවිද්‍යාල උපාධිය ලබා ගන්නා තුරු අප ශිෂ්‍යත්ව ලබා දෙනවා. ඒ වාගේම නිවාස වැඩ පිළිවෙළ නැවත ආරම්භ කරනවා. මගේ බලාපොරොත්තුව 2014 අවසාන වනකොට හැම ධීවරයකුටම නිවාසයක් දෙන්නයි. ඒ සඳහා ධීවර සංවිධානයක් දැන් අප හදා තිබෙනවා. ලක්ෂයකට වැඩි ධීවරයෝ ඒකට බැඳිලා තිබෙනවා. සමුපකාරය නොවෙයි, වෙනම සංවිධානයක්. අනෙක් එක ධීවරයන්ගේ පවුලේ අයට ස්වයං රැකියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා අප කරන්නේ මෙහෙමයි. සවුදි රජතුමාගේ පදනමත් එක්ක ඩොලර් මිලියන 300ක මුදලක් අපට ලබා දෙනවා. ඒ මුදල ලබා ගෙන ධීවර සංස්ථාවත් එක්ක ඇති කර ගන්නා වූ ගිවිසුම තුළින් ලබා දෙන ලාභයෙන් සියයට 25ක් ඒ ගොල්ලෝ ධීවරයින්ගේ සුබ සාධනය සඳහා දෙන්න ලැහැස්තියි. ඒ කියන්නේ, කෝටි 3000ක් ආවාම අවුරුදු තුන හතරක් යන කොට කෝටි 1000ක් හම්බ වුණොත් එයින් කෝටි 250ක් ධීවරයින්ගේ සුබ සාධනය සඳහා අපට ලැබෙනවා. ඒ මුදල අප පාවිච්චි කරනවා. සංස්කෘතික වැඩ පිළිවෙළටත් අප දිගටම ප්‍රජා ශාලා වැඩ පිළිවෙළ කර ගෙන යනවා. බොහෝ තැන්වල දරුවන්ට ප්‍රජා ශාලා, ක්‍රීඩාංගන අප අරඹන කරනවා. අනෙක් එක, අපනයනය ගැන ඔබතුමා කිව්වා. අපනයන වාර්තාව මා ළඟ තිබෙනවා.

පසු ගිය අවුරුද්දේ ජනවාරි මාසයේ මෙට්‍රික් ටොන් 1481ක් තිබුණු අපනයන මේ අවුරුද්දේ ජනවාරි මාසයේ මෙට්‍රික් ටොන් 1712 යි. ගිය අවුරුද්දේ පෙබරවාරි මාසයේ මෙට්‍රික් ටොන් 1550 තිබුණු එක, මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේ මෙට්‍රික් ටොන් 2650යි. පසු ගිය අවුරුද්දේ මාර්තු මාසයේ මෙට්‍රික් ටොන් 1381 යි. මේ අවුරුද්දේ මාර්තු මාසයේ මෙට්‍රික් ටොන් 1426යි. පසු ගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ මෙට්‍රික් ටොන් 844යි. මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ මෙට්‍රික් ටොන් 2587යි. පසු ගිය අවුරුද්දේ මැයි මාසයේ මෙට්‍රික් ටොන් 2184 ක් තිබුණා. මේ අවුරුද්දේ මැයි මාසයේ මෙට්‍රික් ටොන් 2755ක් තිබෙනවා. ඒ කියන්නේ අපනයනය වැඩි වෙලා තිබෙනවා, GSP නැතිව. [බාධා කිරීමක්]ඔව්.හරි. ඒක මා පිළිගන්නවා. සම්පූර්ණයෙන්ම පිළිගන්නවා. හරිද?

මන්ත්‍රීතුමා කියපු ඒ මූලික දේවල් මම පිළිගන්නවා. නමුත් මම පුළුවන් තරම් හදනවා, ඒක ඉහළ මට්ටමට ගේන්න. අනෙක් එක තමයි මන්ත්‍රීතුමා උතුර ගැන කථා කළා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, තව කාලය අවශ්‍යද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්. මේ උත්තර ටික දීලා මම අවසන් කරනවා. පළමුවැනි එක තමයි, මේ වෙරළ සම්පූර්ණයෙන්ම නිදහස් කරලා තමයි ආරක්ෂක ලේකම්වරයා මාත් එක්ක කථා කළේ. මොකද මගේ ප්‍රධානත්වයෙන් ආරක්ෂක අමාත්‍යාංශය, නාවික හමුදාව, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ Department of Coast Conservation එක කියන ඔක්කොම එකතු කරලා අපට තිබෙනවා, Special Task Force එකක්. මන්ත්‍රීතුමා කිව්වා වාගේ සමහර තැන්වල ආරක්ෂක අංශ තමන්ගේ බලය තියා ගෙන පෙන්වන්න ඕනෑ කමට එක එක තැන්වල කටයුතු කරනවා. ඒ බොහෝ තැන් අපි නිදහස් කළා. ඉරණමඩුත් අපි පසු ගිය සතියේ නිදහස් කර ගත්තා.

අනෙක් එක අවසර පත්‍රවල ප්‍රශ්නයක් තිබෙනවා. ඒක එතැනට විතරක් නොවෙයි, අපේ බෝරුවල වරායේත් අවසර පත්‍ර බලනවා. මොකද බලා ගෙන ගියාම දැන් විශාල මත් ද්‍රව්‍ය ප්‍රවාහනයක් කරන්නේ මේ බෝට්ටුවලයි. අද ඇවිල්ලා තිබෙන ඉන්දීය ධීවරයොත් එක්ක අපේ ආරක්ෂක අංශවල සමහර අයත් මේ මත් ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ වෙලා තිබෙනවා. ඒක හින්දා තමයි බෝට්ටු පරීක්ෂා කරන්නේ. ඒ, පුළුවන් තරම් මත් ද්‍රව්‍ය ජාවාරම නවත්වන්නයි. විශේෂයෙන්ම තලෙයිමන්නාරම සහ පේසාලෙයි ඒවායේ ඉන්දියාවත් සමඟ කරන මේ මත් ද්‍රව්‍ය ජාවාරම අතටම අහු වෙලා තිබෙනවා. මේක කඩා ගන්නට තමයි ඇත්තටම ඒ වැඩ

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

පිළිවෙළ ආරක්ෂක අංශ විසින් යොදවා තිබෙන්නේ. ඒ නිසා මමත් කථා කරලා ඒකට අනුමැතිය දුන්නා. අපේ පැතිවලත් ඔය ප්‍රශ්නය තිබෙනවා. බෝට්ටු යනකොට ඒවාත් අරගෙන යනවා.

අනෙක් එක දික්ඕවිට නිවාස. ඇත්තටම මම එන්න ඉස්සෙල්ලායි මේවා සිදු වුණේ. ඒක වුණේ දික්ඕවිට වරාය හදන්න ගිහිල්ලායි. මේක වංචාවක් නොවෙයි වුණේ. ඒ සඳහා කොන්ත්‍රාත් ගත් කට්ටියට කිව්වා වහාම මේක හදන්න කියලා. එතකොට මේ බිම සකස් කරලා තිබුණේ නැහැ. ඒක නිසා මම ඇවිල්ලා මොරටුව විශ්වවිද්‍යාලයට මේ විස්තර දුන්නාම ඒ ගොල්ලන් කිව්වා, මේක වුණේ මේක හරියට pile කරලා නැති නිසා කියලා. මොකද මේ ඔක්කොම හැදුවේ හදිස්සියටයි. නමුත් ඒ සියලුම කට්ටියට වන්දි ගෙවන්න මම දික්ඕවිට fund එකෙන් සල්ලි දීලා තිබෙනවා. ඒ ගෙවල් සියල්ලම හදලා යථා තත්ත්වයට පත් කරලා දෙනවා.

අනෙක් එක ඉන්දීය ධීවරයින්ගේ ප්‍රශ්නය. එයත් සතුටුදායක අන්දමින් එන්න එන්න අඩු වෙනවා. මම ගිය සුමානේ යාපනයේ හිටියා. එතකොට ඒ ගොල්ලන් කිව්වා ඉස්සරට වඩා ඒ ප්‍රශ්න දැන් හුඟක් අඩුයි කියලා. ඒක දැන් අපි සාකච්ඡා කර ගෙන යනවා.

අනෙක් එක බහුදින යාත්‍රාවලට මේ 25වැනි දා අපි ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරනවා. ඒ තුළින් ධීවරයින් 150කට බහුදින යාත්‍රා 150ක් සඳහා අපි ණය නිකුත් කරනවා. අපි ඒ කටයුතු ආරම්භ කරන්නේ ඒකෙන්. ඒ අනුව තමයි අපි මේ ඉලක්කය කරා ගමන් කරන්න යන්නේ. මෙන්න මේ ටික තමයි කියන්න තිබෙන්නේ.

සරත් ෆොන්සේකා මැතිතුමාගේ ප්‍රශ්නයේදීත් මම කියන්නේ එතුමා මගේ මිත්‍රයා. කොහේ හිටියත් මම ඒ මිත්‍රත්වය අත් හරින්නේ නැහැ. දේශපාලනය වෙනම කථාවක්. කුඩා කාලයේ ඉඳලා අපි දෙන්නා එකට ඉඳලා ආවේ. එදා ඉඳලාම අද වන තුරු කවදාවත් අපි දෙන්නා වෙනස් වෙලා නැහැ, දෙපැත්තක සිටියත්. බෝගොල්ලාගම ඇමතිතුමා ඇත්තටම ඒ වෙලාවේ කිව්වේ යුද අධිකරණය යම් කිසි වැරදි තීන්දුවක් දුන්නොත් ඒක ඉහළ අධිකරණයකින් වෙනස් කරන්න පුළුවන්ය කියලායි. නමුත් ඉහළ අධිකරණයෙන් තීන්දුව දුන්නේ නැහැයි කියන එක ඇත්තටම යුද අධිකරණයට නෛතික අයිතියක් නැහැයි කියන එක ප්‍රතික්ෂේප කරනවා. එච්චරයි. නමුත් යුද අධිකරණය ගන්නා වූ තීන්දුවක් ඕනෑ වෙලාවක ඉහළ අධිකරණයකින් වෙනස් කරන්න පුළුවන්. පුළුවන්නේද? [බාධා කිරීමක්] ඔව්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

[பி.ப. 5.02]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, இன்று இச்சபையில் கடற்றொழில், நீரியல் வளங்கள் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமான விவாதம் நடைபெறுகின்ற இவ்வேளையிலே, எனக்கு அல்-குர்ஆனிலுள்ள

"லாஇலாஹ இல்லா அன்த ஸுப்ஹானக இன்னீ குன்து மினல் ழாலிமீன்"

-"There is no God but Thou; Glory to Thee; I was indeed wrong" (Sura 21:87 Al-Anbiya)

لَآ إِلَٰهَ إِلَّآ أَنتَ سُبۡحَٰنَكَ إِنِّي كُنتُ مِنَ ٱلظَّٰلِمِينَ ٨٧

என்ற ஆயத் ஞாபகத்துக்கு வருகின்றது. இஸ்லாமிய வரலாற்றின்படி, நபி யூனுஸ் (அலை) அவர்கள் மீனுடைய - whale - வயிற்றிலே நெடுங்காலமாக இருந்தார்கள். அதனுள்ளிருந்து அவர்கள் ஒரு துஆவினை அல்லாஹுத்தஆலாவிடம் கேட்டு இறைஞ்சினார்கள். அந்த துஆவினுடைய பரக்கத்தின் காரணமாக அவர்கள் மீனுடைய - whale - வயிற்றிலிருந்து வெளியே வந்தார்கள். இந்தச் சம்பவத்தை அல்-குர்ஆனிலுள்ள "அல்-அன்பியா" என்ற ஸூரா மிக அழகாகச் சித்தரிக்கின்றது.

இன்று இந்த நாட்டைப் பொறுத்தமட்டில், நாங்கள் அனைவரும் அராஜகத்திலிருந்து - பயங்கரவாதத்திலிருந்து - மீட்சி பெறுவதற்காக இந்த துஆவை பள்ளிவாசல்கள்தோறும் ஓதிவருகிறோம்; ஹஜ்ஜுடைய காலத்திலும் அதிகமாக ஓதிவருகின்றோம். எங்களுடைய மதிப்புக்குரிய ஓர் உலமாவான மர்ஹூம் அல்ஹாஜ் மௌலவி ஏ. ஏ. எம். மஸூத் ஆலிம் ஸாஹிப் அவர்கள் நோன்பு காலங்களில் 'தராவீஹ்' தொழுகை முடிந்ததன் பின்னர் இந்த துஆவை தொழுகையாளிகளுக்கும் ஏனையவர்க ளுக்கும் ஓதிக் காண்பிப்பார்கள்.

நாங்கள் விடுதலையடைய வேண்டும்! இந்த துஆவின் காரணமாகத்தான் எங்களுக்கு விடுதலை கிடைத்தது என்பதை நாங்கள் முஸ்லிம்கள் என்ற வகையில் நம்பலாம். அப்படியென்றால், எங்களுக்குக் கிடைத்த இந்த விடுதலையை, சுயாட்சியை, சமாதானத்தை நாங்கள் பேணிப் பாதுகாக்க வேண்டியவர்களாக இருக்கின்றோம். முஸ்லிம்களாக இருந்தாலும் சரி, ஏனையவர்களாக இருந்தாலும் சரி, அது ஒன்றேதான் எங்களுக்குத் தேவைப்படுகின்றது. மீண்டுமொருமுறை இந்த நாட்டிலே பயங்கரவாதம் தோன்றுவதற்கு இடமளிக்க முடியாது; அதற்கு எந்தவிதமான சந்தர்ப்பங்களையும் வழங்கக்கூடாது; ஒரு சில்லும் இருக்கக்கூடாது. அப்படியென்றால்தான், அல்-குர்ஆன் கூறுகின்ற இந்த ஆயத்தின் பிரகாரம் இந்த நாட்டிலே நாங்கள் அனைவரும் சமாதானமாக வாழக்கூடிய ஓர் அருமையான சூழலை எல்லாம் வல்ல அல்லாஹ் எங்களுக்கு உருவாக்கித் தருவான். நாங்கள் மீனவர்களைப் பற்றிச் சிந்திக்கும்பொழுது இதனையும் நினைவுபடுத்திக்கொள்வது நலம்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මා ඉතාම සන්තෝෂයෙන් කියනවා, අපේ රටේ මහා ධීවර යාත්‍රාව ඉතාම දක්ෂ ලෙස පැදවිය හැකි නියමුවෙක් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිවරයා වශයෙන් ලැබිලා තිබෙන බව. ඒ, ගරු රාජිත සේනාරත්න මැතිතුමායි.

இந்த நாட்டில் மீனவர்களுக்கும் ஏனையவர்களுக்கும் சமாதானம் வேண்டும் என்றால், அதனை முன்னெடுத்துச் செல்லக் கூடிய வல்லமை இந்த அமைச்சரிடத்திலே இருக்கின்றது.

எனக்கு ஞாபகம் வருகின்றது - ஒருமுறை அவர் காலஞ்சென்ற விஜய குமாரதுங்க அவர்களுடன் யாழ்ப்பாணத்துக்குச் சென்றதும், அங்குள்ள மீனவர்களைச் சந்தித்ததும். தனது அரசியல் வரலாற்றில் சாதி, இன, மத, மொழி வேற்றுமை இல்லாமல் பாடுபடுகின்ற ஒரு பாராளுமன்ற உறுப்பினரான, ஓர் அமைச்சரான, ஓர் இலங்கைப் புருஷரான அவர் இந்த நாட்டுக்குக் கிடைத்த ஒரு நல்ல சொத்து என்றுதான் நாங்கள் கருதவேண்டும். இப்பொழுது, அவர் களுத்துறை மாவட்டத்திலுள்ள பேருவளைத் தொகுதியைப் பொறுப்பெடுத்து செயற்படுகின்றார். பேருவளை யில் நடைபெற்ற பல கூட்டங்களுக்கு நான் அவருடன் இணைந்து சென்றிருக்கின்றேன். அன்று பலர் கனவு கண்டார்கள், பேருவளை யில் ஒரு மீன்பிடித் துறைமுகத்தை அமைக்கவேண்டும் என்று. அந்த மீன்பிடித் துறைமுகத்தை அமைப்பதற்காகவும் அதனை சக்திமிக்க ஒரு துறைமுகமாக மாற்றுவதற்கும் மாண்புமிகு ராஜித சேனாரத்ன அவர்கள் மேற்கொண்டு வருகின்ற முயற்சிகள் பாராட்டத்தக்கவை என்பதை நான் இந்த சபையில் சொல்லத்தான் வேண்டும்.

பேருவளை நகர சபை, பிரதேச சபை என்பன ஆண்டாண்டு காலமாக ஐக்கிய தேசியக் கட்சியினுடைய ஆட்சியின்கீழ் இருந்தது. அமைச்சர் அவர்கள் பொறுப்பெடுத்த பிறகுதான் பேருவளையில் ஐக்கிய மக்கள் சுதந்திரக் கூட்டமைப்பு அபார வெற்றியீட்டியது. அந்நகர சபையின் தலைவராக இப்பொழுது அன்புக்குரிய இளைய நண்பர் மில்பர் கபூர் அவர்கள் அருமையாக சேவையாற்றிக்கொண்டு வருகின்றார். அவருடைய மாமனார் மர்ஜான் பளீல் அவர்களும் அவருக்குத் துணையாகப் பக்கபலமாகவிருந்து சேவையாற்றி வருகின்றார்.

එදා රාජිත සේනාරත්න ඇමතිතුමා කිව්වා, "ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කරන අවස්ථාවේදී විශේෂයෙන්ම බේරුවලත් ආශ්චර්යවත් නගරයක් කරනවා" කියලා. එතුමා ඒ අඩිතාලම දමා අවසානයි. ඒ පළාතේ සිංහල, මුස්ලිම් සහ ද්‍රවිඩ අය ඉතාම ප්‍රිය කරන, ප්‍රියමනාප ඇමතිවරයකු තමයි එතුමා. අද ලංකාවේ ධීවර වරාය 18ක් පමණ තිබෙනවා. තව 15ක් ඉදි වෙමින් පවතිනවා.

There are 15 harbours to be established under the leadership of the Minister of Fisheries and Aquatic Resources Development in Silawatura, Vankalai, Talaimannar, Gurunagar, Myliddy, Point Pedro, Chalai, Mullaitivu, Pudavaikaddu - all are in the North but Pudavaikaddu is in the East - in Ilangathurai, Palachchenai, Kallar, Pottuvil, Kalamatiya and Gandara .

ஆகவே, பேருவளைத் தொகுதி மிகவும் முக்கியமான தொகுதியாகும். அரபு வம்சத்தவர்கள் முதன்முதலாக இந்தத் தொகுதியிலேயே வந்து இறங்கினார்கள். பேருவளைத் தொகுதியின் முன்னாள் உறுப்பினராக முன்னாள் சபாநாயகர் எம்.ஏ.பாக்கீர் மாக்கார் அவர்கள் விளங்கினார். அப்பிரதேசத்தி லுள்ள மக்களுடைய அபிலாஷைகளையும் உணர்வுகளையும் நன்கு அறிந்தவர் மாண்புமிகு ராஜித சேனாரத்ன அவர்கள். அவர் இந்த நாட்டிலே சமாதானத்தை ஏற்படுத்தக்கூடிய முன்னணி வீரராகத் திகழக்கூடியவர். அவர் பேருவளை நகரத்தைப் புதுப்பொலிவுடன் கட்டியெழுப்ப வேண்டும் என்றுதான் நாங்களும் எதிர்பார்க் கின்றோம்; அதற்காக இந்தச் சபையிலே துஆ செய்கின்றோம்.

So, he has got very talented expertise, personnel to help him. People of the calibre of Dr. Hiran Jayawardene of NARA, the other expert, Dr.T.B. Wanninayake, they are guiding him well. He is fortunate enough to get the help and assistance to pool the resources in order to develop the fishing industry in this country. Then, look at the new Chairman of the Ceylon Fishery Harbours Corporation. He was one of our Colleagues in this House, Mr. Amal Senadhilankara. I pay tribute to him, to the talented Board of Directors and others who are helping the Minister ably.

Then, Sir, “බහුදින යාත්‍රා”- longtime vessels- වැඩි වැඩියෙන් ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙනවා කියා මා හිතනවා. ඒක ඇමතිතුමා කරගෙන යනවා. Basic training is given to fishermen to export Tuna fish with Sashimi quality - ජපානයේ අය කියන්නේ එහෙමයි- with the collaboration of a |Japanese company. They will purchase directly from the fishermen and I think you will also get a commission. As a result, there is income coming to the Ceylon Fishery Harbours Corporation. Vocational Training for fishing youth on new technology will be given with the collaboration of CINEC. This is now being handled by a Sri Lankan firm and the Institute is in Malabe. I am happy to say that the first centre will be established in Beruwala within a month’s time, I believe, and thereafter they will go to Cod Bay in the Eastern Province. Tuna fishing කරන්නේ Silverline Fishery International (Pvt.) Limited එක. There is a plan to purchase Japanese dredgers. මේක ඉතාම වුවමනා කරනවා. Mitsubishi එක සමඟ එකතු වෙලා මේක කරන්නයි හදන්නේ. ඒ සඳහා විශාල මුදලක් යනවා. ඒ වුණත් ඒක ප්‍රයෝජනවත් වනවා. දික්ඕවිට ධීවර වරාය ඇමතිතුමා තව මාසයකින් දෙකකින් විවෘත කරනවා. That is the biggest fishing harbour in Asia. ඒකේ වැඩ ඉවරයි. Balm International Limited ඒක කර ගෙන යනවා. එමඟින් තරුණයන් 1000කට පමණ රැකීරක්ෂා ලැබිලා තියෙනවා.

நேற்றைய தினம் யாழ்ப்பாணத்துக்கு விஜயம் செய்துள்ள மேதகு ஜனாதிபதி அவர்கள் இன்றும் அங்கேயே தங்கியுள்ளார். அவர் யாழ்ப்பாணத்திலுள்ள மீனவர்களைச் சந்தித்து அவர்களது சுக துக்கங்களைக் கேட்டறிந்தார். அதன் பின்னர் அவர் காரைநகர் மற்றும் தீவுப் பகுதிகளுக்குச் சென்றார். அங்குள்ள மக்கள் மேதகு ஜனாதிபதி அவர்களை மிகுந்த ஆரவாரத்துடன் வரவேற்றார்கள்.

யாழ்ப்பாணத்திலே கோப்பாய் நாவலர் தமிழ் வித்தியால யத்தில் இரண்டு மாடிக்கட்டிடத்தை மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் உத்தியோகபூர்வமாகத் திறந்துவைத்து உரையாற்றியபொழுது,

"வாக்குகளை எதிர்பார்த்துச் சேவை செய்வது எமது நோக்கமல்ல"

என்று கூறியது இன்றைய 'தினகரன்' பத்திரிகையில் தலைப்புச் செய்தியாக மிகவும் அழகாகப் பிரசுரிக்கப்பட்டுள்ளது. மேதகு ஜனாதிபதி அவர்களை ஓர் இந்து மதகுரு நெற்றியில் திலகமிட்டு வரவேற்றார்.

"வாக்குகளை எதிர்பார்த்துச் சேவை செய்வது எமது நோக்கமல்ல; இந்நாட்டின் ஜனாதிபதி என்ற வகையில் அனைத்து மக்களுக்கும் சேவை செய்வது எனது பொறுப்பாகும்"

என மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் தெரிவித்தார். நேற்றைய தினம் ஊவா மாகாணத்தின் முதலமைச்சர் சஷீந்திர ராஜபக்ஷ அவர்கள் ஊவா மாகாண சபையின் நிதியுதவியுடன் யாழ். கோப்பாய் நாவலர் தமிழ் வித்தியாலயத்தில் நிர்மாணித்த இரண்டுமாடிக் கட்டிடத்தை உத்தியோகபூர்வமாகத் திறந்துவைத்தபொழுதுதே அவர் இவ்வாறு தெரிவித்தார். මෙන්න බලන්න දියුණුව. I am very happy that the Hon. D.M. Swaminathan is also in this House.

நாவலர் எனப்படுவது முத்தமிழ் வித்தகரைக் குறிப்பதாகும். முத்தமிழ் வித்தகர் ஒருவருடைய நாமத்தினால் இந்த நாட்டிலே கல்வியிலே புதிய மறுமலர்ச்சி ஏற்படுவதற்காக அவர் இவ்வேலைத்திட்டத்தை மேற்கொண்டுள்ளார்.

"மீன்பிடித் தொழில் சர்ச்சைக்குத் தீர்வு காண்பதற்கு அரசியல் விட்டுக்கொடுப்பு அவசியம்"

என்று ஐக்கிய நாடுகள் சபையின் இந்தியாவுக்கான பிரதிநிதியாக நியமிக்கப்பட்டுள்ள முன்னாள் வெளியுறவுத்துறை அமைச்சர் நிருபமாராவ் அவர்கள் கூறியிருப்பதாக இன்றைய 'தினக்குரல்' பத்திரிகையில் செய்தி வெளியாகியுள்ளது. They were talking about Mrs. Nirupama Rao and the Hon. (Dr.) Jayalath Jayawardana. They were completely misled.

இலங்கைக்கும் இந்தியாவுக்கும் இடையில் அடிக்கடி இடம்பெறுகின்ற மீன்பிடித்துறை சார்ந்த சர்ச்சைகளுக்குத் தீர்வு காண அரசியல் ரீதியான விட்டுக்கொடுப்புக்கள் தேவைப்படு

வதாக இந்திய வெளியுறவுச் செயலாளர் நிருபமாராவ் அவர்கள் வலியுறுத்தியிருக்கிறார். நான் ஹன்சாட் பதிவுக்காக இதனைச் சொல்கின்றேன். ஏனெனில் இது மிகவும் முக்கியமான விடயம். எதிர்காலத்திலே இரு நாடுகளுக்கிடையில் எழுகின்ற பிரச்சினைகளை இருநாட்டு அரசாங்கங்களின் உதவிகளைப் பெற்று எப்படித் தீர்க்க வேண்டும் என நிருபமாராவ் அவர்கள் மிகவும் அழகாகவும் தத்துவரூபமாகவும் தெளிவாகவும் குறிப்பிட்டிருக்கிறார்.

"கிளிநொச்சி கடற்றொழிலாளரின் தொழில் முன்னேற்றம் பத்தொன்பது மடங்காக அதிகரிப்பு"

- இது எமது குழுக்களின் பிரதித் தவிசாளர் வட மாகாணத்திலே குறிப்பிட்டுள்ள செய்தி! இதுவும் 'தினகரன்' பத்திரிகையில் வெளிவந்துள்ளது.

நான் இங்கு ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். ஐக்கிய தேசியக் கட்சியைச் சேர்ந்த முன்னாள் இந்து சமய விவகார அமைச்சர் மாண்புமிகு ரி.மகேஸ்வரன் அவர்களுடன் நானும் வட மாகாணத்திலுள்ள யாழ்ப்பாணத்துக்குச் சென்றிருந்தேன். மாண்புமிகு மகேஸ்வரன் அவர்களது வேண்டுகோளுக்கிணங்க, அப்போது கடற்றொழில் அமைச்சராக இருந்த மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ அவர்கள் யாழ்ப்பாணத்துக்கு வந்து வட மாகாணத்திலுள்ள மீன்பிடித் தொழிலாளர்களுக்குப் புதிய வீடுகளை அமைத்துக் கொடுத்தார். அவ்வாறு செய்யக்கூடிய மிகவும் நல்ல மனம் படைத்தவர் எமது மேதகு ஜனாதிபதி அவர்கள் இன்று யாழ்ப்பாணத்துக்குச் சென்று, "நாங்கள் வாக்குகளுக்காக இங்கு வரவில்லை" எனக் கூறியிருக்கிறார். அவ்வாறான தேவை இல்லையென்று இந்தச் சபையிலே நான் சொல்கின்றேன். ஏனென்றால் ஐக்கிய தேசியக் கட்சியைச் சேர்ந்த மகேஸ்வரன் அவர்களுடைய வேண்டுகோளுக்கிணங்க, அன்றே அவர் யாழ்ப்பாணம் சென்று இந்த வீட்டுத் திட்டங்களை எல்லாம் மீனவர்களுக்கு ஏற்படுத்திக் கொடுத்திருக்கிறார்; அங்கு நீர் வழங்கல் சபை ஊடாக நீரையும் வழங்கியிருக்கின்றார். இன்றைய 'தினகரன்" பத்திரிகையைப் பாருங்கள்! அதன் இரண்டாம் பக்கத்திலே

"வடபகுதி மக்கள் அனுபவித்த கருமேகங்கள் சூழ்ந்த கஷ்டநிலை முற்றாக மாறிவிட்டது - பெஸில் ராஜபக்ஷ"

என்ற தலைப்புடன் கட்டுரை ஒன்று பிரசுரிக்கப்பட்டுள்ளது. இந்த நாட்டிலே சமாதானத்தை ஏற்படுத்துவதற்காக இப்பொழுது இங்கு தலைமைதாங்கிக்கொண்டிருக்கின்ற ஓர் 'அட்மிரல்' தரத்திலுள்ள நீங்கள் பேருதவி புரிந்தீர்கள். இதில் வரலாற்றிலே முக்கிய இடம் வகிப்பவர்தான் பாதுகாப்புச் செயலாளர் கோட்டாபய ராஜபக்ஷ அவர்கள் - ஜனாதிபதி அவர்களின் சகோதரர். அவர்தான் இந்தச் சமாதானத்தை உருவாக்கித் தந்தார். எனவே, அவர்கள் வடக்கையும் அபிவிருத்தி செய்கின்றார்கள். இந்தக் கட்டுரையிலே,

“மீனவர்களுக்குத் தேவையான படகுகள், வலைகளை வழங்குவதுடன் மற்றும் படகுகள் நங்கூரமிடுவதற்கான மீன்பிடித் துறைமுகங்களையும் நாம் ஏற்படுத்தி வருகின்றோம். பெண்களை இலக்காக வைத்துச் சுயதொழில் முயற்சிகளுக்கான கடனுதவிகளையும் நாங்கள் செய்து வருகின்றோம்..."

என்றும் குறிப்பிடப்பட்டுள்ளது. இந்த விடயங்கள் ஹன்சாட் அறிக்கையில் பதியப்பட வேண்டும் என்பதற்காகவே நான் இங்கு தெரிவிக்கின்றேன். ஏனென்றால் இவை வரலாற்றில் முக்கியத்துவம் பெறுகின்ற விஷயங்கள்!

வாழைச்சேனை மீன்பிடித் துறைமுகத்தைப் பற்றியும் நான் இங்கு சொல்ல வேண்டும். வாழைச்சேனையில் தமிழ் மற்றும் முஸ்லிம் மக்கள் வாழ்கின்றார்கள். அங்கே வாகரை, ஓட்டமாவடி, ஏறாவூர், கல்குடா, சித்தாண்டி, கிரான், சந்திவெளி, முறக்கொட்டாஞ்சேனை, செங்கலடி ஆகிய பிரதேசங்களில் சுமார் 90 ஆயிரம் வாக்காளர்கள் இருக்கின்றார்கள். அவர்கள் தொழில் புரிவதற்காக வேண்டிய ஏற்பாடுகள் செய்து கொடுக்கப்பட வேண்டும் என்று எங்களிடத்திலே வேண்டுகோள் விடுத்திருக்கிறார்கள். அந்தப் பிரதேசத்தில் வசிக்கும் ஹனீபா GS அவர்கள் பயங்கரவாதிகளின் செயற்பாடுகள் காரணமாக எவ்வளவோ துயருக்குட்பட்டவர். அவரும் அடிக்கடி இந்த வேண்டுகோளை விடுத்து வந்தார் என்பதையும் நான் இங்கு சொல்ல வேண்டும்.

I will finish with this. Our Friends are missing from the House now. There is Jayalalitha across the Palk Strait and Jayalath La-La in this House; Jayalalitha is across the Palk Strait and Jayalath-La-La is in this country. Both are the same. They are conspirators. So, there is no difference between Jayalalitha and Jayalath-La-La.

I should emphasize that in this House. I am happy because our learned Lawyer, the Hon. D.M. Swaminathan, is also in this House.

Then, Sir, there is a list of prison offences under the revision made to the Section 78 of the Prisons Ordinance of 1956. It states, I quote :

“A prisoner shall be guilty of an offence against prison discipline if he -

(xvi) without the authority of a prison officer, communicates whether by writing, speech or gesture with any person who is not connected with the administration of the prison ;”

What is Mr. Sarath Fonseka doing daily at the court there? Everyday he is speaking to the press. He had made it a propaganda meeting for him when they are taking him to courts. I think the Minister of Justice and also the Government should take very serious note of this. He is violating - the Hon. Swaminathan who is sitting across the aisle here will agree with me - the Prisons Ordinance. He will agree with me because he is a senior lawyer. This has set a precedent. Some relatives of certain prisoners who came from the fishing community in Beruwala asked me, “අපිටත් පුළුවන්ද, මාධ්‍යයට කථා කරන්න?” எங்களுக்கு இயலுமா இவ்வாறு ஊடகங்களுக்குப் பேட்டி அளிப்பதற்கு? So, it will be a very bad precedent for other prisoners also if this is allowed to continue. I think the time has come. He is making propaganda. He is lashing out at the Government. Let him do it if he wants to, but, he is a convicted prisoner. There are two cases against him, in that he is a remand prisoner who has already been convicted for 30 months. As a result, as a prisoner he must observe discipline of the prison laws and ordinances and if he still continues to violate them, I state in this House that stern action must be taken against him and clear orders given to the Commissioner General of Prisons to take proper action regarding this.

Thank you very much.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊ ළඟට ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා.

ඊට ප්‍රථමයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මේ අවස්ථාවේ "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர அக்கிராசனத்தி னின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. (DR.) SARATH WEERASEKARA *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 5.21]

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා (සමාජ සුබසාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து - சமூக நலன்புரி அமைச்சர்)
(The Hon. Milroy Fernando - Minister of Social Welfare)
ස්තුතියි, මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි. මා විශේෂයෙන්ම ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. ධීවර ජනතාව වෙනුවෙන්, ධීවර කර්මාන්තය වෙනුවෙන් තමුන්නාන්සේ ඉතාමත්ම හොඳ නියෝග හතරක් මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.

තහනම් දැල් පාවිච්චිය තහනම් කිරීම සම්බන්ධව මා තමුන්නාන්සේට විශේෂ ස්තුතියක් කරනවා. මේක කල්පිටිය ප්‍රදේශයේ පැවැති ලොකු ප්‍රශ්නයක්. තහනම් දැල් පාවිච්චි කිරීමෙන් මත්ස්‍ය සම්පත විනාශ වනවා. කොච්චර කිව්වත් සමහර අය මේක පිළිගන්නේ නැහැ. මේ බොහොම සුළු පිරිසක්. තමුන්නාන්සේට හරි ගණනට පෙන්නුව තිබෙන බෝට්ටු ප්‍රමාණය මෙච්චරයි කියලා. ඒක ඉතාමත්ම සාධාරණ විධියට තමයි තමුන්නාන්සේ ඉදිරිපත් කළේ. බොහොම සුළු බෝට්ටු හිමියෝ ගණනක් තමයි මේ ක්‍රමයට තමන්ගේ රැකියාව කරන්නේ. මේක සම්පූර්ණයෙන් තහනම් කරන්න ඕනෑ. මේක දකුණේ තහනම් කළා. කල්පිටිය, මන්නාරම ප්‍රදේශවලත් ඒ වාගේම උතුරු නැඟෙනහිරත් තහනම් දැල් පාවිච්චි කරනවා.

ඒ වාගේම නැඟෙනහිර තිබෙන තවත් ලොකු ප්‍රශ්නයක් තමයි ඩයිනමයිට් දාන එක. මේකත් මේ රටේ මාළු සම්පත විනාශ කරන ප්‍රධානම දෙයක්. ඒ නිසා තමුන්නාන්සේ මේ ගෙනල්ලා තිබෙන නියෝග ඉතාමත් සාධාරණ, මේ රටේ ධීවර කර්මාන්තය නඟා සිටුවන්න කරලා තිබෙන ලොකු දේවල් හැටියටයි මම සලකන්නේ.

දැනට තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන් ඉස්සන් ව්‍යාපාරය සම්බන්ධව කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඉස්සෝ පැටවු දාන්නේ එක කාලයකටයි. සියලුම දෙනා එකම කාලයකදී තමයි ඉස්සෝ පැටවු ටික දාන්න ඕනෑ. ඒවායින් harvest කරන්න ඕනෑත් එකම කාලයකදීයි. එතකොට ලෙඩ බෝ වීම අඩු වෙනවා. ඒ වැඩ කටයුත්ත තමුන්නාන්සේ ඉතාමත්ම හොඳින් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ සඳහා අපේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ස්තුතිය තමුන්නාන්සේට පුද කරන්නට ඕනෑ.

මිරිදිය -දේශීය- මත්ස්‍ය සම්පත වර්ධනය කරන්න කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම හිරිකනයා සම්පූර්ණයෙන්ම වඳ වෙලා තිබුණු මත්ස්‍යයෙක්. අද මම සන්තෝෂ වෙනවා. ජලජීවී වගාව සම්බන්ධයෙන් කටයුතු කරන අය, තමුන්නාන්සේලා ඒ මත්ස්‍යයා නැවත නිෂ්පාදනය කරලා අවුරුද්දකට මිලියන දෙකක් පමණ මුදා හරිනවා. ඒ වාගේම වලයා, වලපොත්තා වාගේ අපේ දේශීය මත්ස්‍ය සම්පත ආරක්ෂා කර ගන්න තමුන්නාන්සේ කටයුතු කරලා තිබෙනවා.

අනෙක් කාරණය බෝට්ටු නිෂ්පාදනයයි. බෝට්ටු නිෂ්පාදනයත් හරියාකාරව කරන්න ඕනෑ. තෙප්පන් කපන සමහර අයත් බෝට්ටු නිෂ්පාදනයට යනවා. නමුත් මේකේ යම් කිසි ප්‍රමිතියක් තිබෙනවා; ක්‍රියා මාර්ගයක් තිබෙනවා. බෝට්ටු නිෂ්පාදනය කරන පිළිවෙළක් තිබෙනවා. ඒ වාගේම ඒ සඳහා තමුන්නාන්සේ ගෙන තිබෙන වැඩ පිළිවෙළ ඉතාමත්ම හොඳයි. ඒ විධියට තමයි කෙරෙන්න ඕනෑ.

ඒ වාගේම අනෙක් කාරණය ආදායම් බද්දෙන් නිදහස් කිරීම. ධීවර කර්මාන්තයේ යෙදෙන අය බොහොම සුළුවෙන් පටන් අරන් අද විශාල බෝට්ටු හිමියෝ වෙලා තිබෙනවා. නමුත් එයාලා බොහොම අමාරුවෙන් තමයි මේ තත්ත්වයට ඇවිත් තිබෙන්නේ. අඩු තරමින් අවුරුදු පහකට, දහයකටවත් ඒ අයගේ ආදායම් බදු ගෙවන එක නතර කිරීමට කටයුතු කළොත් විශේෂයෙන්ම අපි තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම තමුන්නාන්සේ දැන් බැංකු ණය දෙන්න ලැහැස්ති කරලා තිබෙනවා. ධීවරයාට තමුන්ගේ බෝට්ටු ගන්න අවශ්‍ය කරන ණය පහසුකම් ලබා දෙන්නත්, ධීවරයාට අවශ්‍ය කරන පහසුකම් සපයා ගන්න කටයුතු කිරීම ඉතාමත්ම හොඳ දෙයක්.

ඒ වාගේම දැල්, ආම්පන්නවල මිල ටිකක් අඩු කරලා දෙනවා නම් හොඳයි කියන එකත් ධීවර ජනතාවගෙන් තිබෙන තවත් ඉල්ලීමක්. ඒ කටයුත්තත් ඉෂ්ට කරන්න කියලා විශේෂයෙන්ම මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම උතුරු-නැඟෙනහිර යුද්ධය පටන් ගන්න ඉස්සර අපේ ප්‍රදේශයේ ජනතාව ඇතුළු මේ රටේ විශාල පිරිසක් - විශේෂයෙන් මේ දවස්වල මෙහෙ වාරකන් එද්දී නැඟෙනහිර ප්‍රදේශයේ වලාල තිබෙනවා.- ඒ ප්‍රදේශයේ රක්ෂාව කරන්න ගියා. ඒ නිසා ඒ අයට රැකියාව කිරීමේ අවස්ථාව ලැබුණා. පසු ගිය කාලයේ දුෂ්කරතාවක් තිබුණා. නමුත් දැන් ඒ දුෂ්කරතාව මඟ හැරලා ඒ අයට රැකියාව කිරීමේ අවස්ථාව සලසා දෙන්න. ඒ වාගේම බොහොම සහෝදරත්වයෙන් තමයි එදා මේ අය ජීවත් වුණේ. ඒ අවුරුදු 30ක කාල සීමාවක් තිබුණු යුද්ධය නිසා ඒ සහෝදරත්වය නැති වුණත් ඉස්සර මේ අය බොහොම සහෝදරත්වයෙක් ජීවත් වෙච්ච පිරිසක්. ඒ නිසා අපි දකුණේ ජනතාවත්, උතුරේ ජනතාවත්, නැඟෙනහිර ජනතාවත් එකට එකතු වෙලා කරන මේ කර්මාන්තය ඉදිරියට ගෙන යන්න, ඒ අයට ඒ ප්‍රදේශවලට ගිහින් රක්ෂාව කරන්න අවස්ථාව සලසා දෙන්න ඕනෑ.

විශේෂයෙන් මම තමුන්නාන්සේගෙන් තව එක ඉල්ලීමක් කරනවා. ධීවර රක්ෂණ ක්‍රමය තවත් පහසුවෙන් ගෙවන්න පුළුවන් විධියට, ඒ වාගේම බෝට්ටු රක්ෂණය සහ ධීවරයාගේ ජීවිත රක්ෂණ ක්‍රමයත් හරියාකාරව, සාධාරණව ගෙවන විධියට සකස් කරන්න කියලා.

අනෙක් කාරණය ධීවර නිවාස. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ධීවර ඇමතිවරයා හැටියට සිටියදී එදා ධීවර නිවසක් හදන්න රුපියල් 25,000ක් ලබා දුන්නා. ඉන් පසුව එය රුපියල් 50,000 දක්වා වැඩි කළා. පුළුවන් නම්, අවස්ථාවක්

[ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා]

තිබෙනවා නම් එය වැඩි කිරීම හොඳයි. මොකද, ධීවරයාගේ ජීවන තත්ත්වය නඟා සිටුවන්න නම් අපි ඒ කටයුත්ත කරන්න ඕනෑ.

ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයාගේ "දිවි නැගුම" වැඩසටහන යටතේ තිබෙන ධීවර සහ පශු සම්පත් අංශය බාර දීලා තිබෙන්නේ මටයි. මෙතැනදී අපි ධීවර වැඩසටහන් තුළින් විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම පරම්පරාවෙන් එන ධීවරයන්ට අමතරව තවත් අයව රැකියාවට යොමු කරන්න අලුත් ව්‍යාපෘති ගණනාවක් අපි දැනට සැලසුම් කර ගෙන යනවා. ඉදිරියේදී ඒවා අපට හරියට සැලසුම් කරලා කටයුතු කරන්න පුළුවන් වෙනවා. 12,000කට වැඩි පිරිසකට ස්වයං රැකියා කිරීමේ කටයුතු කරන්න අපට භාර දෙන්න පුළුවන්. ඒ වාගේම මේ ගංගා ආශ්‍රිතව කූඩු තුළ මසුන් ඇති කිරීමේ ව්‍යාපෘතියකුත් අපට පටන් ගන්න පුළුවන්. ඒකටත් දැනට ධීවර අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරු සම්බන්ධ වෙලා කටයුතු කරගෙන යනවා. "දිවි නැගුම" වැඩසටහන මාර්ගයෙන් මේ ධීවර ජනතාවගේත් ඒ වාගේම සාමාන්‍ය ජනතාවගේත් සාමාන්‍ය තත්ත්වය දියුණු කර ගන්නට අපට පුළුවන්කම ලැබෙනවා.

අද මත්ස්‍ය මිල ගැන අපේ රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා කථා කළා. එතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. මේ දවස්වල අපේ වාරකන් කාලයයි තිබෙන්නේ. ඒ කියන්නේ මුහුදට යන්න අමාරුයි කියන එකයි. වලාල කාලය තිබෙන්නේ අනික් පැත්තේ. ඒ නිසා මේ කාල සීමාවේදී මාළුවල මිල ටිකක් වැඩියි. මොකද ලබන සැප්තැම්බර් මාසයෙන් පස්සේ, ඔක්තෝබර් වෙද්දී මා දැල් වට කරන්න ගන්නවා. මේ පැත්ත ආපසු වලාල වෙනවා. හය මාසයට මාරු වෙනවා, වාරකන් වලාල කියලා. වලාල ආවාට පස්සේ මාළු සම්පත අපට ඕනෑ තරම් ලබා ගන්න පුළුවන් වෙනවා; ජනතාවට අවශ්‍ය කරන මාළු සම්පත ගන්න පුළුවන්කම ලැබෙනවා. මාළු මිල ගත්තාම අද තිබෙන මිල නොවෙයි හෙට තිබෙන්නේ. ඒ වාගේම අද ධීවර ජනතාවට මෙච්චර මාළු ප්‍රමාණයක් හමු වුණත් හෙට කොච්චර ප්‍රමාණයක් හමු වෙයිද කියලා දන්නේ නැහැ.

ධීවර බැංකු ක්‍රමයකුත් තමුන්නාන්සේලා ලැහැස්ති කරලා තිබෙනවා. විශේෂයෙන්ම අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ධීවර ඇමති වෙලා ඉන්න කාලයේ අපි "ඉදිවර බැංකු" කියලා බැංකු ක්‍රමයක් ඇති කළා. ඒ බැංකු ක්‍රමය තවත් ඉදිරියට ගෙනි යන්න, මම හිතන හැටියට ඒකේ සැලැස්මක් තිබුණා, විශාල බැංකුවක් විධියට කටයුතු කරලා ධීවර ජනතාවට අවශ්‍ය කරන ණය පහසුකම් ලබා දෙන්න. ඒ කටයුත්තත් තමුන්නාන්සේ කරන්න.

අවසාන වශයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. තහනම් දැල් යොදා මසුන් ඇල්ලීම තහනම් කිරීම කරන්න බැරිව ගිහින් තිබුණු වැඩක්. ඒ කටයුතු තමුන්නාන්සේ කිරීමම ඇති ධීවර ජනතාවගේ ප්‍රශංසාව ලබන්න. ඒ වාගේම ධීවර ජනතාවගේ ඉදිරි කටයුතු කරන්න ඒ අයට ලොකු අවස්ථාවක් ලැබෙනවා, මෙවැනි තහනම් දැල් පාවිච්චි කරලා මසුන් ඇල්ලීම තහනම් කිරීමෙන්. ඒ වාගේම ඒ තහනම් දැල් සම්පූර්ණයෙන් විනාශ කිරීමට කටයුතු කරලා තිබෙනවා. ඒ අයට අවශ්‍ය කරන බෝට්ටු තිබෙනවා. අවශ්‍ය වන්නේ දැල් ආම්පන්න විතරයි. ඒක සාධාරණ මිලකට ධීවරයාට දෙන්න කටයුතු කළොත් මම හිතන හැටියට මේ ධීවර කර්මාන්තය මේ රටේ සංචාරක ව්‍යාපාරයටත් වැඩිය ඉතාමත්ම දියුණු ව්‍යාපාරයක් වශයෙන් තමුන්නාන්සේලාට ඉදිරියට ගෙනි යන්න පුළුවන් කියන එක ප්‍රකාශ කරන අතර මටත් අවස්ථාව සලසා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා. ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ධීවර හා ජලජ සම්පත් පනත: නියෝග
## கடற்றொழில், நீரியல் வளங்கள் சட்டம்: ஒழுங்குவிதிகள்
## FISHERIES AND AQUATIC RESOURCES ACT: REGULATIONS

### I

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

On behalf of the Minister of Fisheries and Aquatic Resources Development, I move,

"That the Regulations made by the Minister of Fisheries and Aquatic Resources Development under Section 61 of the Fisheries and Aquatic Resources Act No. 2 of 1996 and published in the Gazette Extraordinary No. 1700/19 of 07th April 2011, which were presented on 05.07.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

On behalf of the Minister of Fisheries and Aquatic Resources Development, I move,

"That the Regulations made by the Minister of Fisheries and Aquatic Resources Development under paragraphs (c) and (f) of sub-section (1) of Section 61 of the Fisheries and Aquatic Resources Act No. 2 of 1996 and published in the Gazette Extraordinary No. 1600/13 of 05th May 2009, which were presented on 5.07.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### III

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

On behalf of the Minister of Fisheries and Aquatic Resources Development, I move,

"That the Regulations made by the Minister of Fisheries and Aquatic Resources Development under Section 61 read with Section 30 of the Fisheries and Aquatic Resources Act No. 2 of 1996 and published in the Gazette Extraordinary No. 1665/16 of 04th August 2010, which were presented on 05.07.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The Adjournment Motion to be moved by the Hon. Thilanga Sumathipala. - [*Pause.*] He is not present.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.30 ට, 2011 ජූලි 21 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 5.30 மணிக்கு பாராளுமன்றம், 2011 யூலை 21, வியாழக்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 5.30 p.m. until 1.00 p.m. on Thursday, 21st July, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.